ශ්‍රී ලංකා
රක්ෂණ නියාමන
කොමිෂන් සභාව

විශිෂ්ටත්වය
උදෙසා

වාර්ෂික වාර්තාව 2022

පටුන

දැක්ම, මෙහෙවර 02 | වසරේ වැදගත් සිදුවීම් 03 | සභාපතිතුමාගේ පණිවිඩය 04 | අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය 08 |
කොමිෂන් සභාවේ සාමාජිකයින් 16 | කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව 18 | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 20 |
කාර්ය මණ්ඩලය 22 | පොදු සමාලෝචනය 28 | කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය 34 | අධීක්ෂණ සමාලෝචනය 46 |
නියාමන සමාලෝචනය 51 | විමර්ශන සමාලෝචනය 53 | වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය 56 |
පරිපාලනමය සමාලෝචනය 61 | මූල්‍ය සමාලෝචනය 62 | සංයුක්ත පාලනය පිළිබඳ වාර්තාව 64 | විගණන කමිටුවේ වාර්තාව 65 |
විගණකාධිපති වාර්තාව 68 | 2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම 78 |
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය 91 | මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය 92 | ශුද්ධ වත්කම් හා
ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය 93 | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 94 | රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල්
ප්‍රවාහ ප්‍රකාශනය 95 | ගිණුම්කරණ ප්‍රතිපත්ති 96 | මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 103 | මූල්‍ය කාර්ය සාධනයේ විශේෂ අවස්ථා 117 |
පරිශිෂ්ඨය I 118 | පරිශිෂ්ඨය II 119 | පරිශිෂ්ඨය III 122 | පාරිභාෂික ශබ්ද මාලාව 123 |

විශිෂ්ටත්වය උදෙසා

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමට, තිරසාර රක්ෂණ කර්මාන්තයක් ඇති කිරීමට සහ ශක්තිමත් අධීක්ෂණ සහ නියාමන පාලන තන්ත්‍රයක් ඇති කිරීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අපගේ සමාජය සහ ආර්ථිකය අවදානම්වලට වඩාත් ඔරොත්තු දෙන තත්ත්වයට පත් කිරීමට කැපවී සිටියි. අපි වැදගත් සම්පත් ආයෝජනය කරන අතර මෙරට රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහා කර්මාන්තය සමග සහයෝගයෙන් කටයුතු කරන්නෙමු.

දැක්ම

දකුණු ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීම.

මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම,
අධීක්ෂණය කිරීම සහ අභිවෘද්ධිය සඳහා
පහසුකම් සැලසීම සිදුකරලමින් රක්ෂණ ඔප්පු
හිමියන්ගේ යහපත සුරැකීම.

වසරේ වැදගත් සිදුවීම්

28	රක්ෂණ සමාගම්
77	රක්ෂණ තැරැව්කාර සමාගම්
47,102	රක්ෂණ සමාගම් නියෝජනය කරන රක්ෂණ නියෝජිතයින්
620	රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින්

රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

	2022	2021	වෙනස %
දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන)	258,100.4	233,521.2	10.5
මුළු වත්කම් (රු. මිලියන)	962,299.2	889,637.5	8.2
දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය	1.1	1.3	15.4
රක්ෂණ ඝනත්වය (රු.)	11,636.1	10,539.9	10.4
කොමිෂන් සභාවේ කාර්යසාධනය			
ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු. මිලියන)	9,381	8,441	11.13
සෙස් ආදායම (රු. මිලියන)	588	544	8.09
වාර්ෂික ගාස්තුව (රු. මිලියන)	291	258	12.79

රු. මිලියන 962,299.2
රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

රු. මිලියන 258,100.4
රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරික ආදායම

සභාපතිතුමාගේ පණිවිඩය

සභාපතිතුමාගේ පණිවිඩය

2022 දී, ආර්ථික පසුබෑම නොතකා රක්ෂණ කර්මාන්තය වාරික ආදායමට අදාළව ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. රක්ෂණ කර්මාන්තයේ සමස්ත දළ ලිඛිත වාරික ආදායම පසුගිය වසරේ සමස්ත වාරික වර්ධනය වූ 12.1% ට සාපේක්ෂව 10.5% ක අඩු වර්ධනයක් පෙන්නුම් කරමින් වසර තුළ ඉහළ ගොස් ඇත.

2022 වසර ශ්‍රී ලාංකේය ඉතිහාසයට එක්වන්නේ උග්‍ර සමාජ-ආර්ථික අර්බුදයකට මුහුණ දීමට සිදු වූ වඩාත් අභියෝගාත්මක වසර ලෙස සහ රට නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ වු වඩාත්ම දුෂ්කර හා අතිශයින් අස්ථාවර වු වසර ලෙසද වේ. මෙම පසුබිම යටතේ, වර්ෂය 2022 සඳහා වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (කොමිෂන් සභාව) වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරමි.

අභියෝග

කොවිඩ් - 19 හි ප්‍රතිවිපාකවලින් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් සිටිය දී 2022 වසරේ ආර්ථිකය එහි ඉහළම කැලඹීම අත් දකින විට අහිතකර සිදුවීම් මාලාවක් හේතුවෙන් ශ්‍රී ලංකාව අභියෝග කිහිපයකට මුහුණ දුන්නේය. ශීඝ්‍රයෙන් වෙනස් වන තත්වයන් සමග සමස්ත ශ්‍රී ලාංකේය දේශපාලන හා සමාජ ආර්ථික පසුබිම අසාමාන්‍ය කැළඹීමකට ලක් විය. රටේ දළ දේශීය නිෂ්පාදිතය 7.8% ක හැකිලීමක් වාර්තා කළ අතර එය නිදහසින් පසු ශ්‍රී ලංකාව ප්‍රදර්ශනය කළ වාර්තාගත අඩුම ආර්ථික සාධනයයි. දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වය සහතික කිරීම සඳහා රජය ක්‍රියාකාරී පියවර කිහිපයක් ගෙන ඇතත් ව්‍යාපාරික පරිසරය 2022 දී බලාපොරොත්තු වූ මට්ටමට වඩා අඩු කාර්යසාධනයක් පෙන්නුම් කළේය.

රටේ පවතින අයහපත් ආර්ථික පරිසරය සමස්ත කාර්ය සාධනයට බලපෑවේය. 2022 වසරේ සාර්ව ආර්ථික පීඩනය හේතුවෙන් රක්ෂණ ක්ෂේත්‍රය ද අභියෝග රැසකට මුහුණ දුන්නේය. ජීවන වියදම වැඩිවීම සහ උපයෝජ්‍ය ආදායම අඩුවීම සාමාන්‍ය ජනතාව විසින් රක්ෂණ නිෂ්පාදන සඳහා වියදම් කිරීම අවම කිරීමට බලපෑ අතර එය රක්ෂණ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම සැලකිය යුතු ලෙස පහත වැටීමට හේතු විය. එසේම, ඉහළ යන උද්ධමනයේ බලපෑම් මගින් හිමිකම් පෑම්වලට අදාළ වියදම් මෙන්ම මෙහෙයුම් සහ පරිපාලන වියදම් ද ඉහළ නංවනු ලැබූ අතර එමගින් ලාභදායි ඉලක්ක සමග සාර්ථකව කටයුතු කිරීමේ අරමුණින් රක්ෂණ සමාගම් විසින් වාරික අනුපාත වැඩි කිරීමට කටයුතු කෙරිණි. රක්ෂණ සමාගම්වල එවැනි ක්‍රියාමාර්ග දැනට පවතින සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ වාරික ගෙවීමේ හැකියාව තවදුරටත් අඩු කිරීමට මග පාදා ඇත.

කාර්යසාධනය පිළිබඳ දළ විශ්ලේෂණය

2022 දී, ආර්ථික පසුබෑම නොතකා රක්ෂණ කර්මාන්තය වාරික ආදායමට අදාළව ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත. රක්ෂණ කර්මාන්තයේ සමස්ත දළ ලිඛිත වාරික ආදායම පසුගිය වසරේ සමස්ත වාරික වර්ධනය වූ 12.1% ට සාපේක්ෂව 10.5% ක අඩු වර්ධනයක් පෙන්නුම් කරමින් වසර තුළ ඉහළ ගොස් ඇත. සමස්ත දළ ලිඛිත වාරික ආදායමේ වර්ධන වේගය පසුගිය වසර පහේ (05) අඩුම අගය වාර්තා කළ අතර දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරික ආදායමේ අඩු ප්‍රගතිය එයට බොහෝ සෙයින් දායක විය.

උද්ධමනය ඉහළ යාමේ අවසාන ප්‍රතිඵලය වන ගෘහ ඒකකවල සැබෑ ආදායම ක්ෂය වීම හේතුවෙන් 2022 වසරේ නිකුත් කරන ලද නව දිගු කාලීන රක්ෂණ ඔප්පුවල

සභාපතිතුමාගේ පණිවිඩය

සැලකිය යුතු පහත වැටීමේ සෘජු ප්‍රතිඵලයක් වන්නේ වර්ධන වේගය අඩු වීමයි. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පෙර වසරේ වාර්තා වූ 3.5% වර්ධන වේගයට සාපේක්ෂව 11.9% ක වර්ධන වේගයක් වාර්තා කරමින් 2022 තුළ සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළේය. 2020 සහ 2021 කාලය තුළ පිළිවෙලින් සෘණ වාරික වර්ධනයක් වාර්තා කිරීමෙන් පසු අදාළ වාරික අනුපාතවල අනුරූපී වැඩිවීමත් සමග මෝටර් රථවල වෙළෙඳපොළ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් 2022 වසරේදී මෝටර් රථ රක්ෂණ උප කාණ්ඩයේ වාරික ආදායම 7.2% කින් වර්ධනය විය. සෞඛ්‍ය රක්ෂණය හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ අනෙකුත් සියලුම උප කාණ්ඩ, මෝටර් රථ රක්ෂණ උප පන්තියට අමතරව වසර තුළ සාධනීය වාරික වර්ධනයක් පෙන්නුම් කළේය.

මුළු දළ ලිඛිත වාරික ආදායමේ අඩු වර්ධන වේගය සහ වර්තමාන වෙළඳපල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීම රක්ෂණ ව්‍යාප්ති අනුපාතයට සෘණාත්මකව බලපෑ අතර එය වසරින් වසර 1.3% සිට 1.1% දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආරක්ෂණ පරතරය සැලකිය යුතු ලෙස පුළුල් වන අතර අවදානම් අවම කිරීමේ මෙවලමක් ලෙස රක්ෂණයේ වැදගත්කම සහ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීම, සමාජයේ අවශ්‍යතා මත පදනම් වූ නව්‍ය නිෂ්පාදන සංවර්ධනය, රක්ෂණ සේවාවන් වෙත වන ප්‍රවේශය ඉහළ නැංවීම සහ රක්ෂණ සේවාවන් දැරිය හැකි මුදලකට ලබා ගත හැකි තත්වයට පත් කිරීම දැරිය හැකි මිල, තාක්ෂණික දියුණුව තුළින් පාරිභෝගික සේවාව වැඩිදියුණු කිරීම යනාදිය පරතරය අවම කිරීම සහ එමගින් රක්ෂණ ව්‍යාප්තියේ වේගය වැඩි කිරීම සඳහා ඵලදායී පියවර ගත යුතුය. කෙසේ වුවද, ඉහත සඳහන් කළ නොනවතින සාර්ව ආර්ථික කැළඹීම් හේතුවෙන් පැනනගින සෘණාත්මක ප්‍රතිඵලයන්, රට තුළ රක්ෂණ ව්‍යාප්තිය ඉහළ නැංවීමේ ප්‍රයත්නයන්ට තවදුරටත් බාධාවක් වනු ඇත.

වසර තුළ රක්ෂණ කර්මාන්තය සැලකිය යුතු ඩිජිටල් පරිවර්තනයකට ලක් විය. රක්ෂණකරුවන් විසින් සිය මෙහෙයුම් විධිමත් කිරීම, පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ ප්‍රතිරක්ෂණ සහ හිමිකම් පෑමේ ක්‍රියාවලීන් ප්‍රශස්තකරණය කිරීම සඳහා අති නවීන තාක්ෂණයන් භාවිතා කර ඇත. තවද, ක්‍රමයෙන් ඉහළ යන පාරිභෝගික අවශ්‍යතා සහ මතු වන අවදානම්වලට අදාළව රක්ෂණ අංශය විසින් නව්‍ය රක්ෂණ නිෂ්පාදන හඳුන්වා දෙනු ලැබූ අතර ම ආවරණ විකල්පයන්ද පුළුල් කරන ලදී. විශේෂයෙන්, නව රක්ෂණ නිෂ්පාදන සැලසුම් කර ඇත්තේ සයිබර් ආරක්ෂාව, දේශගුණික විපර්යාස සහ වසංගතවලට ආශ්‍රිත අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහාය. ව්‍යාපාර වෙත එල්ල වන බාධාවන්, සංචාර කෙරෙහි වන අවිනිශ්චිතතා සහ සෞඛ්‍ය ආරක්ෂණ ආවරණය වැනි වසංගත ආශ්‍රිත අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට රක්ෂණකරුවෝ තම මෙහෙයුම් සහ පිරිනැමීම් ද සකස් කළහ.

නියාමන රාමුව ශක්තිමත් කිරීම

2022 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද නියාමන මුලපිරීම් මගින් රක්ෂණ සේවා සැපයීමේදී අනුකූලතාව නිරීක්ෂණය කිරීම මෙන්ම රක්ෂණ සමාගම්වල පද්ධති සහ පාලනයන් වැඩිදියුණු කිරීම අරමුණු කර ගෙන ඇත. වෙනස් වන නියාමන සහ ආර්ථික පරිසරයට මෙන්ම වර්තමාන වෙළඳපල ප්‍රවණතා සහ අවස්ථාවන්ට රක්ෂණ කර්මාන්තය විසින් ධනාත්මකව ප්‍රතිචාර දැක්විය යුතු බව කොමිෂන් සභාවේ අදහසයි.

රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS) සහ රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය (AFIR) සමග සබඳතාව වර්ධනය කිරීමෙහිලා කොමිෂන් සභාව ක්‍රියාකාරීව නියැලී සිටියි. රක්ෂණ වෙළෙඳපොළ සංවර්ධනයට පහසුකම් සලසන අතරම සේවාවල කාර්යක්ෂමතාව සහ වෙළෙඳපොළ ස්ථායිතාව ප්‍රවර්ධනය කරමින් දේශීය වෙළෙඳපොළ තත්ත්වයන්ට සහ කර්මාන්ත ක්‍රියාකාරිකයින්ගේ හැකියාවන්ට ගැළපෙන ශක්තිමත් නියාමන සහ අධීක්ෂණ රාමුවක් කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලැබේ.

අනාගත අපේක්ෂාවන්

රක්ෂණ ව්‍යාප්ති අනුපාතය මේ වන විට කලාපීය රටවලට වඩා බොහෝ සෙයින් අඩු වී ඇති අතර දළ දේශීය නිෂ්පාදිතයේ වර්තමාන හැකිලීමත් සමග තවදුරටත් ක්ෂය වී ඇති නමුත් ආර්ථික අර්බුදයෙන් පසු අපේක්ෂිත ප්‍රකෘතිමත් වීමත් සමග රක්ෂණ ක්ෂේත්‍රය ව්‍යාප්ත වීමේ අවස්ථා වැඩි වෙමින් පවතින අතර ක්ෂේත්‍රය තුළ සාර්ථකත්වය ළඟා කර ගැනීමේ හැකියාව ද පවතියි. අඩු රක්ෂණ ව්‍යාප්ති මට්ටම මගින් පෙන්නුම් කරන්නේ නිවැරදි ව්‍යාපාර ආකෘති, තිරසාර පාරිභෝගික වටිනාකම් යෝජනා සහ රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳ ප්‍රමාණවත් දැනුවත් කිරීමක් සමගින් රක්ෂණ අංශයේ ශීඝ්‍ර සංවර්ධනය සඳහා ඇති අවස්ථාව සහ හැකියාවයි. ජීවිත රක්ෂණ ව්‍යාපාර විසින් නව්‍ය පාරිභෝගික වටිනාකම් යෝජනා සමග අවශ්‍යතා මත පදනම් වූ නිෂ්පාදන පිරිනැමීම ඉතා වැදගත් වේ.

වසර ගණනාවක් එක තැන පල්වෙමින් පවතින ව්‍යාප්ති මට්ටම වැඩිදියුණු කිරීම සඳහා රක්ෂණ කර්මාන්තය නව උපාය මාර්ග අනුගමනය කළ යුතුය. නිෂ්පාදනවල සංකීර්ණත්වය සහ ඒවායේ මිල ගණන් හේතුවෙන්

සභාපතිතුමාගේ පණිවිඩය

රක්ෂණ නිෂ්පාදන සැලසුම් කර අලෙවි කිරීමේදී රක්ෂණ සමාගම් ඉහළ ආදායම් ලබන කණ්ඩායම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කළේය. නිෂ්පාදන සරල කිරීම මගින් ඒවා නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල මධ්‍යම හා පහළ ආදායම්ලාභී කණ්ඩායම් ආකර්ෂණය කර ගැනීමට හැකි වඩාත් මිල අඩු නිෂ්පාදන බවට පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් වැඩි අවධානයක් යොමු කළ යුතුය.

සාමාන්‍යයෙන්, රක්ෂණ සඳහා ඇති ඉල්ලුම පාරිභෝගිකයාගේ උපයෝජ්‍ය ආදායම් මට්ටම මත රඳා පවතී. එබැවින්, වසර ගණනාවක් පුරා, උපයෝජ්‍ය ආදායමේ පහළ මට්ටම, රක්ෂණයේ වැදගත්කම සහ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම, රක්ෂණ ව්‍යාප්ති මට්ටම ඉහළ නැංවීමට බාධා පමුණුවන සාධක වී ඇත. ආර්ථික පුරෝකථනය මගින් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් මට්ටම් කරා ගමන් කිරීමට අපේක්ෂා කරන බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස උපයෝජ්‍ය ආදායම ඉහළ නැංවෙන අතර එමගින් රක්ෂණ ව්‍යාප්ති මට්ටම ඉහළ නැංවෙන බවත්ය. උපයෝජ්‍ය ආදායම වැඩිවීම නිසැකවම අනාගතයේදී ඉල්ලුම මත පදනම් වූ රක්ෂණ කර්මාන්තයක් නිර්මාණය කරනු ඇත. එබැවින්, රක්ෂණකරුවන් නව අවදානම් මෙන්ම පවතින අවදානම් ආවරණය කිරීම සඳහා නව අවදානම් සහ දැනට පවතින අවදානම් පැතිකඩවල වෙනස්කම් කල්තියාම හඳුනා ගැනීම, පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම, ක්‍රියාවලීන් විධිමත් කිරීම සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ ගුණාත්මක නිෂ්පාදන සහ සේවා කෙරෙහි අවධානය යොමු කිරීම, නවෝත්පාදනය සහ වෙනස්වන වෙළඳපල තත්ත්වයට අනුවර්තනය වීම සිදු කළ යුතුය.

අගය කිරීම

අවසාන වශයෙන්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත සිය සහාය අඛණ්ඩව ලබා දීම සහ සුහදත්වය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සහ රක්ෂණ ඔම්බුඩ්ස්මන් ඇතුළු සියලුම ක්ෂේත්‍රවල පාර්ශවකරුවන්ට කොමිෂන් සභාවේ සාමාජිකයින් වෙනුවෙන් මාගේ හෘදයංගම ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

කොමිෂන් සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීමේදී දක්වන කැපවීම සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් සහ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්තූති කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.



රසික් සරූක් – ජනාධිපති නීතීඥ
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

> සාර්ව ආර්ථික කැළඹීම්වල ප්‍රතිවිපාක, ක්ෂේත්‍රයේ වර්ධනයට සෘජු බලපෑමක් එල්ල කළද, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමත් සමග කර්මාන්තය යහපත් තත්වයට පත් වනු ඇතැයි අපි සුබවාදී වන්නෙමු.

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකාව සාර්ව-ආර්ථික පරිසරයට බලපෑම් එල්ල කරන ආතතීන් සහ විදුලිය කප්පාදුව, ඉන්ධන, ගෑස් වැනි මූලික අවශ්‍යතාවන්වල හිඟය සහ ඉහළ යන ජීවන වියදම හේතුවෙන් අත්විඳින ලද ආන්තික ආර්ථික කැලඹීම් සමගින් බොහෝ දුෂ්කරතාවලට මුහුණ දුන්නේය. කෙසේ වුවද, රක්ෂණ ඔප්පු හිමියන්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම අතරතුර රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් වර්ධනයක් පවත්වා ගැනීමට හැකි විය.

එවැනි ආන්තික තත්වයන් යටතේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කල අතරම, ඔවුන්ගේ විශ්වාසය ඉහළ නැංවීම මධ්‍යයේ, ශක්තිමත් සහ ඔරොත්තු දෙන රක්ෂණ කර්මාන්තයක් සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට සිය අධිකාරය ඉදිරියට ගෙන ගොස් ඇත. වසර පුරා පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණක් විය.

රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය සංක්ෂිප්තව

කර්මාන්තයේ මුළු දළ ලිඛිත වාරික ආදායම 2022 දී රුපියල් මිලියන 258,100 දක්වා වැඩි වූ නමුත් පෙර වසරේ සමස්ත වාරික වර්ධනය වූ 12.1% හා සැසඳීමේ දී 10.5% ක අඩු වර්ධනයක් පෙන්නුම් කළේය. ප්‍රධාන වශයෙන් අඩු වූ සමස්ත වාරික වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස රක්ෂණ ව්‍යාප්තිය වසරින් වසර 1.3% සිට 1.1% දක්වා අඩු විය. ඉහළ ජීවන වියදම, ඉහළ බදු සහ එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් මට්ටම්වල පහත වැටීමත් සමග රක්ෂණයට අදාළ සුළු උපයෝජ්‍ය ආදායමක් සහිත වීම හෝ උපයෝජ්‍ය ආදායමක් නොමැති වීම හේතුවෙන් මහජනතාවගේ ප්‍රමුඛතා ලැයිස්තුවේ රක්ෂණය සඳහා ඇති ඉල්ලුම පැහැදිලිවම අඩු වනු ඇත. සාර්ව ආර්ථික කැළඹීම්වල ප්‍රතිවිපාක, ක්ෂේත්‍රයේ වර්ධනයට සෘජු බලපෑමක් එල්ල කළද ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමත් සමග කර්මාන්තය යහපත් තත්වයට පත් වනු ඇතැයි අපි සුබවාදී වන්නෙමු. රට තුළ ව්‍යාප්තිය වැඩි කිරීම සඳහා ආර්ථිකයේ ප්‍රසාරණයත් සමග ප්‍රධාන වශයෙන් ආපදා අවදානම් රක්ෂණාවරණය ඇතුළුව රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම, රක්ෂණ නිෂ්පාදන වෙත ප්‍රවේශ වීමේ හැකියාව සහ මිල දැරිය හැකි බව ඉහළ නැංවීම, නව්‍ය නිෂ්පාදන සංවර්ධනය, ක්ෂුද්‍ර රක්ෂණ අංශය දියුණු කිරීම, කෘෂිකර්මාන්තය පාදක වූ රක්ෂණ නිෂ්පාදන සංවර්ධනය, නවීන තාක්ෂණය හරහා පාරිභෝගික සේවාවන් වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාශීලී පියවරයන් රක්ෂණ කර්මාන්තය විසින් ගත යුතුය.

2022 වර්ෂයේ පශ්චාත් වසංගත සමය තුළ මතු වූ ප්‍රබල අභියෝග කුමක් මධ්‍යයේ වුවද, දිගුකාලීන රක්ෂණ ක්ෂේත්‍රය පසුගිය වසරේ වාර්තා වූ 21.0% වර්ධනයට සාපේක්ෂව රු.මි. 136,271 ක සමස්ත දළ ලිඛිත වාරිකයක් සමගින් 9.4% ක මධ්‍යස්ථ වර්ධනයක් පවත්වා ගෙන ගියේය. වාරික ආදායම සම්බන්ධයෙන් ගත් කල, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය පසුගිය වසරේ වාර්තා වූ 3.5% ක වර්ධනය අභිබවා යමින් සමස්ත වාරික ආදායම රු.මි. 121,829 ක් සමගින් 11.9% ක වර්ධන වේගයක් වාර්තා කරමින් සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළේය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි කාර්යසාධනය

වසර පුරා පැවති සමාජ හා ආර්ථික අභියෝග දිගු කාලීන රක්ෂණ කර්මාන්තය දැඩි ආතතියකට ලක් කර ඇති අතර, 2021 වසරේ දළ ලිඛිත වාරිකවල වර්ධනයට සාපේක්ෂව 2022 දී දළ ලිඛිත වාරිකවල මන්දගාමිත්වයක්

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

දක්නට ලැබේ. පසුගිය වසර පහ තුළ ජීවිත රක්ෂණ අංශයේ අඩුම වර්ධන වේගය වාර්තා කරමින් දිගුකාලීන රක්ෂණ කර්මාන්තයේ වර්ධන වේගය තනි ඉලක්කමක මට්ටමට පහත වැටී ඇත. ජීවිත රක්ෂණ වෙළෙඳපොළ ව්‍යාප්තිය 0.6% ලෙස වාර්තා වූ අතර එය කලාපයේ සෙසු රක්ෂණකරුවන්ට සාපේක්ෂව අඩු අගයකි. අඩු ජීවිත රක්ෂණ ව්‍යාප්ති අනුපාතයක් මගින් නිවැරදි ව්‍යාපාර ආකෘති, පාරිභෝගික වටිනාකම් යෝජනා සහ දැනුවත් කිරීම් සමග සංවර්ධනය සඳහා ඇති හැකියාව පෙන්නුම් කරයි.

2022 දී මුළු රක්ෂිත මුදල රු.මි. 7,197,378 ක් වූ අතර එය 2021 දී වාර්තා වූ රු.මි. 6,270,175 ට සාපේක්ෂව 14.8% ක වර්ධනයකි. එසේ වුවද, බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2021 දී වාර්තා වූ 6.3% ක වර්ධනයට සාපේක්ෂව 2022 දී 4.1% ක සැලකිය යුතු සෘණ වර්ධනයක් වාර්තා කළේය. 2021 වර්ෂයේ වාර්තා වූ 4,317,695 හා සසඳන විට බලාත්මකව පවතින මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව අවසානය වන විට 4,139,420 දක්වා අඩු විය. පෙර වසරේ ප්‍රවණතාවය දිගටම පවත්වා ගෙන යමින්, නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 637,912 දක්වා අඩු වූ අතර එය 28.5% ක සැලකිය යුතු පහත වැටීමකි. රක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යාප්ති වීම කෙරෙහි පීඩනයක් එල්ල කළ සහ අඩපණ කළ වසර පුරා පැවති දැඩි ආර්ථික පසුබෑම මෙයින් පෙන්නුම් කරයි. 2021 වසරට සාපේක්ෂව බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 18.7% ක් ද බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස 48.4% ක් ද විය.

2022 වර්ෂය තුළ වටිනාකම අනුව ගෙවන ලද හිමිකම්වල කැපී පෙනෙන වර්ධනයක් ඇති අතර එය රු.මි. 61,642 ක් විය. ගෙවන ලද හිමිකම්වල වර්ධන අනුපාතය 34.1% ක් ලෙස වාර්තා වී ඇති අතර එය පසුගිය වසර පහ තුළ වාර්තා වූ ඉහළම වර්ධන අනුපාතය වේ. මෙම වැඩි වීම මූලික වශයෙන් කල් පිරෙන අවස්ථාවේ ලබා දෙන ප්‍රතිලාභ, පවාරණයන් සහ වෙනත් දෑ හේතුවෙන් සිදු විය. වාර්තා කරන ලද රක්ෂණ හිමිකම් පෑම් ප්‍රමාණය පසුගිය වසරේ හිමිකම් පෑම් 544,834 හා සසඳන විට හිමිකම් පෑම් 605,485 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 11.1% ක සාමාන්‍ය වර්ධනයක් වේ. පවාරණ හිමිකම් හැර සෑම කාණ්ඩයකම වැඩිවීමක් දෘශ්‍යමාන විය. වටිනාකම අනුව කල්පිරීමේ ප්‍රතිලාභ රු.මි. 28,897 ක් වාර්තා කරමින් 28.7% ක වේගවත් වර්ධනයක් පෙන්නුම් කළ අතර එය හිමිකම් පෑම්වලින් 46.9%ක සැලකිය යුතු කොටසක් හිමිකර ගත්තේය.

2022 වර්ෂය තුළ වාර්තා වූ සැලකිය යුතු වර්ධනය සඳහා ආසන්නත ම හේතුව වන 'අනෙකුත්' කාණ්ඩයේ විශාලතම කොටස සෞඛ්‍ය හිමිකම් පෑම් හිමි කරගෙන ඇත. ඉහළ යෑමේ ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින්, 'වෙනත්' කාණ්ඩය යටතේ වාර්තා වූ හිමිකම් පෑම් සංඛ්‍යාව වසරින් වසර 32.3% ක ඉහළම වර්ධන අනුපාතය පෙන්නුම් කළේය. අනෙක් අතට, දරන ලද මුළු හිමිකම්වලින් 20.0% ක කොටසකින් සමන්විත පවාරණයන්, 51.2% ක කැපී පෙනෙන වර්ධන අනුපාතයක් වාර්තා කරමින්, රු.මි. 12,357 ක් දක්වා වැඩි විය. කෙසේ වුවද, පවාරණයන් යටතේ වාර්තා වූ හිමිකම් පෑම් සංඛ්‍යාව වසරින් වසර 31.2% කින් අඩු විය.

වසර තුළදී, ප්‍රතිරක්ෂණකරුවන්ට ලබා දුන් වාරිකය සැලකිය යුතු ලෙස 31.5% කින් ඉහළ ගිය අතර එය රු.මි. 6,610 ක් විය. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ විනිමය අනුපාත ඉහළ යාමයි. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත රඳවා ගැනීමේ අනුපාතය වසරින් වසර 0.9% සිට 95.1% දක්වා පහත වැටී ඇත.

රක්ෂණකරුවන්ගේ පවතින මුළු ප්‍රාග්ධනය පෙර වසරට සාපේක්ෂව 9.4% ක ආන්තික වර්ධනයක් වාර්තා කරමින් රු.මි. 308,181 ක් වාර්තා කර ඇත. එක් රක්ෂණකරුවෙකු හැර, 2022 දෙසැම්බර් 31 වන දිනට සියලුම ජීවිත රක්ෂණකරුවන් රු.මි. 500 ක පවතින අවම මුළු ප්‍රාග්ධනයට අනුකූල විය. සාමාන්‍ය ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 303% ක් ලෙස වාර්තා වූ අතර, එය මූලික වශයෙන් 2022 වර්ෂය තුළ පැවති ඉහළ පොලී අනුපාත හේතුවෙන් 85.0% කින් අඩු විය. එක් රක්ෂණකරුවෙකු හැර 2022 දෙසැම්බර් 31 වන විට සියලුම දිගු කාලීන රක්ෂණ සමාගම් අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අවශ්‍යතාවය සපුරා ඇත.

සාමාන්‍ය රක්ෂණ අංශයෙහි කාර්යසාධනය

මුහුණ දීමට සිදු වූ අභියෝග මධ්‍යයේ වුවද, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය 2022 වර්ෂයේදී ඔරොත්තු දීමේ හැකියාව ප්‍රදර්ශනය කරමින් කැපී පෙනෙන ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇති අතර 11.9% ක වර්ධන අනුපාතයක් සහ රු.මි. 121,829 ක වාරික ආදායමක් වාර්තා කරමින් කැපී පෙනෙන දියුණුවක් ද පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසර පහ තුළ ලබා ගත් ඉහළම දළ ලිඛිත වාරිකය ලබා ගැනීමට හැකි විය. සාමාන්‍ය රක්ෂණ අංශයේ සමස්ත වාරික ආදායම ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර සෞඛ්‍ය රක්ෂණය හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම අංශ වෙළෙඳපොළ පරිසරයකට අනුවර්තනය වීමේ හැකියාව පිළිබිඹු කරමින් සමස්ත ප්‍රගතියට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.

මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය මත දැඩි ලෙස රඳා පවතින සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය, මෝටර් රථ සඳහා පනවා ඇති ආනයන සීමා කිරීම් හේතුවෙන් සැලකිය යුතු අභියෝගවලට මුහුණ දුන්නේය. මෙම තීරණය මගින් ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස මෝටර් රථ වාරික මත දැඩි ලෙස රඳා පවතින කර්මාන්තයක් සඳහා සැලකිය යුතු පසුබෑමක් ඇති කෙරිණි. කෙසේ වුවද, මෙම සීමා කිරීම මගින් මෝටර් රථ සඳහා ඇති ඉල්ලුම අඩු කෙරුණු අතර එමගින් මෝටර් රථවල වටිනාකම් වේගයෙන් ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථ රක්ෂණ කර්මාන්තය 2022 දී 7.2% ක ආකර්ෂණීය වර්ධනයක් පෙන්නුම් කළ අතර එය පෙර වසර දෙක තුළ නිරීක්ෂණය කළ සෘණ වර්ධනයට සාපේක්ෂව කැපී පෙනෙන වෙනසක් විය.

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

උප කාණ්ඩ හරහා දළ ලිඛිත වාරිකය සඳහා දායක වූ රක්ෂණ ඔප්පුවල එකතුව 6,423,297 ක් විය. මෙය පෙර වසර හා සසඳන විට රක්ෂණ ඔප්පු 196,933 ක අඩුවීමක් පෙන්නුම් කර ඇත. පසුගිය වසර පහ තුළ දළ ලිඛිත වාරිකය සඳහා දායක වූ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාවේ උච්චාවචනයන් නිරීක්ෂණය කළද, පැවති අයහපත් ආර්ථික තත්ත්වයන් පිළිබිඹු කරමින් 2022 වර්ෂය තුළ මුළු රක්ෂණ ඔප්පුවල අඩුම සංඛ්‍යාව සනිටුහන් කළේය. තුන්වන පාර්ශ්ව රක්ෂණ ඔප්පු 3,331,282 ක් සහ විස්තීරණ රක්ෂණ ඔප්පු 2,362,254 ක් වාර්තා කරමින් පෙර ප්‍රවණතාවය සමගින් ඉදිරියට යමින්, මෝටර් රථ උප පන්තිය අඛණ්ඩව සිය ආධිපත්‍යය පවත්වා ගෙන ගියේය. සමස්ත රක්ෂණ ඔප්පු සංඛ්‍යාවෙන් 88.6% ක් මෝටර් රථ රක්ෂණ ඔප්පු සඳහා වන අතර පෙර වසරට සාපේක්ෂව මෝටර් රථ රක්ෂණ ඔප්පුවල 5,693,536 ක සමුච්චිත සංඛ්‍යාවක් සමගින් 263,501 ක සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය විය. මෝටර් රථ විස්තීර්ණ රක්ෂණ ඔප්පුවල 309,562 ක කැපී පෙනෙන අඩුවීම මෙම පහත වැටීමට හේතු විය හැක. කෙසේ වුවද, විස්තීර්ණ රක්ෂණ ඔප්පු හා සසඳන විට අඩු වාරික ආදායමක් ලබා දෙන මෝටර් රථ තුන්වන පාර්ශවීය රක්ෂණ ඔප්පුවල ඉහළ යන ජනප්‍රියතාවයෙන් මෙම ප්‍රවණතාවය පැහැදිලි කළ හැකිය. ඇතැම් රක්ෂණ සමාගම් අතර කල්බදු ව්‍යාපාර මත යැපීම සහ කල්බදු ක්ෂේත්‍රයේ සීමිත වර්ධනය රක්ෂණ කර්මාන්තයේ මෝටර් පන්තියට ද වක්‍රව බලපා ඇත. ගිනි සහ සමුද්‍ර පන්ති රක්ෂණ ඔප්පුවල ආන්තික පහත වැටීමක් පෙන්නුම් කළ අතර 2021 වසරට සාපේක්ෂව සෞඛ්‍ය සහ විවිධ පන්තිවල මෙන්ම මෝටර් රථ තෙවන පාර්ශවීය රක්ෂණ ඔප්පුවල සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කළේය.

2022 දී, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය මුළු ශුද්ධ හිමිකම්වල සැලකිය යුතු වර්ධනයක් අත්කර ගත් අතර, එය රු.මි. 60,172 ක් (වර්ජන, හිරිහැර, ජන කැළඹීම් සහ ත්‍රස්තවාදී ක්‍රියා රක්ෂණය හැර) දක්වා ළඟා විය. මෙය 2021 වසරේ වාර්තා වූ රු.මි. 48,239 ට සාපේක්ෂව 24.7% ක සැලකිය යුතු වර්ධනයක් විය. විවිධ අංශ අතර, මෝටර්රථ රක්ෂණය සහ සෞඛ්‍ය රක්ෂණය මුළු එකතුවෙන් දැරූ ඉහළම ශුද්ධ හිමිකම් පෑම් ප්‍රමාණයට දායක විය. වසරේ මැද භාගයේ ඇති වූ සිවිල් කෝලාහල සහ විරෝධතාවල ප්‍රතිඵලයක් ලෙස, වර්ජන, හිරිහැර, ජන කැළඹීම් සහ ත්‍රස්තවාදී ක්‍රියා රක්ෂණ අංශය 2022 දී ඉහළම ශුද්ධ හිමිකම් පෑම් ප්‍රමාණය වාර්තා කර ඇති අතර එය රු.මි. 1,320 කි. සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ හිමිකම් පෑම් ඉහළ ගොස් ඇති අතර, ඉහළ උද්ධමන තත්ත්වයන් හේතුවෙන් අළුත්වැඩියා කිරීම් සහ ප්‍රතිස්ථාපන සඳහා වන පිරිවැය ඉහළ යාම, විරෝධතා හේතුවෙන් පැන නගින අනපේක්ෂිත කෝලාහලවලට අදාළ හිමිකම්පෑම් වැනි බහුවිධ සාධක රක්ෂණකරුවන් මුහුණ දෙන මූල්‍ය පීඩනයට දායක වී ඇත. වසංගතය හේතුවෙන් පනවා තිබූ සීමාවන් ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සංචලනය ඉහළ ගොස් ඇති අතර අනතුරු වැඩිවීමට සහ ඉන් පසු රක්ෂණ හිමිකම් වැඩි වීමට එම තත්වය හේතු වී ඇත. මෝටර් 58.7% සහ සෞඛ්‍ය 107.1% පන්තිවල ඉහළ ශුද්ධ හිමිකම් අනුපාතයේ ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂය සඳහා ශුද්ධ හිමිකම් අනුපාතය (වර්ජන, හිරිහැර, ජන කැළඹීම් සහ ත්‍රස්තවාදී ක්‍රියා රක්ෂණය) 67.9% ක් විය.

පසුගිය වසර කිහිපය තුළ ක්‍රමානුකූලව වැඩිවීමක් පෙන්නුම් කරමින්, 2022 වර්ෂයේදී, ප්‍රතිරක්ෂණකරුවන් වෙත ප්‍රේෂණය කළ වාරික පෙන්නුම් කරන මුළු ප්‍රතිරක්ෂණ වාරික ප්‍රමාණය රු.මි. 23,733 ක් විය. සාමාන්‍ය රක්ෂණ අංශය පසුගිය වසර පහට සාපේක්ෂව 2022 තුළ එහි ඉහළම ප්‍රතිරක්ෂණ වාරික අගය අත්කර ගෙන ඇති අතර, එය පෙර වසරට සාපේක්ෂව 13.1% ක වර්ධනයක් පෙන්නුම් කිරීම විශේෂත්වයකි. රක්ෂණකරුවන් විසින් රඳවාගෙන ඇති මුළු වාරික ප්‍රමාණය රු. මි. 98,097 දක්වා ළඟා වූ අතර එය 2021 ට සාපේක්ෂව රු. 10,177 ක සැලකිය යුතු වැඩි වීමකි. සාමාන්‍ය රක්ෂණ අංශයේ රඳවාගත් වාරිකයේ සමස්ත වැඩිවීමට සාමූහිකව දායක වෙමින් මෝටර්, ගිනි හා විවිධ පන්තිවල වාරික වැඩි වශයෙන් රඳවා ගැනීම මෙම රඳවා ගැනීමේ වර්ධනයට හේතු විය හැක. සාමාන්‍ය රක්ෂණ අංශයේ සමස්ත රඳවා ගැනීමේ අනුපාතය පෙර වසරේ අගය වූ 80.7% හා සැසඳීමේදී 2022 වසරේ දී 80.5% දක්වා සුළු අඩුවීමක් පෙන්නුම් කර ඇත. 2020 වසරේ සිට රඳවා ගැනීමේ අනුපාතය ක්‍රමානුකූලව අඩුවීමක් පෙන්නුම් කර තිබීම විශේෂත්වයකි.

සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ පවත්නා මුළු ප්‍රාග්ධන ප්‍රමාණය රු. මි. 81,754 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 9.1% ක සැලකිය යුතු වර්ධනයක් විය. එසේම පසුගිය වසර පහ තුළ එය ඉහළ යාමේ ප්‍රවණතාවක් වාර්තා කළේය. කෙසේ වුවත්, එක් රක්ෂකයෙකු හැර අනෙකුත් සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් 2022 වසර සඳහා වන අවම අවශ්‍යතාවය වූ රු. මි. 500 ට වැඩි පවත්නා මුළු ප්‍රාග්ධන ප්‍රමාණයක් වාර්තා කර ඇත. අවශ්‍ය අවදානම්-පාදක ප්‍රාග්ධනයට සහාය දැක්වීම සඳහා පවත්නා මුළු ප්‍රාග්ධනයෙහි ප්‍රමාණවත් බව තක්සේරු කරන ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය, 2022 අවසානයේ සාමාන්‍යයෙන් 206.6% ක් වූ අතර එය 2021 දී 251.2%ට සාපේක්ෂව අඩු වීමකි. එක් රක්ෂණකරුවෙකු හැර, සියලුම රක්ෂණකරුවන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අවදානම් පාදක ප්‍රාග්ධනය පිළිබඳ බලාත්මක කිරීමේ උපායමාර්ගයට අනුව 160% ක් වන බලාත්මක කිරීමේ මට්ටමට වඩා වැඩි ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක් වාර්තා කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සාමාන්‍ය අංශය විසින් වාර්තා කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය 430% කි.

ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය සමන්විත වන්නේ සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් වාරික අනිවාර්යයෙන් අවලංගු කිරීමකින් වන අතර එය ඔවුන්ගේ සෑම ප්‍රතිරක්ෂණ කටයුත්තක ම ප්‍රතිඵලයක් වන 30% කට නොඅඩු මුළු බැරකම්වලට අදාළ වේ. ඒ අනුව, ජාතික රක්ෂණ භාර අරමුදල සියලු ප්‍රාථමික රක්ෂණ

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

සමාගම්වල ජාතික ප්‍රතිරක්ෂණකරු ලෙස ක්‍රියා කරන අතර ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරයි.

2022 වර්ෂයේදී, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ වාරික ආදායම රු.මි. 3,107 ක් වූ අතර, එය 2021 දී වාර්තා වූ රු.මි. 3,549 හා සසඳන විට 12.4% ක අඩු වීමකි. එය ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ගිවිසුම් ප්‍රතිරක්ෂණ කටයුතුවලට සහභාගී වීම අඩු වීම සහ සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ වාරික රඳවා ගැනීමේ මට්ටම් වසර තුළ සැලකිය යුතු ලෙස වැඩිදියුණු වීමක් පිළිබිඹු කරයි.

2022 දී, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ප්‍රතිරක්ෂණකරුවන් වෙත ලබා දුන් ශුද්ධ ප්‍රතිරක්ෂණ වාරික ප්‍රමාණය රු.මි. 515 ක් වූ අතර 2021 දී එම අගය රු.මි. 1,120 ක් විය. රට තුළ පැවති විදේශ විනිමය අර්බුදය විසින් අදාළ ප්‍රතිරක්ෂණකරුවන් වෙත ප්‍රතිරක්ෂණ වාරික ප්‍රේෂණය සීමා කර ඇති අතර අවසානයේ එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිරක්ෂණ කාර්යය සඳහා ලබා ගත් ආවරණ කාලය සීමා විය.

වර්ෂය තුළ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළව ජාතික රක්ෂණ භාර අරමුදල විසින් දරන ලද හිමිකම් රු.මි. 2,461 ක් වූ අතර එමගින් පසුගිය වර්ෂයේ වාර්තා වූ රු.මි. 2,379 ට සාපේක්ෂව 3.5% ක සුළු වර්ධනයක් පෙන්නුම් කරයි. සාමාන්‍ය රක්ෂණ අංශය විසින් ගෙවීමට සිදු විය හැකි සමස්ත හිමිකම් ප්‍රමාණය 2022 දී ඉහළ යාමක් අත්විඳ ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිරක්ෂණ හිමිකම් වැඩි වීමට එය බලපා ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය ලාභදායිත්වය අතින් ප්‍රශංසනීය ලෙස යථා තත්වයට පත් වූ අතර එයට ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලරය මත පදනම් වූ මූල්‍ය ආයෝජනවලින් ලැබෙන විදේශ විනිමය ලාභය සහ ආයෝජන ආදායමේ සමස්ත වැඩිවීම ඉවහල් විය.

පෙර වසරවල මෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ සමස්ත වත්කම් සංයුතිය ප්‍රධාන වශයෙන් මූල්‍ය ආයෝජන, ලැබිය යුතු වාරික සහ ලැබිය යුතු ප්‍රතිරක්ෂණවලින් සමන්විත වූ අතර රු.මි. 5,533 සිට රු.මි. 8,182 දක්වා කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. රු.මි. 3,577 ක් වූ මූල්‍ය ආයෝජන මෙම වැඩිවීමට බොහෝ දුරට හේතු විය. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ සමස්ත මූල්‍ය ආයෝජන රාජ්‍ය සුරැකුම්පත්වලින් සමන්විත වන අතර භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන දෙගුණයකට ආසන්න වීමත් සමග වසර තුළ එහි කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. තවද, එක්සත් ජනපද ඩොලරයේ අගය සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් විදේශ මුදල්වලින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල රුපියලේ අගය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එසේ වුවද, 2022 දෙසැම්බර් 31 වන විට අවසර ලත් ආයෝජනවලින් ආවරණය වී ඇත්තේ ප්‍රතිරක්ෂණ බැරකම්වලින් 62% ක් පමණි.

රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්යසාධනය

රක්ෂණ තැරැව්කාර සමාගම් දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යන දෙකෙහිම දළ ලිඛිත වාරිකයට සැලකිය යුතු දායකත්වයක් දක්වා ඇත. රක්ෂණ අතරමැදියන් ලෙස, මෙම සමාගම් සාමූහිකව රු.මි. 38,852 ක දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කරන ලද අතර, එයට දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දායකත්වය පිළිවෙලින් රු.මි. 4,013 සහ රු.මි. 34,839 ඇතුළත් වේ.

රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය හරහා ජනනය කරන ලද මුළු දළ ලිඛිත වාරිකය 2021 දී ජනනය කරන ලද රු.මි. 30,286 ට සාපේක්ෂව 2022 දී 28.28% ක වර්ධනයක් වාර්තා කළේය. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයෙහි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර එය 121.45% ක් විය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සැලකිය යුතු දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කිරීම සඳහා අතරමැදියන් ලෙස සිය කාර්යභාරය ඉටු කරමින් රක්ෂණ තැරැව්කාර සමාගම් සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

2022 දී රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් අටක් විසින් එක් එක් සමාගම දළ ලිඛිත වාරිකය රු.මි. 100 ට වඩා උපයා ඇත. මෙම සමාගම් එක්ව උපයා ඇති මුළු දළ ලිඛිත වාරිකය රු.මි. 37,103 කි. ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් හය විසින් රු.මි. 1750 ක් උපයන ලදී.

තවද, රක්ෂණ තැරැව්කාර සමාගම් ප්‍රතිරක්ෂණ තැරැව්කාරත්වයේ අතරමැදියන් ලෙස සිය සේවාවන් පුළුල් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, තැරැව්කාර සමාගම් කිහිපයක් විසින් 2022 දී රු.මි. 2,414 ක් 2021 දී රු.මි. 1,409 ට සාපේක්ෂව වූ සැලකිය යුතු වාරික සහ කොමිස් මුදල් ප්‍රමාණයක් උපයාගෙන ඇත.

රක්ෂණ සමාගම්වල ලාභදායී බව

2022 වර්ෂයේදී රු. මි. 53,990 ක් වාර්තා කිරීමෙන් රක්ෂණ ක්ෂේත්‍රයේ ලාභදායීතාවය 16.4% ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය පෙර වසරේ වර්ධනයක් වාර්තා කළ ද ලාභය රුපියල් මිලියන 27,360 සිට 2022 දී රුපියල් මිලියන 24,836 දක්වා අඩු විය. පසුගිය වසරේ පෙන්නුම් කෙරුණු අඩු ලාභදායීතාවයෙන් ප්‍රකෘතිමත් තත්වයට පත් වෙමින්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2022 වසරේ දී 43.2% ක විශිෂ්ට වසරින් වසර ලාභ වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර එයට සමස්ත වාරික ආදායමේ ඉහළ යාම සහ විදේශ විනිමය ආයෝජනවලට අදාළව සාමාන්‍ය රක්ෂණකරුවන් කිහිප දෙනෙකු විසින් වාර්තා කරන ලද සැලකිය යුතු විදේශ විනිමය ලාභය බොහෝ දුරට බලපෑවේය.

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

අනාගත අපේක්ෂාව

රක්ෂණ ඔප්පුහිමියන් ආරක්ෂාකාරී, ස්ථාවර සහ රක්ෂණ හිමියන්ට ප්‍රයෝජනවත් වන ආකාරයෙන් ආරක්ෂා කිරීම සහ කර්මාන්තයේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමෙන් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සඳහා වන නියාමන රාමුව පැහැදිලිව පෙන්නුම් කෙරේ. අනාගත නියාමන ප්‍රතිසංස්කරණ සහ මුලපිරීම් මගින් කර්මාන්ත නව්‍යකරණය සහ ඩිජිටල්කරණය දිරිමත් කරන අතරම නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට උත්සාහ කරනු ඇත.

ආර්ථිකය වටා ඇති අවිනිශ්චිතතාවයන් අනුව තත්වය පිළිබඳ පුරෝකථනය කිරීම දුෂ්කර වුවද, වැඩිදියුණු කළ විදේශ මුදල් සංචිත, වැඩිදියුණු වූ ද්‍රවශීලතාවය, සමස්ත ආර්ථිකයේ අනාගත වැඩිදියුණු කිරීම් රට තුළට මුදල් ප්‍රේෂණය වීමේ ඉහළ යාම සහ සංචාරක ආදායම වැඩි වීම සමග ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අපි සුභවාදීව සිටිමු. එබැවින්, රක්ෂණ කර්මාන්තයේ සාර්ථකත්වය සහ රක්ෂණ වෙළඳපොලේ දිගුකාලීන වර්ධනයට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපාර ආකෘති සමාලෝචනය කරන අතරම, වර්ධනය පවත්වා ගැනීමට ඉඩ සලසන අවස්ථා ලබා ගත යුතුය. රක්ෂණකරුවන්ට පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශයක් අනුගමනය කිරීමට අවශ්‍ය වන අතර පාරිභෝගිකයින්ගේ පුළුල් වන අවශ්‍යතා සපුරාලන නව්‍ය සහ නම්‍යශීලී නිෂ්පාදන පිරිනැමීමට අවශ්‍ය වනු ඇත. තාක්ෂණයේ වැඩි භාවිතයත් සමග රක්ෂණකරුවන්ට ඩිජිටල් පරිවර්තනයට යොමු වීමත්, තරගකාරීව සිටීමට ශක්තිමත් මාර්ගගත පැවැත්ම ඇති කර ගැනීමට අවශ්‍ය වනු ඇත. තවද, කාර්යක්ෂම හිමිකම් සැකසීම සහ පුද්ගලාරෝපිත සේවා සැපයීම තුළින් පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම කෙරෙහි රක්ෂණකරුවන් අවධානය යොමු කළ යුතුය.

අනාගතය පිළිබඳ අපේක්ෂාවන් සහිතව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ජාත්‍යන්තර පිළිගත් නීති රීති වලට අනුකූලව පහත සඳහන් ප්‍රධාන මුලපිරීම් කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

- රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමයේ මූලික රක්ෂණ මූලධර්මවලට අනුකූලව පුළුල් බලතල සහිත රක්ෂණ නියාමන පනතට ප්‍රතිසංස්කරණ
- සංවර්ධනය වෙමින් පවතින ප්‍රවණතාවලට අනුකූලව අවදානම් පදනම් වූ ප්‍රාග්ධන රාමුවේ ප්‍රතිසංස්කරණ
- පාරිභෝගිකයින්ට සාධාරණව සහ කාලෝචිත ලෙස සලකන බව සහතික කිරීම සඳහා හිමිකම් කළමනාකරණ අවශ්‍යතා පිළිබඳ ප්‍රතිසංස්කරණ.
- ඩිජිටල් පරිවර්තනය පිළිබඳ ප්‍රතිසංස්කරණ.
- මහජනතාව අතර විශ්වාසය වර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා පාරිභෝගික දැනුවත්භාවය ඉහළ නැංවීම.
- රක්ෂණ සමාගම් සහ අතරමැදියන් පාරිභෝගිකයින්ට සාධාරණව සහ කාලෝචිත ලෙස සැලකීමට අවශ්‍ය වන ශක්තිමත් වෙළඳපල හැසිරීම් අධීක්ෂණ රාමුවක් ඇති කිරීම.
- මුදල් විශුද්ධිකරණ විරෝධී සහ මූල්‍ය ත්‍රස්තවාදයට අදාළ අවශ්‍යතාවන්ට එරෙහි වීම පිළිබඳ වැඩිදියුණු කළ අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කිරීම.
- සියල්ල ඇතුළත් රක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායක වීම.

ප්‍රධාන නියාමන මුලපිරීම්

2022 දී රක්ෂණ කර්මාන්තයේ නියාමන රාමුව ශක්තිමත් කිරීම අරමුණු කරගත් නියාමන ප්‍රතිසංස්කරණ සහ මුලපිරීම් කිහිපයක් තිබුණු අතර ඒවා මෙම වාර්තාවේ පොදු සමාලෝචනයේ විස්තරාත්මකව දක්වා ඇත.

අගය කිරීම

අපගේ සභාපතිවරයාගෙන් සහ කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් ලැබුණු වටිනා උපදෙස්, නිරන්තර මගපෙන්වීම සහ සහයෝගය පිළිබඳව මම ඉතා කෘතඥ වෙමි. සියලුම පාර්ශ්වකරුවන්ට වටිනාකමක් එකතු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ සමස්ත කණ්ඩායම විසින් ඉටු කරන ලද කාර්යය සහ ඔවුන්ගේ කැපවීම අගය කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

මෙම අභියෝගාත්මක කාල වකවානුවේදී රක්ෂණ ක්ෂේත්‍රයේ සංගම් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් දැක්වූ නොමසුරු සහයෝගය සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන අතර කර්මාන්තය මුහුණ දෙන අභියෝගවලට මුහුණ දීමටත් රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි ධනාත්මක ආකල්පයක් ගොඩනැගීම සඳහා විශේෂයෙන් ඵලදායි සන්නිවේදනය සහ විනිවිදභාවය තුළින් රක්ෂණ හිමිකම් ගෙවීමට අදාළ පාරිභෝගිකයින්ගේ ගැටලුවලට වඩාත් හොඳින් අවධානය යොමු කිරීමටත් රක්ෂණ ක්ෂේත්‍රය සමග එක්ව කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

දමයන්ති ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්

කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ සාමාජිකයින්

01. රසික් සරූක් මහතා - ජනාධිපති නීතීඥ සභාපති

02. ඒ.කේ. සෙනෙවිරත්න මහතා

03. සංජීව දිසානායක මහතා

04. ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය
06. රාජා ගුණරත්න මහතා
05. හරිස් සල්පිටිකෝරාල මහතා
07. ඉන්ද්‍රා බදුගේ මෙනවිය

කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව

01 **රසික් සරූක් මහතා**
ජනාධිපති නීතිඥ
සභාපති

ජනාධිපති නීතිඥවරයෙකු, රාජතාන්ත්‍රිකයෙකු හා රාජ්‍ය සංස්ථා රැසක හිටපු සභාපති වන රසික් සරූක් මහතා ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකි.

ඔහු සතොස ආයතනයේ සභාපති ධූරය දැරූ අතර ඔහුගේ සේවා කාලය තුළ එනම් 1978 සිට 1989 දක්වා වූ කාලය තුළ සතොස ආයතනය ලාභ ලබන හා ශක්‍යතාවයෙන් යුතු ආයතනයක් බවට පත් කළ අතර ඉඩම් සංවර්ධනය හා සීමා සහිත සතොස මෝටර්ස් හා සීමා සහිත ලංකා මිල්ක් ෆුඩ් වැනි ලැයිස්තුගත පොදු සමාගම් ගණනාවක් ස්ථාපනය කරමින් දේපළ රැසක් අත්පත් කර ගැනීමට මෙම ආයතනයට හැකි විය. ඔහු කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන අධිකාරිය සහ ලංකා බැංකුව යන ආයතනවල සභාපති ධූරය ද දැරීය.

ඔහු එවකට යුගෝස්ලෝවියානු ෆෙඩරල් ජනරජයේ තානාපති ලෙසත් ඉන් පසුව හංගේරියාවේ පළමු තානාපති ලෙසත් තානාපති සේවයෙහි කටයුතු කළේය. ඉන් පසුව, ඔහු සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ලෙස පත් කෙරිණි.

ඔහු මාතර සර්වේෂස් විද්‍යාලයේ හා කොළඹ සහිරා විද්‍යාලයේ ආදි සිසුවෙකි.

02 **ඒ.කේ. සෙනෙවිරත්න මහතා**

ආනන්ද කිත්සිරි සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.

සෙනෙවිරත්න මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳ විශේෂ ගෞරව උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

ඔහු 1995 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් විය.

ඔහුගේ සේවාස්ථ පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසු ඔහු 1996 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. 2006 දී ඔහු එම අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අධ්‍යක්ෂවරයෙකු ලෙස අනුයුක්ත කරන ලදී. 2015 දී ඔහු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරන ලදී. 2018 ජනවාරි මාසයේ සිට සෙනෙවිරත්න මහතා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කළේය. පසුව ඔහු 2018 පෙබරවාරි මාසයේදී භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු ලෙස පත් කරන ලද අතර 2020 නොවැම්බර් දක්වා ඔහු එම තනතුරේ කටයුතු කළේය.

පසුව ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස කටයුතු කර ඇත. ඔහු නැවතත් 2022 අගෝස්තු මාසයේ සිට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු ලෙස පත් කර ඇත.

සෙනෙවිරත්න මහතා රාජ්‍ය ආයතන රැසක මණ්ඩල අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කර ඇත.

03 **සංජීව දිසානායක මහතා**

සංජීව දිසානායක මහතා හොංකොං විශ්වවිද්‍යාලයෙන් මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු 1997 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස ලියාපදිංචි විය. ඔහු ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර දැනට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස රාජකාරි ඉටු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිදහස් කර ඇත.

සංජීව දිසානායක මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් යන දෙඅංශයේම අත්දැකීම් ඇති අතර දූෂණයට එරෙහි ෆීජි ස්වාධීන කොමිෂන් සභාවේ ද කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකි.

04 **ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය**

ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මහත්මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 30 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අතර, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ හා නියාමන, විදේශ විනිමය කළමනාකරණ, ව්‍යවහාර මුදල් කළමනාකරණ, ගෙවීම් සහ පියවීම් පද්ධති යන ක්ෂේත්‍රයන්හි විශේෂ පළපුරුද්දක් දරයි. මෙම කාලය තුළ ඇය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ විනිමය පාලක ලෙස සේවය කර ඇති අතර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා මනා පරිචයන්ට අනුකූල ව බැංකු සඳහා

කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව

ශක්තිමත් නියාමන රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය ලබා දීම මගින් මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමට විශාල කාර්යභාරයක් ඉටු කළා ය.

ප්‍රනාන්දු මහත්මිය විසින් වර්තමානයේ දී බැංකු අධීක්ෂණ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ, ගෙවීම් සහ පියවීම්, ව්‍යවහාර මුදල්, විදේශ විනිමය, මූල්‍ය කටයුතු, ප්‍රාදේශීය සංවර්ධන සහ සේවක අර්ථසාධක අරමුදල් යන දෙපාර්තමේන්තුවල කටයුතු අධීක්ෂණය කරනු ලබන අතර, මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසර මූල්‍ය සඳහා වන පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමේ පාලන කමිටුව මෙන් ම, ජාතික ගෙවීම් කවුන්සිලයේ සභාපතිනිය වශයෙන් ද කටයුතු කරන්නී ය. තවද ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සභාපතිනිය ලෙස ද කටයුතු කරන අතර, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අපි වෙනුවෙන් අපි අරමුදලෙහි කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකාවක වශයෙන් ද කටයුතු කරයි.

ප්‍රනාන්දු මහත්මිය ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, සීමාසහිත ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගම, සීමාසහිත ජීකේ හොස්පිට්ල්ස්, සීමාසහිත ජෙට්වින් සිම්පනි යන ආයතනවල අධ්‍යක්ෂකවරියක ලෙසත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ යහපාලන නීති සංග්‍රහය සමාලෝචනය සඳහා පත් කළ කමිටුවේ, නිදහස් වෙළෙඳ ගිවිසුම් ගනුදෙනු සඳහා ආයෝජනය කිරීම පිළිබඳ උප කමිටුවේ සහ අග්නිදිග ආසියාතික මහ බැංකුවල (SEACEN) පුහුණු කිරීම් පිළිබඳ උපදේශක කමිටුවේ සාමාජිකාවක ලෙසත් ඇය කටයුතු කර ඇත.

ප්‍රනාන්දු මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධිය ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය ද ලබා ඇත.

05 හරිස් සල්පිටිකෝරාල මහතා

හරිස් සල්පිටිකෝරාල මහතා බ්‍රිතානයේ වරලත් කළමනාකරණ ගණකාධිකරුවන්ගේ ආයතනය හා ඇමරිකාවේ ජීවිත කළමනාකරණ ආයතනය යන ආයතනවල අධිසාමාජිකයෙකි. ඇමරිකන් ඉන්ටර්නැෂනල් ඇෂුවරන්ස් කම්පනි ලිමිටඩ්හි දිස්ත්‍රික් කළමනාකරුවෙකු හා උප සභාපති ලෙස ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයෙහි වසර 30ට වැඩි පළපුරුද්දක් ඔහු සතු වන අතර බෲනායි, සිංගප්පූරුව හා ශ්‍රී ලංකාව යන රටවල රක්ෂණ සමාගම්හි උපදේශකයෙකු ලෙස සේවය කර ඇත.

06 රාජා ගුණරත්න මහතා

රාජා ගුණරත්න මහතා නීතිඥවරයෙකු වන අතර ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයෙන් වාණිජ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

ආර්. ගුණරත්න මහතා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි.

ඔහු ජාතික ඖෂධ නියාමන කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස ද රාජ්‍ය සේවයට දායක වේ.

ගුණරත්න මහතා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ යාවජීව සාමාජිකයෙකු වන අතර බංග්ලාදේශයේ ජෛව වෛද්‍ය සංගමයේ සහ ශ්‍රී ලංකා වෛද්‍ය-නීති සංගමයේ සාමාජිකයෙක් ද වේ.

එසේම ඔහු හිටපු ජාතික නිවාස කොමසාරිස්වරයා ද ජාතික නිවාස අධිකාරියේ අධ්‍යක්ෂ සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුද වේ. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඔහු විවෘත විශ්ව විද්‍යාලයේ නීති අධ්‍යයන අංශයේ ප්‍රධානියා සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ වැඩබලන පීඨාධිපති වැනි බොහෝ තනතුරු හොබවා ඇත.

07 ඉන්ද්‍රා බදුගේ මෙනවිය

ඉන්ද්‍රා බදුගේ මෙනවිය නීතිඥවරියක් වන අතර ඇය නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇයට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වසර 26 කට වැඩි සේවා පළපුරුද්දක් ඇත. මෙම කාලය තුළ ඇය මහාමාර්ග අමාත්‍යාංශයේ නීති උපදේශක සහ ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ ප්‍රධාන නීති නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හොබවා ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

01 දමයන්ති ප්‍රනාන්දු මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල්)
02 චමරි ඒකනායක මහත්මිය (අධ්‍යක්ෂ අධීක්ෂණ)
03 සතීෂ් කුමාර් මහතා (අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)
04 ප්‍රභාෂිණී සමරකෝන් මහත්මිය (අධ්‍යක්ෂ විමර්ශන)
05 දීපිකා නවරත්න මහත්මිය (අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)
06 රාජන් නිරුඃබසිංහම් මහතා (අධ්‍යක්ෂ නීති හා බලාත්මක කිරීම)

07 බිම්සර විජේසිංහ මහතා (සහකාර අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)
08 චමරි හීනටිගල මහත්මිය (සහකාර අධ්‍යක්ෂ විමර්ශන)
09 ඩිරල් ප්‍රනාන්දු මහතා (සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ)
10 මලිති අම්බලන්ගොඩ මෙනවිය (සහකාර අධ්‍යක්ෂ නීති හා බලාත්මක කිරීම)
11 ලසන්ති තොටහේවා මහත්මිය (සහකාර අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)

කාර්ය මණ්ඩලය

ශ්‍යාමලී අත්තනායක මහත්මිය

උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය

ඩෙසිකා රත්නායක මහත්මිය

පවිත්‍රා පුංචිහේවා මහත්මිය

තිළිණි වාකිෂ්ඨ මහත්මිය

අනුෂ්ක ඩිලාන් බණ්ඩාර මහතා

පාරමී මුණසිංහ මෙනවිය

උපේක්ෂා ලියනගේ මෙනවිය

නිසල් කරුණාරත්න මහතා

තුෂාරි විජේගුණවර්ධන මහත්මිය

කෝකිලා සිරිවර්ධන මහත්මිය

චරිත වික්‍රමසිංහ මහතා

නිලංකා වලිසුන්දර මහත්මිය

සචිත්‍රා රණතුංග මහත්මිය

නටාෂා කීර්තිසිංහ මහත්මිය

නුවන් සුදර්ශණ මහතා

හසන්ති නදීශා මහත්මිය

එතිරාජ් ශ්‍රීකාන්තන් මහතා

කාර්ය මණ්ඩලය

සුජීවා රණසිංහ මහත්මිය | ඩී.ඩබ්ලිව්.එස්.එස්. සුපුලි මහත්මිය | චන්දිමා කඹුරුගමුව මහත්මිය

ඩී. එස්. කේ. සේනාධීර මහතා | නලීන් තලගල මහතා | චමින්ද ලාල් කුමාර මහතා

මලින් පෙරේරා මහතා - ආධුනික | ඒ. ඩබ්ලිව්. සෙව්වන්දි මෙනවිය - ආධුනික | ඉමාෂා වඩුගේ මෙනවිය - ආධුනික

මල්හාරි වික්‍රමසිංහ මහත්මිය

තිසලි සහරා මෙනවිය

වීණා සෙනෙවිරත්න මහත්මිය



ඡායාරූපයේ පෙනී නොසිටි

ප්‍රියංගි ද සිල්වා මහත්මිය
නයන රවීන්ද්‍ර මහතා
සඳමාලි කරුණාරත්න මහත්මිය
හර්ෂණී පෙරේරා මහත්මිය
සනත් උදයංග මහතා

ඡායාරූපයේ පෙනී නොසිටි

ගයාන් රත්නසිරි මහතා - ආධුනික

මන්තිල විජයරත්න මහතා - ආධුනික



සමාලෝචන

පොදු සමාලෝචනය 28
කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය 34
මෙහෙයුම් සමාලෝචනය 46

පොදු සමාලෝචනය

පනත සහ නියාමන ප්‍රතිසංකරණ පරිපාලනය කිරීම

නීති සම්පාදනය

රක්ෂණ කොමිෂන් සභාවේ ("මින් මතු කොමිෂන් සභාව" ලෙස හැඳින්වෙන) අරමුණ හා වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභායෙන් පවත්වාගෙන යාම තුළින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීමයි.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙතැන් සිට "පනත" ලෙස හැඳින්වේ) මගින් රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ නියෝජිතයින් සහ පාඩු ගැලපුම්කරුවන් නියාමනය සහ අධීක්ෂණය සඳහා අදාළ නීතිමය රාමුව සපයයි.

2007 අංක 27, 2011 අංක 3 සහ 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් මගින් එම පනත සංශෝධනය කර ඇත.

උප නීති සම්පාදනය

වර්ෂය තුළ පනත යටතේ සම්පාදනය කරන ලද උප නීති, නියාමන ප්‍රතිසංස්කරණ යටතේ පහතින් විස්තර කෙරේ.

නියාමන ප්‍රතිසංස්කරණ

පනතේ 96 (අ) වගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන

1. **2022 විධාන අංක 1 - කේත සැපයීම සහ කේත වෙනස් කිරීම පිළිබඳ සීමාව**

   රක්ෂණ නියෝජිතයින් සහ රක්ෂණ තැරැව්කරුවන් හැර වෙනත් පුද්ගලයින් වෙත කේත ලබා දීමෙන් රක්ෂණ සමාගම් සීමා කරමින් සහ රක්ෂණ ඔප්පු හිමියන් විසින් සාධාරණ හේතු මත එවැනි වෙනසක් සිදු කිරීමට අපේක්ෂා කරන බවට රක්ෂණ සමාගමට ලිඛිතව දන්වා ඇති විටෙක හැර රක්ෂණ නියෝජිතයාගේ හෝ තැරැව්කරුගේ ලිඛිත අවසරයකින් තොරව දිගු කාලීන රක්ෂණ සමාගම්වලට පවතින කේත වෙනස් කිරීම තහනම් කරමින් කොමිෂන් සභාව කර්මාන්තයට මෙම නියෝගය නිකුත් කර ඇත. මෙම විධානය 2022 ජනවාරි 26 දින සිට ක්‍රියාත්මක වූ අතර මෙම විෂය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2021 අංක 02 විධානය අවලංගු කරන ලදී.

2. **2022 අංක 02 විධානය - රක්ෂණකරුවන් සඳහා ආයතනනික පාලන රාමුව (2020 අංක 17 විධානය ප්‍රතිශෝධනය කිරීම)**

   රක්ෂණ සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ වයස් සීමාව අවුරුදු 75 සීමාව දක්වා ප්‍රතිශෝධනය කිරීම සඳහා විධානය සංශෝධනය කරන ලදී. උදා : රක්ෂණකරුවෙකුට අධ්‍යක්ෂවරයෙකුගේ සේවය වයස අවුරුදු 70 න් ඔබ්බට පවත්වාගෙන යාමට අවශ්‍ය නම්, සමාගම් පනතේ විධිවිධාන, සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්තිවලට අනුකූලව සහ ඊට අදාළ නව යෝජනාවක් සම්මත කර ගැනීමට යටත්ව වයස අවුරුදු 75 වන තෙක් වාර්ෂිකව එවැනි අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම ඔවුනට දිගටම කරගෙන යා හැකිය. මෙම සංශෝධනය 2007 පෙබරවාරි 03 දින සිට බලාත්මක විය.

3. **2022 අංක 02 විධානය (ප්‍රතිශෝධිත) - රක්ෂණකරුවන් සඳහා ආයතනික පාලන රාමුව**

   2022 ජුනි 30 වන දින දක්වා අධ්‍යක්ෂවරයෙකු ලෙස දිගටම සේවය කිරීමට වසර 75 ඉක්ම වූ අධ්‍යක්ෂවරයාට අදාළ සංක්‍රාන්තිය විධිවිධාන සංශෝධනය කිරීම සඳහා මෙම විධානය සංශෝධනය කර ඇති අතර 2022 ජුනි 30 දින ධුරයෙන් ඉවත් වූවා සේ සලකනු ලැබේ. මෙම සංශෝධනය 2022 පෙබරවාරි 25 දින සිට බලාත්මක විය.

4. **2022 අංක 03 විධානය - තීරණයකට එළඹීමට පෙර ගත කරන කාලය, සහතික කළ සහ සහතික නොකළ ප්‍රතිලාභ සහ දිගු කාලීන රක්ෂණ ඔප්පුවක අදාළ උපලේඛන**

   දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන යන රක්ෂණ සමාගම් විසින් තීරණයක් ගැනීමට පෙර ලබා දෙන කාලය, සහතික කළ සහ සහතික නොකළ ප්‍රතිලාභ සහ දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පුවක අදාල උපලේඛන එහි රක්ෂණ නිෂ්පාදන, මිල ගණන් සහ අදාළ රක්ෂණ ඔප්පු උප ලේඛන/ ආවරණයන්වල හෙළි කරන ලෙස කර්මාන්තයට ඉහත උපදෙස් නිකුත් කරන ලදී. ඉහත විධානය අනුව, 2016 අප්‍රේල් 01 දින සිට බලාත්මක වූ තීරණයක් ගැනීමට පෙර ලබා දෙන කාලය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2016 අංක 8 විධානය අවලංගු කරන ලදී. මෙම විධානය 2022 ඔක්තෝම්බර් 01 දින සිට බලාත්මක විය.

වසර තුළ නිකුත් කරන ලද චක්‍රලේඛ

1. **2022 අංක 01 චක්‍රලේඛය - එකම රක්ෂණ ආවරණයක් සඳහා එකම රක්ෂණ ඔප්පු හිමියාට වෙනස් මිල ගණන් (වාරිකය අඩු කිරීම) ලබා දීම තහනම් කිරීම**

   ඉහත චක්‍රලේඛය කර්මාන්තයට නිකුත් කර ඇත්තේ එකම රක්ෂණ ආවරණයක් සඳහා තැරැව්කරුවකු සහ/හෝ නියෝජිතයකු වෙතින් (රක්ෂණ ඔප්පු හිමියාගේ කැමැත්ත ඇතිව) මිල ගණන් භාර ගැනීමෙන් පසු වාරිකය අඩු කිරීම සඳහා එම රක්ෂිතයාටම සංශෝධිත මිල ගණන් සැපයීම රක්ෂණකරුවන්ට තහනම් කරමිනි. මෙම චක්‍රලේඛය 2022 ජනවාරි 26 දින සිට බලාත්මක විය.

පොදු සමාලෝචනය

2. 2021 අංක 01 චක්‍රලේඛය පිළිබඳ පැහැදිලි කිරීම – ඉ (1)(අ) ඡේදයේ සඳහන් වන ආයුගණක සහතිකය

2021 අංක 01 චක්‍රලේඛය යටතේ නිකුත් කරන ලද ජීවගණක සහතිකය 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 114 (1) වගන්තියේ ඇතුළත් 'ජීවගණක' යන්නෙහි නිර්වචනය සමග කියවන ලද 46 වගන්තිය ප්‍රකාරව පත් කරන ලද ආයුගණක විසින් නිකුත් කළ යුතු බව පැහැදිලි කිරීම සඳහා ඉහත චක්‍රලේඛය කර්මාන්තයට නිකුත් කරන ලදී. එම චක්‍රලේඛය පිළිබඳ මෙම පැහැදිලි කිරීම 2022 ඔක්තෝබර් 6 වැනි දින නිකුත් කරන ලදී.

3. අංක 40 චක්‍රලේඛය පිළිබඳ පැහැදිලි කිරීම – දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන යන රක්ෂණකරුවන් විසින් ප්‍රතිරක්ෂණය කරන සෞඛ්‍ය රක්ෂණ ආවරණ

දිගුකාලීන රක්ෂණකරුවන් විසින් සහතික කරන ලද ස්ථිර සෞඛ්‍ය රක්ෂණ ඔප්පු (තනි සෞඛ්‍ය ආවරණ - stand-alone health covers) සම්බන්ධයෙන් 2019 අංක 40 චක්‍රලේඛය පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා දීම සඳහා ඉහත සඳහන් චක්‍රලේඛය කර්මාන්තය වෙත නිකුත් කරන ලදී. එම චක්‍රලේඛය පිළිබඳ වූ මෙම පැහැදිලි කිරීම 2022 නොවැම්බර් 10 දින නිකුත් කරන ලදී.

වසර තුළ කරන ලද නිශ්චයන්

2022 අංක 12 නිශ්චය සඳහා කරන ලද සංශෝධන

එක් එක් කාර්තුව අවසන් වීමෙන් පසු දින තිහක් ඇතුළත ප්‍රතිශෝධිත ආකෘති අනුව කාර්තුමය වාර්තා ඉදිරිපත් කළ යුතු බවට නියම කරමින් ඉහත නිශ්චය කර්මාන්තයට නිකුත් කරන ලදී. මෙම සංශෝධනය 2022 ඔක්තෝම්බර් 06 දින සිට බලාත්මක විය.

වෙළඳ දැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ

සියලුම රක්ෂණකරුවන්, තැරැව්කාර සමාගම් සහ නියෝජිතයින් වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලද අතර ඔවුන් වෙළඳ දැන්වීම් පළ කිරීමේදී ඒවාට අනුකූලව කටයුතු කළ යුතුය. මෙම මාර්ගෝපදේශ 2022 ජූලි 01 දින සිට බලාත්මක විය.

වෙළඳපොළ ව්‍යුහය

රක්ෂණකරුවන්

පනතේ 12 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් පුද්ගලයකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා මෙම පනත යටතේ තත් කාලයේ ලියාපදිංචි වී ඇත්නම් හෝ ලියාපදිංචි වී ඇතැයි සැලකෙන්නේ නම් මිස, එම පුද්ගලයා ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයක් සිදු නොකළ යුතුය.

පනතේ 13 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයේ නිරත වීමට කැමති ඕනෑම පුද්ගලයකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් සංස්ථාගත කර නිශ්චිතව දක්වා ඇති සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පනත යටතේ රක්ෂණකරුවෙකු ලෙස ලියාපදිංචි වී රක්ෂකයෙක් වශයෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය.

කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලයිෆ් ලංකා ලිමිටඩ් වෙත නව ලියාපදිංචිය ලබා දීමත් සමග වසර අවසාන වන විට සමාගම් විසි අටක් (28) රක්ෂණකරුවන් ලෙස ක්‍රියාත්මක විය. තවද, ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා නිකුත් කළ බලපත්‍රය 2022 අප්‍රේල් 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇත. එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් 2020 ජූනි 1 වන දින සිට නව ජීවිත රක්ෂණ ව්‍යාපාර සිදු කිරීම නතර කර ඇත.

1 රූප සටහන මගින් සමාගම් විසින් නියැලුණු රක්ෂණ ව්‍යාපාර පන්ති නිරූපණය කරයි. ක්‍රියාත්මක වූ සමාගම් 28 න් සමාගම් 2 ක් සංයුක්ත රක්ෂණකරුවන් වූ අතර සමාගම් 14 ක් දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන ගිය අතර සමාගම් 12 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන යමින් තිබිණි.

1 රූප සටහන – රක්ෂණකරුවන් විසින් සිදු කරගෙන යන රක්ෂණ ව්‍යාපාරයේ පන්ති



රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවෙකු යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කරගෙන යාම සඳහා පනත යටතේ ලියාපදිංචි වූ සමාගමකි. රක්ෂණ තැරැව්කරුවෝ ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමග හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණය සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරති.

පොදු සමාලෝචනය

වසර අවසානයේදී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වූ සමාගම් ගණන 77කි. එම සමාගම් අතරින් සමාගම් 58ක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර දෙකෙහිම ලියාපදිංචි වී ඇති අතර සමාගම් 19ක් සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ පමණක් ලියාපදිංචි වී ඇත.

2 රූප සටහන මගින් වසර තුළ රක්ෂණ තැරැව්කරුවන් විසින් පවත්වාගෙන යන ලද රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්ති දැක්වේ.

2 රූප සටහන – රක්ෂණ තැරැව්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්ති



රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමග ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාවක් ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයන්වේ. රක්ෂණ නියෝජියෙකු ලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇත.

පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයන් රක්ෂණ සමාගම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකකි.

රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව වසර තුළ දී රක්ෂණ නියෝජිතයන් ලෙස බඳවා ගෙන ඇති මුළු පුද්ගලයන් සංඛ්‍යාව 15850 ක් පමණ වන අතර එය පසුගිය වසරේ බඳවා ගත් සංඛ්‍යාව වූ 16387 ට සාපේක්ෂව 3.28% ක පහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යාව 47102 ක් පමණ වූ අතර එය පසුගිය වසරට (43934) සාපේක්ෂව 7.21% ක ඉහළ යාමකි.

3 වන රූප සටහන මගින් රක්ෂණ සමාගම් සමග ලියාපදිංචි වී සිටින තනි රක්ෂණ නියෝජිතයන් පෙන්නුම් කරයි.

3 රූප සටහන – 2022.12.31 දිනට මුළු රක්ෂණ නියෝජිතයන්



වසර අවසානය වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් නියෝජනය කරන මුළු රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යාව 620 ක් පමණ විය.

අලාභ ගැලපුම්කරුවන්

වසර අවසාන වන විට අලාභ ගැලපුම්කරුවෝ 29 ක් සිටියහ.

අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි වීම පිළිබඳ රීති 2017 ජුලි 5 දිනැති අංක 2026/27 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

2011 වසරේ දී 2011 අංක 03 දරන සංශෝධන පනත මගින් සංශෝධනය වූ පරිදි යම් තැනැත්තෙකු කොමිෂන් සභාව සමග ලියාපදිංචි වීමෙන් තොරව අලාභ ගැලපුම්කරුවකු (පනතේ 114 (1) යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි) ලෙස පෙනී සිටීම හා කටයුතු කිරීම තහනම් කරන ලදී. පනතේ 89 අ (2) වගන්තියේ අලාභ ගැලපුම්කරුවන් සඳහා වන අවශ්‍යතාවන්ට අදාළව සීමිත ව්‍යතිරේකයක් ඇත.

89 ආ වගන්තිය යටතේ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචි වීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් කරමින් රීති සෑදීමට ඉඩ ඇත. පනතේ 89 ඇ (1) වගන්තිය අනුව අවශ්‍ය ලේඛන, තොරතුරු සහ ගාස්තු නිශ්චය කරමින් රීති සකසනු ලැබේ.

ඒ අනුව, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තෙකු අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා/ හෝ පළපුරුද්ද උක්ත රීති මගින් නිශ්චිතව දක්වා ඇත.

පොදු සමාලෝචනය

සමාගම්වල තත්වය හා ප්‍රාග්ධන වෙනස්කම්

කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් 10 ක් වර්ෂ 2022 දෙසැම්බර් 31 දින වන විට කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොට ඇත: එනම් යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී, එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී, අමානා ටකාෆුල් පීඑල්සී, අමානා ටකාෆුල් ලයිෆ් පීඑල්සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී, ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී සහ කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී වේ.

ලැයිස්තුගත සහ ලැයිස්තුගත වූ/නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන රූප සටහනින් දැක්වේ.

4 වන රූප සටහන - ලැයිස්තුගත වූ/නොවූ රක්ෂණකරුවන්ගේ තත්වය



2011 අංක 03 දරන සංශෝධිත පනතින් සියළු රක්ෂණ සමාගම් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය වේ. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තුගත කිරීමට ද අවශ්‍ය වේ.

2011 අංක 3 දරන සංශෝධිත පනත බලාත්මක වූ පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක් කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුළත දී ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

2011 ජූනි මාසයට පෙර ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රු.මි. 500 ක අවමයක් දක්වා වැඩි කළ යුතු බවට කොමිෂන් සභාව නියම කර ඇත.

2011 ජූනි මාසයට පසුව ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්වලට රු.මි. 500 කට නොඅඩු ගෙවා නිමි ප්‍රාග්ධනයක් ඇත.

රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අය කිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අය කිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මගින් දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2% ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.4% ක් ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කළ යුතු බවට පැහැදිලි කොට ඇත.

රක්ෂණකරුවන්ගෙන් සෙස් බද්ද එකතු කිරීම 2003 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ආරම්භ විය. සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ක්‍රියාකාරීත්වය 5 වන රූප සටහන මගින් දැක්වේ.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වගන්තිය ප්‍රකාරව ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සහ වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා වන වෙනත් විශේෂිත හේතුවක් සඳහා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේදීත් රක්ෂණ කාර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදු වන වියදම් පියවාලීම සහ

ආ) කොමිෂන් සභාව එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේ දී දරණු ලබන වියදම් පියවා ගැනීම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල සහ රාජ්‍ය බැංකුවල පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ.

පොදු සමාලෝචනය

5 රූප සටහන - සෙස් බද්ද සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල



රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නොවේ. 2002, 2005 සහ 2007 යන වර්ෂවල ජනවාරි 1 දින සිට අනුපිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය හා කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

පනතේ බලපෑමෙන් නිදහස් වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩල පනත යටතේ සාමාජික සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12 (3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැනවෙන නීති රීති අදාළ නොවේ.

ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, 2011 අංක 3 දරන සංශෝධිත පනත මගින් කොමිෂන් සභාවේ විෂය පථය තුළට ග්‍රහණය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ වර්ජන, කැරළි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම් ඒ සඳහා අය කර ගන්නා වාරික මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරන සංශෝධන පනත අනුව සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම්, ගැසට් පත්‍රයේ පළ කරන ලද අමාත්‍යවරයාගේ නියෝගය ප්‍රකාරව සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50% නොඉක්මන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. අංක 1791/4 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් 2013 ජනවාරි 01 දින සිට සියළු ම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ඔප්පුවලින් පැන නගින සම්පූර්ණ වගකීමෙන් 30%ක ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දන්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20% ක් විය.

අදාළ අනෙකුත් කරුණු

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථ වාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතියි. මෝටර් රථ රක්ෂණ ආවරණ ලබාදෙන රක්ෂකයින් සෑම කෙනෙකු ම තෙවන පාර්ශවීය ආරක්ෂණ ආවරණයකින් 2%ක් මාර්ග ආරක්ෂණ අරමුදලට දායක කළ යුතුය (1%) ක් වූ දායකත්වය 2021 ඔක්තෝම්බර් 1 දින සිට බලපැවැත්වෙන පරිදි 2%දක්වා ඉහළ නංවන ලදී).

මෙම දායක මුදල් හඳුනා නොගත් මෝටර් රථවලින් සිදු වන අනතුරුවල වින්දිතයන් සඳහා වන්දි ලබා දීමට භාවිත කරනු ලැබේ.

අන්තර් නියාමන ආයතන සභාව (FSOC)

අන්තර් නියාමන ආයතන සභාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද්දක් වන අතර මූල්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් මෙම කවුන්සිලයේ සාමාජිකයෝ වෙති. මෙහි සභාපතිත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් උසුලනු ලබයි. මෙම ඉහළ මට්ටමේ කමිටුව පිහිටුවන ලද්දේ මූල්‍ය වෙළඳපොලෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ථ මූල්‍ය පද්ධතියේ ම අභිවෘද්ධිය උදෙසා සියළු නියාමන නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීම සඳහාය. කොමිෂන් සභාවේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් අන්තර් නියාමන සභාව සඳහා කොමිෂන් සභාව නියෝජනය කරනු ලැබේ.

පොදු සමාලෝචනය

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකට ම ලබා ගත හැකි ය.

සියලුම රක්ෂණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා රක්ෂණ සංගමෙහි විධායක කමිටුව, ක්‍රියාකාරකම්වල සමස්ත කළමනාකරණය සඳහා වගකිව යුතු අතර තම ක්ෂේත්‍රවලට අදාළ විෂයයන් පිළිබඳ විධායක කමිටුවට නිර්දේශ ඉදිරිපත් කරන පහත කමිටු මගින් එයට සහාය ලබා දේ:

- ජීවිත රක්ෂණ සන්සදය
- සාමාන්‍ය රක්ෂණ සන්සදය
- මූල්‍ය තාක්ෂණ අනු කමිටුව
- නීති උපදේශන සන්සදය
- මානව සම්පත් අනු කමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණ හා විකුණුම් සන්සදය
- ජීවගණක අනු කමිටුව

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය නියෝජනය කරනු ලබන්නේ රක්ෂණ කොමිෂන් සභාව සමග ලියාපදිංචි වූ රක්ෂණ තරැව්කාර සමාගම් වේ.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්ත වන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම්වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල්වලිනි.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය, ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ ක්ෂේත්‍රයේ සේවයේ නියුතු පුද්ගලයින් සඳහා කෙටි කාලීන ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු රක්ෂණ අධ්‍යාපනයට අදාළ විවිධ වැඩසටහන් ආයතනය විසින් පවත්වනු ලැබේ. මීට අමතරව, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) සම්මන්ත්‍රණ, රක්ෂණයට අදාළ සමුළු, අන්තර් රක්ෂණ සමාගම් පැන විසඳුම් වැඩසටහන් සහ අන්තර් රක්ෂණ සමාගම් ක්‍රිකට් සහ දැල් පන්දු තරඟාවලි පැවැත්වීම මෙමගින් සිදු කෙරෙන අනෙකුත් ක්‍රියාකාරකම් කිහිපයකි.

රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ පැවැත්වීමේ වගකීම කොමිෂන් සභාව විසින් මෙම ආයතනයට පවරා ඇත. මෙම ආයතනය විසින් රක්ෂණ ව්‍යාපාරයේ පන්ති දෙකටම අදාළ වන පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ ලිඛිතව හා දුරස්ථ පරීක්ෂාව සහිත පරිඝණක පාදක මාර්ගගත යන දෙයාකාරයෙන් ම අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි.

රක්ෂණ ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2019 පෙබරවාරි මස රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා ලෙස ආචාර්ය රංජිත් රණරාජා මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරවුල් නිරාකරණය හා සමථ කිරීම සඳහා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා සහ ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකයින් වන රක්ෂණ සමාගම් විසින් තමන්ගෙ උපරිමයෙන් කටයුතු කරනු ඇත.

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙකු ලෙස, ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන, රක්ෂණයේ මූලික මූලධර්ම වැනි මාර්ගෝපදේශ සහ රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු නිතිපතා ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන ඇතැම් මූලික මූලධර්ම ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමට සහ මෙහෙයවීමට කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය (AFIR)

කලාපීය රක්ෂණ නියාමන සහයෝගීතා යාන්ත්‍රණයක් වන රක්ෂණ නියාමකයන්ගේ අසියානු සංසදය 2006 දී ආරම්භ කරන ලද අතර චීන රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මේ සඳහා මුල පුරන ලදී. කොමිෂන් සභාව මෙහි සාමාජිකත්වය දරයි.

රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය ආසියාතික රක්ෂණ නියාමකයින්ගේ රට රටවල් අතර අධීක්ෂණ කටයුතු සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

රක්ෂණ නියාමකයින් අතර නියාමන තොරතුරු තාක්ෂණය හා නියාමන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ රක්ෂණ කර්මාන්තයේ වෘත්තිකයන් හුවමාරු කර ගැනීම රට රටවල් අතර පවතින නියාමනය කිරීමේ අවදානම අඩු කරමින් සහයෝගීතාව වැඩි දියුණු කරමින් ද රක්ෂණ කටයුතු නියාමනය කිරීමේ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම තුළින් ගෝලීය රක්ෂණ නියාමනයේ වඩාත් ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීම මෙහි අරමුණ වේ.

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

මෙම සමාලෝචනයෙහි වගු හා ප්‍රස්තාරවල දත්ත අර්ථ දැක්වීමේ දී පහත දැක්වෙන පොදු සටහන් ඌණපූර්ණයක් වේ:

1. මෙම වාර්තාවෙහි දක්වා ඇති වගු හා ප්‍රස්තාර රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් මගින් සපයන සංඛ්‍යාලේඛන මත පදනම් වේ.
2. 2018 දී අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් මගින් ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්පත් කර ගන්නා ලද අතර 2018 සැප්තැම්බර් 28 දින ඒකාබද්ධ කෙරිණි. එය "අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
3. 2016 පෙර සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී හඳුන්වනු ලැබුවේ ඒෂියන් අලියාන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී ලෙසයි.
4. ඒෂියන් අලියාන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් 2015 වසරේදී ෆෙයාර් ෆැක්ස් ඒෂියා විසින් අත්පත් කර ගන්නා ලද අතර එය "ෆෙයාර් ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
5. 2017 පෙබරවාරි 28 දින සිට යූනියන් ජෙනරල් ලිමිටඩ් හා ෆෙයාර් ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් ඒකාබද්ධ කෙරිණි. එය ෆෙයාර් ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හඳුන්වනු ලැබේ.
6. සීමාසහිත සණස රක්ෂණ සමාගම විසින් 2019 ජූලි 01 දින සිට එහි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන් කරන ලදී, ඒ අනුව, "සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්" හා "සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්" මගින් පිළිවෙලින් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යනු ලැබේ.
7. ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ප්‍රතිරක්ෂණ හා රක්ෂණ ව්‍යාපාර පිළිබඳ කටයුතු කරන බැවින් සංසන්දනාත්මකතාව පවත්වා ගැනීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල මගින් අවදානම් පාදක ප්‍රාග්ධනයට අදාළව ඉදිරිපත් කරන ලද දත්ත සැලකිල්ලට ගෙන නොමැත.
8. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි වගා හා ණය ආරක්ෂණ යෝජනා ක්‍රමය "රක්ෂණය" වශයෙන් නොසලකන ලද බැවින් ඒවායේ මූල්‍ය දත්ත 2014 සිට සංඛ්‍යාලේඛනවලින් ඉවත් කරන ලදී.
9. ඇතැම් වගුවල සංඛ්‍යා ආසන්නත ම සංඛ්‍යාංකයට වටයන ලදී, ඒ අනුව දක්වා ඇති එකතුව හා එහි සංරචකයන්ගේ එකතුව අතර යම් වෙනසක් පැවතිය හැකිය.
10. මින් පෙර ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යා සමග සැසඳීමේ දී වෙනස්කම් පසුව සංශෝධනය වී ඇත.
11. වරහන් තුළ දක්වා ඇති අගයන් සෘණ අගයන් වේ.
12. පහත සංකේත වර්තාව පුරා භාවිතා කර ඇත: -

(අ) = ප්‍රතිස්ථාපිත හා විගණිත සංඛ්‍යා

(ආ) = තාවකාලික සංඛ්‍යා

\- = ශූන්‍ය

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළඳපළ

දිගු කාලීන රක්ෂණකරුවන් දාහතරක්, සාමාන්‍ය රක්ෂණකරුවන් දොළොස් දෙනෙක් සහ සංයුක්ත රක්ෂණ සමාගම් දෙකක් ඇතුළු රක්ෂණ සමාගම් විසි අටක් දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. 2022 දී එක් දිගු කාලීන රක්ෂණ සමාගමක් ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ලබා ගැනීමෙන් පසු වෙළෙඳපොළට පිවිසියේය. හිමිකාරිත්වය සම්බන්ධයෙන් ගත් කල, රක්ෂණ සමාගම් හයක් ප්‍රධාන විදේශීය කොටස් හිමිකාරිත්වය සහිතව ක්‍රියාත්මක වේ. කොළඹ කොටස් වෙළෙඳපොළේ රක්ෂණකරුවන් දස දෙනෙක් ලැයිස්තුගත කර ඇත.

රට තුළ පැවති අයහපත් ආර්ථික පරිසරය ශ්‍රී ලංකාවේ සමස්ත මූල්‍ය ක්ෂේත්‍රයට විවිධාකාරයෙන් බලපෑවේය. එසේම, 2022 වසර තුළ සාර්ව ආර්ථික පීඩනයන් හේතුවෙන් රක්ෂණ කර්මාන්තය අභියෝගාත්මක තත්වයන් රැසකට මුහුණ දුන්නේය. ඉහළ යන ජීවන වියදම සහ අඩුවන/හීනවන උපයෝජ්‍ය ආදායම මහජනතාවට රක්ෂණ නිෂ්පාදන සඳහා වන වියදම් අඩු කිරීමට බලපෑ අතර ඒ අනුව රක්ෂණ සේවා සඳහා ඇති ඉල්ලුම අඩු විය. එසේම උද්ධමනයේ ප්‍රතිඵලයක් ලෙස රක්ෂණකරුවන්ගේ හිමිකම් පෑම්වලට අදාළ වියදම්, මෙහෙයුම් සහ පරිපාලන වියදම් ඉහළ ගිය අතර ඒ හේතුවෙන් ලාභදායීතා ඉලක්ක වෙත ළඟා වීමට හැකි වන පරිදි වාරික අනුපාත ඉහළ නැංවීමට රක්ෂණ සමාගම්වලට සිදු විය. මෙය වර්තමාන සහ අනාගත ඔප්පු හිමියන්ගේ වාරික ගෙවීමේ හැකියාව තවදුරටත් අඩු කර ඇත. දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ඉහළ පොලී අනුපාත සහිත පරිසරය රක්ෂණකරුවන්ගේ ආයෝජන ආදායමට සාධනීය ලෙස බලපෑවද එය 2022 තුළ බොහෝ රක්ෂණ සමාගම් සඳහා සැලකිය යුතු වෙළඳපොළ පාඩු ඇති කර තිබේ. පවතින ආර්ථික අස්ථාවරත්වයේ සහ නිරන්තරයෙන් පුළුල් වන රක්ෂණ වෙළඳපල සැකසුමේ බලපෑම් සලකා බැලීමේදී රක්ෂණ කර්මාන්තයේ ඉදිරිය වඩාත් අභියෝගාත්මක වනු ඇත.

1 වගුව සහ 1 ප්‍රස්ථාරයෙහි පෙන්වා දී ඇති පරිදි රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු දළ ලිඛිත වාරික ආදායම 2022 දී රුපියල් මිලියන 258,100 දක්වා වැඩි වූ නමුත් පෙර වසරේ සමස්ත වාරික වර්ධනය වූ 12.1% හා සැසඳීමේ දී 10.5% ක අඩු වර්ධනයක් පෙන්නුම් කරයි. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරික ආදායමේ මන්දගාමී ප්‍රගතිය, සමස්ථ වාරික වර්ධනයට අහිතකර ලෙස බලපෑ අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය පසුගිය වසර පහ තුළ වාර්තාකල අඩුම වාරික වර්ධනය පෙන්නුම් කළේය. ඉහළ යන පොලී අනුපාත ණය ලබාදීමට බාධාවක් වූ අතර එය ණය ආරක්ෂණ රක්ෂණාවරණවල වාරික වර්ධනයට අහිතකර ලෙස බලපෑවේය. ඉහළ යන උද්ධමනය හේතුවෙන් ගෘහ ඒකකවල සැබෑ ආදායම ක්ෂය වීමේ ප්‍රතිඵලයක් ලෙස වසර තුළ නිකුත් කරන ලද නව දිගු කාලීන රක්ෂණ ඔප්පුවල සැලකිය යුතු පහත වැටීමක් සිදු වී ඇති අතර අවසානයේ දී එය අඩු වූ වාරික වර්ධනයට බලපා ඇත.

වාරික ආදායම සලකා බැලීමේදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පසුගිය වසරේ වාර්තා වූ 3.5% වර්ධනයට සාපේක්ෂව 11.9% වර්ධන වේගයක් වාර්තා කරමින් වසර තුළ සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළේය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත වාරික ආදායම රුපියල් මිලියන 121,829 ක් වූ අතර වාර්තා වූ වාරික ආදායමේ ප්‍රධාන කොටස මෝටර් රථ රක්ෂණයට අදාළ විය. අඛණ්ඩව වසර දෙකක වාරික වර්ධනයේ අඩුවීමකින් පසුව, ඉහල ගිය වාරික අනුපාත සහ මෝටර් රථ මිල ගනන්, ප්‍රධාන වශයෙන් මෝටර් රථ රක්ෂණයේ වාරික ආදායම 2022 දී, 7.2% ඉහලයාමට හේතු විය. මෝටර්රථ රක්ෂණයට අමතරව, සෞඛ්‍ය රක්ෂණය හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ අනෙකුත් සියලුම උප කාණ්ඩ වසර තුළ ධනාත්මක වාරික වැඩි වීමක් පෙන්නුම් කළේය. ප්‍රතිරක්ෂණ වාරික ආදායම මගින් සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පවරා ඇති ප්‍රතිරක්ෂණ වාරිකය පෙන්නුම් කෙරෙන අතර එය 2022 දී රුපියල් මිලියන 3,549 සිට රුපියල් මිලියන 3,107 දක්වා අඩු වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල ගිවිසුම් ප්‍රතිරක්ෂණ කටයුතුවලට සහභාගී වීම අඩුවීම හේතුවෙනි.

රක්ෂණ ව්‍යාප්තිය පෙර වසරේ 1.3% සිට 2022 දී 1.1% දක්වා පහත වැටීමට ප්‍රධාන වශයෙන්, අඩු වූ මුළු වාරික වර්ධනය සහ වර්ථමාන වෙළඳපල මිල අනුව දළ දේශීය නිශ්පාදිතයේ සාපේක්ෂ වැඩිවීම හේතු විය. එසේ වුවද රට තුළ ආරක්ෂණ පරතරය සැලකිය යුතු ප්‍රමාණයකින් පුළුල් වී ඇති අතර එම පරතරය අවම කර ගැනීමට සහ රක්ෂණ ව්‍යාප්තිය ඉහල නංවාගැනීමට රක්ෂණ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ව්‍යාප්ත කිරීම, රක්ෂණ සේවාවන් වෙත ප්‍රවේශවීමේ හැකියාව ඉහළ නැංවීමට සහ වඩා දැරිය හැකි මිලකට රක්ෂණ සේවා ලබාදීම, නව්‍ය නිෂ්පාදන සංවර්ධනය කිරීම, තාක්ෂණය තුළින් පාරිභෝගික සේවාවන් වැඩි දියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග ගත යුතුය. එහෙත්, රට තුළ පවතින සාර්ව ආර්ථික ව්‍යාකූලතාවයන් රක්ෂණයේ ව්‍යාප්තිය කෙරෙහි අහිතකර ලෙස බලපෑම් එල්ල කරනු ඇත. කෙසේ වෙතත්, 2022 වසරේ රට තුළ සාපේක්ෂ වශයෙන් ස්ථාවර ජනගහන වර්ධනය හේතුවෙන් එක් පුද්ගලයෙකුගේ රක්ෂණ වාරිකයේ ප්‍රමාණය වසර තුළදී රුපියල් 10,540 සිට රුපියල් 11,636 දක්වා ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළේය.

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

1 වගුව
වාර්ෂික ආදායම සහ ව්‍යාප්තිය

අයිතමය	රක්ෂණ ව්‍යාපාර කටයුතු	2018	2019	2020	2021(අ)	2022(ආ)	ප්‍රවණතාව
වාර්ෂික ආදායම (රු.මි.)	දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය	80,294.0	88,787.0	103,000.0	124,616.0	136,271.0	
	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය	100,586.1	107,684.7	105,265.0	108,905.2	121,829.4	
	මුළු වාර්ෂික ආදායම - රක්ෂණ ව්‍යාපාරය	**180,880.1**	**196,471.8**	**208,265.0**	**233,521.2**	**258,100.4**	
වාර්ෂික ආදායමේ වර්ධන අනුපාතය (%)	දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය	12.2	10.6	16.0	21.0	9.4	
	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය	7.7	7.1	-2.3	3.5	11.9	
	මුළු වාර්ෂික ආදායමේ වර්ධන අනුපාතය - රක්ෂණ ව්‍යාපාරය (%)	**9.7**	**8.6**	**6.0**	**12.1**	**10.5**	
ව්‍යාප්තිය % (රක්ෂණ ව්‍යාපාරයේ වාර්ෂික ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස)	දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය	0.6	0.6	0.7	0.7	0.6	
	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය	0.7	0.7	0.7	0.6	0.5	
	ව්‍යාප්තිය % (රක්ෂණ ව්‍යාපාරයේ මුළු වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස)	**1.3**	**1.3**	**1.4**	**1.3**	**1.1**	
ප්‍රතිරක්ෂණ වාර්ෂික ආදායම (රු.මි.)		4,056.4	4,173.7	3,235.5	3,548.8	3,107.3	
"රක්ෂණ ඝණත්වය - (මුළු වාර්ෂික ආදායම - රක්ෂණ ව්‍යාපාරය/ ජනගහනය) රු."		8,347.0	9,011.2	9,501.6	10,539.9	11,636.1	
"වර්තමාන වෙළඳපළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (රුපියල් බිලියන)*"		15,352	15,911	15,672	17,600	24,148	
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය %*		2.3	-0.2	-4.6	3.5	-7.8	
"ජනගහනය 000 (මධ්‍ය වාර්ෂික)*"		21,670	21,803	21,919	22,156	22,181	

* මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2022 ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව මත පදනම්ව 2018 සිට වර්තමාන වෙළඳපළ මිළට අදාළ දළ දේශීය නිෂ්පාදිතය යාවත්කාලීන කරන ලදී.

** ප්‍රතිරක්ෂණ වාර්ෂික ආදායම මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පවරා දෙන ලද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ වාර්ෂික අනිවාර්ය පැවරීම පෙන්නුම් කෙරේ.

1 ප්‍රස්තාරය
රක්ෂණ කර්මාන්තය තුළ වාර්ෂික ආදායම සහ වර්ධන අනුපාතය



කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

රක්ෂණ සමාගම්හි මුළු වත්කම්

රක්ෂණ කර්මාන්තයේ සමස්ත වත්කම් තත්ත්වය සහ පසුගිය වසර පහ තුළ එහි ප්‍රගතිය 2 වගුව මගින් පෙන්නුම් කෙරේ. පෙන්වා දී ඇති ඇති පරිදි, පෙර වසරට සාපේක්ෂව 8.2% ක වර්ධනයක් වාර්තා කරමින් 2022 වසර අවසන් වන විට මුළු වත්කම්වල වටිනාකම රුපියල් මිලියන 962,299 දක්වා ඉහළ ගියේය. මුළු වත්කම් ප්‍රමාණය ව්‍යාපාර වර්ධනයට සමාන්තරව වර්ධනය වූ නමුත් එම වර්ධන අනුපාතය පෙර වසරවලට සාපේක්ෂව අඩු විය. වසර තුළ පැවති ඉහළ පොලී අනුපාත හමුවේ රක්ෂකයන්ගේ වත්කම් වටිනාකම් ක්ෂය වීම මෙයට බොහෝ සෙයින් හේතු විය.

දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 671,611 ක් වටිනා කමින් යුතු වත්කම්වලින් සමන්විත වන අතර එය රක්ෂණ ක්ෂේත්‍රයේ වත්කම් කෙරෙහි ප්‍රධාන දායකත්වයක් සපයයි. අඩු ව්‍යාපාර වර්ධනය සහ මූල්‍ය ආයෝජනවල සැලකිය යුතු වෙළඳපොල පාඩු හේතුවෙන් 2022 දී දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර වත්කම්වල වර්ධනය 6.2% දක්වා අඩු වූ අතර එය පසුගිය වසර පහ තුළ වාර්තා වූ අඩුම වර්ධන වේගය බවට පත් විය. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2022 දී 12% ක වර්ධනයක් සනිටුහන් කරමින් සමස්ත වත්කම් කළඹෙහි හිතකර ප්‍රගතියක් පවත්වා ගැනීමට සමත් විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපෑවේ වසර තුළ ඉහළ පොළී අනුපාත පිරිනැමීම හේතුවෙන්, විශේෂයෙන් රාජ්‍ය ණය සුරැකුම්පත්වල සිදු කරන ලද මූල්‍ය ආයෝජන ඉහළ යාමයි. වසර දෙකක් තුළ දිගින් දිගටම සිදු වූ අඩු වීමෙන් පසුව ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් 2022 දී රුපියල් මිලියන 9,182 ක් වාර්තා කරමින් සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කළ අතර එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 3,649 ක වැඩිවීමකි (2021 රුපියල් මිලියන 5,533). ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයෙහි මූල්‍ය ආයෝජන කළඹ සම්පූර්ණයෙන්ම රජයේ සුරැකුම්පත්වලින් සමන්විත වන අතර වසර තුළ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන දෙගුණයකින් පමණ වැඩි විය. තවද, ඩොලරයේ අගය ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් විදේශීය මුදල්වලින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල රුපියල් අගය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

සංයුතිය අනුව, රක්ෂණ කර්මාන්තයේ සමස්ත වත්කම්වලින් 80% කට ආසන්න ප්‍රමාණයක් මූල්‍ය ආයෝජන නියෝජනය කළ අතර එයින් රජයේ සුරැකුම්පත්, ආයතනික ණය සහ තැන්පතු ප්‍රමුඛ වත්කම් වර්ග ලෙස පැවතුණි.

2 වගුව

රක්ෂණ සමාගම්හි මුළු වත්කම්

අයිතමය	රක්ෂණ ව්‍යාපාර කටයුතු	2018	2019	2020	2021(අ)	2022(ආ)	ප්‍රවණතාව
මුළු එකතුව වත්කම් රු.මි.)	දිගුකාලීන රක්ෂණය	430,759.0	485,121.0	562,706.0	632,687.1	671,610.8	
	සාමාන්‍ය රක්ෂණය	196,005.0	205,130.0	227,639.5	251,417.5	281,506.1	
	ප්‍රතිරක්ෂණය	3,683.0	6,690.0	6,065.8	5,532.9	9,182.4	
	කර්මාන්ත එකතුව	**630,463.0**	**696,958.0**	**796,411.3**	**889,637.5**	**962,299.2**	
වත්කම්හි වර්ධන අනුපාතය (%)	දිගුකාලීන රක්ෂණය	9.9	12.6	16.0	12.4	6.2	
	සාමාන්‍ය රක්ෂණය	5.6	4.7	11.0	10.4	12.0	
	ප්‍රතිරක්ෂණය	-12.5	81.6	-9.3	-8.8	66.0	
	සමස්ත කර්මාන්ත වර්ධනය	**8.4**	**10.6**	**14.3**	**11.7**	**8.2**	

ප්‍රධාන මූල්‍ය අංශවල මුළු වත්කම් ව්‍යාප්තිය

ඉතිහාසයේ බරපතල ම ආර්ථික අවපාතයකට මුහුණ දෙමින් සිටියද, 2022 දී 17.5% ක වර්ධනයක් වාර්තා කරමින් ශ්‍රී ලංකා මූල්‍ය අංශය සමස්ත වත්කම් පරිමාවේ ප්‍රශංසනීය පුළුල් වීමක් පෙන්නුම් කළේය. 3 වගුවෙහි දක්වා ඇති පරිදි, සමස්ත වත්කම් පදනමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බැංකු අංශය සහ හිවිසුම්ගත ඉතුරුම් ආයතනයයි. මෝටර් රථ ආනයනය අඛණ්ඩව සීමා කිරීම සහ ඉහළ ලීසිං අනුපාත හේතුවෙන් ඉල්ලුම අඩුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ලීසිං කළඹ හැකිලීමෙන් 2022 දී විශේෂිත මූල්‍ය ආයතනවල වත්කම් 11.0% කින් හැකිලී ගියේය.

2022 දී (2021 74.7%) මුළු වත්කම්වලින් 74.0% ක් හිමිකර ගනිමින් බැංකු අංශය ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ සමස්ත වත්කම් සංයුතිය තුළ සිය ආධිපත්‍යය දිගටම පවත්වා ගෙන

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

ගියේය. එය 2022 දී බලපත්‍රලාභී වාණිජ බැංකු 24 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 කින් සමන්විත වූ අතර ණය ගුණාත්මකභාවය පහත වැටීම, ද්‍රවශීලතාවය කෙරෙහි එල්ල වූ දැඩි පීඩනය, අඩු මට්ටමක පැවති ලාභදායිතාවය සහ ප්‍රාග්ධන මට්ටම් දුර්වල වීම වැනි නිරන්තර අභියෝග නොතකා අංශයේ ස්ථාවරභාවය රැක ගැනීමට සමත් විය. ඒ අනුව, බැංකු අංශයේ වත්කම් පදනම 20.4% කින් පුළුල් වෙමින් රුපියල් ට්‍රිලියන 23.9 සීමාවට ළඟා විය. දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය හේතුවෙන් ණය සහ අත්තිකාරම් වර්ධනය මන්දගාමී වුවද, ආයෝජන කළඹ කැපී පෙනෙන වේගයකින් වර්ධනය විය.

අඛණ්ඩ වාහන ආනයන සීමා කිරීම් හේතුවෙන් කල්බදු පහසුකම්වල අඩු වර්ධනයක් පැවතිය ද බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, සමුපකාර ග්‍රාමීය බැංකු සහ සකසුරුවම් සහ ණය ගනුදෙනු සමුපකාර සමිතිවලින් සමන්විත තැන්පතු බාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන 2022 දී මුළු වත්කම් පදනමෙහි 11.2% ක මධ්‍යස්ථ වර්ධනයක් පවත්වා ගැනීමට සමත් විය. වත්කම් පදනමේ සමස්ත වර්ධනයට උකස්/රන් ණය ප්‍රමාණය ඉහළ යාම සහ අංශයේ ඉහළ ගිය ආයෝජන කළඹ බොහෝ දුරට උපකාරී විය. විශේෂිත මූල්‍ය ආයතනවල වත්කම් වසර තුළ පහත වැටීමක් වාර්තා කළේ ප්‍රධාන වශයෙන් ආයෝජකයන්ගේ අභිමතය වෙනස් වීම හේතුවෙන් ඒකක භාරවල වත්කම් පදනමේ සංකෝචනය වීම හේතුවෙනි.

ප්‍රධාන මූල්‍ය අංශවල මුළු වත්කම්වලින් දෙවන විශාලතම කොටස සඳහා දායක වෙමින්, අනෙකුත් ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන 2022 අවසානය වන විට රුපියල් ට්‍රිලියන 5.3 ක වත්කම් වාර්තා කර ඇත. සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සහ අනෙකුත් අනුමත විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් අංශයට ඇතුළත් කෙරුණු අතර වසර තුළ වත්කම් ප්‍රමාණයෙහි වැඩි වීම සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකයින්ගේ ශුද්ධ දායකත්වයේ ඒකාබද්ධ බලපෑම සහ අරමුදල්වල ආයෝජන හරහා උපයන ආදායම හේතුවෙන් සිදු විය. (මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2022). වසර තුළ රක්ෂණ අංශයේ වත්කම්වල උදාසීන වර්ධනය හේතුවෙන්, ප්‍රධාන මූල්‍ය අංශවල වත්කම් සඳහා රක්ෂණ සමාගම් විසින් සපයන ලද සමස්ත දායකත්වය 3.2% සිට 3% දක්වා පහත වැටුණි.

3 වගුව

ප්‍රධාන මූල්‍ය අංශවල මුළු වත්කම් ව්‍යාප්තිය

මූල්‍ය අංශ	2018		2019		2020		2021 (අ)		2022 (ආ)	
	රු.බි.	%	රු.බි.	%	රු.බි.	%	රු.බි.	%	රු.බි.	%
බැංකු අංශය	13,711.4	72.2	14,442.1	71.9	17,087.9	72.9	19,872.5	74.7	23,926.9	74.0
තැන්පතු බාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන	1,603.2	8.4	1,553.2	7.7	1,536.5	6.6	1,646.2	6.1	1,830.9	5.7
විශේෂිත මූල්‍ය ආයතන	241.1	1.3	286.7	1.4	386.5	1.6	369.4	1.4	328.9	1.0
ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන	2,807.4	14.8	3,097.9	15.4	3,635.9	15.5	4,758.2	14.5	5,292.3	16.4
රක්ෂණ සමාගම්*	630.4	3.3	696.9	3.5	796.4	3.4	889.6	3.2	962.3	3.0
එකතුව	**18,993.5**	**100.0**	**20,076.8**	**100.0**	**23,443.2**	**100.0**	**27,535.9**	**100.0**	**32,341.3**	**100.0**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව 2022

*රක්ෂණ සමාගම් වෙතින් ලද දත්ත මත පදනම්ව රක්ෂණ සමාගම්වල වත්කම් ප්‍රතිස්ථාපනය කෙරිණි.

රක්ෂණ කර්මාන්තයෙහි ලාභදායිත්වය

4 වන වගුවේ දක්වා ඇති පරිදි, 2022 වසර සඳහා රුපියල් මිලියන 53,990 ක ලාභදායීතාවයක් වාර්තා කිරීමෙන් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ ලාභදායීතාවය 16.4% ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය. මෙයට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ඉහළ කාර්ය සාධනය සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ යළි ඉහළ නැංවුණු ලාභදායිතාව ඉවහල් විය. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය පෙර වසරේ වර්ධනයක් වාර්තා කළ ද ලාභය රුපියල් මිලියන 27,360 සිට 2022 දී රුපියල් මිලියන 24,836 දක්වා අඩු විය. රටේ පවතින දැඩි සමාජ-ආර්ථික පරිසරය තුළ දෙදෙනෙක් හැර අනෙකුත් සියලුම දිගුකාලීන රක්ෂකයන් වසර සඳහා වාසිදායක ලාභදායී ප්‍රතිඵල ලබා ගෙන ඇත. කෙසේ වුවද, මූලික වශයෙන් දුර්වල දළ ලිඛිත වාරික

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

වර්ධනය සහ ඉහළ පොලී අනුපාත පරිසරය හේතුවෙන් ඇති වූ සැලකිය යුතු වෙළඳපොල පාඩු හේතුවෙන් ලාභය පෙර වසරට වඩා සැලකිය යුතු ලෙස අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2.1 ප්‍රස්තාරයෙහි දැක්වෙන පරිදි සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ඉපැයීම් 2022 දී 3.8% දක්වා පහත වැටී ඇත.

පසුගිය වසරේ පෙන්නුම් කෙරුණු අඩු ලාභදායීතාවයෙන් ප්‍රකෘතිමත් තත්වයට පත් වෙමින්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පසුගිය වසරට සාපෙක්ෂව 2022 වසරේ දී 43.2% ක විශිෂ්ට ලාභ වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර එයට සමස්ත වාරික ආදායමේ ඉහළ යාම සහ විදේශ විනිමය ආයෝජනවලට අදාළව සාමාන්‍ය රක්ෂණකරුවන් කිහිප දෙනෙකු විසින් වාර්තා කරන ලද සැලකිය යුතු විදේශ විනිමය ලාභය බොහෝ දුරට බලපෑවේය. ඊට අනුරූපව, 2.2 ප්‍රස්තාරයෙහි දැක්වෙන පරිදි සාමාන්‍ය රක්ෂණ සමාගම්හි වත්කම් මත ප්‍රතිලාභය 2022 දී 8.2% සිට 10.5% දක්වා ඉහළ යාමක් පෙන්නුම් කළේය.

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයෙහි ලාභදායිත්වය අතින් යථා තත්වයට පත් වූ අතර එයට ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලරය මත පදනම් වූ මූල්‍ය ආයෝජනවලින් ලැබෙන විදේශ විනිමය ලාභය සහ ආයෝජන ආදායමේ සමස්ත වැඩිවීම ඉවහල් විය.

4 වගුව
රක්ෂණ කර්මාන්තයෙහි ලභදායිත්වය

රක්ෂණ ව්‍යාපාර	2018	2019	2020	2021(අ)	2022(ආ)	ප්‍රවණතාව
දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය (රු.'000)	26,026,617.7	21,119,627.1	19,143,355.1	27,360,476.5	24,836,062.1	
සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (රු.'000)*	11,736,739.2	11,317,738.3	23,360,482.0	19,548,731.8	27,992,365.3	
ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය (රු.'000)**	1,342,480.5	(662,401.9)	1,230,410.0	(525,548.0)	1,161,827.0	
එකතුව (රු.'000)	**39,105,837.4**	**31,774,963.5**	**43,734,247.1**	**46,383,660.3**	**53,990,254.4**	
වර්ධනය (%)	**-17.8**	**-18.7**	**37.6**	**6.1**	**16.4**	

* ජාතික රක්ෂණභාර අරමුදලේ වැඩ වර්ජන, කරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් රක්ෂණාවරන ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ඇතුළත් වේ.
** ජාතික රක්ෂණභාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය ඇතුළත් වේ.

2.1 ප්‍රස්තාරය
ලාභදායිත්වය සහ වත්කම් මත ප්‍රතිලාභය - දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය



කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

2.2 ප්‍රස්තාරය
ලාභදායිත්වය සහ වත්කම් මත ප්‍රතිලාභය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



රක්ෂණ කර්මාන්තයෙහි කොටස් හිමිකරුවන්ගේ අරමුදල්

පෙර වසර පහ සඳහා රක්ෂණ කර්මාන්තයෙහි කොටස් හිමියන්ගේ අරමුදල්වල හැසිරීම 5 වගුවේ දක්වා ඇත. ඒ අනුව, රක්ෂණ කර්මාන්තයෙහි මුළු කොටස් හිමියන්ගේ අරමුදල් 2022 වසර අවසන් වන විට රුපියල් මිලියන 272,986 දක්වා ළඟා වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 2.4% ක මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළේය (2021 12.5% ක වර්ධනය). වසර තුළ මූල්‍ය ආයෝජන හේතුවෙන් ඇති වූ සැලකිය යුතු වෙළඳපොළ අලාභ විශේෂයෙන් දිගුකාලීන රක්ෂණ සමාගම් ඇතුළු රක්ෂණ සමාගම්වල මුළු සංචිත කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. කෙසේ වුවද, සාමාන්‍ය රක්ෂණ සමාගම්වල වැඩි ලාභදායිත්වය කොටස් හිමියන්ගේ අරමුදල් මත සමස්ත බලපෑම සමතුලිත කර ඇත.

ප්‍රධාන වශයෙන් දිගුකාලීන රක්ෂණකරුවන් දෙදෙනෙකු ප්‍රාග්ධන සහ නුබුන්වත් තත්වය ශක්තිමත් කිරීම සඳහා තම කොටස් ප්‍රාග්ධනය ඉහළ නැංවීම හේතුවෙන් වසර තුළ රක්ෂණ සමාගම්වල සමස්ත ප්‍රකාශිත ප්‍රාග්ධනය 7.1% කින් පුළුල් විය. තවද, අලුතින් ලියාපදිංචි කරන ලද දිගුකාලීන රක්ෂණකරුගේ කොටස් ප්‍රාග්ධන නිකුතුව කර්මාන්තයේ සමස්ත ප්‍රකාශිත ප්‍රාග්ධනය ද පුළුල් කිරීමට දායක විය. රඳවාගත් ඉපැයීම්, ප්‍රත්‍යාගණන සංචිත සහ අනෙකුත් සාමාන්‍ය සංචිතවලින් සමන්විත අනෙකුත් මුළු සංචිත ප්‍රමාණය 1.5% ක ආන්තික වැඩිවීමක් පෙන්නුම් කළේ ප්‍රධාන වශයෙන් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ අඩු ලාභය සහ මූල්‍ය ආයෝජනවලින් ඇති වූ වෙළඳපොල අලාභ හේතුවෙනි. රුපියල් මිලියන 16,248 ක් වූ සීමිත නියාමන සංචිත යටතේ එක වරක් පමණක් වන අතිරික්තයක් පවත්වා ගෙන යනු ලැබේ.

5 වගුව
රක්ෂණ කර්මාන්තයෙහි කොටස් හිමිකරුවන්ගේ මුළු අරමුදල් ප්‍රමාණය

රක්ෂණ ව්‍යාපාර කාණ්ඩය		2018 (රු '000)	2019 (රු '000)	2020 (රු '000)	2021(අ) (රු '000)	2022(ආ) (රු '000)	ප්‍රවණතාව
දිගුකාලීන	ප්‍රකාශිත ප්‍රාග්ධනය	13,649,754.8	14,354,342.6	14,504,345.0	14,793,860.6	18,014,843.5	
	මුළු වෙනත් සංචිත	56,640,512.4	67,894,168.4	78,871,012.7	85,583,931.5	83,752,294.2	
	එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය	16,150,089.4	16,150,089.7	16,150,088.7	16,150,089.0	16,150,089.4	
	මුළු කොටස් හිමියන්ගේ අරමුදල්	**86,440,356.5**	**98,398,600.7**	**109,525,446.4**	**116,527,881.1**	**117,917,227.0**	

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

රක්ෂණ ව්‍යාපාර කාණ්ඩය		2018 (රු '000)	2019 (රු '000)	2020 (රු '000)	2021(අ) (රු '000)	2022(ආ) (රු '000)	ප්‍රවණතාව
සාමාන්‍ය	ප්‍රකාශිත ප්‍රාග්ධනය	20,700,820.3	20,911,875.1	20,911,875.0	22,194,434.0	22,194,434.0	
	මුළු වෙනත් සංචිත	26,790,621.4	27,086,660.7	42,274,886.0	51,695,239.4	55,319,136.4	
	මුළු කොටස් හිමියන්ගේ අරමුදල්	**47,491,441.7**	**47,998,535.9**	**63,186,761.0**	**73,889,673.4**	**77,513,570.4**	
සංයුක්ත රක්ෂණ සමාගම්	ප්‍රකාශිත ප්‍රාග්ධනය	7,080,021.9	8,280,021.9	8,280,022.0	8,280,022.0	8,280,022.0	
	මුළු වෙනත් සංචිත	54,396,837.2	55,298,972.5	55,880,435.0	67,835,937.5	69,177,395.7	
	එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය	133,667.6	98,236.6	98,237.0	98,237.0	98,236.6	
	මුළු කොටස් හිමියන්ගේ අරමුදල්	**61,610,526.8**	**63,677,231.0**	**64,258,694.0**	**76,214,196.5**	**77,555,654.3**	
මුළු කොටස් හිමියන්ගේ අරමුදල් (දිගුකාලීන+සාමාන්‍ය+සංයුක්ත)		**195,542,325.0**	**210,074,367.6**	**236,970,901.4**	**266,631,751.0**	**272,986,451.0**	

රක්ෂණකරුවන්ගේ ශාඛා, සේවකයින් සහ නියෝජිතයන් පිළිබඳ විශ්ලේෂණය

6 වගුව සහ 3 ප්‍රස්තාර මගින් 2021 සහ 2022 වසර සඳහා ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ පළාත් මට්ටමේ ශාඛා , සේවකයන් සහ නියෝජිතයන් ව්‍යාප්තිය පෙන්නුම් කරයි. 2022 වර්ෂය තුළ බොහෝ රක්ෂණකරුවන් තම ශාඛා ජාලය පළාත් නවයම ආවරණය වන පරිදි පුළුල් කර ඇති අතර ඒ අනුව මුළු ශාඛා සංඛ්‍යාව 1,896 සිට 2,046 දක්වා ඉහළ ගොස් ඇත. පසුගිය වසරවලට සමානව බොහෝමයක් ශාඛා බස්නාහිර පළාත තුළත් මීළඟට වැඩිම ශාඛා ප්‍රමාණය දකුණු පළාත සහ වයඹ පළාත තුළත් පිහිටා ඇත. ඒ අනුව 2022 වසර අවසන් වන විට දිගුකාලීන රක්ෂණය සමාගම්හි ශාඛා 1,014 ක්, සාමාන්‍ය රක්ෂණ සමාගම් ශාඛා 844 ක් සහ සංයුක්ත රක්ෂණ සමාගම් ශාඛා 188 ක් රට තුළ ක්‍රියාත්මක විය.

රක්ෂණ සමාගම්වල සේවය කරන සමස්ත ශ්‍රම බලකාය 2022 අවසානය වන විට 20,057 ක් ලෙස බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි. වසර තුළ නව බඳවා ගැනීම් සිදු කළද, ඇතැම් රක්ෂණ සමාගම් ආර්ථික හේතූන් මත සේවකයින් සේවයෙන් ඉවත් කිරීම සඳහා උපාය මාර්ගික තීරණ ගෙන ඇත. තවද, රට තුළ ශ්‍රම බලකායේ වේගවත් සංක්‍රමණය ද රක්ෂණ අංශයේ සේවක සංඛ්‍යාව කෙරෙහි බලපෑමක් ඇති කළේය.

රක්ෂණ සමාගම්වල සේවයේ නියුතු නියෝජිතයන් සංඛ්‍යාව 2022 අවසානය වන විට 47,102 දක්වා ඉහළ ගිය අතර එම ප්‍රමාණයෙන් 56%ක් දිගු කාලීන රක්ෂණකරුවන් විසින් ද 7.8% ක් සාමාන්‍ය රක්ෂණකරුවන් විසින් ද 36.2% ක් සංයුක්ත රක්ෂණ සමාගම් විසින් ද නියෝජනය කරන ලදී. ශාඛා ජාලයේ ව්‍යාප්තියට අනුරූපව වසර තුළදී නව නියෝජිතයන් බඳවා ගැනීමත් සමග බොහෝ රක්ෂණකරුවන්ගේ නියෝජිත බළකාය ද ඉහළ ගොස් ඇත. එසේ වුවද, ප්‍රධාන වශයෙන් දුර්වල කාර්ය සාධනය, සේවයෙන් ඉල්ලා අස්වීම් සහ මූල්‍ය අවභාවිතයන් හේතුවෙන් නියෝජිතයින් සේවයෙන් පහකිරීම් සිදු විය.

6 වගුව
2021 සහ 2022 දෙසැම්බර් 31 දිනට ශාඛා, සේවකයන් සහ නියෝජිතයන් සංඛ්‍යාව

පළාත	ශාඛා සංඛ්‍යාව		සේවකයන් සංඛ්‍යාව		නියෝජිතයන් සංඛ්‍යාව	
	2021	2022	2021	2022	2021	2022
මධ්‍යම පළාත	197	206	1,327	1,328	3,705	4,171
නැගෙනහිර පළාත	130	139	665	684	2,401	2,520
උතුරු මැද පළාත	134	143	736	746	2,472	2,486
වයඹ පළාත	207	220	1,221	1,308	4,414	4,954
උතුරු පළාත	130	140	689	717	3,513	3,292
සබරගමුව පළාත	145	161	907	916	3,527	3,994
දකුණු පළාත	238	256	1,599	1,646	5,162	5,798
ඌව පළාත	117	132	742	677	2,087	2,566
බස්නාහිර පළාත	598	649	12,146	12,035	16,539	17,321
එකතුව	**1,896**	**2,046**	**20,032**	**20,057**	**43,820**	**47,102**

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

3 ප්‍රස්තාරය
2022 දෙසැම්බර් 31 දිනට ශාඛා, සේවකයන් සහ නියෝජිතයන් සංඛ්‍යාව



රක්ෂණ සමාගම්වල බෙදාහැරීමේ මාර්ග

රක්ෂණ සමාගම් සහ ගනුදෙනුකරුවන් අතර පාරිභෝගිකරණය කරන ලද, නව්‍ය සහ තාක්ෂණය පදනම් කරගත් විකුණුම් ක්‍රම ඉතා ජනප්‍රිය වෙමින් පවතින බැවින්, රක්ෂණ නාලිකා විවිධාංගීකරණයේ වර්ධනයන් කිහිපයක් පෙර වසර තුළ සිදු විය. ඒ අනුව, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය සහ ජංගම යෙදුම් (සෘජු කාණ්ඩයට ඇතුළත්) හරහා ජනනය කරන ලද රක්ෂණ වාරිකය යහපත් වර්ධනයක් පෙන්නුම් කළේය. පෙර වසරවල මෙන්ම, දිගුකාලීන රක්ෂණ ඔප්පු මූලික වශයෙන් අලෙවි කරනු ලැබුවේ 2022 වසරේ සමස්ත වාරික බෙදා හැරීමෙන් 82.4%ක් වූ නියෝජිත ආයතන ජාලය හරහාය. 2022 වසරේ රක්ෂණ වාරික උත්පාදනය සඳහා බැංකු රක්ෂණ නාලිකාවේ දායකත්වය පහත වැටී ඇත්තේ ප්‍රධාන වශයෙන් ඉහළ පොලී අනුපාත පරිසරයක් හේතුවෙන් ණය ආරක්ෂණ රක්ෂණ ආවරණ නිකුත් කිරීම සීඝ්‍රයෙන් අඩුවීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ ණය ලබා දීම අඩුවීම හේතුවෙනි. මෑත වසරවලදී රට තුළ රක්ෂණ තැරැව්කාර කර්මාන්තයේ වර්ධනයට අනුරූපව දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යන දෙඅංශයේම තැරැව්කරුවන්ගේ ප්‍රමාණය වසර තුළ ඉහළ ගියේ ය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයට මූලික වශයෙන් දායකත්වය සපයනු ලැබුවේ 2022 දී තනි දායකත්වය 20% ඉක්මවූ ගනුදෙනු, සුවිශේෂී විකුණුම් බලකාය, නියෝජිතයින් සහ තැරැව්කරුවන් හරහා ය. සෘජු ගනුදෙනු 24.1% ක ඉහළම මැදිහත්වීමට හිමිකම් කියනු ලැබූ අතර ඒවා ප්‍රධාන වශයෙන් වේලාවක් වෙන්කර නොගෙන පැමිණෙන ගණුදෙනුකරුවන්ගෙන් එකතු කරන ලද වාරික, සමාජ මාධ්‍ය ඇතුළු අන්තර්ජාලය සහ ජාතික රක්ෂණ භාර අරමුදල හරහා ක්‍රියාත්මක කරන ලද රජයේ රක්ෂණ යෝජනා ක්‍රම වලින් සමන්විත විය.

4 ප්‍රස්තාරය
රක්ෂණ සමාගම්වල බෙදාහැරීමේ මාර්ග



	දිගුකාලීන 2021	දිගුකාලීන 2022	සාමාන්‍ය 2021	සාමාන්‍ය 2022
නියෝජිතයින්	80.6	82.4	23.9	21.9
තැරැව්කරුවන්	2.0	2.8	18.4	20.8
විශේෂිත විකුණුම් බලකාය (රක්ෂණ නියෝජිතයින් නොවූ)	0.6	1.0	21.6	23.5
සෘජු	2.7	3.1	25.6	24.1
බැංකුරක්ෂණය	13.2	10.0	3.6	3.3
අදාළ/සමූහ සමාගම්	1.0	0.8	6.1	5.6
වෙනත්	0.0	0.0	0.9	0.8

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයද සමන්විත වන්නේ සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් සෘජු ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයකම සම්පූර්ණ වගකීමෙන් 30% ජාතික රක්ෂණ භාර අරමුදල වෙත සිදුකරන පැවරීම්වලින් මෙම අනිවාර්ය අවශ්‍යතාවය අංක 1791/4 හා 2012 දෙසැම්බර් 31 දිනැති රජයේ ගැසට් නිවේදනය සමගින් බලාත්මක වූ අතර එමගින් ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රාථමික රක්ෂණ සමාගම් සඳහා "ජාතික ප්‍රතිරක්ෂණකරු" ලෙස ක්‍රියා කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදලට ඉඩ සලසයි.

2022 වර්ෂයේදී, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ වාරික ආදායම රු.මි. 3,107 ක් වූ අතර එය 2021 දී වාර්තා වූ රු.මි. 3,549 හා සසඳන විට 12.4% ක අඩුවීමක් පෙන්නුම් කරයි. එය ප්‍රධාන වශයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ගිවිසුම්ගත ප්‍රතිරක්ෂණ කටයුතුවලට සහභාගී වීම අඩුවීම හේතුවෙන් ඇති විය. මීට අමතරව, සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ සමස්ත වාරික රඳවා ගැනීමේ මට්ටම් වසර තුළ සැලකිය යුතු ලෙස වැඩිදියුණු වූ අතර එය ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ වාරික ආදායමට ද අහිතකර බලපෑමක් එල්ල කළේය.

2022 දී, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ප්‍රතිරක්ෂණකරුවන් වෙත ලබා දුන් ප්‍රතිරක්ෂණ වාරිකවල ශුද්ධ නිරාවරණය රු.මි. 515 ක් වූ අතර එය 2020 දී රු.මි. 1,120 ක් විය. රට තුළ පැවති විදේශ විනිමය අර්බුදය හේතුවෙන් අදාළ ප්‍රතිරක්ෂණකරුවන් වෙත ප්‍රතිරක්ෂණ වාරික ප්‍රේෂණය සීමා කර ඇති අතර අවසානයේ එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිරක්ෂණ කාර්යය සඳහා ලබා ගත් ආවරණ කාලය සීමා විය.

වර්ෂය තුළ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළව ජාතික රක්ෂණ භාර අරමුදල විසින් දරන ලද හිමිකම් රු.මි. 2,461 ක් වූ අතර එමගින් 2020 වර්ෂයේ වාර්තා වූ රු.මි. 2,379 ට සාපේක්ෂව 3.5% ක සුළු වර්ධනයක් පෙන්නුම් කරයි. සාමාන්‍ය රක්ෂණ අංශය විසින් ගෙවීමට සිදු විය හැකි සමස්ත හිමිකම් ප්‍රමාණය 2022 දී ඉහළ යාමක් අත්විඳ ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිරක්ෂණ හිමිකම් වැඩි වීමට එය බලපා ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය ලාභදායිත්වය අතින් ප්‍රශංසනීය ලෙස යථා තත්වයට පත් වූ අතර එයට ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලරය මත පදනම් වූ මූල්‍ය ආයෝජනවලින් ලැබෙන විදේශ විනිම ලාභය සහ ආයෝජන ආදායමේ සමස්ත වැඩිවීම ඉවහල් විය.

පෙර වසරවල මෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ සමස්ත වත්කම් සංයුතිය ප්‍රධාන වශයෙන් මූල්‍ය ආයෝජන, ලැබිය යුතු වාරික සහ ලැබිය යුතු ප්‍රතිරක්ෂණවලින් සමන්විත වූ අතර 2022 අවසන් වන විට රු.මි. 5,533 සිට රු.මි. 8,182 දක්වා කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. රු.මි. 3,577 ක් වූ මූල්‍ය ආයෝජන මෙම වැඩිවීමට බොහෝ දුරට හේතු විය. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ සමස්ත මූල්‍ය ආයෝජන කළඹ රාජ්‍ය සුරැකුම්පත්වලින් සමන්විත වන අතර භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන දෙගුණයකට ආසන්න වීමත් සමග වසර තුළ එහි කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. තවද, එක්සත් ජනපද ඩොලරයේ අගය සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් විදේශ මුදල්වලින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල රුපියලේ අගය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එසේ වුවද, 2022 දෙසැම්බර් 31 වන විට අවසර ලත් ආයෝජනවලින් ආවරණය වී ඇත්තේ ප්‍රතිරක්ෂණ වගකීම් වලින් 62% ක් පමණි.

රක්ෂණ තැරැව්කාර සමාගම්

රක්ෂණ තැරැව්කාර සමාගම් අතරමැදියන් ලෙස කටයුතු කරන අතර ඔවුහු ගනුදෙනුකරුවන්ට තම පුද්ගලික අවශ්‍යතා සඳහා සුදුසු රක්ෂණ ඔප්පු ලබා ගැනීමට සහාය වෙති. ඔවුන්ට නිශ්චිත රක්ෂණ වර්ගයක් පිළිබඳ විශේෂ වීමට හෝ විවිධ රක්ෂණ විකල්පයන් පිළිබඳ මග පෙන්වීමක් ලබා දීමට හැකිය. රක්ෂණ නියෝජිතයන් ලෙස බොහෝ සමාන කාර්යයන් ඉටු කරන අතරම, ඔවුන් ඔප්පු හිමියන්ගේ අවශ්‍යතා සඳහා ක්‍රියා කරන බැවින් ඔවුන් නියෝජිතයින්ගෙන් වෙනස් වේ. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 82 වගන්තිය අනුව රක්ෂණ තැරැව්කරුවෝ තමන් නියෝජනය කරන රක්ෂණ සමාගම් එකකින් හෝ කිහිපයකින් රක්ෂණ ඔප්පු විකුණති.

2022 අවසන් වන විට වෙළඳපොලේ ක්‍රියාත්මක වූ මුළු රක්ෂණ තැරැව්කාර සමාගම් ගණන 77 ක් විය. කෙසේ වුවද, මෙම සමාගම් අතුරින් සමාගම් තුනක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියම කරන ලද කාල සීමාව තුළ සිය වාර්ෂික වාර්තා දත්ත ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, රක්ෂණ තැරැව්කාර සමාගම් 74 විසින් ඉදිරිපත් කරන ලද දත්ත භාවිතයෙන් සියලුම ගණනය කිරීම් සහ විශ්ලේෂණයන් සිදු කරන ලදී. මෙම සමාගම් සාමූහිකව රු.මි. 38,852 ක දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කර ඇති අතර එය පෙර වසරේ දළ ලිඛිත වාරිකය වූ රු.මි. 30,286 ට වඩා වැඩි විය. මෙම දළ ලිඛිත වාරිකය කොටස් දෙකකින් සමන්විත විය: දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හරහා ජනනය කරන වාරික ආදායම. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය රු.මි. 4,013 (2021 රු.මි. 1,812) සඳහා දායක වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය රු.මි. 34,839 (2021 රු.මි. 28,474) සඳහා දායක විය.

සමස්ත දළ ලිඛිත වාරිකය සලකා බැලීමේදී, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය මුළු දළ ලිඛිත වාරිකයෙන් 89.7% ක් සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය මුළු දළ ලිඛිත වාරිකයෙන් 10.3% ක් නියෝජනය කරයි.

රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය හරහා ජනනය කරන ලද මුළු දළ ලිඛිත වාරිකය 2021 දී ජනනය කරන ලද රු.මි. 30,286 ට සාපේක්ෂව 2022 දී 28.3% ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වුවද, වසර තුළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයෙහි 121.5% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර ඊට ප්‍රධාන වශයෙන් රටේ පවතින වසංගත තත්ත්වයත් සමග ජීවිත රක්ෂණ ඔප්පු සඳහා ඇති

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

ඉල්ලුම ඉහළ යාම හේතු විය.

අතරමැදියන් වශයෙන් වන සිය භූමිකාව තුළ, රක්ෂණ තැරැව්කාර සමාගම් වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් රක්ෂණාවරණය සඳහා වාරික ඇතුළත් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි (රු.මි. 121,829) සැලකිය යුතු දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කිරීමට කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත. කෙසේ වුවද, පෙර වසරවල මෙන්ම 2022 දී දිගුකාලීන රක්ෂණ අංශයට ඔවුන්ගේ බලපෑම අවම මට්ටමක පැවතුනි.

තැරැව්කාර සමාගම් විසින් සපයන ලද දත්තවලට අනුව, ඔවුන් දිගුකාලීන රක්ෂණ අංශය සඳහා රු.මි. 136,271 ක් වූ මුළු දළ ලිඛිත වාරිකවලින් 2.9% ක් පමණක් ජනනය කර ඇත.

2022 දී රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් අටක් විසින් එක් එක් සමාගම දළ ලිඛිත වාරිකය රු.මි. 100 ට වඩා උපයා ඇත. මෙම සමාගම් එක්ව උපයා ඇති මුළු දළ ලිඛිත වාරිකය රු.මි. 37,103 කි. 7 වගුවෙහි දැක්වෙන පරිදි ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් හය විසින් රු.මි. 1,750 ක් උපයන ලදී.

තවද, රක්ෂණ තැරැව්කාර සමාගම් ප්‍රතිරක්ෂණ තැරැව්කාරත්වයේ අතරමැදියන් ලෙස සිය සේවාවන් පුළුල් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, තැරැව්කාර සමාගම් කිහිපයක් විසින් 2022 දී රු.මි. 2,414 ක් (2021 දී රු.මි. 1,409 ට සාපේක්ෂව) වූ සැලකිය යුතු වාරික සහ කොමිස් මුදල් ප්‍රමාණයක් උපයාගෙන ඇත.

05 ප්‍රස්ථාරය මගින් රක්ෂණ තැරැව්කරුවන්ට අදාළ වන දළ ලිඛිත වාරික දායකත්වය නිරූපණය කරයි. 2021 සහ 2022 අතර සැසඳීමකින් දිගු කාලීන සහ සාමාන්‍ය අංශ දෙකටම දළ ලිඛිත වාරිකයෙහි කැපී පෙනෙන වැඩි වීමක් අනාවරණය වේ. ප්‍රතිශතය අනුව, රක්ෂණ තැරැව්කරුවන් විසින් සමස්ත එකතුවට දායක වූ දළ ලිඛිත වාරිකයෙහි කොටස 2021 දී 13% ක් වූ අතර එය 2022 වර්ෂයේදී 15.1% දක්වා වැඩි වීමක් පෙන්නුම් කළේය.

5 ප්‍රස්තාරය
2012 සිට 2022 දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදනය වූ දළ ලිඛිත වාරිකය



	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021 (අ)	2022 (අ)
දිගුකාලීන රක්ෂණය (රු.'000)	195	191	158	206	263	341	655	1,095	1,422	1,812	4,013
සාමාන්‍ය රක්ෂණය - දළ ලිඛිත වාරිකය (රු.මි.)	12,532	14,189	14,559	16,124	17,518	22,083	24,408	28,222	27,490	28,474	34,839
තැරැව්කරුවන්ගේ දායකත්වය මුළු දළ ලිඛිත වාරිකයේ % ලෙස	14.0	14.4	13.9	13.3	12.4	13.6	15.2	16.2	13.9	13.0	15.1

කර්මාන්තයේ කාර්යසාධන සමාලෝචනය

7 වගුව
රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදනය වූ දළ ලිඛිත වාරිකය - 2022

අංකය	තැරැව්කරුවාගේ නම	දළ ලිඛිත වාරිකය					
		දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය		සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු		එකතුව	
		රු. (000)	වෙළඳපළ කොටස (%)	රු. (000)	වෙළඳපළ කොටස (%)	රු. (000)	වෙළඳපළ කොටස (%)
1	ඒ.එම්.ඩබ්ලිව්. ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	-	-	340,527	0.98	340,527	0.88
2	ඒඩීඉසඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	73,349	1.83	1,945,787	5.59	2,019,136	5.20
3	එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	-	-	1,335,424	3.83	1,335,424	3.44
4	ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	1,729	0.04	1,256,725	3.61	1,258,454	3.24
5	ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	27,772	0.69	81,402	0.23	109,174	0.28
6	අසේකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	18,589	0.46	2,285,828	6.56	2,304,417	5.93
7	ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	40,807	1.02	1,897,216	5.45	1,938,023	4.99
8	බීඅයිඑම්ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	290,957	7.25	624,613	1.79	915,570	2.36
9	බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	58,155	1.45	74,242	0.21	132,397	0.34
10	සිලෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	-	-	109,255	0.31	109,255	0.28
11	සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	103,294	2.57	189,751	0.54	293,045	0.75
12	සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	228	0.01	2,103,409	6.04	2,103,637	5.41
13	චරෙන්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	-	-	120,888	0.35	120,888	0.31
14	කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	18,806	0.47	466,789	1.34	485,595	1.25
15	කමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	48,631	1.21	1,116,714	3.21	1,165,345	3.00
16	ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	203,788	5.08	1,985,989	5.70	2,189,777	5.64
17	ඉක්විටි ඉන්ෂුවරන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	-	-	163,891	0.47	163,891	0.42
18	එසාජි කරිම්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	24,333	0.61	791,976	2.27	816,309	2.10
19	ෆෝමෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	8,293	0.21	116,657	0.33	124,950	0.32
20	ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	45,240	1.13	2,499,856	7.18	2,545,096	6.55
21	ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	15,661	0.39	114,505	0.33	130,166	0.34
22	අයිඅයිආර්එම් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	847,914	21.13	2,335,062	6.70	3,182,976	8.19
23	ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	390,663	9.74	1,615,626	4.64	2,006,289	5.16
24	ජේබී බොඩා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	-	-	224,749	0.65	224,749	0.58
25	ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් ඉන්ෂුවරන්ස් ප්‍රයිවට් ලිමිටඩ්	108,133	2.69	387,143	1.11	495,277	1.27
26	මර්කන්ටයිල් ෆෝර්චූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	30,086	0.75	1,042,958	2.99	1,073,044	2.76
27	මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	66,349	1.65	644,244	1.85	710,593	1.83
28	ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	126,058	3.14	1,420,842	4.08	1,546,900	3.98
29	ප්‍රයෝරිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	254,753	6.35	186,470	0.54	441,223	1.14
30	ප්‍රෝකෙයාර් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	115,491	2.88	482,403	1.38	597,894	1.54
31	ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්	91,247	2.27	749,550	2.15	840,797	2.16
32	රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	111,129	2.77	1,077,485	3.09	1,188,614	3.06
33	සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	84,576	2.11	1,615,227	4.64	1,699,803	4.38
34	සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	-	-	848,016	2.43	848,016	2.18
35	ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	55,218	1.38	171,331	0.49	226,549	0.58
36	වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	169,344	4.22	9,029	0.03	178,373	0.46
37	වොලංකා ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	342,354	8.53	187,982	0.54	530,336	1.37
38	සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	98,491	2.45	611,547	1.76	710,038	1.83
	වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් (36)	**141,170**	**3.52**	**1,608,387**	**4.62**	**1,749,557**	**4.50**
	මුළු එකතුව	**4,012,609**	**100**	**34,839,494**	**100**	**38,852,103**	**100**

මෙහෙයුම් සමාලෝචනය

අධීක්ෂණ සමාලෝචනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අධීක්ෂණ අංශය සාධාරණ, ආරක්ෂිත සහ ස්ථාවර රක්ෂණ වෙළඳපොළක් සහතික කිරීම සඳහා අවශ්‍යතා සහ අධීක්ෂණ ක්‍රියා පටිපාටි අඛණ්ඩව යොදා ගනිමින් රක්ෂණ කර්මාන්තයේ විචක්ෂණශීලී අධීක්ෂණය සහ එමගින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අවදානම්-පාදක අධීක්ෂණ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ව්‍යවස්ථානුකූල වාර්තා සමාලෝචනය සහ නීති සහ රෙගුලාසි වල අනුකූලතා තත්ත්වය, රක්ෂණ සමාගම්වල අවදානම් ඇගයීම, පූර්ව අනතුරු ඇඟවීමේ අනුපාත ගණනය කිරීම ආදිය සහ ස්ථානීය පරීක්ෂණ කටයුතුවලින් සමන්විත වේ. තවද, අංශය විසින් විවිධ අරමුණු සඳහා සංඛ්‍යාන වාර්තා සකස් කරනු ලැබේ.

තවද, මෙම අංශය විසින් අවදානම් ඇගයීමේ මෙවලම් සමාලෝචනය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශයේ සහයෝගීතාවයෙන් **AML/CFT** ස්ථානීය පරීක්ෂන පැවැත්වීම ආදිය මගින් මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා මූල්‍යනයට එරෙහිව සටන් කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවලට මුලපුරනු ලැබේ.

රක්ෂණ සමාගම්වලින් පිටත සිදු කෙරෙන අධීක්ෂණය

I. ව්‍යවස්ථානුකූල වාර්තා පිළිබඳ සමාලෝචනය

අ) වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණිත මූල්‍ය ප්‍රකාශන හා ජීවගණකඥ වර්තා

2021 දෙසැම්බර් 31 වන දින සංශෝධිත 14 සහ 15 නීර්නයන්ට අනුව, සියලුම ලියාපදිංචි රක්ෂණ සමාගම් අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී මාස හතරක් ඇතුළත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. දිගුකාලීන රක්ෂණ සමාගම් විසින් තම ජීවගණකඥ වාර්තා සහ එහි සංක්ෂිප්තයන් වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමග ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් වාර්තා නියමිත දිනට ඉදිරිපත් කරන්නේ දැයි අධීක්ෂණය කර ඒවායේ නිරවද්‍යතාව සහ ඒවා අදාළ නීති රීතිවලට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කරනු ලබයි. එම වාර්තා ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවන්ගෙන් බැහැර වන අවස්ථාවලදී, දක්වා ඇති දිනයන් වන විට නිවැරදි කරන ලෙස රක්ෂණ සමාගම් වෙත උපදෙස් ලබා දෙනු ලැබේ. අවශ්‍ය අවස්ථාවලදී පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. මීට අමතරව, ඉදිරිපත් කරන ලද වාර්තා සමාලෝචනය කිරීමේ දී නිරීක්ෂණය කරන ලද ඇතැම් කරුණු ක්ෂේත්‍රගත විමර්ශන අතරතුර දී අවධානයට ලක් කරනු ලැබේ.

ආ) රක්ෂණ සමාගම්වල අභ්‍යන්තර පාලන, පාලනය සහ අවදානම් කළමනාකරණය තක්සේරු කිරීම

සෑම රක්ෂණ සමාගමක්ම එක් එක් සමාගමේ අවදානම් තක්සේරු කිරීමේ වාර්තා වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තාවන්හි කොටසක් ලෙස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ. අවදානම් තක්සේරු කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීම හරහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ආයතනික ව්‍යුහය සහ හිමිකාරිත්වය, ව්‍යාපාර පැතිකඩ, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, අලෙවිකරණය සහ බෙදා හැරීම වැනි කාර්යයන්, හිමිකම්පෑම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය යනාදී රක්ෂණ සමාගම් පිළිබඳ ඇතැම් ගුණාත්මක තොරතුරු ලබාගනී. මෙම තොරතුරු රක්ෂණ සමාගම්වල පාලනය, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ රාමු පිළිබඳ අවබෝධ කර ගැනීම සහ තක්සේරු කිරීම සඳහා යොදා ගනු ලැබේ.

ඇ) ප්‍රතිරක්ෂණ/අවදානම් විතැන් කිරීමේ වැඩසටහන්

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 31 (1) වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවන් විසින් පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව, රක්ෂණකරුවන් විසින් 2022 ජනවාරි 31 දින හෝ ඊට පෙර 2022 වර්ෂය සඳහා වන ප්‍රතිරක්ෂණ/අවදානම් මාරු කිරීමේ වැඩසටහන පිළිබඳ වාර්තාවක් ද 2022 මාර්තු 15 දින හෝ ඊට පෙර අදාළ සහතික සමග ප්‍රතිරක්ෂණ ගිවිසුම් විධිවිධාන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. රක්ෂණකරුවන් තිදෙනෙකු හැර, අනෙකුත් සියලුම රක්ෂණ සමාගම් නියමිත කාල සීමාව තුළ සිය ප්‍රතිරක්ෂණ ගිවිසුම් විධිවිධාන ඉදිරිපත් කර ඇත. තවද, සියළු රක්ෂණකරුවන් විසින් එළඹුණු අතිරේක (Facultative) ප්‍රතිරක්ෂණ ආවරණ සෑම කාර්තුවක් සඳහා ම ඉදිරිපත් කළ යුතුය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් එම විධිවිධාන සමාලෝචනය කරන ලද අතර අවශ්‍ය අවස්ථාවලදී නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට අදාළ රක්ෂණකරුවන් වෙත නිරීක්ෂණය කරන ලද නියාමන අවශ්‍යතාවලින් බැහැර වීම් පිළිබඳ දැනුම් දෙන ලදී.

අධීක්ෂණ සමාලෝචනය

ඇ) කාර්තුමය වාර්තා

පනතේ විධිවිධාන ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත සිය කාර්තුමය වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු විය. වසර තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නීර්න අංක 12 සංශෝධනය කරන ලද අතර එමගින් එක් එක් කාර්තුව අවසානයේ සිට දින හතළිස් පහක් වූ වාර්තා ඉදිරිපත් කළ යුතු කාල සීමාව දින තිහ ලෙස වෙනස් කෙරිණි. මෙම විධිවිධානය 2022 සැප්තැම්බර් 30 දින සිට අදාළ විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ සංගමයෙන් (IASL) ලැබුණු ඉල්ලීම සලකා බැලීමෙන් පසු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් වාර්තා ඉදිරිපත් කිරීමේ සංශෝධිත කාලසීමාව 2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ කාර්තුවේ සිට බලපැවැත්වීමට අවසර දෙන ලදී.

සමාගම්හි කාර්යසාධනය නිර්ණය කිරීම සඳහාත් පනතේ අදාළ නීති රීති රෙගුලාසිවලට අනුකූල වන ලෙස ඉදිරිපත් කර ඇති ද යන්න පරීක්ෂා කර බැලීම සඳහාත් 2022 වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා සමාලෝචනය කරන ලදී. එක් එක් සමාග මෙහි මූල්‍ය තත්වයන් කාර්තුමය වාර්තා පදනම් කර ගනිමින් නිරන්තරව නිරීක්ෂණය කරනු ලැබූ අතර මෙහි දී වත්කම් හා බැරකම්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය, ද්‍රවශීලීතාවය සහ අනෙකුත් අවදානම් සහිත අංශ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී. එකී කාර්තුමය වාර්තාවන් සමාලෝචනය කිරීමේ දී නිරීක්ෂණය කරන ලද විෂමතාවන් නීති රීති රෙගුලාසිවලින් බැහැරවීම් සහ අනෙකුත් වෙනස්කම් නියමිත කාලයන් තුළ නිවැරදි කිරීමට අදාළ සමාගම් වෙත උපදෙස් ලබා දුණි.

රක්ෂණ සමාගම්වල කාර්තුමය කාර්යසාධනය ඇගයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය සඳහා වන වාරික ආදායම, මෙහෙයුම් ලාභය සහ ශුද්ධ ලාභය විශ්ලේෂණය කරන ලදී. තවද, අංශය විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරෙන කාර්තුමය වාර්තා මත පදනම්ව රක්ෂණ සමාග ම්වල පූර්ව අනතුරු ඇඟවීම් අනුපාත ගණනය කරනු ලබයි. මෙම අනුපාතවලට වාරික ස්ථායීතාවය, හිමිකම් පෑම් අනුපාතය, වියදම් අනුපාතය, රඳවා තබා ගැනීම, ඒකාබද්ධ අනුපාතය, ප්‍රතිරක්ෂණ ප්‍රතිඵල, වත්කම් මත ප්‍රතිලාභ, කොටස් මත ප්‍රතිලාභ සහ ලාභය යනාදිය ඇතුළත් වේ. අංශය විසින් මෙම අනුපාතවල චලනයන් සමාගම් අනුව මෙන්ම කර්මාන්ත මට්ටමින් ද අධීක්ෂණය සහ සංසන්දනය කරනු ලැබේ. එසේම ප්‍රමාණාත්මක විචලනයන් කාර්තුමය ප්‍රතිලාභ සමග තවදුරටත් ඇගයීමට ලක් කෙරෙන අතර කාර්තුමය ප්‍රතිලාභ පිළිබඳ අනෙකුත් නිරීක්ෂණ සමග රක්ෂණකරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

රක්ෂණකරුවන් විසින් පනතේ විධිවිධාන සහ රීති සපුරාලන බවටත් 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු විධිවිධාන පනතට අනුකූල වී ඇති බවටත් සහතික කිරීම සඳහා වාර්තා දෙකක් සෑම කාර්තුවක ම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

ඉ) මාසික වාර්තා

2022 දී නියාමන අවශ්‍යතාවලින් බැහැර වීම මත පදනම්ව එක් සමාගමට මාසිකව ව්‍යවස්ථානුකූල වාර්තා, මූල්‍ය ප්‍රකාශන, අවදානම් පාදක ප්‍රාග්ධන තත්වය ආදිය ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී.

2. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති ප්‍රකාර අනුකූලතාවය අධීක්ෂණය කිරීම

2015 දී ප්‍රකාශිත නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති නියමයන්ට අනුව සෑම සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ සමාගමක් ම අවම ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය සහ අවම පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලිය යුතු අතර එම ගණනය කිරීම් මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන වාර්තා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවදානම් පාදක ප්‍රාග්ධන නියමයන්ට දක්වන අනුකූලතාවය විශ්ලේෂණය කරනු ලබයි. අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා නොමැති අවස්ථාවල දී සහ ගණනය කිරීම් සාවද්‍ය වන අවස්ථාවල දී නියම කරන ලද කාලයක් ඇතුළත අනුකූලතාවයන් සපුරා ගන්නා ලෙස සහ නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස අදාළ රක්ෂණකරුවන් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දෙනු ලැබේ.

3. ආයෝජන පිරිවිතරයන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීම

අ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

සියළු ම රක්ෂණ සමාගම් තම රක්ෂණ අරමුදල්වලින් කොටසක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව තාක්ෂණික සංචිතවලින් 20%ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම්වලින් 30% ට නොඅඩු ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනම්ව එකී විධිවිධානවලට අනුකූලව කටයුතු කර ඇත්දැයි යන්න වාර්තා හා අදාළ ලේඛන මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අධීක්ෂණය කරනු ලබයි.

නිරීක්ෂණය කරනු ලබන දෝෂ සහ නියාමන අවශ්‍යතාවන්ගෙන් බැහැර වීම් නියම කරනු ලබන කාල සීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාළ ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

ආ) නීර්ණය අංක 1 අනුව කෙරෙන අනෙකුත් ආයෝජන

2011 මාර්තු 1 දින දරණ නීර්ණය අංක 01 සහ පසුව කළ සංශෝධනවලට අදාළ වන පරිදි සියළු ම රක්ෂණ සමාගම් තමන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව

අධීක්ෂණ සමාලෝචනය

පවතින වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව පවතින වත්කම් ආයෝජනය කළ යුතුය. නිර්ණය අංක 01ට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා ඉදිරිපත් කරන වාර්තා මත පදනම්ව තාක්ෂණික සංචිතයන්ගේ සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ ආයෝජන විස්තර මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබයි.

වර්ෂය තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණකරුවන් තුන් දෙනෙකුගේ නීර්න අංක 01 අවශ්‍යතාවන්ට අනුකූල නොවීම් සහ ඉන් බැහැර වීම් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, නිර්ණය අංක 01ට අනුකූල වීම සඳහා වහාම අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරන ලෙස අදාළ සමාගම් වෙත දැනුම් දෙන ලදී. සමාගම් දෙකක් පසුව නීර්න අංක 1 ට අනුකූලව කටයුතු කර ඇති අතර අනෙක් සමාගම තවමත් අදාළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

4. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති මත බලාත්මක උපාය මාර්ග

නුබුන්වත් ආන්තික රීතිවල දක්වා ඇති පරිදි යම්කිසි රක්ෂණකරුවකු අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අවශ්‍යතාවන් පවත්වා ගැනීමට අපොහොසත් වීමේ අවදානමක් ඇති විට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මැදිහත් වී අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපාය මාර්ග අනුව කටයුතු කරන ලෙස දැනුම් දෙනු ලැබේ. මෙහි අරමුණ වන්නේ ගැටළු විසඳීම සඳහා ප්‍රායෝගික හා ඵලදායී පිළියම් යෙදීමට හැකි වන පරිදි ගැටළු සහගත රක්ෂණ සමාගම් මුල් අවධියේදී ම හඳුනාගැනීමයි. මෙමගින් අදාළ රක්ෂණ සමාගම්වල මූල්‍ය තත්වය හෝ ණය ගෙවීමේ හැකියාව සැලකිය යුතු ලෙස පහළ යාමට පෙර තම අධීක්ෂණ මැදිහත් වීම් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ඉඩ සැලසෙන අතර ඇති විය හැකි අර්බුධකාරී තත්වයන් මගහරවා ගැනීමට හැකිවේ. වර්ෂය තුළ සමාගම් තුනක් ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 120% සහ 160% අතර වාර්තා කළ අතර එම සමාගම් බලාත්මක උපාය මාර්ගය යටතේ වන අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු විය. තවද, බොහෝ දිගු කාලීන රක්ෂණ සමාගම්වල ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය 2022 මැද භාගයේ දී ප්‍රධාන වශයෙන් ඉහළ ගිය පොලී අනුපාතවල බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස පහත වැටුණි.

ක්ෂේත්‍රගත විමර්ශන - රක්ෂණ සමාගම්

1. ක්ෂේත්‍රගත විමර්ශන

2022 වසර තුළදී, රක්ෂණ සමාගමේ ආයෝජන, මෙහෙයුම්, මූල්‍ය තත්ත්වය, ව්‍යවසාය අවදානම් කළමනාකරණය, පාලනය යනාදී ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළ කාර්ය සාධනය, ක්‍රියා පටිපාටි සහ පාලනයන් ඇගයීමේ අරමුණින් අංශය විසින් එක් ක්ෂේත්‍රගත විමර්ශනයන් සිදු කරන ලදී. එහිදි නීරික්ෂණය කරනලද ගැටළු සහ නිරාකරනය කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර සඳහා, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙහි නිර්දේශ සමග රක්ෂණකරු වෙත දැනුම් දෙන ලදී.

සංඛ්‍යාන වාර්තාකරණය සහ අනෙකුත් ක්‍රියාකාරකම්

1. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2021

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන විගණිත මූල්‍ය ප්‍රකාශන සහ සංඛ්‍යාලේඛන මත පදනම්ව අංශය විසින් රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2021 සකස් කරන ලදී. ඒ අනුව, රක්ෂණ කර්මාන්තයේ අත්පොත කර්මාන්තයට අදාළ සංඛ්‍යාලේඛන සහ සමාගම් අනුව ශේෂ පත්‍ර, ආදායම් ප්‍රකාශන, වත්කම් සංකේන්ද්‍රණය ආදියෙන් සමන්විත වේ. එය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියෙහි පළ කරන ලදී.

2. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

2022 දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි පහත තොරතුරු ඉදිරිපත් කරන ලදී.

- කාර්තුමය වාර්තා වලින් සසඳන ලද සඛ්‍යානමය සහ අනෙකුත් තොරතුරු මත පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුවට කාර්තුමය පදනමින් ඉදිරිපත්කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ රක්ෂණ කර්මාන්ත පරිශිෂ්ඨය සඳහා රක්ෂණ ක්ෂේත්‍ර තොරතුරු වාර්ෂික පදනමින්.
- මහ බැංකුව විසින් සකස් කරන ලද පළාත් දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තුවල තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා වාරික ආදායම, ගෙවන ලද හිමිකම් සහ වෙනත් ආදායම් පිළිබඳ පළාත් දත්ත.
- 2022 මාර්තු 31 සහ 2022 සැප්තැම්බර් 30 වැනි දිනට රජයේ සුරැකුම්පත් මත රක්ෂණ සමාගම් කර ඇති ආයෝජන සම්බන්ධ තොරතුරු.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ඒකාබද්ධ අධීක්ෂණය සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ අනුබද්ධිත ආයතන සහ ආශ්‍රිතයන් ලෙස පිළිගත් රක්ෂණ ආයතන පිළිබඳ තොරතුරු.

3. මුදල් අමාත්‍යංශය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

අංශය විසින් අත්කරගත් ප්‍රගතිය පිළිබඳ කාර්තුමය පදනමින් වාර්තාවක් සකස් කර මුදල් අමාත්‍යංශය වෙත ඉදිරිපත් කෙරිණි. මෙමගින් එක් එක් කාර්තුව තුළ අංශය මගින් සිදු කරන ලද අධීක්ෂණ කටයුතු ආවරණය කරනු ලැබේ.

අධීක්ෂණ සමාලෝචනය

4. අවදානම් මෙවලම

වාර්ෂික හා කාර්තුමය වාර්තා හරහා රක්ෂණකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය හා වෙනත් තොරතුරු මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පූර්ව අනතුරු හැඟවීමේ යාන්ත්‍රණයක් ලෙස එක් එක් සමාගමේ ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර අවදානම් මෙවලමක් සකස් කරන ලදී. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක නිර්ණායක සහ අවදානම් තක්සේරු සාරාංශය, නුබුන්වත් වාර්තා සහ ක්ෂේත්‍රගත විමර්ශන ආදියෙන් රැස් කරගත් අදාළ දත්ත මත පදනම්ව දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් සඳහා අවදානම් ප්‍රරේඛනය වෙන් වෙන් වශයෙන් සිදු කරන ලදී. ප්‍රධාන මූල්‍ය නිර්ණායකවලට ප්‍රාග්ධනය, වත්කම්, ලාභදායිත්වය, වෙළඳපල කොටස ආදිය ඇතුළත් වන අතර අනුකූලතා දෘෂ්ඨිකෝණයට නුබුන්වත් අවශ්‍යතා, ප්‍රතිරක්ෂණ නියමයන් සහ කොන්දේසි, නිර්ණය අංක 1 සහ ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය යනාදියට අනුකූල වීම ඇතුළත් වේ. තවද, අවදානම් ප්‍රරේඛනය සඳහා ආයතනික ව්‍යුහය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල අනු කමිටු, අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය යනාදිය පිළිබඳ කටයුතු කරන පාලනය සහ අවදානම් කළමනාකරණ දෘෂ්ඨිකෝණය සම්බන්ධයෙන් ද සලකා බලන ලදී.

ඒ අනුව, ලබා ගන්නා ලකුණු මත පදනම්ව රක්ෂණ සමාගම් "ඉහළ", "මධ්‍යම" හා "පහළ" අවදානම් සමාගම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මින් පෙර සඳහන් කළ අවදානම් බාණ්ඩ අනුව අදාළ රක්ෂණ සමාගම් වර්ගීකරණය කිරීම සඳහා අංශය විසින් වාර්ෂික කාර්යසාධනය යොදා ගනු ලැබේ. අංශය විසින් "ඉහළ අවදානම්" සමාගම් ලෙස වර්ගීකරණය කෙරෙන රක්ෂණ සමාගම්වල කාර්යසාධනය වැඩිදුර අධීක්ෂණය කරනු ලැබේ. අවදානම් පාදක ප්‍රවේශය සැලකීමේ දී සමාගම්වලට නිශ්චිත වූ නියාමන අවශ්‍යතාවන් සහ අධීක්ෂණයේ ප්‍රමාණය රක්ෂණකරුගේ අවදානම් ලකුණු ප්‍රමාණය අනුව වෙනස් වනු ඇත.

5. රක්ෂණකරුවෙකු අලුතින් ලියාපදිංචි වීම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණකරුවෙකු ලෙස 2022 ජූලි 29 වැනි දින සිට දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා කොන්ටිනෙන්ටල් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් වෙත නව බලපත්‍රයක් ලබා දෙන ලදී.

6. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම වැළැක්වීම

අ) ක්ෂේත්‍රගත විමර්ශන

මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති සමග කියවන 15(1) (ඉ) වගන්තිය ප්‍රකාරව දක්වා ඇති නෛතික හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව රක්ෂණ සමාගම් විසින් ගනුදෙනුකරුවන්ගේ යථායෝග්‍ය රීති ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සමග එක්ව 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව ක්ෂේත්‍රගත විමර්ශන තුනක් පවත්වන ලදී. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා විමර්ශන සිදු කළ නිරීක්ෂණයන් පිළිබඳ අදාළ රක්ෂණකරුවන් දැනුවත් කෙරිණි.

ආ) අවදානම් මෙවලම

මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ සමග එක්ව සියළුම දිගු කාලීන රක්ෂණ සමාගම් විශුද්ධිකරණයට ලක් වීමේ අවදානම් ඇගයීම අඛණ්ඩව සිදු කර ඇති අතර මුදල් විශුද්ධිකරණ විරෝධී/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ අවදානම නිර්ණය කිරීම සඳහා මෙවලමක් ද සකස් කර ඇත.

ඒ අනුව 2021 ඔක්තෝම්බර් 1 සිට 2022 සැප්තැම්බර් 30 දක්වා කාලය සඳහා නිෂ්පාදන, පාරිභෝගිකයන්, දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන්, බෙදා හැරීමේ මාර්ග, ඒකාබද්ධ පාලනය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපරිපාටීන්, අවදානම් කළමනාකරණය, සේවක අනලස් බව, අනුකූලභාවය සහ අභ්‍යන්තර පාලනයන් ආදී කරුණු පිළිබඳ එක් එක් සමාගමට අදාළ තොරතුරු රැස් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගු කාලීන රක්ෂණ සමාගම් අතර ප්‍රශ්නාවලියක් බෙදා හරින ලදී. මෙම තොරතුරු මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගු කාලීන රක්ෂණය සමාගම්හි මුදල් විශුද්ධිකරණ විරෝධී/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ අවදානම නිර්ණය කිරීම සඳහා වන මෙවලම යාවත්කාලීන කරන ලදී.

ඇ) AML/CFT වගකීම් පිළිබඳ දැනුවත් කිරීමේ සැසි

2021 දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සමග සහයෝගයෙන් AML/CFT අනුකූලතා වගකීම් සම්බන්ධයෙන් සියලුම දිගු කාලීන රක්ෂණ සමාගම් සඳහා මාර්ගගත දැනුවත් කිරීමේ සැසි දෙකක් පවත්වා ඇත. මෙම මාර්ගගත දැනුවත් කිරීමේ සැසිවල ඉලක්කගත කණ්ඩායම වූයේ දිගුකාලීන රක්ෂණ සමාගම්වල අධ්‍යක්ෂවරුන්, අනුකූලතා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ය.

7. ලාභාංශ බෙදාහැරීම්

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත 2021 මාර්තු 10 දිනැති අංක 01 දරන විධානය සහ 2021 අගෝස්තු 30 දිනැතිව එයට පසුකාලීන සිදු කළ සංශෝධන ප්‍රකාරව රක්ෂණකරුවන්ගෙන් ලාභාංශ ප්‍රකාශන ඉල්ලීම් ලැබුණි. ඒ අනුව, රක්ෂණකරුවන් ලාභාංශ ප්‍රකාශ කිරීමේදී 2021 විධාන අංක 01 හි දක්වා ඇති නියමයන් සහ කොන්දේසි සපුරාලීමට අවශ්‍ය වන අතර එයට එම රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

අධීක්ෂණ සමාලෝචනය

විසින් එකී විධානයේ සඳහන් කර ඇති සියලුම නියමයන් සහ කොන්දේසි සලකා බලා ඇති බවට තහවුරු කිරීමක් ඇතුළත් වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදීමට පෙර ලාභාංශ ප්‍රකාශන ඉල්ලීම් 2021 අංක 01 දරන විධානයේ අවශ්‍යතා සහ සමාගමේ අනෙකුත් අදාළ මූල්‍ය සහ නුබුන්වත් කොන්දේසි අනුව වෙන වෙනම සමාලෝචනය කරන ලදී.

8. වත්මන් පොලී අනුපාත කම්පන හේතුවෙන් ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයට ඇති විය හැකි අහිතකර බලපෑම අවම කිරීම සඳහා වන අතුරු ක්‍රියාමාර්ග

රක්ෂණකරුවන්ගේ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය මත පවතින පොලී අනුපාත කම්පනවල ඇති විය හැකි බලපෑම පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් මතු කරන ලද කරුණු තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති විවිධ අවස්ථා අනුව රක්ෂණකරුවන්ගේ අවදානම් පාදක ප්‍රාග්ධන ගණනය කිරීම් සසඳන ලදී. සසඳන ලද අවදානම් පාදක ප්‍රාග්ධන තොරතුරු විශ්ලේෂණය මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙහි නිගමනය ශ්‍රී ලංකා රක්ෂණ සංගමය වෙත දැනුම් දෙන ලදී.

9. රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IAIS) රක්ෂණයේ මූලික මූලධර්මය (ICP) 9 සහ රක්ෂණයේ මූලික මූලධර්මය (ICP) 10 පිළිබඳ සමගාමී සමාලෝචන ක්‍රියාවලිය

වසර තුළදී, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අධීක්ෂණ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමය විසින් නිර්මාණය කරන ලද තක්සේරු උපාය මාර්ග යේ කොටසක් වන රක්ෂණයේ මූලික මූලධර්මය 9 සහ රක්ෂණයේ මූලික මූලධර්මය 10 සම්බන්ධ අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ස්වයං-තක්සේරු කිරීමක් සහ සමගාමී සමාලෝචනයක් සිදු කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ අධීක්ෂණ සහ නියාමන රාමුවල යම් දුර්වලතා හෝ හිඩැස්වල ස්වභාවය සහ ප්‍රමාණය හඳුනා ගැනීම සහ වත්මන් අධීක්ෂණ ධාරිතා මට්ටම සහ අනාගත අධීක්ෂණ සංවර්ධනයේ ප්‍රමාණය පිළිබඳ තොරතුරු සැපයීමයි.

රක්ෂණ තැරැව්කාර සමාගම්

1. කාර්තුමය වාර්තා, අතුරු මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

2010 පෙබරවාරි 25 දින අංක 1642/16 දරණ ගැසට් නිවේදනය සහ පසුව එයට සිදු කරන ලද සංශෝධන ප්‍රකාරව සියළු රක්ෂණ තැරැව්කාර සමාගම් සිය කාර්තුමය වාර්තා එක් එක් කාර්තුව අවසන් වී දින හතළිස් පහක් ඇතුළත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

2022 වර්ෂය තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් බහුතරයක් විසින් නියමිත දිනට තම කාර්තුමය වාර්තා ඉදිරිපත් කරන ලදී. සමාගම් විසින් ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා එම සමාගම්වල මූල්‍ය තත්වය, කාර්යසාධනය සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වීම ආදිය ඇගයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලදී. එහි දී නිරීක්ෂණය කරන ලද අනනුකූලතාවන් හෝ නියාමනයන් බැහැර වීම් පැහැදිලි කිරීම් සහ නිවැරිදි කිරීම් සඳහා අදාළ තැරැව්කාර සමාගම් වෙත සන්නිවේදනය කර කෙරිණි.

රක්ෂණ තැරැව්කාර සමාගම් සිය විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 86 (2) වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 06ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉදිරිපත් කරන විගණිත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමාලෝචනය කළ අතර රෙගුලාසිම අවශ්‍යතාවන් හා නිරීක්ෂණවලින් වෙනස් වූ අවස්ථාවලදී පැහැදිලි කිරීම් හා නිවැරදි කිරීම් සඳහා අදාළ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත සන්නිවේදනය කරන ලදී.

2. ලියාපදිංචිය අළුත් කිරීම

2023 වර්ෂය සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අයදුම්පත් ලැබිණි. බලපත්‍ර අලුත් කිරීමට පෙර ඔවුන්ගේ මූල්‍ය තත්වය අවබෝධ කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් විගණිත මූල්‍ය ප්‍රකාශන හා කාර්තුමය වාර්තා විශ්ලේෂණය කරන ලදී.

3. නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම

වසර තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් ලෙස බලපත්‍ර ලබා ගැනීමට යෝජිත පාර්ශවයන් වෙතින් අයදුම්පත් ලැබිණි. ලියාපදිංචිය සඳහා නිර්දේශ කිරීමට පෙර විකුණුම් හා මූල්‍ය පුරෝකථනයන්, සංවිධාන සටහන, පවතින යටිතල පහසුකම් හා බාහිර විගණකගේ සහතිකය ඇතුළුව අයදුම්කරුගේ ව්‍යාපාර සැලැස්ම අංශය විසින් විශ්ලේෂණය කරන ලදී.

නියාමන සමාලෝචනය

රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

වසර තුළදී කොමිෂන් සභාව විසින් රක්ෂණකරුවෙකු වෙත එක් නව ලියාපදිංචියක් ලබා දෙන ලදී. ඒ අනුව වසර සඳහා ලියාපදිංචි වූ රක්ෂණකරුවන් සංඛ්‍යාව 28 කි.

පරිශිෂ්ඨය I: කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින සියළු රක්ෂණ සමාගම්වල නාම ලේඛණය සහ ඒ සඳහා අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති දැක්වේ.

බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

රක්ෂණ සමාගම්

අත්හිටුවීම්

2009 වසරේ දී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සම්බන්ධයෙන් පනවන ලද අත්හිටුවීම 2022 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් විසින් නීතිමය කටයුතුවලට අදාළ හිමිකම් පෑම් කිහිපයක් හැර සියළු හිමිකම් පෑම් නිරවුල් කර තිබුණ ද සමාගමට එරෙහිව තවමත් විභාග වෙමින් පවතින නඩුකරයන් නිසා අදාළ හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නොලැබිණි.

පනතේ 18 (1) වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම, වෙනත් කරුණු අතර කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙන යාමට අසමත් වීම සහ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ කොමිෂන් සභාව විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් හෝ රෙගුලාසියක් හෝ රීතියක් කඩ කර තිබීම හේතුවෙන් සම්පූර්ණයෙන් ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් හෝ උප පන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකිය.

විධානයන්

1. කොමිෂන් සභාව විසින් පනතේ 57 වැනි වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවෙකුට ආදායමට ගලපන ලද හිමිකම් නොපාන ලද ප්‍රතිලාභ නැවත ශේෂ පත්‍රයේ "හිමිකම් නොපාන ලද ප්‍රතිලාභ" යටතේ වගකීමක් ලෙස සටහන් කිරීමට විධානයක් නිකුත් කර ඇත.

2. කොමිෂන් සභාව විසින් පනතේ 57 වැනි වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවෙකුට 2021 වසරේ දී එම සමාගම වෙත ම නිකුත් කළ විධානය අවලංගු කිරීමට සහ එම සමාගමේ ප්‍රධාන නිලධාරී, පනත යටතේ ලියාපදංචි කරන ලද කිසිදු රක්ෂණ සමාගමක හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරී, ප්‍රධාන විධායක නිලධාරී හෝ අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම වසර දෙකක කාලසීමාවකට වැළැක්වීම සඳහා විධානයක් නිකුත් කර ඇත.

අවවාද කිරීම්

1. 2019 වසරේ දී හිමිකම් පෑම්වලට අදාළ ඉදිරිපත් නොකරන ලද චෙක්පත් ආපසු ලිවීමෙන් විධාන අංක 18 උල්ලංඝණය කිරීම වෙනුවෙන් රක්ෂණ සමාගමක ප්‍රධාන නිලධාරියාට අවවාද කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. 2019 පෙබරවාරි 22 දිනැති විධාන අංක 18 ට අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි හිමිකම් පෑම් නොකලාවූ ප්‍රතිලාභ, කොටස් හිමියන්ට පැවරීම, දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන සියලුම රක්ෂණකරුවන්ට තහනම් කර ඇත.

2. කොමිෂන් සභාව විසින් තහනම් කරන ලද ලාභාංශ ගෙවීම සඳහා ඉඩ දීම/අනුමත කිරීම මගින් ප්‍රධාන මූල්‍ය නිලධාරියා ලෙස තමන්ගේ රාජකාරිය පැහැර හැරීම සම්බන්ධයෙන්, රක්ෂණ සමාගමක ප්‍රධාන මූල්‍ය නිලධාරියාට අවවාද කිරීමට කොමිසම විසින් තීරණය කරන ලදි.

නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම

මෙම වසර තුළ රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ව්‍යාපාර යෝජනා හතරක් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. කොමිෂන් සභාව විසින් වසර තුළ සමාගම් සංස්ථාගත කිරීම සඳහා එක් පුද්ගලයෙකු වෙත නම් සඳහා අනුමැතිය ලබා දී ඇත. කොමිෂන් සභාව විසින් මෙම වසර තුළ රක්ෂණ සමාගම් හයකට රක්ෂණ තැරැව්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචිය ලබා දෙන ලදී. දැනට පවතින තැරැව්කාර සමාගම් දෙකකට (සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කරගෙන යන) දිගු කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කරගෙන යාමට ලියාපදිංචිය ලබා දෙන ලදී.

2023 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් 70 කින් ඉල්ලුම්පත්‍ර කොමිෂන් සභාව වෙත ලැබී තිබූ අතර එම සමාගම් 70 අතරින් සමාගම් 69 ක් පනත යටතේ දක්වා ඇති අවශ්‍යතාවන් සම්පූර්ණ කර තිබූ බැවින්, ඒවා සඳහා ලියාපදිංචිය අළුත් කරන ලදී. 2022 දෙසැම්බර් 31 වැනි දිනට පෙර, දැනුම් දුන් පරිදි ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තාවල මූල්‍ය සාවද්‍යතාවයන් නිවැරදි නොකිරීම හේතුවෙන්, එක් සමාගමක ලියාපදිංචිය අලුත් කිරීම සිදු නොකරන ලදි.

පරිශිෂ්ඨය II: කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින සියළු රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛණය, ඒ සඳහා අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති සහ ලියාපදිංචි කාල සීමාව දැක්වේ.

නියාමන සමාලෝචනය

බලාත්මක කිරීමේ කාර්යය

රක්ෂණ තැරැව්කාර සමාගම්

අවවාද කිරීම්

නියමිත කාල සීමාව තුළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා ඇතුළු නියාමන වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් එක් තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරියා වෙත අනතුරු ඇඟවීම් දෙකක් නිකුත් කරන ලදී.

අත්හිටුවීම්

වසර තුළ කිසිදු තහනමක් පනවා නැත.

අවලංගු කිරීම්

වසර තුළ කිසිදු අවලංගු කිරීමක් සිදු කර නැත.

අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම

කොමිෂන් සභාව විසින් වසර තුළ දී පුද්ගලයන් තුන්දෙනෙකු හට අලාභගැලපුම්කරුවන් ලෙස ලියාපදිංචිය ලබා දී ඇත. වසර තුළ අලාභ ගැලපුම්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා පුද්ගලයන් විසිහය දෙනෙකුගෙන් වාර්ෂික ගෙවීම් ද කොමිෂන් සභාව විසින් භාර ගන්නා ලදී.

පනතේ 114 (1) වගන්තිය ප්‍රකාරව "අලාභ ගැලපුම්කරු" යන්නෙන් රක්ෂණ හිමිකම් පෑමක දී උද්ගත වන අලාභ විමර්ශනය කිරීමේ සහ තක්සේරු කිරීමේ විශේෂිත දැනුමක් ඇති සහ පනතේ විධිවිධාන යටතේ අලාභ ගැලපුම්කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති තැනැත්තකු අදහස් වේ.

පරිශිෂ්ඨය III: කොමිෂන් සභාව සමග ලියාපදිංචි වී සිටින අලාභ ගැලපුම්කරුවන්ගේ නාම ලේඛණය සහ ලියාපදිංචිය බලාත්මක වන දිනය සඳහන් වේ.

නියාමන/ උපදේශන ක්‍රියාමාර්ග

1. සංශෝධන පනත මගින් හඳුන්වා දෙන ලද නව විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණනාවක් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී. කෙසේ වුවද, ආයතනික පාලන රාමුව පිළිබඳ 2022 විධාන අංක 20 අනුකූල නොවීම හේතුවෙන් ඉල්ලීම් කිහිපයක් අනුමත නොකරන ලදී.

2. පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණනාවක් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

3. (ඉ) (1) (අ) ඡේදයේ සඳහන් වන ආයුගණක සහතිකය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් 2021 මාර්තු 23 දිනැති 2021 අංක 01 දරණ චක්‍රලේඛයට පැහැදිලි කිරීමක් සපයා ඇත. ඒ අනුව, එවැනි සහතිකයක් පනතේ 114 (1) වගන්තියේ ඇතුළත් "ආයුගණක" යන නිර්වචනය සමග කියවා ඇති 46 වැනි වගන්තියේ නියම කර ඇති ආකාරයට පත් කරන ලද ආයුගණක විසින් නිකුත් කරනු ලැබේ.

4. එක් රක්ෂණ තැරැව්කරුවෙකුගේ ප්‍රධාන නිලධාරියාට එරෙහිව පැමිණිල්ලක් ලැබී තිබීමෙන්, කොමිෂන් සභාව ඒ පිළිබඳව සොයා බැලීම සඳහා ස්ථානීය පරීක්ෂණයක් පැවැත්විය. සොයාගැනීම් සහ නිරීක්ෂණ අනුව, එම රක්ෂණ තැරැව්කරු මෙම කාරණය නිවැරදි කිරීමට පියවර කිහිපයක් ගත යුතු විය.

5. චක්‍රලේඛ අංක 36 ප්‍රකාරව විදේශීය සෞඛ්‍ය රක්ෂණයන් අළුත් කිරීම සඳහා වන රක්ෂණ තැරැව්කරුවන් ගණනාවකගේ ඉල්ලීම් සමාලෝචනය කරන ලදුව කොමිෂන් සභාව විසින් බලය හිමිවන කාල සීමාව තවත් වසරක් සඳහා අළුත් කරන ලදී.

විදේශ සෞඛ්‍ය රක්ෂණාවරණයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ඕනෑම රක්ෂණ තැරැව්කාර සමාගමක් තමන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන රක්ෂණය සඳහා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගත යුතු බවට චක්‍රලේඛ අංක 36 මගින් දක්වා ඇත.

විමර්ශන සමාලෝචනය

විමර්ශන අංශය, රක්ෂණ හිමියන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමේ අරමුණ ඉටුකර ගැනීමේ අරමුණින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන රක්ෂණකරුවන් සහ හිමිකරුවන් අතර ඇති වන ආරවුල් විමර්ශනය කර නිරාකරණය කරයි. කිසියම් රක්ෂණකරුවෙකු, තැරැව්කරුවෙකු හෝ නියෝජිතයකුගේ හැසිරීම 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ යම් විධිවිධානයකට හෝ ඒ යටතේ සම්පාදනය කරන ලද ඕනෑම නීතියකට පටහැනිද යන්න තහවුරු කිරීම සඳහා ඒ සම්බන්ධ පැමිණිලි පිළිබඳව ද මෙම අංශය විමර්ශනය කරනු ඇත.

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි විභාග කිරීමේදී එම අංශය විසින් අදාළ සියළු පාර්ශව වෙත සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය තහවුරු කරනු ඇත. අංශය විසින් හිමිකම් පෑම් පිළිබඳ ආරවුල් විමර්ශනය කිරීමේ දී රක්ෂණකරුවන් එහි තීරණ සනාථ කිරීම සඳහා සාක්ෂි සහිතව එම තීරණයෙහි පදනම ස්ථාපිත කළ යුතු වනු ඇත. කොමිෂන් සභාව විසින් තීරණයන්ට එළැඹීමට පෙර අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය පරිදි තෙවන පාර්ශවයන් වෙතින් කරුණු තහවුරු කර ගැනීම හා විශේෂඥ මතයන් ලබා ගැනීම ද සිදු කරනු ලැබේ.

සමස්ථ පැමිණිලි පිළිබඳ සමාලෝචනය

සමාලෝචනයට පාත්‍ර වන කාල සීමාව තුළ නව පැමිණිලි 435 ක් කොමිෂන් සභාව වෙත යොමු වූ අතර එම කාලය තුළ පැමිණිලි 398 ක් (පෙර වසරින් ඉදිරියට ගෙන ආ පැමිණිලි ද ඇතුළුව) සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කෙරුණි. කොමිෂන් සභාවේ මැදිහත් වීම මත රක්ෂණ වන්දි ආරවුල් 97 ක් රක්ෂණ හිමිකම් පාන්නන්ට වාසිදායක ලෙස නිරාකරණය වූ අතර එම හිමිකම් පෑම්වල එකතුව ආසන්න වශයෙන් රු.මි. 40 ක් විය.

1 රූප සටහන: පසුගිය වසර පහ (5) තුළ වාර්ෂිකව ලැබුණු පැමිණිලි



පසුගිය වසර පහ (5) තුළ අංශයට ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 1853 කි. සමාලෝචිත කාල සීමාව තුළ කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව (435) පෙර වසරට (410) සාපේක්ෂව සුළු වශයෙන් වැඩි වී ඇත. රට මුහුණ දී ඇති ආර්ථික ගැටළු හේතුවෙන් රක්ෂිත ජනතාව මුහුණ දෙන මූල්‍ය ගැටළු සහ ආනයන සීමා කිරීම් හේතුවෙන් වාහන මිලෙහි වෙළෙඳපොළ වටිනාකමෙහි හදිසි අස්ථාවරත්වය වසර තුළ ආරවුල් සංඛ්‍යාව ඉහළ යාමට හේතු වන්නට ඇත.

2 රූප සටහන: 2022 වසර තුළ ලැබුණු පැමිණිලිවල මාසික විශ්ලේෂණය



මාසිකව ලැබුණු පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ විස්තරයක් 2 රූප සටහන මගින් දැක්වෙන අතර වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (82) ලැබී ඇත්තේ මාර්තු මාසය තුළ බවත් අඩුම පැමිණිලි සංඛ්‍යාවක් (13) ලැබී ඇත්තේ ජුලි මාසය තුළ බවත් එමගින් පෙන්නුම් කෙරේ.

රූප සටහන 3 – 2022 වසරේ දී ලැබුණු පැමිණිලි වර්ගීකරණය



3 රූප සටහන මගින් 2022 වර්ෂය තුළ ලැබුණු සමස්ථ පැමිණිලි ප්‍රමාණය දක්වා ඇත. සමස්ථ පැමිණිලිවලින් බහුතරය, එනම් 277 (63.7 %) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද පැමිණිලි 138 (31.7 %)ක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද වේ. විශේෂිත වූ රක්ෂණ ව්‍යාපාරයකට වර්ගීකරණය කළ නොහැකි වෙනත් පැමිණිලි 20(4.6 %) ක් ද වේ. පසුගිය සමාලෝචිත වර්ෂය හා සැසඳීමේ දී රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය 72.9 % (2021 වසරේ දී) සිට 63.7 % දක්වා අඩු වීමක් පෙන්නුම් කළ අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය

විමර්ශන සමාලෝචනය

19.75 % (2021 වසරේ දී) සිට 31.7 % දක්වා සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කළේය.වෙනත් පැමිණිලි ද ඊට සමානුපාතිකව 7.32 % (2021 වසරේ දී) සිට 4.6 % දක්වා අඩු වී ඇත.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි විශ්ලේෂණය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි ගැටළුවේ ස්වභාවය අනුව වර්ග කර 1 වන වගුවේ දක්වා ඇත.

1 වගුව – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි: ගැටළුව අනුව

ගැටළුව	පැමිණිලි සංඛ්‍යාව	ප්‍රතිශතය
රක්ෂණ වන්දි ආරවුල්	256	92.42
වගකීම පිළිනොගැනීම	*102*	*39.84*
ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම	*28*	*10.94*
හිමිකම් ගෙවීම ප්‍රමාද වීම	*126*	*49.22*
වෙනත් පැමිණිලි	21	7.58
එකතුව	**277**	**100.00**

1 වන වගුවෙහි දැක්වෙන පරිදි සමස්ථ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පැමිණිලි අතුරින් (277) රක්ෂණ වන්දි ආරවුල් 256 (94.42%) වන අතර ඉතිරි පැමිණිලි 21 (7.58%) අර්ධකාලීනව රක්ෂණ ඔප්පු අවලංගු කිරීම්, අසන ලද ප්‍රශ්නවලට ප්‍රතිචාර නොදැක්වීම්, වාරික නැවත ලබා ගැනීම පිළිබඳ ඉල්ලීම් හා රක්ෂණ ඔප්පු නොලැබීම ආදී වෙනත් පැමිණිලි වේ.

වගකීම පිළිනොගැනීමට අදාළව (39.84%) පැමිණිලිවල මූලසාධකය විශ්ලේෂණය කිරීමේ දී මෝටර් රථ වාහන හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ ප්‍රධාන හේතු ලෙසට අනාවරණය වන්නේ අනතුර සම්බන්ධයෙන් වන වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම (රක්ෂණය ලබාගත් අරමුණට පරිබාහිර අරමුණු සඳහා වාහනය භාවිතා කිරීම, රියදුරු බීමත්ව සිටීම, වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති අයෙක් රිය පැදවීම හෝ හිමිකම් පාන්නාට වාහනය කෙරෙහි එය විකිණීමෙන් පසුව රක්ෂණීය බැඳියාවක් නොමැති වීම මෙම කරුණු ඉදිරිපත් නොකිරීමට හේතු විය හැක) රියදුරු/ රක්ෂිතයා විසින් අනතුර පිළිබඳ ලබා දුන් විස්තරය සමග අනතුරෙන් සිදු වූ අලාභහානි නොසැසඳීම හෝ අනතුර සිදුවන දිනය වන විට මුළු රක්ෂණ වාරික මුදල නොගෙවීම මත රක්ෂණ ඔප්පුව අවලංගු වීමයි.

රක්ෂණ හිමිකම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ දී අවශ්‍ය අවස්ථාවන්හි දී රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, පොලිස් ස්ථාන, රෝහල් හා සිද්ධිය පිළිබඳ ප්‍රකාශ ලබාදුන් අය වෙතින් අදළා තොරතුරු කැඳවීමෙන් හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණය පවත්වන ලදී. හිමිකම් උද්ගත වීමට හේතු වූ අලාභය රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය වන සහ කිසිදු ආකාරයක වංචාවක් හෝ හිතාමතා කරුණු වරදවා දැක්වීමක් සිදුව නොමැති අවස්ථාවලදී හිමිකම් පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය.

රක්ෂණ වන්දි ආරවුල් යටතේ ප්‍රධාන වශයෙන් බලපෑ මීළඟ හේතුව වූයේ (49.22%)හිමිකම් ගෙවීම ප්‍රමාද වීමයි. මෙම ප්‍රමාදයන් අතුරින් බොහෝමයක් උද්ගත වී ඇත්තේ හිමිකම් පිළිබඳ වැඩිදුර විමර්ශන පැවැත්වීම බව නිරීක්ෂණය විය. මීට අමතරව, රක්ෂිතයාගේ හෝ අළුත්වැඩියාකරුවන්ගේ පාර්ශවයෙන් හිමිකම් නිරාකරණය කිරීමට අවශ්‍ය තොරතුරු හා ලේඛන ඉදිරිපත් කිරීමේ දී සිදුවන ප්‍රමාදයන් ද නිරීක්ෂණය විය. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරුණු ඉතිරි පැමිණිලි 28 (10.93%) ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීමට අදාළ විය. මෙම පැමිණිලිවලට මූලික හේතුන් වූයේ රක්ෂණ ඔප්පුවෙහි කරුණු වරදවා වටහා ගැනීම සහ රක්ෂකයන් විසින් ගෙවන ලද අලාභ ගැලපුම්/ අඩු කිරීම් පිළිබඳව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබා නොදීමයි. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡාවලදී හිමිකම් පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදීම මගින් මෙවැනි බොහෝමයක් ආරවුල් විසඳාගත හැකි විය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි විශ්ලේෂණය

දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරයට අදාළව ලැබුණු පැමිණිලි ගැටළුවේ ස්වභාවය අනුව විශ්ලේෂණය කර දෙවන වගුවේ දක්වා ඇත.

2 වගුව – දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි: ගැටළුව අනුව

ගැටළුව	පැමිණිලි සංඛ්‍යාව	ප්‍රතිශතය
රක්ෂණ වන්දි ආරවුල්	41	29.71
වගකීම පිළිනොගැනීම	*30*	*73.17*
පූර්ණත්වය සහ පවාරණ ප්‍රතිලාභ	*01*	*2.44*
යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම	*10*	*24.39*
වෙනත් පැමිණිලි	97	70.29
ගෙවන ලද වාරික මුදල ආපසු ලබාගැනීම/ ඔප්පු අවලංගු කිරීම හෝ පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම්	*43*	*44.33*
තොරතුරු ලබා දීම	*14*	*14.43*
වාරික ගෙවීම/ සාවද්‍ය පරිහරණය	*15*	*15.47*
වෙනත්	*25*	*25.77*
එකතුව	**138**	**100.00**

විමර්ශන සමාලෝචනය

2 වන වගුවට අනුව සමස්ථ දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය යටතේ ලැබුණු පැමිණිලි (138) අතරින් 29.71% ක් වන්දි ආරවුල් සම්බන්ධයෙන් වන අතර 70.29 %ක් වෙනත් පැමිණිලි වේ.

රක්ෂණ වන්දි ආරවුල් (73.17%) සඳහා මූලික හේතුව වගකීම පිළිනොගැනීමට අදාළ විය. එවැනි ආරවුල් ඇති වීමට ප්‍රධාන හේතුව වන්නේ රක්ෂණ ඔප්පුවේ ඇති කරුණු පිළිබඳ අවබෝධය මඳ බව සහ රක්ෂකයන් විසින් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සිදු නොකිරීමයි. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡාවලදී හිමිකම් පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දීම මගින් මෙවැනි බොහෝමයක් ආරවුල් විසඳන ලදී.

හිමිකම් පෑම් පිළිබඳ ආරවුල්වලින් තවත් 24.39%ක් ඉදිරිපත් කළ හිමිකම් පිළිබඳ අතෘප්තියට අදාළ විය. හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප වීමට පාදක වී ඇත්තේ රක්ෂණ ඔප්පුව ලබා ගැනීමේ දී හෝ පුනස්ථාපනය කිරීමේ දී රක්ෂිතයා විසින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ වරදවා දැක්වීමයි. රක්ෂණ ගිවිසුමක පදනම වන "උපරිම සද්භාවය" (uberrimae fidei) නම් මූලික නෛතික මූලධර්මය රක්ෂණ ගිවිසුමේ දෙපාර්ශවය එනම් රක්ෂකයා මෙන්ම රක්ෂිතයාට එකසේ ක්‍රියා කරයි. යෝජකයා විසින් රක්ෂණ යෝජනා පත්‍රය මගින් හෙළිදරව් කරන තොරතුරු මත පදනම්ව රක්ෂණ යෝජකයාගේ ජීවිතය පිළිබඳ අවදානම පිළිගන්නේ ද යන වග සහ රක්ෂණ ගිවිසුමට අදාළ වන කොන්දේසි හා නියමයන් රක්ෂකයා විසින් තීරණය කරනු ලබයි. එවන් අවස්ථාවක රක්ෂිතයා විසින් කිසියම් වැදගත් කරුණක් හෙළිදරව් නොකළහොත් හෝ වරදවා දැක්වීමක් සිදු කළහොත් උපරිම සද්භාවය මූලධර්මය උල්ලංඝණය වේ.

ඇතැම් අවස්ථාවල දී යෝජකයා විසින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හා වරදවා දැක්වීමට හේතු වී ඇත්තේ අදාළ රක්ෂණ මූලධර්ම හා වැදගත් තොරතුරු හෙළිදරව් කිරීමේ වගකීම පිළිබඳ දැනුම මඳ බවට නිරීක්ෂණය විය. වැදගත් කරුණු වරදවා දැක්වීම හිතාමතා හෝ නොසැලකිල්ලෙන් නොවන අවස්ථාවන් කිහිපයක දී පමණක් අදාළ රක්ෂණ හිමිකම් පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය.

රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති කාල වකවානුව තුළ හා නියමිත පරිදි වාරික ගෙවීම රක්ෂණ ඔප්පු හිමියාගේ ගිවිසුම්ගත යුතුකමක් වේ. අලාභය සිදුවන විට වාරික නොගෙවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අප්‍රාණිකව පැවති අවස්ථාවලදී රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී ඇත. නියමිත වේලාවට රක්ෂණ වාරික ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙන යාම රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීමක් වන අතර ආරවුලක දී ඉදිරිපත් කිරීමට සිදු වුවහොත් ගෙවීම් තහවුරු කිරීමට සාක්ෂි ඔවුන් සතුවිය යුතුය. ඒ අනුව, නියමිත කාල සීමාව තුළ වාරික ගෙවන ලද බව තහවුරු කළ හැකි හෝ ගෙවීමේ දී සිදු වූ ප්‍රමාදය සාධාරණීකරණය කළ හැකි අවස්ථාවලදී පමණක් කොමිෂන් සභාවට සහාය විය හැකිය. හිමිකම් පාන්නන්ට තමන්ගේ යෝජිත මුදල දැනුම් දීමේ දී ප්‍රමාණවත් පැහැදිලි කිරීම් හෝ විස්තර ලබා නොදීම් මෙවැනි යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවූ ආරවුල් බහුතරයකට (7.25%) හේතුව වී ඇති බවට හඳුනා ගන්නා ලදී.

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අනෙකුත් පැමිණිලිවලින් බහුතරයක් (44.33%) ආපසු ගෙවීම/අවලංගු කිරීම හෝ රක්ෂණ ඔප්පු නැවත බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීම් යටතේ ඉදිරිපත් විය. අවලංගු කිරීමේ කාල සීමාව (එනම් රක්ෂණ ඔප්පුව ලද දින සිට දින 21 ක් ඇතුළත) ඉකුත් වීමෙන් අනතුරුව රක්ෂණ ඔප්පු හිමියාට එවැනි අයිතියක් නොමැති වීම නිසා රක්ෂණ ඔප්පු අවලංගු කිරීම සහ ගෙවන ලද වාරික මුදල් ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් වන පැමිණිලි සඳහා සහාය වීමට හැකියාවක් නොලැබුණි. කෙසේ වුවද, ඇතැම් අවස්ථාවල හිමිකම් පාන්නන්ගේ දුර්වල මූල්‍ය තත්වය සැලකිල්ලට ගෙන රක්ෂණකරුවන්ට සහන සලසා ඇත. රක්ෂණ ඔප්පුව පුනස්ථාපනය කිරීමට පියවර ගැනීමට ප්‍රමාද වූ කරුණු සාධාරණීකරණය කළ හැකි විටදී පමණක් නියමිත කාලය ඉකුත් වීමෙන් පසුව සිදු කරන ලද පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම්වලට රක්ෂණ ඔප්පු හිමියන්ට සහාය වීමට හැකි විය. ගෙවූ රක්ෂණ වාරික මුදල් ආපසු ගෙවන ලෙස වන ඉල්ලීම්වලට මූලික හේතුව වන්නේ රක්ෂණ ඔප්පු හිමියන් තුළ ජීවිත රක්ෂණයේ වැදගත්කම පිළිබඳ අවබෝධය මඳ බව සහ අඛණ්ඩව වාරික ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙන යාමේ දී මුහුණ පාන්නට වන ආර්ථික දුෂ්කරතායි.

වෙනත් පැමිණිලි

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි 20 ක් ප්‍රධාන වශයෙන් අසාධාරණ අයුරින් රක්ෂණාවරණය අවසන් කිරීම සහ නියෝජිතයන්ගේ අධ්‍යාපනයයි. හැකි සෑම අවස්ථාවක දී ම පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කර ඇත.

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීම සහ රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන අංගයක් ලෙස දැනුවත් කිරීම සැලකේ. රක්ෂණ ව්‍යාපාරයේ මූලික පාර්ශවකරුවන් වන, වර්තමාන සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ට තම අභිලාෂයන් ආරක්ෂා කර ගැනීමට සහ රක්ෂණ ගිවිසුමකට එළඹීමේ දී මනා අවබෝධයකින් යුතු තීරණ ගැනීමට හැකි වන පරිදි දැනුමෙන් සන්නද්ධ විය යුතුය.

රක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා වන අපගේ උපායමාර්ගය සැකසී ඇත්තේ රක්ෂණ දැනුමින් මහජනතාව සවිබල ගැන්වීම සඳහා දැනුවත් කිරීම, අවදානම් වලට නිරාවරණය වීම කළමනාකරණය කිරීමේ දැනුම ඉහළ නැංවීම සහ රක්ෂණාවරණය/ හිමිකම්පෑම සම්බන්ධ ආරවුලක් හටගත් විට එය විසඳීමෙහිලා රක්ෂණ නියාමකගේ කාර්යය, වැනි කරුණු පදනම් කරගෙනය.

නියමිත පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පැවැත්වීම සම්බන්ධයෙන් 2022 වසර අභියෝගාත්මක වසරක් විය. රටේ පැවති දේශපාලන හා ආර්ථික තත්ත්වය හේතුවෙන් ඇති වූ බාධාවන් හඳුනාගත් කොමිෂන් සභාව මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය වැනි මහජනතාව සමග පහසුවෙන් සන්නිවේදනය කළ හැකි ක්‍රමවේද කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට ඉක්මන් පියවර ගත්තේ ය. කොවිඩ් -19 වසංගතය හේතුවෙන් එල්ල වූ බාධාවන් හේතුවෙන් ලෝකය අඛණ්ඩව වෙනස් වෙමින් පවතින බැවින්, වැඩි වැඩියෙන් මහජනතාව ඩිජිටල් මාධ්‍ය සමග සම්බන්ධ වීමට පෙළඹී සිටිති. එබැවින්, සමාලෝචිත කාල සීමාව තුළ විශාල පිරිසක් වෙත ළඟා වීමට ඩිජිටල් නාලිකා භාවිතා කිරීම පිළිබඳව කොමිෂන් සභාව වැඩි අවධානයක් යොමු කළේය.

රක්ෂණාවරණ සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්, රක්ෂණය පිළිබඳ දැනුම, රක්ෂණ කර්මාන්තය සහ එහි නවතම වර්ධනයන්, සුදුසු රක්ෂණ නිෂ්පාදන තෝරා ගැනීම, රක්ෂණ ඔප්පු හිමියන්ට ඇති දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් ආදිය පිළිබඳ රක්ෂණ ඔප්පු හිමියන්ගේ දැනුම වැඩි කිරීමෙන් වත්මන් සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමට කොමිෂන් සභාව උත්සාහ කරයි. කොමිෂන් සභාව මෙම අරමුණ සපුරා ගැනීම සඳහා ඉලක්කගත පිරිස් වෙත ළඟා වීමට විවිධ සන්නිවේදන ක්‍රම භාවිත කළේය. සමාලෝචිත වර්ෂය තුළ භාවිතා කරන ලද සන්නිවේදන මාර්ග සහ සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත පරිදි වේ:

මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

මුද්‍රිත මාධ්‍ය

සමාලෝචිත කාල සීමාව තුළ කොමිෂන් සභාව විසින් පුවත්පත් දැන්වීම් සහ මාධ්‍ය නිවේදන කිහිපයක් ප්‍රකාශයට පත් කරන ලදී.

මාධ්‍ය නිවේදන

පහත දැක්වෙන මාධ්‍ය නිවේදන පළ කෙරිණි.

අ) "රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය - 03 කාර්තුව, 2021" - 2022 ජනවාරි මාසයේදී

ආ) "ජංගම සහ ස්ථාවර දුරකථන ජාල උපයෝගී කරගමින් රක්ෂණ ඔප්පු අලෙවිය නැවත්වීම"- 2022 ජනවාරි මාසයේදී

ඇ) "බැංකු, මුල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් මගින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී ඇති කරගන්නා රක්ෂණාවරණ (රක්ෂණ ඔප්පු) සම්බන්ධවයි" - 2022 පෙබරවාරි මාසයේදී

ඈ) "රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය - 04 කාර්තුව, 2021" - 2022 අප්‍රේල් මාසයේදී

ඉ) "රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය - 01 කාර්තුව, 2022" - 2022 ජූලි මාසයේදී

ඊ) "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය හරහා අනාවරණය කෙරෙන රක්ෂණ ඔප්පු හිමියන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි" - 2022 අගෝස්තු මාසයේදී

උ) "රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය - 02 කාර්තුව, 2022" - 2022 ඔක්තෝබර් මාසයේදී

ඩිජිටල් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

ඊ-පුවත් ලිපි

රක්ෂණ ඔප්පුහිමියන්, අනාගත රක්ෂණ ඔප්පු හිමියන් සහ රක්ෂණ වෘත්තිකයන් කෙරෙහි අවධානය යොමු කරමින් රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්, වැදගත් රක්ෂණ ඉඟි, රක්ෂණ කර්මාන්තයට අදාල සංඛ්‍යාලේඛන, රක්ෂණ කර්මාන්තය ආශ්‍රිත මාතෘකා සහ නව මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ පිළිබඳ තොරතුරු අඩංගු ඊ-පුවත් ලිපියේ සංස්කරණ දෙකක් කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඉලෙක්ට්‍රොනික් පුවත් ලිපියේ පළමු සංස්කරණය 500,000 කට වැඩි පිරිසක් අතර විද්‍යුත් තැපැල් මගින් බෙදා හරින ලද අතර එම සංස්කරණ දෙකම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ සහ සමාජ මාධ්‍ය පිටුවල මෙම වසර තුළ ප්‍රකාශයට පත් කරන ලදී.

කෙටි පණිවුඩ (SMS) මගින් දැනුවත් කිරීම

කොමිෂන් සභාව "IRCSL" යන නාමය (name tag) යටතේ රක්ෂණය සම්බන්ධ මාතෘකා, රක්ෂණ ඉඟි සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් ආවරණය කරමින් කෙටි පණිවුඩ (SMS) යැවීමේ වැඩසටහනක් පවත්වන ලදී. සමාලෝචිත කාල සීමාව තුළ තෝරාගත් ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවකු හරහා 1900 කට වැඩි පාරිභෝගික පිරිසක් වෙත මෙම කෙටි පණිවුඩ බෙදා හරින ලදී.

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

Facebook පිටුව සහ LinkedIn පිටුව

සමාලෝචිත කාලසීමාව තුළ කොමිෂන් සභාව විසින් රක්ෂණයේ විවිධ පැතිකඩ, රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සහ රක්ෂණ ක්ෂේත්‍රයට අදාල සංඛ්‍යාලේඛන පිළිබඳව Facebook සහ LinkedIn පිටු හරහා ජනතාව දැනුවත් කර ඇති අතර (Facebook) නිල පිටුව හා සම්බන්ධවූවන් 3500 ක් සහ (LinkedIn) නිල පිටුව හා සම්බන්ධවූවන් 2400ක් වෙත ළඟා වී ඇත.

YouTube

රක්ෂණ නියාමන ආයතනයේ භූමිකාව, රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් සහ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධ අනෙකුත් කරුණු මත පදනම්ව සජීවිකරණ අන්තර්ගතයන් 04ක් YouTube නාලිකාවට එක් කරන ලදී.

මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ චක්‍රලේඛයක් හේතුවෙන් මුද්‍රිත මාධ්‍ය ඇතුළු ජනසන්නිවේදන මාධ්‍ය හරහා ඇතැම් දැනුවත් කිරීම් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ නොහැකි විය. පුවත්පත් වෙළඳ දැන්වීම් සහ පුවත්පත් දැන්වීම් එවැනි ක්‍රියාකාරකම් විය. එබැවින්, පවතින සම්පත් යොදා ගෙන එවැනි කාර්යයන් කොමිෂන් සභාව මගින් ඉටු කෙරිණි. පුවත්පත් දැන්වීම් පළ කිරීමට නොහැකි වූ බැවින් සිංහල සහ දෙමළ භාෂාවලින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳ පුවත්පත් දැන්වීම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය වෙත උඩුගත කරන ලදී. 2022 වසරේ පැවති රක්ෂණ සමාගම්, තැරැව්කාර සමාගම් සහ අලාභ ගැලපුම්කරුවන්ගේ නම් ලැයිස්තු පිළිබඳ මාධ්‍ය නිවේදනය ද වෙබ් අඩවියේ පළ කර ඇත. රූපවාහිනියේ විකාශය කිරීමට සූදානම් කර තිබූ වීඩියෝ දැන්වීම සහ ගුවන් විදුලියේ විකාශනය කිරීමට සැලසුම් කර තිබූ කෙටි පණිවිඩ මත පදනම්ව සකස් කරන ලද සජීවිකරණ අන්තර්ගතයන් ද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ YouTube නාලිකාවට එක් කරන ලදී.

වෙළඳ දැන්වීම් සහ රක්ෂණ නිෂ්පාදන නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම තුළින් රක්ෂණ ඔප්පුහිමියාගේ සුරක්ෂිතබව සහතික කිරීම

රක්ෂණ නිෂ්පාදන සම්බන්ධයෙන් ප්‍රචාරණය කිරීමට අදාළ සියලුම තොරතුරු සඳහා අවම ප්‍රමිතීන් සකසන වෙළඳ ප්‍රචාරණ මාර්ගෝපදේශය 2022 ජූලි 1 වන දින සිට ක්‍රියාත්මක වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කොමිෂන් සභාව රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල රක්ෂණාවරණ අලෙවිකරණය සඳහා යොදා ගන්නා වෙළඳ හා ප්‍රචාරණ දැන්වීම් ආදිය ඇගයීමට ලක් කළේය. මීට අමතරව, රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් සාධාරණ, අවංක සහ විනිවිදභාවයෙන් යුතු පරිචයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නව ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන සමාලෝචනය කර නිරීක්ෂණ ලබා දෙන ලදී.

වෙළඳපොළ පර්යේෂණ හරහා රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය වැඩි කරන විවිධ සාධක හඳුනාගැනීම සහ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

(අ) රක්ෂණය පිළිබඳ පවතින විශ්වාසයේ මට්ටම මැන බැලීම සඳහා වූ පර්යේෂණ නැවත පැවැත්වීම

රක්ෂණය පිළිබඳ මහජන මතය සහ විශ්වාසය තහවුරු කර ගැනීම සහ මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා අවධානය යොමු කළ යුතු ගැටළු හඳුනා ගැනීමට රක්ෂණය පිළිබඳ පවතින විශ්වාසයේ මට්ටම පිළිබඳ සමීක්ෂණය කොළඹ විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලදී. සමීක්ෂණය පිළිබඳ අවසන් වාර්තාවේ කෙටුම්පත කොළඹ විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කර ඇති අතර රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා හඳුනාගත් ගැටළු විසඳීම කොමිෂන් සභාවේ අරමුණු වේ.

(ආ) වෙළඳපොළ පර්යේෂණය

රක්ෂණ සමාගම් විසින් ලබාදෙන සේවයේ ගුණාත්මකභාවය, රක්ෂණ ප්‍රතිලාභ, රක්ෂණ ඔප්පු කොන්දේසි, බැහැර කිරීම් රක්ෂණකරුවන් විසින් පිරිනමනු ලබන සේවාවන්හි ගුණාත්මක බව, බෙදාහැරීමේ මාර්ග, පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලිය සහ රක්ෂණ හිමිකම් පියවීම් පිළිබඳ වත්මන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආකල්ප, හැඟීම සහ අවබෝධය හඳුනාගැනීම සහ රක්ෂණ කර්මාන්තය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා වෙළෙඳපොළ පර්යේෂණයක් පැවැත්වීමට කොමිෂන් සභාව සැලසුම් කර ඇත. සමීක්ෂණය සිදු කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමට කොමිෂන් සභාව විසින් අදාළ කටයුතු අවසන් කරමින් පවතියි.

ඉල්ලීම මත පාර්ශවකරුවන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන් සඳහා වෘත්තීය යෙදවුම් සැපයීම

ආරාධනා කිරීම මත, කොමිෂන් සභාවේ නිලධාරීන් වෘත්තීය දැනුම ලබා දීම සඳහා විවිධ සාකච්ඡා සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී විය.

- සෞඛ්‍ය අමාත්‍යාංශය - "රථවාහන අනතුරු පිළිබඳ තොරතුරුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දත්ත හුවමාරු කර ගැනීම" පිළිබඳ සාකච්ඡාවට සහභාගී විය.
- ධීවර අමාත්‍යාංශය - ධීවර ප්‍රජාව සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීම/නිර්මාණය කිරීම සඳහා වන කමිටුවක් නියෝජනය කරන ලදී.
- ශ්‍රී ජයවර්ධනපුර රෝහල - වෛද්‍යවරුන්, මාණ්ඩලික නිලධාරීන් සහ කළමනාකරණ සහකාරවරුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය සහ ප්‍රතිපූරණ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

- ආරක්ෂක අමාත්‍යාංශය ආපදා කළමණාකරණ අංශය විසින් සංවිධානය කළ - "පාඩු සහ හානි" සම්බන්ධ වැඩමුළුව නියෝජනය කරන ලදී.

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP)

සාමාන්‍ය රක්ෂණ ඔප්පුවල දක්වා ඇති තොරතුරුවල විනිවිදභාවය සහ පූර්ණත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් සාමාන්‍ය රක්ෂණ ඔප්පු සඳහා මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. රක්ෂණ කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ යෝජනාද එයට ඇතුළත් කර ඇති අතර 2023 දී රක්ෂණ කර්මාන්තය වෙත නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

වෙනත් ක්‍රියාකාරකම්

- රක්ෂණ සමාගම්වල රක්ෂණ ඔප්පු හිමියන්ගේ පැමිණිලි විසඳීමේ ක්‍රියා පටිපාටියේ අන්තර්ගතය සමාලෝචනය කරන ලද අතර රක්ෂණ ඔප්පු හිමියන්ට අදාළ රක්ෂණ සමාගම වෙත පැමිණිලි කිරීමට පහසු ප්‍රවේශයක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ සියලුම රක්ෂණ සමාගම්වල පාරිභෝගික පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිවල වෙබ් සබැඳි ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදා ඇත.
- ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල හිමිකම් පෑමේ සංඛ්‍යාලේඛන විශ්ලේෂණය කිරීමට කටයුතු යොදා ඇති අතර ජීවිත රක්ෂණ හිමිකම් පෑම් පිළිබඳ සංඛ්‍යාලේඛන ඊ-පුවත් ලිපියේ දෙවැනි සංස්කරණයේ ප්‍රකාශයට පත් කරන ලදී.
- රක්ෂණ යෝජනා ආකෘති පත්‍ර හරහා රැස් කරන ලද තොරතුරු විධිමත් කිරීම සඳහා මෝටර් රථ රක්ෂණ ඔප්පුවල යෝජනා ආකෘති සමාලෝචනය කරන ලද අතර කොමිෂන් සභාවේ තාක්ෂණික අනුකමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

වෙනත් කටයුතු

මහජන විමසුම් සඳහා ප්‍රතිචාර

සමාලෝචිත වර්ෂය තුළ, රක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තොරතුරු සහ මගපෙන්වීම් ඉල්ලා සාමාන්‍ය ජනතාව, රක්ෂණ ඔප්පු හිමියන් සහ වෙනත් විවිධ පාර්ශ්වකරුවන් වෙතින් විමසීම් රාශියකට කොමිෂන් සභාව පිළිතුරු ලබා දී ඇත.

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනයේ විශේෂ අවස්ථා/ වසර තුළ සිදු වූ දෑ

ප්‍රකාශන හා සිදු කරන ලද ක්‍රියාකාරකම්හි ඡායාරූප

පුවත්පත් නිවේදන සහ දැන්වීම්



වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

ඊ-පුවත්ලිපි

NEWSLETTER
THE INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA
INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA
APRIL 2022
ISSUE 3

IN THIS ISSUE

Policyholders' Rights 01-02
Be A Smart Policyholder........ 03
Recent Regulatory Developments........ 04

IMPORTANCE OF POLICYHOLDER RIGHTS & DUTIES

It is vital that policyholders are aware of their rights and duties to avoid difficulties and dissatisfaction throughout the insurance process. A smart policyholder needs to be aware of their rights regarding policy benefits and conditions. Knowing their rights and fulfilling their duties will ensure satisfactory insurance coverage and give the policyholder peace of mind at the time of claiming under the policy. The IRCSL, in this newsletter, mainly focuses on creating awareness on important facts that will help create informed policyholders.

POLICYHOLDERS' RIGHTS

1. YOU HAVE A RIGH

- You can obtain clarificatio is unclear or difficult to unders
- The Insurance Compa material facts & all other m

E.g., The status of a

www.ircsl.gov.lk

NEWSLETTER
THE INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA
December 2022
ISSUE 04

IN THIS ISSUE

1. Insurance Awareness Month

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

සමාජ මාධ්‍ය

පරිපාලනමය සමාලෝචනය

කාර්ය මණ්ඩලය

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන් රඳා පවතින්නේ එහි ක්‍රියාකාරීත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. කොමිෂන් සභාවේ සාර්ථක උපක්‍රමවල කශේරුව වන්නේ අපගේ මානව සම්පත් බැව් අප විශ්වාස කරනවා.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, වර්තමාන රක්ෂණ ඔප්පු හිමියන්ගේ හා අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයෙන් කරගෙන යනු ලබන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය මූලික කාර්යයන් හඳුනා ගනිමින් කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය සකස් කර ඇත.

සමාලෝචිත වර්ෂය තුළ මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා නිසි කලට අවශ්‍ය වෘත්තිකයන් බඳවා ගැනීම මගින් කොමිෂන් සභාව ප්‍රධාන මූලාරම්භයන් කිහිපයක් ගෙන ඇත. එම කටයුතු සාර්ථක කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ සහකාර අධ්‍යක්ෂවරියක් බඳවා ගනු ලැබීය. 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය 46ක් විය.

සේවා නියුක්තියේ ස්ත්‍රී පුරුෂ සංයුතියේ පැතිකඩ

46ක් වූ මුළු සේවා නියුක්ති සංයුතියෙන් 31 දෙනෙකු කාන්තාවන් වන අතර එය මුළු සේවා නියුක්තියෙන් 67% ක් වේ.



කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

සේවක සංඛ්‍යාව	අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහිත සේවකයන් සංඛ්‍යාව					
	පශ්චාත් උපාධිය, ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම්	පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම්	පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය	ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම්	ප්‍රථම උපාධිය	වෘත්තීය සුදුසුකම්
46	11	04	07	04	08	01

පුහුණු කිරීම

ආයතනික අරමුණු ළඟා කර ගැනීම සඳහා දැනුම සහ වෘත්තීය නිපුණතාවන් කෙරෙහි යොමු වීම ප්‍රධාන වේ. වෙබ් අඩවිය හරහා වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ (webinars) ඇතුළුව කාර්ය මණ්ඩලය සඳහා වසර තුල පුද්ගලික සහ මාර්ගගත පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

කාර්ය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් කොමිෂන් සභාව විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත් ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තවද, කොමිෂන් සභාවේ සුභසාධක සංගමය විසින් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වාර්ෂික සුහද හමුවක් පවත්වන ලදී.

මූල්‍ය සමාලෝචනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF)

කොමිෂන් සභාව විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF) වෙනුවෙන් එකතු වන මුදල (සෙස්) විචක්ෂණශීලීව ආයෝජනය කළ ද 2022 දී පොළී අනුපාතය වේගයෙන් ඉහළ යාම හේතුවෙන් සමස්ථ පොළී ආදායම ඉහළ ගියේය. 1 ප්‍රස්තාරය මගින් 2018 සිට 2022 දක්වා රැස් කළ සෙස් බදු මුදල සහ ආයෝජන ආදායම පෙන්නුම් කෙරේ. ආර්ථික අස්ථාවරත්වය මධ්‍යයේ වුව ද සෙස් ආදායම ඉහළ යාමක් වාර්තා කර ඇත.

1 ප්‍රස්තාරය

2018 -2022 කාල පරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම



	2018	2019	2020	2021	2022
සෙස් ආදායම (රු. මිලියන)	479	493	506	544	588
ආයෝජන ආදායම (රු. මිලියන)	455	574	622	516	1236

1 වන ප්‍රස්තාරයෙන් පසුගිය වසර පහ තුළ සෙස් ආදායම වර්ධනය වූ ආකාරය නිරූපණය වේ. වාසිදායක වෙළඳපොළ තත්වයන්ගේ බලපෑම හේතුවෙන් 2018 සිට 2020 දක්වා ආයෝජන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ නමුත් 2021 වසරේ දී පොළී අනුපාතය කැපී පෙනෙන අන්දමින් පහත වැටුණු අතර එම වසරේ වැඩි කාලයක් එලෙස අඩු මට්ටමක පැවතිණි. ආයෝජන ආදායම 2022 ජූලි සිට දෙසැම්බර් දක්වා ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කර ඇත්තේ 2022 දී පොළී අනුපාතිකය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් 2022 වසරේ වැඩිපුර කාල සීමාවක් තුළ එය ඉහළ මට්ටමක පැවති බැවිණි.

පසුගිය වසර පහ තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය ඉහළ ගිය අතර 2 ප්‍රස්තාරය මගින් එය පෙන්නුම් කරයි. දිගුකාලීන ආයෝජන සඳහා වැඩි පොළී අනුපාත සහ 2020 දක්වා කොමිෂන් සභාව වෙතින් වන ශුද්ධ අතිරික්ත මාරු කිරීම් අරමුදලේ ස්ථාවර වර්ධනයට දායක විය.

2 ප්‍රස්තාරය

2018 - 2022 දක්වා කාලපරිච්ඡේදය තුල රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම



	2018	2019	2020	2021	2022
අරමුදලේ වටිනාකම (රු. මිලියන)	5,043	6,253	7,469	8,441	9,381

2022 දෙසැම්බර් 31දිනට අරමුදලේ වත්කම් සංයුතිය පහතින් දැක්වේ

3 ප්‍රස්තාරය

2022 දෙසැම්බර් 31 දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය



මූල්‍ය සමාලෝචනය

කොමිෂන් සභාවේ ආදායම

කොමිෂන් සභාවේ ආදායම පහත මූලාශ්‍ර වලින් ජනනය වේ:

- රක්ෂකයින්, රක්ෂණ තැරැව්කාර සමාගම් සහ අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචිය සඳහා අය කරන ලියාපදිංචි කිරීමේ ගාස්තුව
- රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තුව
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් අය කරන ගාස්තුව
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොළී ආදායම

2018 සිට 2022 දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 ප්‍රස්තාරය මගින් දැක්වේ

4 ප්‍රස්තාරය
2018 - 2022 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ ආදායම



	2018	2019	2020	2021	2022
වාර්ෂික ගාස්තු (රු. මිලියන)	168	224	245	258	291
ලියාපදිංචි හා ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු (රු. මිලියන)	8	14	14	15	17
වෙනත් ආදායම (රු. මිලියන)	8	16	13	13	59
ප්‍රදාන හඳුනාගැනීම (රු. මිලියන)	2	84	16	0	0
මුළු ආදායම (රු. මිලියන)	186	339	288	286	367

කොමිෂන් සභාවේ වියදම

2018 සිට 2022 දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ මුළු වියදම 5 වැනි ප්‍රස්තාරය මගින් දැක්වේ

5 ප්‍රස්තාරය
2018 -2022 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ මුළු වියදම



	2018	2019	2020	2021	2022
මුළු වියදම (රු. මිලියන)	143	188	178	200	212

සංයුක්ත පාලනය පිළිබඳ වාර්තාව

කොමිෂන් සභාව ආයතනික පාලනයේ උසස් ප්‍රමිතීන් තහවුරු කිරීමට කැපවී සිටින අතර එය ආයතනයේ පූර්ණත්වය සහ සංවිධානය කෙරෙහි පාර්ශවකරුවන්ගේ විශ්වාසය පවත්වා ගැනීමට ඉතා වැදගත් යැයි සලකයි. කොමිෂන් සභාව එහි වැඩ ආචාරධර්ම, එහි වටිනාකම් සහ අඛණ්ඩව වැඩිදියුණු කෙරෙන වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ශක්තිමත් රාමුවක් අනුමත කිරීම තුළින් පිළිබිඹු වන යහපාලන සංස්කෘතියක් ඇති බව සහතික කරයි.

සංයුක්ත පාලන රාමුව

බාහිර නිර්ණායක සහ අභ්‍යන්තර නිර්ණායකවලින් නියාමනය වන පසුබිමක සෑම මට්ටමකම ස්වාධීනත්වය සහ විනිවිදභාවය සහතික කරමින් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කළ ශක්තිමත් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ කාර්යක්ෂම යාන්ත්‍රණයක් සහිත ගතික අභ්‍යන්තර සහ බාහිර සංයුක්ත පාලන රාමුවක් කොමිෂන් සභාව විසින් භාවිතා කරනු ලැබේ.

කොමිෂන් සභාව

පාර්ශවකරුවන්ගේ අඛණ්ඩ තෘප්තිය සහතික කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් උපායමාර්ගික සැලැස්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සංයුක්ත පාලනය කෙරෙහි වූ කොමිෂන් සභාවේ කැපවීම අත්‍යවශ්‍ය අංගයකි.

සංයුක්ත පාලනයේ මූලිකයා ලෙස කොමිෂන් සභාවේ සියලුම සාමාජිකයින් විශේෂ අවධානයක් යොමු කොට රැස්වීම්වලට සහභාගී වීමට සහ උපාය මාර්ග, කාර්ය සාධනය, අවදානම් කළමනාකරණය, පාලනය සහ වෙළඳපළ චර්යාව සම්බන්ධ කාරණා වලට අදාළව ස්වාධීන විනිශ්චයක් ලබා දීමට කාලය වෙන් කරති.

කොමිෂන් සභාවේ සංයුතිය

රක්ෂණය, නීතිය, ගිණුම්කරණය සහ මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණ උපදේශනය, අලෙවිකරණය, තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් කළමනාකරණය ඇතුළු විවිධාංගීකරණය වූ ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ කුසලතා සහිත සුදුසුකම් ලත් වෘත්තිකයන් හත් දෙනෙකුගෙන් (7) කොමිෂන් සභාව සමන්විත වේ. කොමිෂන් සභාවේ සාමාජිකයින් හත් දෙනා අතරින් සාමාජිකයින් තිදෙනෙකු නිල බලයෙන් පත් වූ සාමාජිකයින් වන අතර ඔවුන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මහ බැංකු නියෝජ්‍ය අධිපති සහ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වේ. මේ අනුව, ගතික ව්‍යාපාරික පරිසරයක් තුළ තරඟ කිරීමේ හැකියාව මනා සමබරතාවකින් යුතු කොමිෂන් සභාවක් මගින් සහතික කෙරේ.

කොමිෂන් සභා අනු කමිටු

කොමිෂන් සභාව විසින් එහි ඇතැම් කාර්යයන් කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් සමන්විත අනු කමිටු වෙත පවරා ඇති අතර එම අනු කමිටු විෂය පථයට අයත් අදාළ විෂය කරුණු පිළිබඳ ඔවුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද හොඳින් ඇගයීමෙන් පසුව ඔවුන් එම කමිටු සඳහා පත් කරනු ලැබේ. මෙමගින් කොමිෂන් සභාවට තම විෂය පථය තුළ ඇති කාරණා සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කිරීමට හැකියාව ලැබේ. සෑම කමිටුවක්ම සිය බලතල අනුව තමන්ට පැවරී ඇති රාජකාරි ඉටුකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු අතර කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

මේ අනුව, කොමිෂන් සභාවට වටිනාකමක් සහ විනිවිදභාවයක් එක් කිරීමට කමිටු වගබලා ගත යුතුය. කොමිෂන් සභා රැස්වීම්වලදී අදාළ කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳව කමිටු විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කරන අතර කමිටුවල ඵලදායී ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වගකිව යුතුය.

වර්ෂය තුළ පහත කොමිෂන් සභා අනු කමිටු ක්‍රියාත්මක වී ඇත.

- විගණන කමිටුව
- තාක්ෂණික අනු කමිටුව
- මානව සම්පත් කළමනාකරණ සහ බඳවා ගැනීම් අනු කමිටුව

පහත වගුවේ දැක්වෙන්නේ කොමිෂන් සභාවේ සහ කාරක සභා රැස්වීම්වල පැමිණීම:

කොමිෂන් සාමාජිකයාගේ නම	අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම	විගණන කමිටුව	තාක්ෂණික අනු කමිටුව	මානව සම්පත් කළමනාකරණ සහ බඳවා ගැනීම් අනු කමිටුව
1. රසික් සරූක් මහතා	15/15	-	-	-
2. ආර්.එම්.පී. රත්නායක මහතා (2022.03.01 දින දක්වා සාමාජික)	05/05	01/01	01/01	-
3. ඒ.කේ. සෙනෙවිරත්න මහතා (2022.08.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි)	03/04	03/03	-	-
4. ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය	15/15	04/04	12/12	-
5. සංජීව දිසානායක මහතා	11/15	-	-	04/04
6. හරීස් සල්පිටිකෝරාල මහතා	14/15	04/04	12/12	04/04
7. රාජා ගුණරත්න මහතා	14/15	-	07/12	04/04
8. ඉන්ද්‍රා බදුගේ මෙනවිය	13/15	01/01	11/12	-

අධ්‍යක්ෂ ජනරාල්ගේ භූමිකාව

අධ්‍යක්ෂ ජනරාල් යනු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහාය ඇතිව එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීමේ වගකීම දරයි. කොමිෂන් සභාවේ සාමාන්‍ය මග පෙන්වීම සහ පාලනයට යටත්ව එහි බලතල, කර්තව්‍යයන් සහ රාජකාරි ක්‍රියාවට නැංවීමේ සහ කාර්ය මණ්ඩලය පරිපාලනය සහ පාලනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී ඇත.

විගණන කමිටුවේ වාර්තාව

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ප්‍රඥප්තියට අනුකූලව විගණන කමිටුව ස්වාධීනව සහ අපක්ෂපාතීව සිය රාජකාරි ඉටු කර ඇත. මෙම ප්‍රඥප්තිය රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ආයතන සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවලට සහ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වත්මන් ව්‍යාපාරික ප්‍රමුඛතාවලට අනුකූල වේ. නියාමකයාගේ දිගුකාලීන තිරසාර ක්‍රියාකාරීත්වය සඳහා පාලනය, අඛණ්ඩතාව, ආචාර ධර්ම, වගවීම සහ විනිවිදභාවය යනාදියෙන් යුක්ත ශක්තිමත් සංස්කෘතියක් වෙනුවෙන් විගණන කමිටුව පෙනී සිටී.

විගණන කමිටුව 2022.03.11 දක්වා කොමිෂන් සභා සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත විය. ඉන් පසුව, එය භාණ්ඩාගාර මාර්ගෝපදේශවලට අනුව කොමිෂන් සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. සාමාජිකයින්ට ඒකාබද්ධ කුසලතා සහ මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර පිළිබඳ විශේෂඥ දැනුම ඇත. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විගණන කමිටුවේ සභාපතිවරයා වේ.

කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර පහත පරිදි වේ:

නම	විගණන කමිටුවේ තනතුර	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ තනතුර	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ තනතුර
ආර්.එම්.පී රත්නායක මහතා	සභාපති	01.01.2022 සිට 01.03.2022	නිල බලයෙන් පත් වූ සාමාජික
සමන් ප්‍රනාන්දු මහතා	සභාපති	11.03.2022 සිට 15.08.2022	නිල බලයෙන් පත් වූ සාමාජික
ඒ.කේ. සෙනෙවිරත්න මහතා	සභාපති	26.08.2022 සිට 31.12.2022	නිල බලයෙන් පත් වූ සාමාජික
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය	සාමාජික	01.01.2022 සිට 31.12.2022	නිල බලයෙන් පත් වූ සාමාජික
හරිස් සල්පිටිකෝරාල මහතා	සාමාජික	01.01.2022 සිට 31.12.2022	සාමාජික
ඉන්ද්‍රා බදුගේ මෙනවිය	සාමාජික	01.01.2022 සිට 11.03.2022	සාමාජික

සාමාජිකයින් පිළිබඳ විස්තර 2022 වාර්ෂික වාර්තාවේ 18 සිට 19 2022 දී, විගණන කමිටුව විසින් සියලුම සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් හතරක් (04) රැස් කරන ලදී.

2022 වර්ෂය තුළ විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත සාරාංශගත කර ඇත.

1. මූල්‍ය වාර්තා සමාලෝචනය:

ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මත පදනම් වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද කාර්තුමය වාර්තා සහ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වැදගත් තොරතුරු කලමනාකාරීත්වය සහ බාහිර විගණක සමග එක්ව විගණන කමිටුව මගින් සමාලෝචනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය, මූල්‍ය ප්‍රකාශනවලට බලපෑ සැලකිය යුතු ගැලපීම්, ගිණුම්කරණ ක්‍රමවල ප්‍රමාණවත් බව සහ යෝග්‍යතාව, අභ්‍යන්තර පාලනයන් ඇගයීම, මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා අදාළ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව අනාවරණය කරන තොරතුරුවල නිවැරදි බව සහ ප්‍රමාණවත් බව පිළිබඳව විගණන කමිටුව විසින් බාහිර විගණකවරයා සමග සාකච්ඡා කරන ලදී.

බාහිර විගණකවරුන්ගේ උපදෙස් පරිදි, කොමිෂන් සභා අරමුදල සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල සඳහා සකස් කළ මූල්‍ය ප්‍රකාශන කට්ටල දෙකක් ඒකාබද්ධ කර, 2 වැනි විගණන කමිටු රැස්වීමට අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී.

2. අභ්‍යන්තර පාලන පද්ධතිය සහ අනුකූලතා පිළිබඳ සමාලෝචනය:

2020 වසර සඳහා අභ්‍යන්තර විගණන වාර්තාව සමාලෝචනය

විගණන කමිටුව විසින් 2020 වසර සඳහා වන අභ්‍යන්තර විගණන වාර්තාව එහි 2 වැනි රැස්වීමේදී සමාලෝචනය කරන ලදී. මෙම වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ බේකර්ටිලි එදිරිසිංහ සහ සමාගම විසිනි. එම වාර්තාව කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා කමිටුව විසින් නිර්දේශ කර ඇත.

2020 සවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පිළිබඳ සමාලෝචනය

3 වන විගණන කමිටු රැස්වීමේදී, විගණකාධිපතිවරයාගේ 2020 සවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව අදහස් සහිතව සාකච්ඡාවට ගන්නා ලදී.

විගණන කමිටුවේ වාර්තාව

3. කෙටුම්පත් අයවැය, කෙටුම්පත් උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සහ කෙටුම්පත් ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ සමාලෝචනය:

- ඉහළ උද්ධමනය සහ මුදල් අවප්‍රමාණය වීම හේතුවෙන් 2022 වර්ෂය සඳහා වන අයවැය සංශෝධනය විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.
- 4 වන විගණන කමිටු රැස්වීමේදී, අයවැය කෙටුම්පත, කෙටුම්පත් උපාය මාර්ගික සැලැස්ම 2023-27, ක්‍රියාකාරී සැලැස්ම, කෙටුම්පත් ප්‍රසම්පාදන සැලැස්ම සහ 2023 වර්ෂය සඳහා මූල්‍ය අධිකාරය පැවරීම සමාලෝචනය කර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

4. අදාළ පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ සමාලෝචනය:

විගණන කමිටුව විසින් අදාළ පාර්ශ්ව ගනුදෙනු නිරන්තරයෙන් සමාලෝචනය කරන ලදී.

5. මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය හරහා පත් කරන ලද උපදේශක ජීවගණකවරයාගේ කාර්යයභි තත්ත්වය සමාලෝචනය කිරීම:

1 වන විගණන කමිටු රැස්වීමේදී සාමාජිකයින් විසින් විගණන කමිටුවේ සාකච්ඡාව සඳහා ඉදිරිපත් කරන ලද ආයුගණක පැවරුමේ තත්ත්වය සමාලෝචනය කරන ලදී.

මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවත් අදාළ පාර්ශ්ව ගනුදෙනු සාමාන්‍ය ව්‍යාපාර තත්වයන්ගෙන් ඈත්ව පවතින බවත් අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණන පද්ධති ප්‍රමාණවත් සහ ඵලදායී වන බවත් මෙහෙයුම් ඊට සම්බන්ධ රෙගුලාසිවලට සම්පූර්ණයෙන්ම අනුකූල බවත් විගණන කමිටුවේ අදහස විය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ විගණන කමිටුව සඳහා සහ ඒ වෙනුවෙන්

ඒ.කේ. සෙනෙවිරත්න මහතා
විගණන කමිටුවේ සභාපති
2023 සැප්තැම්බර් මස 14 වැනිදා

මූල්‍ය තොරතුරු

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. INF/B/05/IRCSL/AR/2022 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 18 August 2023

සභාපති
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රතිපත්ති වලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ මතය අනුව මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා වන පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍රා.) අනුව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වන මගේ වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විගණකාධිපති වාර්තාව

1.3 කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය මගින් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිඳු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේ දී ලබාගත් මාගේ දැනුමට ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න හෝ ප්‍රමාණාත්මකව සාවද්‍ය ලෙස ප්‍රකාශ කර ඇත්ද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇති බව මා නිගමනය කරන්නේ නම්, එය නිවැරදි කිරීම සඳහා පාලනය සම්බන්ධයෙන් වගකීම දරණ පුද්ගලයන්ට එම කාරණය දැනුම් දිය යුතුය. තව දුරටත් නිවැරදි නොකළ ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශන තිබේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව ඒවා මාගේ වාර්තාවට ඇතුළත් කළ යුතු අතර එය නියමිත වේලාවට පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ සහ පාලනයට සම්බන්ධ පුද්ගලයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක වන සාවද්‍ය ප්‍රකාශනවලින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තියට අනුව, කොමිෂන් සභාව වාර්ෂික හා කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි සිය සියලු ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

විගණකාධිපති වාර්තාව

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙලිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

විගණකාධිපති වාර්තාව

මාගේ විගණනයේ දී මා හඳුනා ගත් අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු අඩුපාඩුවක් ඇතුළුව, වෙනත් කාරණා අතර, සැලකිය යුතු විගණන සොයා ගැනීම් පිළිබඳ මම පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් දැනුවත් කරමි.

2. **වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතට පහත අවශ්‍යතා සඳහා විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මාගේ අධ්‍යයනය තුළින් හැකි පමණ මා ලබාගෙන ඇති අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාව අනුව කොමිෂන් සභාව විසින් නිසි ගිණුම්කරණ වාර්තා තබා ගෙන ඇත.

2.1.2 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මූල්‍ය ප්‍රකාශන පෙර වසරට අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මූල්‍ය ප්‍රකාශනවලට ඉකුත් වර්ෂයේදී මා විසින් ලබාදෙන ලද නිර්දේශ ඇතුළත්ව ඇත.

2.2 ක්‍රියාවට නංවන ලද ක්‍රියා පරිපාටි මත පදනම් වූ බැවින් සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණුවලට පමණක් සීමා වූ බැවින් මාගේ අවධානයට කිසිවක් ලක් වී නැත;

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැර වන කොමිෂන් සභාව විසින් ඇති කර ගන්නා ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2 පහත දැක්වෙන කරුණු හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියට අනුව කොමිෂන් සභාවේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධාන වලට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර නොමැති බව ප්‍රකාශ කිරීම;

	නීති රීති / විධානයට යොමුව	විස්තරය
(අ)	2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අතිරික්තය සඳහා ආදායම් බදු ගෙවීමට කොමිෂන් සභාව බැඳී සිටී. කෙසේ වුවද, කොමිෂන් සභාව 2018 සිට ආදායම් බදු ගෙවා තිබුනේ නැත. එබැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018/19 සිට 2022/23 දක්වා තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු නොගෙවීම සම්බන්ධයෙන් දඩ මුදලක් සහ පොළියක් අය කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ බදු වගකීම රු. 909,009,476 ක් විය.

විගණකාධිපති වාර්තාව

(ආ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.2.2 (අ)(i)	කොමිෂන් සභාවේ රැස්වීම්වලදී නිසි පරිපාටීන් අනුගමනය කරන බවට සභාපතිවරයා වගබලා ගත යුතුය. කෙසේ වුවද, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 4 (3) ඡේදය සහ පළමු උපලේඛනය අනුව රැස්වීම් කටයුතු සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් විගණනයට ලබා දී නොමැත.
(ඇ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.2.2 (ආ) (vi)	කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල් සමග කාර්යසාධන ගිවිසුමකට එළඹිය යුතු අතර එය උපායමාර්ගික සැලැස්මේ පිළිබිඹුවක් වේ. තවද, ඊට අදාළව අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්ය සාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කර ප්‍රසාද දීමනා ඇතුළු දිරිගැන්වීම් තීරණය කළ යුතුය. කෙසේ වුවද, කොමිෂන් සභාව අධ්‍යක්ෂ ජනරාල් සමග කාර්යසාධන ගිවිසුමකට එළැඹ තිබුණේ නැත. තවද, අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්ෂික කාර්යසාධන ඇගයීම කොමිෂන් සභාව විසින් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. ඒ වෙනුවට, එය සභාපතිවරයා විසින් පමණක් සිදු කර සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන දිරි දීමනා ගෙවා ඇත. කොමිෂන් සභාවේ බලගතු තනතුරු දෙකක් අතර වගකීම් සහ වගවීම බෙදීයාම දුර්වල තත්වයකට පත් වීමට හේතු විය හැක.
(ඈ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.4	කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තනි තනිව තම සම්බන්ධතාව වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා වෙත මාර්ගෝපදේශයේ ඇමුණුම ii හි දක්වා ඇති ආකෘතිය භාවිතා කරමින් ප්‍රකාශ කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එවැනි ප්‍රකාශයක් කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ප්‍රකාශයට පත් කර නොතිබුණි.
(ඉ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.6	මණ්ඩල ලේකම්වරයා ප්‍රධාන වශයෙන් මණ්ඩලයට එහි වගකීම් ඉටුකිරීම සම්බන්ධයෙන් මග පෙන්වීම සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ කර්මාන්තයේ හොඳම භාවිතයන්ට අනුකූලව සියලුම ක්‍රියා පටිපාටි අනුගමනය කරන බවට සහතික විය යුතු අතර මාර්ගෝපදේශයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් තිබිය යුතුය. තවද, දැනටමත් වෙනත් කාර්යයක නිරතව සිටින කිසියම් සේවකයෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත් නොකළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් මණ්ඩල අනුකමිටු ලේකම් ලෙස කටයුතු කළ යුතුය. නමුත් කොමිසමට සුදුසුකම් ලත් ලේකම්වරයෙකු නොමැත. මාර්ගෝපදේශයට පටහැනිව සිය ස්ථිර වගකීම්වලට අමතරව දැනට අධ්‍යක්ෂ - විමර්ශන කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙසත් සහකාර අධ්‍යක්ෂ - නීති විගණන කමිටුවේ ලේකම්වරයා ලෙසත් කටයුතු කරයි.

විගණකාධිපති වාර්තාව

(ඊ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 4.2 (ඈ)	රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හට විගණන කමිටුවේ නිරීක්ෂකයා ලෙස කටයුතු කළ හැකිය. කෙසේ වුවත්, 2022 වසර සඳහා වන විගණන කමිටු වෙත රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හට ආරාධනා කර නොතිබුනි.
(උ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 4.2 (ඌ)	විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් රැස් විය යුතුය. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාව විසින් විගණන කමිටු නිතිපතා පවත්වා නොමැති බව නිරීක්ෂණය විය. මෙය ප්‍රධාන වශයෙන් සිදුවූයේ මාර්ගෝපදේශ 2.6 වගන්තිය අනුව අවශ්‍ය සුදුසුකම් සහිත මණ්ඩල ලේකම්වරයා කොමිෂන් සභාව වෙත නොමැති වීමයි.
(ඌ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7වැනි වගන්තිය	විධායක කාණ්ඩයේ සේවකයින් සඳහා වාහන මිලදී ගැනීමට බැංකු හරහා ණය ලබාදීමට ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ සේවකයෙකු හට රු. 1,200,000 ක වාහන ණයක් කොමිෂන් සභා අරමුදල්වලින් රු. 600,000 කොටස් සඳහා පිළිවෙළින් සියයට 4.2 ක් සහ සියයට 9 ක පොලී අනුපාතයකට ලබා දී තිබුණි.
(එ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වන වගන්තිය	සෑම විගණන ආයතනයකටම තමන්ගේ අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු අතර ඔහු එවැනි විගණන ආයතනයක පාලන මණ්ඩලය විසින් නිසි පරිදි පත්කරන ලද අභ්‍යන්තර විගණනයන් සිදු කල යුතුය. (1) උපවගන්තිය යටතේ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති නම් මෙම පනත ක්‍රියාත්මක වූ දින සිට වසර දෙකක් නොඉක්මවන කාල සීමාවක් තුල එම පත්කිරීම සිදු කල යුතුය. කෙසේවෙතත් සමාලොචිත වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.
(ඒ)	2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3 වැනි වගන්තිය	සියලු අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ බලධාරීන් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් බඳවා ගැනීමෙන් සහ වැටුප් හා සේවක සංඛ්‍යාව වැඩි කිරීමෙන් වළකින ලෙස එම චක්‍රලේඛවලින් උපදෙස් ලබා දී ඇත. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව එක් (01) අධ්‍යක්ෂ තනතුරක්, කළමනාකාර/සහකාර කළමනාකාර තනතුරු දහතුනක් (13) සහ එක් (01) ලේකම් තනතුරක් පුරවා ඇත.

විගණකාධිපති වාර්තාව

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තිය අනුව කොමිෂන් සභාව පහත දෑ හැර කිසිවක් එහි බලතල, කාර්යයන් සහ රාජකාරී අනුව ඉටු කර නොමැති බව;

(අ) 2010 වසරේ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කාර්ය සාධන දිරි දීමනාවක් ගෙවා තිබුණි.

(ආ) 2019 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව දිරි දීමනාව ගෙවීමේ පදනම වූ මාස එකක (01) මූලික වැටුප මාස එකහමාරක (1 1/2) දළ වැටුප ලෙස වෙනස් කර ඇත. මේ හේතුවෙන් මුළු දිරි දීමනාව රු. 14,605,381 කින් ඉහළ ගොස් ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 105% වැඩි වීමකි. තවද, අවසාන ඇගයීම සඳහා සියලුම සේවකයින් සියයට 100 ලකුණු ලබා ගෙන තිබුණි. එබැවින් කොමිෂන් සභාව මගින් යථාර්ථවාදී කාර්යසාධන ඇගයීමක් සිදු කර ඇති බවක් නොපෙනේ.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තිය ප්‍රකාරව පහත නිරීක්ෂණ හැර අදාළ නීතිවලට අනුකූලව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීම;

(අ) කොමිෂන් සභාවේ නිල කටයුතු බාහිර ගොඩනැගිල්ලක සිදු කරන ලද අතර ගොඩනැගිල්ල සඳහා බදු කුලිය ලෙස 2022 වර්ෂයේ දී රු. 47,178,758 (2021-44,631,663) ගෙවන ලදී. පසුගිය වසරට සාපේක්ෂව බදු කුලිය සියයට 6 කින් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය. කොමිෂන් සභාව වර්ග අඩි 8,741 කුලියට ගෙන ඇති අතර වර්ග අඩියකට කුලිය සහ සේවා ගාස්තු ලෙස පිළිවෙලින් රු. 351 සහ රු. 78 කුලී සහ සේවා ගාස්තු වශයෙන් ගෙවා ඇත. තවද, ගොඩනැගිල්ලේ බදු කුලී ප්‍රතිශතය 2022 වර්ෂය සඳහා මුළු වියදමෙන් සියයට 22 ක් හෝ මුළු ආදායමෙන් සියයට 13 ක් නියෝජනය කළේය.

(ආ) කොමිෂන් සභාව 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත ප්‍රකාරව එහි කාර්යභාරය ඉටු කිරීමේ දී මහජනතාව සමග සමීපව කටයුතු කළ යුතු ආයතනයක් විය යුතුය. කෙසේ වෙතත්, එහි වත්මන් පිහිටීම, සංස්කෘතිය සහ ඇතුල්වීමේ දොරටු දැඩි ආරක්ෂක මධ්‍යයේ පැවතීම සාමාන්‍ය ජනතාවට ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇති කරයි. තවද, ඔවුන්ගේ වෙබ් අඩවිය සහ සියලුම තොරතුරු (රක්ෂණ ඔප්පු හිමියන්ගේ පැමිණිලි පිටුව හැර) ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV පරිච්ඡේදයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කර නොතිබුණි. එබැවින්, ආබාධ සහිත කණ්ඩායම්, තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව නොමැති සහ භාෂා ප්‍රශ්න ඇති පුද්ගලයින් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට කොමිෂන් සභාවේ සේවය ලබා ගැනීම ඉතා දුෂ්කර විය හැකි බව පෙනේ.

විගණකාධිපති වාර්තාව

2.3 වෙනත් කරුණු

(අ) රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම (ICPs) යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) විසින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. රක්ෂණ නියාමකයින්ගේ නියාමන සහ අධීක්ෂණ කාර්යයේ ගුණාත්මක භාවය තක්සේරු කිරීමට සහ රට තුළ රක්ෂණ ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි හඳුන්වාදීමේ රාමුවක් ලෙස භාවිතා කිරීමට එම මූලධර්ම වැදගත්වේ. රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමයෙහි සාමාජිකයෙකු ලෙස කොමිෂන් සභාව විසින් 2022 වසර සඳහා සාමාජික ගාස්තු ලෙස රු. 5,999,664 ගෙවා ඇත. කොමිෂන් සභාව විසින් රක්ෂණයේ ප්‍රධාන මූලධර්මවලට අනුකූල වන ආකාරය හඳුනා ගැනීම සඳහා 2021 විගණනයේ දී තොරතුරු ඉල්ලා තිබුණි. කෙසේ වුවද, ඉල්ලා සිටි තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් 2020 දක්වා අදාළ වර්ෂ සඳහා කොමිෂන් සභාවේ අරමුදල්වල අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කර ඇත. කෙසේ වුවද, 2021 වර්ෂයේදී මෙම ප්‍රතිපත්තිය හදිසියේ වෙනස් කර ඇති අතර කොමිෂන් සභාවේ අරමුදල් අතිරික්තය සමුච්චිත අරමුදල ලෙස ඉදිරියට ගෙන ගොස් ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය

i. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අධීක්ෂණය මත ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම සඳහා ඇ.ඩො. 945,450 (වි. ඇ.අ. 0.67) වෙන් කර තිබුණි. නමුත් මෙම මුදල් මේ සඳහා යොදවා තිබුණේ නැත.

ii. ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂඥයින් සහ උපදේශකයින්ගේ වැඩ කටයුතු එකිනෙකට සම්බන්ධ විය යුතුය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකයින් වරින් වර බඳවා ගෙන තිබූ අතර ව්‍යාපෘතියේ පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එම උපදේශකයින් අතර දැඩි අන්තර් සම්බන්ධතාවක් දක්නට නොලැබුණු බව නිරීක්ෂණය විය. මෙම දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගෙන නොතිබුණු අතර අවසානයේ ව්‍යාපෘතිය නවතා දැමීමට සිදු විය.

විගණකාධිපති වාර්තාව

iii. ආයුගණක උපදේශකවරයා, 2022 මාර්තු 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඔහුගේ කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. 2022 ජනවාරි 24 දිනට ආයුගණක උපදේශකවරයාගේ "රක්ෂණ (ආයුගණක) ව්‍යාපෘතියේ උපදේශක ඇගයීම" නම් වූ වාර්තාවට අනුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හේතු වූයේ තම නිර්දේශ සඳහා කළමනාකාරිත්වය විසින් ලබා දුන් අදහස් ඉදිරිපත් නොකිරීම, ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහ පසු විපරම් කිරීමට කිසිදු පියවරක් නොගැනීම, සංරචක නියාමකයන් සාධාරණ තර්කයන් සමගින් තම යෝජනාවලට ප්‍රතිචාර නොදැක්වීම, මෙම ව්‍යාපෘතිය යටතේ බඳවා ගත යුතු වූ රක්ෂණ විශේෂඥයින්ගෙන් කිසිඳු සහායක් නොලබා කටයුතු කිරීමට ආයුගණකවරයාට සිදු වීම, රක්ෂණ සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සැපයීමට කොමිෂන් සභාව බැඳී සිටියද නිසි පැහැදිලි කිරීමකින් තොරව කොමිෂන් සභාව එම සහාය ලබා දීම මග හැරීම යනාදියයි. ඉහත නිරීක්ෂණ මත පදනම්ව, ආයුගණක උපදේශකවරයා සඳහා ඇ.ඩො. 168,000 ගෙවීම ආර්ථික වශයෙන් වාසිදායක නොවන ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය.

iv. විගණනය සඳහා පවතින තොරතුරුවලට අනුව ආයුගණක උපදේශකවරයා විසින් ලබා දී ඇති වැඩ සැලැස්මට අනුව කිසිදු වාර්තාවක් හෝ සංරචක 3කට අදාළ කාර්යයන් පිළිබඳ වාර්තා කර නොතිබුණි. එබැවින් සංරචක 17 න් සංරචක 14 ක් සඳහා අවසන් සහ කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර තිබුණි. විගණනය සඳහා පවතින විස්තර අනුව එම වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර නියාමක ලෙස අදහස් දැක්වීම, සංවර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධයෙන් වගකිව යුතු අදාළ පාර්ශව සමග එම වාර්තා පිළිබඳ සාකච්ඡා කර ඇති බවට කිසිදු සාක්ෂියක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති විය.

v. වැඩ සැලැස්මට අනුව ආයුගණක උපදේශකවරයා රක්ෂණ උපදේශකවරයා සහ තොරතුරු තාක්ෂණ උපදේශකවරයා වැනි වෙනත් උපදේශකයින් සමග සම්බන්ධ වී කටයුතු කළ යුතුය. එබැවින් එම උපදේශකයින් අතර සම්බන්ධීකරණය කිරීමට කොමිෂන් සභාව ඔවුන්ට පහසුකම් සපයා නොමැති බව අපට නිරීක්ෂණය විය.

vi. මානව සම්පත් උපදේශක වෙත පැවරී ඇති කාර්යයට අනුව, අවසාන කාර්යය වන්නේ උපදේශකයාගේ කාර්යය ඉටු කිරීමේදී සේවාලාභියාගේ අනාගත වර්ධනයන් පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය යටතේ බඳවාගත් අනෙකුත් උපදේශකයින් සමග සම්බන්ධව කටයුතු කිරීමයි. ව්‍යාපෘති ප්‍රගතිය අනුව පත් කර තිබුණේ ආයුගණක උපදේශකවරයා පමණි. මානව සම්පත් උපදේශක හට මෙම ව්‍යාපෘතියේ අනෙකුත් උපදේශකයින් සම්බන්ධ කර ගැනීමට සහ සාකච්ඡා කිරීමට හැකි වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. එබැවින් උපදේශකයන් අතර නිසි සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයක් නොතිබූ බැවින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගත නොහැකි වනු ඇත.

විගණකාධිපති වාර්තාව

vii. නීතිපතිවරයාගේ මතය මත කොමිෂන් සභාව ඔවුන්ගේ සේවක සංඛ්‍යාව සහ වැටුප් ක්‍රමය තීරණය කර තිබිණි. 2019 මැයි 31 දිනැති සංදේශය මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් ගැලපීම, සේවක සංඛ්‍යා සංශෝධනය, රු. 7,800 ක ජීවන වියදම් දීමනාව, මූලික වැටුපෙන් 15% ක් වන නිපුණතා දීමනාව ගෙවීම සහ රු. 12,500 ක් වූ විශේෂ ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ආයතනයක් වුවද තම සේවක සංඛ්‍යාව තීරණය කිරීමට සහ වැටුප් හා දීමනා ඉහළ නැංවීමට කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරයෙන් තහවුරුවක් හෝ එකඟතාව ලබාගෙන නොතිබුණි.

viii. 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන නීතිපතිවරයාගේ මතය මත පදනම්ව 2019 වර්ෂයේදී කොමිෂන් සභාවේ වැටුප් 12.98% සිට 59.73% දක්වා වැඩි කර ඇත. මෙම කාල සීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලද භාණ්ඩාගාර නියෝජිතයා මේ සම්බන්ධයෙන් තම ස්වාධීන මතය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර මහජන යහපත සුරක්ෂිත කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

ix. තම සේවකයන් සඳහා ස්වයං දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. සේවකයින්ගේ දායකත්වයකින් තොරව රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා 2022 වසරේ දී කොමිෂන් සභාව සිය අරමුදල්වලින් රු.මි. 6.3 ක් (2021 - රු.මි. 6.2) වැය කර ඇත. කෙසේ වුවද, 2017 වර්ෂයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා ද මසකට රු. 1,000 ක දායකත්වයක් අය කරමින් ස්වයං දායක රක්ෂණ ක්‍රමය දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය. කොමිෂන් සභාව විසින් වෛද්‍ය රක්ෂණ ආවරණය සඳහා 2022 වර්ෂයේ දී එක් සේවකයකුට රු. 132,038 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
2.2.2.	පහත දැක්වෙන කරුණු හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියට අනුව කොමිෂන් සභාවේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධාන වලට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර නොමැති බව ප්‍රකාශ කිරීම;	
(අ)	2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අතිරික්තය සඳහා ආදායම් බදු ගෙවීමට කොමිෂන් සභාව බැඳී සිටී. කෙසේ වුවද, කොමිෂන් සභාව 2018 සිට ආදායම් බදු ගෙවා තිබුණේ නැත. එබැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018/19 සිට 2022/23 දක්වා තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු නොගෙවීම සම්බන්ධයෙන් දඩ මුදලක් සහ පොළියක් අය කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ බදු වගකීම රු. 909,009,476 ක් විය.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වැනි වගන්තිය යටතේ වර්ගීකරණය කර ඇති අතර ලාභාංශ හෝ පොලියෙන් ලැබෙන ලාභය සහ ආදායම හැර වෙනත් ලාභය සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කෙරිණි. කෙසේ වුවද, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හඳුන්වාදීමත් සමග එම නිදහස් කිරීම ඉවත් කරන ලදී. ඉහත කරුණ සහ ඒ කෙරෙහි වන බලපෑම සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඇත. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ පොළී ආදායම මත බද්ද, දඩය සහ පොළිය සමග ගෙවීමට 2023.01.19 සහ 2023.02.17 ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පහත ඇගයීම් ලැබී ඇත. **ඇගයුම් වර්ෂය — දඩය — පොළිය** 2018/19 — 25,752,129 — 79,187,797 2019/20 — 36,757,586 — 74,434,113 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බදු තක්සේරුව අනුව ගිණුම්වල බදු ප්‍රතිපාදන සකස් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දඩයෙන් සහ පොළියෙන් නිදහස් කරන බව තහවුරු කළ පසුව එය හඳුනාගත යුතුය.
(ආ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.2.2 (අ)(i) කොමිෂන් සභාවේ රැස්වීම්වලදී නිසි පරිපාටීන් අනුගමනය කරන බවට සභාපතිවරයා වගබලා ගත යුතුය. කෙසේ වුවද, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 4 (3) ඡේදය සහ පළමු උපලේඛනය අනුව රැස්වීම් කටයුතු සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් විගණනයට ලබා දී නොමැත.	2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ උපලේඛනයට අනුව අවශ්‍ය විධිවිධාන අනුගමනය කරනු ලැබේ. එකී උපලේඛනයට අනුව කොමිෂන් සභාවේ රැස්වීම්වලදී නිසි ක්‍රියාපරිපාටීන් අනුගමනය කරන බවට සභාපතිවරයා වගබලා ගනියි. කොමිෂන් සභා රැස්වීම් අවම වශයෙන් මසකට වරක්වත් ක්‍රමානුකූලව පවත්වනු ලබන අතර රැස්වීම්වලට පැමිණීමට නොහැකි සාමාජිකයන්ට මාර්ගගතව ඒ සඳහා සහභාගි වීමේ හැකියාව ලබා දී ඇත. රැස්වීම් න්‍යාය පත්‍රය සහ සාකච්ඡා කළ යුතු ලිපි ලේඛන බෝඩ්පැක් හරහා කල්තියා යවනු ලැබේ. තවද 2022.08.16 දින 223 වැනි රැස්වීමේදී ලිපි ලේඛන ඉදිරිපත් කිරීම සහ රැස්වීම් වාර්තා ලබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටි මැනුවලයක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(ඇ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.2.2 (ආ) (vi) කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල් සමග කාර්යසාධන ගිවිසුමකට එළඹිය යුතු අතර එය උපායමාර්ගික සැලැස්මේ පිළිබිඹුවක් වේ. තවද, ඊට අදාළව අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්ය සාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කර ප්‍රසාද දීමනා ඇතුළු දිරිගැන්වීම් තීරණය කළ යුතුය. කෙසේ වුවද, කොමිෂන් සභාව අධ්‍යක්ෂ ජනරාල් සමග කාර්යසාධන ගිවිසුමකට එළැඹ තිබුණේ නැත. තවද, අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්ෂික කාර්යසාධන ඇගයීම කොමිෂන් සභාව විසින් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. ඒ වෙනුවට, එය සභාපතිවරයා විසින් පමණක් සිදු කර සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන දිරි දීමනා ගෙවා ඇත. කොමිෂන් සභාවේ බලගතු තනතුරු දෙකක් අතර වගකීම් සහ වගවීම බෙදීයාම දුර්වල තත්වයකට පත් වීමට හේතු විය හැක.	මාර්ගෝපදේශය 2021 නොවැම්බර් මස නිකුත් කරන ලද බැවින් කොමිෂන් සභාව 2022 වර්ෂය තුළ උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා සිය මුලපිරීම් ආරම්භ කළ අතර 2023 වර්ෂයේ සිට උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සමත් විය. මාර්ගෝපදේශයට අනුව, උපායමාර්ගික සැලැස්මේ පිළිබිඹුවක් වන කාර්යසාධන ගිවිසුමකට අධ්‍යක්ෂ ජනරාල් සමග එළඹිය යුතුය. අනුමත උපාය මාර්ගික සැලැස්ම මත පදනම්ව, 2023 වසර සඳහා වන ප්‍රධාන කාර්යසාධන දර්ශක කෙටුම්පත සම්බන්ධයෙන් කොමිෂන් සභාවේදී අවසන් තීරණයක් ගැනීමට පෙර 2 වන විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරීම සඳහා සකස් කර ඇත. එය සමාලෝචනය සඳහා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස විගණන කමිටුව දැනුම් දුන්නේය. එබැවින්, 2022 වසර සඳහා සභාපතිවරයා සමග සාකච්ඡා කර ප්‍රධාන කාර්යසාධන දර්ශක සකස් කර ඇති බැවින් අධ්‍යක්ෂ ජනරාල්ගේ ආසන්නතම අධීක්ෂකවරයා වන සභාපතිවරයා විසින් ඇගයීම ද සිදු කරන ලදී. මෙය අනෙකුත් සියලුම සේවකයින්ට ද අදාළ වේ. 2022 වසර සඳහා කාර්ය සාධන දිරි දීමනාව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සියලුම සේවකයින්ට අදාළ වන කොමිෂන් සභාවේ අනුමත කාර්යසාධන දිරි දීමනා යෝජනා ක්‍රමය මත පදනම් වූ අතර කාර්යසාධන දිරි දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමේදී එක් එක් සේවකයාගේ කාර්යසාධන ශ්‍රේණිගත කිරීම තවදුරටත් කොමිෂන් සභාව වෙත අනාවරණය කරන ලදී. අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දී ඇති කාර්යසාධන දිරි දීමනාව ගෙවීම සම්බන්ධයෙන් එහි අනාවරණය කර ඇති අතර එය කොමිෂන් සභාවේ අනුමත කාර්යසාධන දිරි දීමනා යෝජනා ක්‍රමය මත පදනම් වේ.
(ඈ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.4 කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තනි තනිව තම සම්බන්ධතාව වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා වෙත මාර්ගෝපදේශයේ ඇමුණුම ii හි දක්වා ඇති ආකෘතිය භාවිතා කරමින් ප්‍රකාශ කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එවැනි ප්‍රකාශයක් කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ප්‍රකාශයට පත් කර නොතිබුණි.	සැලකිල්ලට ගන්නා ලදී. 2023 වර්ෂය සඳහා වන කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ වාර්ෂික ප්‍රකාශය 2023/07/17 දින පැවති 236 වැනි කොමිෂන් සභා රැස්වීමේදී ලබා ගන්නා ලදී.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(ඉ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 2.6 මණ්ඩල ලේකම්වරයා ප්‍රධාන වශයෙන් මණ්ඩලයට එහි වගකීම් ඉටුකිරීම සම්බන්ධයෙන් මග පෙන්වීම සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ කර්මාන්තයේ හොඳම භාවිතයන්ට අනුකූලව සියලුම ක්‍රියා පටිපාටි අනුගමනය කරන බවට සහතික විය යුතු අතර මාර්ගෝපදේශයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් තිබිය යුතුය. තවද, දැනටමත් වෙනත් කාර්යයක නිරතව සිටින කිසියම් සේවකයෙකු අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පත් නොකළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් මණ්ඩල අනුකමිටු ලේකම් ලෙස කටයුතු කළ යුතුය. නමුත් කොමිසමට සුදුසුකම් ලත් ලේකම්වරයෙකු නොමැත. මාර්ගෝපදේශයට පටහැනිව සිය ස්ථිර වගකීම්වලට අමතරව දැනට අධ්‍යක්ෂ - විමර්ශන කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙසත් සහකාර අධ්‍යක්ෂ - නීති විගණන කමිටුවේ ලේකම්වරයා ලෙසත් කටයුතු කරයි.	මාර්ගෝපදේශ අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙකු පත් කිරීම සඳහා 2023/03/23 දින පැවති එහි 229 වැනි රැස්වීමේදී කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. පසුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ඉල්ලීම මත 2023/04/18 දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලදී. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි, දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගේ අනුමැතිය ලබා ගැනීමට යෝජනා සඳහා ඉල්ලීම් (RFP) යවා ඇති අතර 2023 අගෝස්තු මස අවසන් වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීමට සැලසුම් කර ඇත.
(ඊ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 4.2 (ඈ) රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හට විගණන කමිටුවේ නිරීක්ෂකයා ලෙස කටයුතු කළ හැකිය. කෙසේ වුවත්, 2022 වසර සඳහා වන විගණන කමිටු වෙත රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හට ආරාධනා කර නොතිබුනි.	වර්තමානයේ බාහිර විගණකවරයා නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරයි. එබැවින් එවැනි තත්ත්වයන් ඇති වී නොමැත.
(උ)	2021 රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල මාර්ගෝපදේශ 4.2 (ඌ) විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් රැස් විය යුතුය. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාව විසින් විගණන කමිටු නිතිපතා පවත්වා නොමැති බව නිරීක්ෂණය විය. මෙය ප්‍රධාන වශයෙන් සිදුවූයේ මාර්ගෝපදේශ 2.6 වගන්තිය අනුව අවශ්‍ය සුදුසුකම් සහිත මණ්ඩල ලේකම්වරයා කොමිෂන් සභාව වෙත නොමැති වීමයි.	සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇත. ඉහත සඳහන් කළ පරිදි, අදාළ ලියකියවිලි සම්බන්ධ කටයුතු අවසන් කිරීමෙන් පසු මණ්ඩල ලේකම්වරයා පත් කරනු ලැබේ.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(උෟ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7වැනි වගන්තිය විධායක කාණ්ඩයේ සේවකයින් සඳහා වාහන මිලදී ගැනීමට බැංකු හරහා ණය ලබාදීමට ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ සේවකයෙකු හට රු. 1,200,000 ක වාහන ණයක් කොමිෂන් සභා අරමුදල්වලින් රු. 600,000 කොටස් සඳහා පිළිවෙළින් සියයට 4.2 ක් සහ සියයට 9 ක පොලී අනුපාතයකට ලබා දී තිබුණි.	කොමිෂන් සභා අනුමැතිය සහිත පරිපාලන අත්පොතෙහි විධිවිධාන අනුව වාහන දීමනාවක් නොලැබෙන සහ වාහනයක් මිලදී ගැනීම සඳහා තනතුරේ ස්ථිර කර ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වාහන ණය ලබා දිය හැකිය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පරිපාලන අත්පොත බොහෝ කලකට පෙර සකස් කරන ලදී. එය ප්‍රධාන වශයෙන් පදනම් වූයේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පරිපාලන අත්පොත මත වන අතර එම ආයතනය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (එවකට IBSL) එකම සභාපතිත්වය යටතේ ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ආරම්භයේ සිට එය යොදා ගන්නා ලදී. අවශ්‍යතාවය මත, අධ්‍යක්ෂ මණ්ඩලයේ/කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව එකී අත්පොතට වරින් වර වෙනස්කම් ඇතුළත් කර ඇත. පනතේ 10 වැනි වගන්තිය මගින් කාර්ය මණ්ඩලයේ වැටුප් හා සේවා කොන්දේසි තීරණය කිරීමට කොමිෂන් සභාවට බලය ලබා දී ඇති බව ද සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සමාන මූල්‍ය අංශයේ වෙනත් නියාමකයින් කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයට සපයනු ලබන පහසුකම්වලට වඩා වැඩි පහසුකම් තම කාර්ය මණ්ඩලය සඳහා සපයයි. 2022 දෙසැම්බර් 6 වැනි දින පැවති 6 වැනි විගණන කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කර ඇති අතර ආයතන සංග්‍රහය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත අදාළ නොවන බව කමිටුවේ අදහස වන අතර ඊට හේතුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුමැතිය සඳහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද පරිපාලන අත්පොතක් එය සතු වීමයි. වත්මන් යහපාලන මාර්ගෝපදේශවලට අනුව භාණ්ඩාගාරය එවැනි අත්පොත් අනුමත නොකරන බවත් ආයතන අත්පොත් සැකසීමේදී යහපාලන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු බවත් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී. කාර්ය මණ්ඩල සුබසාධනයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාහන ණය ලබා දෙන බැවින් බැංකු හරහා ණය ලබා ගැනීමට එවැනි අවශ්‍යතාවයක් නොතිබූ අතර බැංකු හරහා ණය ලබා ගන්නේ නම්, වැඩි පොලී අනුපාත හේතුවෙන් සේවකයාට අමතර බරක් පැටවෙනු ඇත.
(එ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වන වගන්තිය සෑම විගණන ආයතනයකටම තමන්ගේ අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු අතර ඔහු එවැනි විගණන ආයතනයක පාලන මණ්ඩලය විසින් නිසි පරිදි පත්කරන ලද අභ්‍යන්තර විගණනයන් සිදු කල යුතුය. (1) උපවගන්තිය යටතේ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති නම් මෙම පනත ක්‍රියාත්මක වූ දින සිට වසර දෙකක් නොඉක්මවන කාල සීමාවක් තුල එම පත්කිරීම සිදු කල යුතුය. කෙසේවෙතත් සමාලොචිත වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.	කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද පරිදි 2023-2025 දක්වා වන කාලය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු තෝරා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(ඒ)	2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3 වැනි වගන්තිය සියලු අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ බලධාරීන් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් බඳවා ගැනීමෙන් සහ වැටුප් හා සේවක සංඛ්‍යාව වැඩි කිරීමෙන් වළකින ලෙස එම චක්‍රලේඛවලින් උපදෙස් ලබා දී ඇත. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව එක් (01) අධ්‍යක්ෂ තනතුරක්, කළමනාකාර/සහකාර කළමනාකාර තනතුරු දහතුනක් (13) සහ එක් (01) ලේකම් තනතුරක් පුරවා ඇත.	කොමිෂන් සභාව තනතුරු 57ක් සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වන සියලුම නව බඳවා ගැනීම් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත සිදු වේ. අංක 01/2021 හා 2023 ජුලි 5 වැනි දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ ප්‍රකාරව මුළු සේවක සංඛ්‍යාවට කිසිදු බලපෑමක් නොවන උසස්වීමේ ශ්‍රේණි සඳහා වන සේවකයින් මුදල් අමාත්‍යාංශයට පවරා ඇත.
2.2.3	**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තිය අනුව කොමිෂන් සභාව පහත දැ හැර කිසිවක් එහි බලතල, කාර්යයන් සහ රාජකාරි අනුව ඉටු කර නොමැති බව;**	
(අ)	2010 වසරේ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කාර්ය සාධන දිරි දීමනාවක් ගෙවා තිබුණි.	දැනට පවතින කාර්ය සාධන ඇගැයීමේ ක්‍රමය විවිධ කාර්ය සාධන ඇගැයීම් ක්‍රම පරීක්ෂාවට ලක් කිරීමෙන් පසු ක්‍රියාත්මක කර ඇති අතර එමගින් සේවකයෙකුගේ කාර්යසාධනය සම්බන්ධයෙන් බොහෝ අංශ ආවරණය කර ඇත. කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යසාධනය මත පදනම් වූ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය වසර පුරා මුදල් අමාත්‍යාංශය වෙත අප විසින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් කාර්යසාධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සහ ඒ සඳහා කරන ලද සියලුම සංශෝධන පිළිබඳ තොරතුරු කලින් කලට මුදල් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. කෙසේ වුවද, අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය ප්‍රකාරව 2023.03.31 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද නව පුද්ගල ඇගයුම් ක්‍රමය සමග ක්‍රියා කළේය.
(ආ)	2019 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව දිරි දීමනාව ගෙවීමේ පදනම වූ මාස එකක (01) මූලික වැටුප මාස එකහමාරක (1 1/2) දළ වැටුප ලෙස වෙනස් කර ඇත. මේ හේතුවෙන් මුළු දිරි දීමනාව රු. 14,605,381 කින් ඉහළ ගොස් ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 105% වැඩි වීමකි. තවද, අවසාන ඇගයීම සඳහා සියලුම සේවකයින් සියයට 100 ලකුණු ලබා ගෙන තිබුණි. එබැවින් කොමිෂන් සභාව මගින් යථාර්ථවාදී කාර්යසාධන ඇගයීමක් සිදු කර ඇති බවක් නොපෙනේ.	කොමිෂන් සභාව එහි 195 වන රැස්වීමේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි කාර්යමණ්ඩලයේ කාර්යසාධනය පදනම් කරගත් දිරිගැන්වීමක් ලෙස උපරිම වශයෙන් මාස 1.5 ක දළ වැටුපක් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලදී. කොමිෂන් සභා තීරණය මත ගෙවීම් සිදු කර ඇත.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
2.2.4	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තිය ප්‍රකාරව පහත නිරීක්ෂණ හැර අදාළ නීතිවලට අනුකූලව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීම;	
(අ)	කොමිෂන් සභාවේ නිල කටයුතු බාහිර ගොඩනැගිල්ලක සිදු කරන ලද අතර ගොඩනැගිල්ල සඳහා බදු කුලිය ලෙස 2022 වර්ෂයේ දී රු. 47,178,758 (2021-44,631,663) ගෙවන ලදී. පසුගිය වසරට සාපේක්ෂව බදු කුලිය සියයට 6 කින් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය. කොමිෂන් සභාව වර්ග අඩි 8,741 කුලියට ගෙන ඇති අතර වර්ග අඩියකට කුලිය සහ සේවා ගාස්තු ලෙස පිළිවෙලින් රු. 351 සහ රු. 78 කුලී සහ සේවා ගාස්තු වශයෙන් ගෙවා ඇත. තවද, ගොඩනැගිල්ලේ බදු කුලී ප්‍රතිශතය 2022 වර්ෂය සඳහා මුළු වියදමෙන් සියයට 22 ක් හෝ මුළු ආදායමෙන් සියයට 13 ක් නියෝජනය කළේය.	2001 වසරේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව පිහිටුවන විට එයට තමන්ගේම පරිශ්‍රයක් නොතිබුණි. එබැවින් එය ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කාර්යාල පරිශ්‍රය කුලියට ගෙන තිබුණි. 2001 සිට 2005 දක්වා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 11 වන මහලේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පරිශ්‍රයේ පවත්වාගෙන ගිය අතර 2005 වර්ෂයේදී ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 7 වන මහලේ කොටසකට මාරු විය. 7 වන මහලේ ඉඩ ප්‍රමාණවත් නොවූ බැවින් 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 11 වන මහල වෙත ගෙන යන ලද අතර ඒ වන විට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 28 වන සහ 29 වන මහල වෙත මාරු වී තිබූ බැවින් 11 වන මහළ හිස්ව තිබුණි. තවද, පහත සඳහන් රාජ්‍ය සංවිධාන ද ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සිය කාර්යාල පවත්වාගෙන යයි: ▪ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ රාජ්‍ය අමාත්‍යාංශය ▪ වේවැල්, පිත්තල, මැටි භාණ්ඩ, ගෘහ භාණ්ඩ සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ▪ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ▪ අධිකරණ අමාත්‍යංශය ▪ ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වත්මන් කල්බදු ගිවිසුම ඕවර්සීස් රියල්ටි (සිලෝන්) පීඑල්සී (ORCP) සමග 2019 ඔක්තෝම්බර් 01 දින සිට වසර පහක් සඳහා සම්පූර්ණ 11 වන මහලේ අඩි 8741 ක් සඳහා අත්සන් කරන ලදී. මූලික කුලියට අමතරව, එම මහල සඳහා අඛණ්ඩ ජල සැපයුම, පිරිමි සහ ගැහැණු වැසිකිළි සහ මහලේ පොදු ප්‍රදේශය නඩත්තු කිරීම, 24/7 පොදු ආරක්ෂක සේවාව, කසළ ඉවත් කිරීම, අඛණ්ඩ විදුලි සැපයුම, ගිනි සංඥාව, ජල ඉසින, වෙන් වූ ගිනි පිටවීම සහ ගිනි පෙරහුරු, සේවා සෝපානය ජනෙල් තිර, සෞඛ්‍ය ප්‍රමිති පවත්වා ගැනීම සහ අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී විදුලි බුබුළු සවි කිරීම (පිටතට යාම්) යනාදී කාර්යයන් සඳහා ORCP වෙත සේවා ගාස්තුවක් ගෙවිය යුතුය.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
		පසුගිය කාලයේ එම පරිශ්‍රය වෙනත් ස්ථානයකට ගෙන යාම සඳහා ස්ථාන කිහිපයක්ම සොයා බලන ලදී. කෙසේ වුවද, එම ගොඩනැගිලිවල යටිතල පහසුකම් අප විසින් ලබා දිය යුතු අතර ඒ සඳහා විශාල මුදලක් වැය වේ. කාර්යාල පරිශ්‍රය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, මෙහෙවර පියස, නාගරික සංවර්ධන අධිකාරිය වැනි රජයට අයත් ගොඩනැගිලි සම්බන්ධයෙන් ද විමසීම් කර ඇත. නමුත් දැනට කුලියට ලබා දීම සඳහා ස්ථානයක් නොමැති බව ඔවුන් අප වෙත දන්වා ඇත. මෙම කාර්යාල ගොඩනැගිල්ල සම්බන්ධයෙන් වන මෙම කරුණ මීට පෙර විගණන වාර්තාවක සඳහන් කර කෝප් කමිටුවකදී ද සාකච්ඡා කර තීරණයකට එළඹ ඇති බව මෙයින් දන්වා සිටිමු.
(ආ)	කොමිෂන් සභාව 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත ප්‍රකාරව එහි කාර්යභාරය ඉටු කිරීමේ දී මහජනතාව සමග සමීපව කටයුතු කළ යුතු ආයතනයක් විය යුතුය. කෙසේ වෙතත්, එහි වත්මන් පිහිටීම, සංස්කෘතිය සහ ඇතුල්වීමේ දොරටු දැඩි ආරක්ෂක මධ්‍යයේ පැවතීම සාමාන්‍ය ජනතාවට ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇති කරයි. තවද, ඔවුන්ගේ වෙබ් අඩවිය සහ සියලුම තොරතුරු (රක්ෂණ ඔප්පු හිමියන්ගේ පැමිණිලි පිටුව හැර) ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV පරිච්ඡේදයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කර නොතිබුණි. එබැවින්, ආබාධ සහිත කණ්ඩායම්, තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව නොමැති සහ භාෂා ප්‍රශ්න ඇති පුද්ගලයින් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට කොමිෂන් සභාවේ සේවය ලබා ගැනීම ඉතා දුෂ්කර විය හැකි බව පෙනේ.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව පිහිටා ඇති වත්මන් ස්ථානය සාමාන්‍ය ජනතාව වෙත ළඟා වීමට පහසු ස්ථානයකි. තවද, ආබාධිත පුද්ගලයින්ට රෝද පුටුවකින් ළඟා වීමට ගොඩනැගිල්ලට බෑවුම් සහිත මාර්ගය, පහළම මාලයේ සිට අදාළ මහල දක්වා රෝද පුටුව හැසිරවීමට පුහුණු ආරක්ෂක නිලධාරීන්, සෝපානවල මහල් අංකය බ්‍රේල් ක්‍රමයට සලකුණු කිරීම වැනි පරිශ්‍ර තුළට ඇතුළු වන ආබාධිතයන්ට සේවා සැපයීමට ලෝක වෙළඳ මධ්‍යස්ථානය විසින් පියවර රැසක් ගෙන ඇත. අප විසින් කුලියට ගැනීම සඳහා පරීක්ෂා කර බැලූ පරිශ්‍රය ආබාධිත පුද්ගලයින් සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා වලින් සමන්විත වී නොමැති බව දන්වා සිටිමු (රෝද පුටු දැමිය නොහැකි කුඩා සෝපාන, බෑවුම් සහිත මාර්ග නොමැති වීම). ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ අන්තර්ගතය ඉංග්‍රීසියෙන් සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීමට පියවර ගනිමින් පවතියි. එය ක්‍රමානුකූලව සිදු කිරීමට සැලසුම් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි නිලධාරීන් මහජනතාව තම කාර්යයන් සඳහා කාර්යාලයට පැමිණෙන විට ඔවුන්ට පහසු භාෂාවෙන් (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) සේවය ලබා දෙයි.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
2.3	**වෙනත් කරුණු**	
(අ)	රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම (ICPs) යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) විසින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. රක්ෂණ නියාමකයින්ගේ නියාමන සහ අධීක්ෂණ කාර්යයේ ගුණාත්මක භාවය තක්සේරු කිරීමට සහ රට තුළ රක්ෂණ ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි හඳුන්වාදීමේ රාමුවක් ලෙස භාවිතා කිරීමට එම මූලධර්ම වැදගත්වේ. රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමයෙහි සාමාජිකයෙකු ලෙස කොමිෂන් සභාව විසින් 2022 වසර සඳහා සාමාජික ගාස්තු ලෙස රු. 5,999,664 ගෙවා ඇත. කොමිෂන් සභාව විසින් රක්ෂණයේ ප්‍රධාන මූලධර්මවලට අනුකූල වන ආකාරය හඳුනා ගැනීම සඳහා 2021 විගණනයේ දී තොරතුරු ඉල්ලා තිබුණි. කෙසේ වුවද, ඉල්ලා සිටි තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම මගින් රක්ෂණයේ අධීක්ෂණ අංශයේ ගෝලීය රක්ෂණ ප්‍රමිතීන් පිළිබිඹු කෙරෙන අතර ඒවා ඕනෑම රක්ෂණ නියාමකයෙකු විසින් ස්වේච්ඡාවෙන් අදාළ කරගත හැකි මාර්ගෝපදේශ වේ. රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම යනු විස්තීර්ණ සහ දීර්ඝ පාඨයන් වන අතර, රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සහ/හෝ එහි අනු නීති සම්පාදනයට අදාළ රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම ඇතුළත් කරන්නේ කෙසේද සහ කොපමණ ප්‍රමාණයකටද යන්න තීරණය කිරීමට පෙර ඒවා ප්‍රවේශමෙන් අධ්‍යයනයක් කළ යුතුය. ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාවේ වත්මන් රක්ෂණ නීතිවල පරතර විශ්ලේෂණයක් (ඇමුණුම) සිදු කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහභාගී වූ 2013 (රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම 1 හා 2) (ඇමුණුම) සහ 2022 (රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම 9 හා 10) (ඇමුණුම) තෝරාගත් රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම මත ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය සමාලෝචන ක්‍රියාවලි සිදු කරන ලදී. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය සඳහා රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම සහ පවතින නීතියේ ඇති අනෙකුත් හිඩැස් පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් අවශ්‍ය වන අතර එය අපගේ උපායමාර්ගික සැලැස්මේ මනාව දක්වා ඇත. තවද, රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග සංශෝධනය කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද කමිටුව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියෝජනය වේ. එබැවින්, රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සහ එහි අනු නීතිවලට දැනටමත් ඇතුළත් කර ඇති රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම මොනවාද සහ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සහ එහි අනු නීතිවලට ඇතුළත් කළ යුතු රක්ෂණයේ ප්‍රධාන මූලධර්ම මොනවාද යන්න පිළිබඳව සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු වෙමින් පවතී.
(ආ)	කොමිෂන් සභාව විසින් 2020 දක්වා අදාළ වර්ෂ සඳහා කොමිෂන් සභාවේ අරමුදල්වල අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කර ඇත. කෙසේ වුවද, 2021 වර්ෂයේදී මෙම ප්‍රතිපත්තිය හදිසියේ වෙනස් කර ඇති අතර කොමිෂන් සභාවේ අරමුදල් අතිරික්තය සමුච්චිත අරමුදල ලෙස ඉදිරියට ගෙන ගොස් ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතුව කොමිෂන් සභා අරමුදල සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ලෙස අරමුදල් දෙකක් ඇත. අරමුදල් දෙකම 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ 6 වන සහ 103 වන වගන්ති ප්‍රකාරව ස්ථාපිත කර ඇත. කොමිෂන් සභාව එහි බලය ක්‍රියාත්මක කිරීමේදී, එහි කාර්යයන් ඉටු කිරීමේදී සහ එහි රාජකාරි ඉටු කිරීමේදී දරන ලද වියදම් පියවා ගැනීමට කොමිෂන් සභා අරමුදල භාවිතා කරයි. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇත්තේ වර්තමාන රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිවයි. රක්ෂණකරුවන්ගෙන් සෙස් බද්ද සහ ආයෝජනවලින් ලැබෙන ප්‍රතිලාභ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙත බැර කෙරේ. එබැවින්, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල පිහිටුවීමේ අරමුණ කොමිෂන් සභා අරමුදල පිහිටුවීමේ අරමුණට වඩා වෙනස් වන බැවිනි.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
		කොමිෂන් සභා අරමුදලේ ඇති යම් අතිරික්තයක් ඉවත් කිරීමෙන් යම්කිසි වසරක පවතින අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදල වෙත මාරු කිරීමටත් ඉදිරි වසරවල මණ්ඩලයේ වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය වූ විට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙහි වාර්ෂික පොලී ආදායමෙන් 20%කට යටත්ව එය නැවත මාරු කිරීමටත් 153 වැනි සහ 160 වැනි කොමිෂන් සභා රැස්වීම්වල දී තීරණය කරන ලදී. ප්‍රාග්ධන වියදම් පියවා ගැනීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙතින් අරමුදල් මාරු කිරීම් ද පෙර සිදු කළ පරිදි සිදු කෙරේ. කෙසේ වුවද, 2020 වර්ෂයේදී ඉහත තත්ත්වය වෙනස් විය. 2023.04.20 දින පැවති 1 වන විගණන කමිටුවේ දී මේ පිළිබඳව සාකච්ඡා කර ඇති අතර කමිටුව විසින් පහත සඳහන් දෑ නිර්දේශ කර ඇත: 1. වෙන් කරන ලද අරමුදල් දෙකක් (කොමිෂන් සභාව සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදල) සමග ඉදිරියට යාම සහ සමුච්චිත අරමුදල ලෙස කොමිෂන් සභා අරමුදලේ අතිරික්තය තබා ගැනීම; 2. අවශ්‍ය නම් මණ්ඩලයේ වියදම් (පුනරාවර්තන සහ ප්‍රාග්ධනය) ආවරණය කිරීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලෙහි වාර්ෂික පොලී ආදායමෙන් 20%ක උපරිම මාරු කළ හැකි ප්‍රතිශතය දිගටම පවත්වා ගැනීම.
(c)	මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය	
(i.)	මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අධීක්ෂණය මත ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම සඳහා ඇ.ඩො. 945,450 (වි. ඇ.අ. 0.67) වෙන් කර තිබුණි. නමුත් මෙම මුදල් මේ සඳහා යොදවා තිබුණේ නැත.	ලෝක බැංකුව, මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය අතර පැවති ව්‍යාපෘති සමාලෝචන රැස්වීම්වලදී ජාතික රක්ෂණ භාර අරමුදලේ මණ්ඩලය සිය රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් නොකිරීමට තීරණය කර ඇති බවත් එබැවින් ඔවුන් ලෝක බැංකුවෙන් තාක්ෂණික සහාය හෝ අරමුදල් ලබා ගැනීමට අකමැති බවත් ලිපියේ සඳහන් කර ඇත. රක්ෂණ කළ අවසන් දිනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි වගකීම මතු වන්නේ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වෙන් කිරීම සඳහා වන සිය යෝජනාව ඉදිරිපත් කළ පසුව පමණි. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් යෝජනාව ඉදිරිපත් කළේ නම්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යෝජනාව සමාලෝචනය කිරීමට අවශ්‍ය වනු ඇති අතර රක්ෂණය කළ අවසන් දිනය ළඟා කර ගැනීම සඳහා කිසිදු විරෝධතාවක් නොපෙන්වන්නට ඉඩ තිබිණි. කෙසේ වුවද, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සිය කාර්යය ඉටු කිරීම සඳහා වෙන්කිරීමේ යෝජනාව එහි ඉදිරිපත් නොකළේය. තවද, දැන් එම ව්‍යාපෘතිය අවලංගු කර ඇත. මේ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 0.5ක් වෙන් කර ඇත.
(ii.)	ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂඥයින් සහ උපදේශකයින්ගේ වැඩ කටයුතු එකිනෙකට සම්බන්ධ විය යුතුය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකයින් වරින් වර බඳවා ගෙන තිබූ අතර ව්‍යාපෘතියේ පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එම උපදේශකයින් අතර දැඩි අන්තර් සම්බන්ධතාවක් දක්නට නොලැබුණු බව නිරීක්ෂණය විය. මෙම දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගෙන නොතිබුණු අතර අවසානයේ ව්‍යාපෘතිය නවතා දැමීමට සිදු විය.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ව්‍යාපෘතිය යටතේ උපදේශකයින් දෙදෙනෙකු පමණක්, එනම් ආයුගණක සහ මානව සම්පත්වලට අදාලව, බඳවා ගන්නා ලදී. අපට දන්වා ඇති පරිදි සහ එවැනි සාකච්ඡා අවශ්‍ය ප්‍රමාණයට උපදේශන ආයතන එකිනෙකා සමග අන්තර් සබඳතා පවත්වා ඇත. මානව සම්පත් පිළිබඳ විශේෂඥයා සහ ආයුගණක විශේෂඥයා යන දෙදෙනාම එකම කාලසීමාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙහි සේවය කළ බැවින් ඒ දෙදෙනා අතර සාකච්ඡා පැවැත්විණි.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(iii.)	ආයුගණක උපදේශකවරයා, 2022 මාර්තු 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඔහුගේ කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. 2022 ජනවාරි 24 දිනට ආයුගණක උපදේශකවරයාගේ “රක්ෂණ (ආයුගණක) ව්‍යාපෘතියේ උපදේශක ඇගයීම” නම් වූ වාර්තාවට අනුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හේතු වූයේ තම නිර්දේශ සඳහා කළමනාකාරිත්වය විසින් ලබා දුන් අදහස් ඉදිරිපත් නොකිරීම, ක්‍රියා කාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහ පසු විපරම් කිරීමට කිසිඳු පියවරක් නොගැනීම, සංරචක නියාමකයන් සාධාරණ තර්කයන් සමගින් තම යෝජනාවලට ප්‍රතිචාර නොදැක්වීම, මෙම ව්‍යාපෘතිය යටතේ බඳවා ගත යුතු වූ රක්ෂණ විශේෂඥයින්ගෙන් කිසිඳු සහායක් නොලබා කටයුතු කිරීමට ආයුගණකවරයාට සිදු වීම, රක්ෂණ සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සැපයීමට කොමිෂන් සභාව බැඳී සිටියද නිසි පැහැදිලි කිරීමකින් තොරව කොමිෂන් සභාව එම සහාය ලබා දීම මග හැරීම යනාදියයි. ඉහත නිරීක්ෂණ මත පදනම්ව, ආයුගණක උපදේශකවරයා සඳහා ඇ.ඩො. 168,000 ගෙවීම ආර්ථික වශයෙන් වාසිදායක නොවන ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය.	කාර්ය නිර්දේශයෙහි සියලුම කාර්යයන් ඉටු කිරීමට එකඟ වෙමින් උපදේශකවරයා තම යෝජනාව ඉදිරිපත් කළේය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසුව, විවිධ හේතු පවසමින් ඇතැම් කාර්යයන් ඉටු කිරීමට ඔහු එකඟ නොවීය, එය පිළිගත නොහැකිය. අදාළ ඇගයීම් වාර්තාව උපදේශකවරයා විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අදහස ලබා ගැනීම සඳහා ඒ වෙත ඉදිරිපත් කර නැත. ඇගයීම් වාර්තාව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට අදහස් සඳහා ඉදිරිපත් නොකර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් පිටත වෙනත් විවිධ පාර්ශ්ව වෙත ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම එම අවස්ථාවේ ඔහුට ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණි. ඔහු භාණ්ඩාගාර ලේකම්වරයාට සහ ජනාධිපති ලේකම්වරයාට පැමිණිලි කර තිබුණු බැවින් ඔහුගේ වාර්තාවේ පිටපතක් මුදල් අමාත්‍යාංශය හරහා අපට ලැබුණි. ඒ අනුව, මෙම කාරණය කොමිෂන් සභා මට්ටමින් සාකච්ඡා කර, වැඩිදුර සමාලෝචනය සඳහා විගණන කමිටුව වෙත යොමු කරන ලදී. ඔහුගේ අසාධාරණ චෝදනා සම්බන්ධයෙන් සියලුම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයන් විසින් විගණන කමිටු මට්ටමින් සවිස්තරාත්මක සාකච්ඡා පවත්වන ලදී. සම්මුතියක් ලෙස ඔහු ලබාදුන් ඇතැම් වාර්තාවලට සමානුපාතික ගාස්තු ගෙවීමට විගණන කමිටුවේදී තීරණය විය. වාර්තාවේ සඳහන් කරුණු සමග ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වට එකඟ විය නොහැක. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඔහුගේ උපදෙස් නොසලකා හැර නැත. අදාළ පාර්ශ්ව සමග සාකච්ඡා කිරීම සඳහා ඔහුට බොහෝ අංශ පිළිබඳ උපදෙස් පත්‍රිකා ලබා දිය යුතු වුවත් ඔහු විසින් ඒවා ඉදිරිපත් නොකරන ලදී. ඔහු රක්ෂණ විශේෂඥයෙකුගේ කාර්යයන් ඉටු කිරීමට සුදුසුකම් ඇති බවට තර්ක කරමින් රක්ෂණ විශේෂඥයෙකු නොමැතිව කාර්යයන් ඉටු කිරීම සඳහා අමතර මුදලක් ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, ඔහුගේ ඉල්ලීමට අපට එකඟ විය නොහැකි විය. ගිවිසුමේ කොන්දේසි අනුව එක් වරක්වත් ලංකාවට පැමිණීමටද ඔහු අපොහොසත් විය. ඔහු තම වීසා බලපත්‍රය ගැන තර්ක කරමින් කාලය හා සම්පත් නාස්ති කළේය. ඔහුගේ වාර්තා බොහෝමයක් අවසන් කර කොමිසමට ඉදිරිපත් කිරීමට පෙර සාකච්ඡාවට තවත් කරුණු තිබුණි. නමුත් ඇතැම් වාර්තා ඉදිරිපත් කර ක්‍රියාත්මක කර ඇත. 15 (ආ) සංරචකය තොරතුරු තාක්ෂණ ආයතනය යටතේ වන කාර්යයක් වූ අතර එහි ආයුගණක උපදේශකවරයාට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත සහාය සේවා සහ උපදෙස් සැපයීමට සිදු විය. කලින් සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි පාලනයෙන් බැහැර වූ කරුණු හේතුවෙන් තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනය ප්‍රදානය කළ නොහැකි විය. එබැවින්, ආයුගණක උපදේශකවරයා වෙත ගෙවීම ආර්ථිකමය වශයෙන් වාසිදායක නොවන ගනුදෙනුවක් ලෙස සැලකිය නොහැක. වාර්තා යනු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතු දේපළවන අතර සියලුම පිළිගත් වාර්තාවල උපදෙස් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ආයුගණකවරයෙකුගේ සේවය ලබා ගන්නා විට සැලකිල්ලට ගනු ඇත.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(iv.)	විගණනය සඳහා පවතින තොරතුරුවලට අනුව ආයුගණක උපදේශකවරයා විසින් ලබා දී ඇති වැඩ සැලැස්මට අනුව කිසිදු වාර්තාවක් හෝ සංරචක 3කට අදාළ කාර්යයන් පිළිබඳ වාර්තා කර නොතිබුණි. එබැවින් සංරචක 17 න් සංරචක 14 ක් සඳහා අවසන් සහ කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර තිබුණි. විගණනය සඳහා පවතින විස්තර අනුව එම වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර නියාමක ලෙස අදහස් දැක්වීම, සංවර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධයෙන් වගකිව යුතු අදාළ පාර්ශව සමග එම වාර්තා පිළිබඳ සාකච්ඡා කර ඇති බවට කිසිදු සාක්ෂියක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති විය.	උපදේශකවරයා වෙත ගෙවීම් කරන ලද ක්‍රියාකාරකම් සඳහා වන තත්ව වාර්තාව දැනගැනීම සඳහා අමුණා ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ආයුගණකවරයෙකු බඳවා ගන්නා විට සියලුම පිළිගත් වාර්තාවල ඇති නිර්දේශ භාවිතා කරනු ලබන්නේ එවැනි වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතු දේපළ වන බැවිනි.
(v.)	වැඩ සැලැස්මට අනුව ආයුගණක උපදේශකවරයා රක්ෂණ උපදේශකවරයා සහ තොරතුරු තාක්ෂණ උපදේශකවරයා වැනි වෙනත් උපදේශකයින් සමග සම්බන්ධ වී කටයුතු කළ යුතුය. එබැවින් එම උපදේශකයින් අතර සම්බන්ධීකරණය කිරීමට කොමිෂන් සභාව ඔවුන්ට පහසුකම් සපයා නොමැති බව අපට නිරීක්ෂණය විය.	ගිවිසුමේ/ප්‍රසම්පාදන සැලැස්මේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව උපදේශන සේවා සඳහා ආදායමෙන් කොටසක් යෙදවීමට අපේක්ෂා කළේය. උපදේශන සේවාවන් වූයේ: i. ආයුගණක විශේෂඥතාව ii. රක්ෂණය පිළිබඳ විශේෂඥතාව iii . තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥතාව iv. මානව සම්පත් පිළිබඳ විශේෂඥතාව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන සහ අධීක්ෂණ රාමුව නවීකරණය කිරීම සඳහා උපදේශන සමාගම. කෙසේ වුවද, පාලනයෙන් ඔබ්බට ගිය හේතූන් නිසා, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් එවැනි උපදේශකයින්ට වෙනත් උපදේශකයින් සමග සම්බන්ධීකරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා රක්ෂණ උපදේශකවරයෙකු සහ තොරතුරු තාක්ෂණ උපදේශකවරයෙකු ලබා නොගත්තේය. මානව සම්පත් පිළිබඳ විශේෂඥයා සහ ආයුගණක විශේෂඥයා යන දෙදෙනාම එකම කාලසීමාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සේවය කළ බැවින් ඒ දෙදෙනා අතර සාකච්ඡා පැවැත්විණි.
(vi.)	මානව සම්පත් උපදේශක වෙත පැවරී ඇති කාර්යයට අනුව, අවසාන කාර්යය වන්නේ උපදේශකයාගේ කාර්යය ඉටු කිරීමේදී සේවාලාභියාගේ අනාගත වර්ධනයන් පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය යටතේ බඳවාගත් අනෙකුත් උපදේශකයින් සමග සම්බන්ධව කටයුතු කිරීමයි. ව්‍යාපෘති ප්‍රගතිය අනුව පත් කර තිබුණේ ආයුගණක උපදේශකවරයා පමණි. මානව සම්පත් උපදේශක හට මෙම ව්‍යාපෘතියේ අනෙකුත් උපදේශකයින් සම්බන්ධ කර ගැනීමට සහ සාකච්ඡා කිරීමට හැකි වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. එබැවින් උපදේශකයන් අතර නිසි සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයක් නොතිබූ බැවින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගත නොහැකි වනු ඇත.	කරුණාකර ඉහත ප්‍රතිචාරය (v) බලන්න.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(vii.)	නීතිපතිවරයාගේ මතය මත කොමිෂන් සභාව ඔවුන්ගේ සේවක සංඛ්‍යාව සහ වැටුප් ක්‍රමය තීරණය කර තිබිණි. 2019 මැයි 31 දිනැති සංදේශය මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් ගැලපීම, සේවක සංඛ්‍යා සංශෝධනය, රු. 7,800 ක ජීවන වියදම් දීමනාව, මූලික වැටුපෙන් 15% ක් වන නිපුණතා දීමනාව ගෙවීම සහ රු. 12,500 ක් වූ විශේෂ ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ආයතනයක් වුවද තම සේවක සංඛ්‍යාව තීරණය කිරීමට සහ වැටුප් හා දීමනා ඉහළ නැංවීමට කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරයෙන් තහවුරුවක් හෝ එකඟතාව ලබාගෙන නොතිබුණි.	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි වැටුප් පිළිබඳ කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුව, පසුගිය වසර 13 තුළ එක් අවස්ථාවක දී පමණක් එනම් 2012 දී එක් වැටුප් සංශෝධනයක් පමණක් ලබා දී ඇති බවත් එබැවින් කාර්ය මණ්ඩල වැටුප් වෙළඳපල අගයන්, විශේෂයෙන් අනෙකුත් මූල්‍ය අංශයේ නියාමකයින් විසින් පිරිනමනු ලබන වේතන සමග සැසඳිය නොහැකි බවත් සඳහන් කළේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, විමර්ශන, ඒකාබද්ධ කිරීම් සහ පවරා ගැනීම් ආදියට අදාළව රක්ෂණ ක්ෂේත්‍රයේ දිනෙන් දින ඉහළ යන සංකීර්ණ අභියෝගවලට මුහුණ දීම සඳහා සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමටත් දැනට සිටින සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමටත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට නොහැකි වනු ඇත. නියාමකයාගේ ඵලදායීතාව, කාර්යක්ෂමතාව සහ අදාළත්වය ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර රක්ෂණ භාවිතාවන්ට අනුකූල වීම සඳහා වත්මන් රාමුව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද පවතී. තවද, අනෙකුත් නියාමකයින් මෙන් මනා ප්‍රතිලාභ සහිත වන්දි පැකේජයක් තිබීම සම්බන්ධ පහත කරුණු ඉස්මතු කිරීමට අපි කැමැත්තෙමු. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සෑම තනතුරක් සඳහාම බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ පිළිගත් ආයතනවල සහ සියලුම විධායක උසස් කළමනාකරණ වැඩසටහනට අදාළ පළපුරුද්ද සහිත පුද්ගලයන් වේ. ඉහත කාර්ය මණ්ඩලයට අදාළ සුදුසුකම් තිබිය යුතුය. 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 10 වන වගන්තිය: කොමිෂන් සභාවට තම කාර්යභාර කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකන නිලධාරීන් පත් කළ හැකි අතර එසේ පත් කරනු ලබන නිලධාරීන්ට එම ක්‍රමයට සහ එම මිල ගණන් යටතේ වැටුප් ගෙවිය යුතු අතර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතුය. ව්‍යවස්ථාපිත අධිකාරියට අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, අංක 01/2021 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ ඇමුණුම් හි ලැයිස්තුගත කර ඇති ආයතනයක් ලෙස වර්ග කළ හැක. ඒ අනුව, කොමිෂන් සභාව විසින් අංක 01/2021 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය ප්‍රකාරව මුදල් අමාත්‍යාංශය වෙත පවරනු ඇත.

2022 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

විගණකාධිපති වාර්තාව		ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාරය
(viii.)	2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන නීතිපතිවරයාගේ මතය මත පදනම්ව 2019 වර්ෂයේදී කොමිෂන් සභාවේ වැටුප් 12.98% සිට 59.73% දක්වා වැඩි කර ඇත. මෙම කාල සීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලද භාණ්ඩාගාර නියෝජිතයා මේ සම්බන්ධයෙන් තම ස්වාධීන මතය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර මහජන යහපත සුරක්ෂිත කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	කරුණාකර ඉහත ප්‍රතිචාරය (vii) බලන්න.
(ix.)	තම සේවකයන් සඳහා ස්වයං දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. සේවකයින්ගේ දායකත්වයකින් තොරව රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා 2022 වසරේ දී කොමිෂන් සභාව සිය අරමුදල්වලින් රු.මි. 6.3 ක් (2021 - රු.මි. 6.2) වැය කර ඇත. කෙසේ වුවද, 2017 වර්ෂයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා ද මසකට රු. 1,000 ක දායකත්වයක් අය කරමින් ස්වයං දායක රක්ෂණ ක්‍රමය දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය. කොමිෂන් සභාව විසින් වෛද්‍ය රක්ෂණ ආවරණය සඳහා 2022 වර්ෂයේ දී එක් සේවකයකුට රු. 132,038 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය.	ආරම්භයේ සිටම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සේවකයින් සඳහා කොමිෂන් සභාව විසින් රක්ෂණාවරණ ලබා දී ඇත. මෙය සේවක වැටුප් පැකේජයේ කොටසක් වන අතර පත්වීම් ලිපිවල දක්වා ඇත. සෑම අවස්ථාවකදීම ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කර ඇත. රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 6/2019 මගින් අදාළ පිරිවැය, ආවරණය කළ යුතු අවදානමේ ස්වභාවය සහ සේවාවන්හි ගුණාත්මකභාවය මෙන්ම මෙම සේවාවන් ආයතන වෙත ලබා ගැනීමේ පහසුව සලකා බැලීමට ආයතනවලට උපදෙස් දෙනු ලැබේ. තවද, පෙර අත්දැකීම්වලට අනුව, මෝටර් රථ සහ පුද්ගලික අනතුරු ආවරණයට අදාළ හිමිකම් පෑම් සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල සතුටුදායක සේවාවක් සපයා නැත. තවද, අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා භාණ්ඩාගාරයේ මුදල් සහාය ලබා දෙනු ලැබේ. එබැවින්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සඳහා එය ලබා ගැනීම සුදුසු නොවේ.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	1	27,301,799	23,827,365
ජංගම සහ ආපසු ගෙවිය හැකි තැන්පතු	2	9,593,949	445,593,949
වෙනත් ජංගම නොවන වත්කම්	3	12,540,714	9,639,737
මුළු ජංගම නොවන වත්කම්		49,436,462	479,061,051
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	4	535,914	598,430
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ වෙනත්	2	9,371,226,885	7,995,830,615
වෙනත් ජංගම වත්කම්	5	38,597,160	12,448,937
ස්ථාවර තැන්පතුවල අයෝජන		228,000,000	-
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය - ප්‍රතිමිලදී ගැනුම්		103,000,000	220,000,000
විලම්භිත බදු වත්කම්	21	7,137,274	-
මුදල් හා මුදල් සමාන දෑ	6	13,542,583	6,320,185
මුළු ජංගම වත්කම්		9,762,039,816	8,235,198,168
මුළු වත්කම්		9,811,476,278	8,714,259,219
සංචිත හා වගකීම්			
සංචිත හා අරමුදල්			
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල	7	9,380,820,835	8,441,424,564
ප්‍රත්‍යාගණන සංචිතය		32,439,194	28,593,684
සමුච්චිත අරමුදල		282,996,422	162,942,114
මුදල් අමාත්‍යංශය වෙතින් ලද ප්‍රදානය		-	552,384
මුළු සංචිත සහ අරමුදල්		9,696,256,451	8,633,512,746
වගකීම්			
ජංගම නොවන වගකීම්			
ප්‍රදානය	8	5,061,291	5,061,291
විලම්භිත බදුකරණය	21	4,672,066	1,898,049
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	9	23,790,913	21,614,840
මුළු ජංගම නොවන වගකීම්		33,524,270	28,574,180
ජංගම වගකීම්			
අත්තිකාරම් ලැබීම්		17,685,781	16,380,329
වෙනත් ජංගම වගකීම්	10	64,009,776	35,791,964
මුළු ජංගම වගකීම්		81,695,557	52,172,293
මුළු සංචිත සහ වගකීම්		9,811,476,278	8,714,259,219

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයන් සතුය.

ඉහත මූල්‍ය ප්‍රකාශනය පිටු අංක 96 සිට 116 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමග සංයෝජිතව කියවිය යුතුය.

රසික් සරූක්
සභාපති

සාමාජික

දමයන්ති ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජෙනරාල්

සතීෂ් කුමාර්
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

කොළඹ, ශ්‍රී ලංකා
2023 ජූලි 17 දින

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	සටහන්	2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
ආදායම			
හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම			
වාර්ෂික ගාස්තු සහ අලුත් කිරීමේ ගාස්තු	11	**307,905,835**	272,610,654
මූල්‍ය අංශ නවීකරන ව්‍යාපෘතියේ ආදායම	12	**750**	255,150
හුවමාරු වන ගණුදෙනුවලින් ලැබෙන ආදායම			
පොළී ආදායම	13	**58,821,625**	12,609,727
වෙනත් ආදායම්	14	**532,554**	425,296
මුළු ආදායම		**367,260,764**	285,900,827
වියදම			
කාර්ය මණ්ඩල පිරිවැය	15	**(127,680,340)**	(127,134,065)
වෘත්තීය ගාස්තු	16	**(227,120)**	(320,576)
මෙහෙයුම් ගාස්තු	17	**(83,834,958)**	(71,346,108)
මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ වියදම්	18	**(750)**	(255,150)
මූල්‍ය සහ අනෙකුත්	19	**(297,028)**	(54,613)
මුළු වියදම්		**(212,040,196)**	(199,110,512)
බදුවලට පෙර ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය)		**155,220,568**	86,790,315
බදුකරණය	21	**(37,981,891)**	(16,014,436)
බදුවලට පසු ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය)		**117,238,677**	70,775,879
සමුච්චිත අරමුදලට මාරු කෙරෙන අතිරික්තය		**120,054,308**	70,279,670
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත ආයුගණන අලාභය / (ලාභය)	9	**(2,815,631)**	496,209
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		**122,869,939**	69,783,461

පිටු අංක 96 සිට 116 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	ප්‍රත්‍යාගණන සංචිත රු.	සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය) රු.	එකතුව රු.
2020 ජනවාරි 1 දිනට ශේෂය	17,689,652	-	17,689,652
ආරම්භක ශේෂය මත විලම්භිත බදු බලපෑම		(633,973)	(633,974)
වර්ෂයට අදාළ අතිරික්තය	-	96,001,300	96,001,300
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම	-	(95,600,233)	(95,600,233)
ආයුගණක ලාභය මත විලම්භිත බදු බලපෑම		40,716	40,716
ආයුගණක අලාභය/ (ලාභය)	-	(290,831)	(290,831)
2020 වසර සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කළ අතිරික්තය ආපසු හැරවීම	-	93,214,934	93,214,934
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	17,689,652	92,731,913	17,206,630
2021 ජනවාරි 1 දිනට ශේෂය	17,689,652	92,731,913	17,206,631
2021 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය	-	69,783,461	69,783,461
වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය	12,679,107	-	12,679,107
විලම්භිත බදු	(1,775,075)	-	(1,775,075)
ආයුගණක අලාභය/ (ලාභය)	-	496,209	496,209
විලම්භිත බදු		(69,469)	(69,469)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	28,593,684	162,942,114	191,535,798
2022 ජනවාරි 1 දිනට ශේෂය	28,593,684	162,942,114	191,535,798
2022 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය	-	122,869,939	122,869,939
වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය	3,845,510	-	3,845,510
ආයුගණක අලාභය/ (ලාභය)	-	(2,815,631)	(2,815,631)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	32,439,194	282,996,422	315,435,615

ප්‍රත්‍යාගණනය කිරීමේ සංචිතය මෝටර් වාහන, ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් හා කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත තක්සේරු කිරීමේදී පැන නගින අතිරික්තය/හිගය නියෝජනය කරයි

සමුච්චිත අතිරික්තය/ හිඟයන් මූල්‍ය මගින් කාර්ය සාධන ප්‍රකාශයෙන් මාරු කරන ලද අතිරික්තය/ හිඟය නියෝජනය කරයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	සටහන්	2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌණතාවය)		155,220,568	86,790,315
ක්ෂය සඳහා ගැලපීම්	1	8,320,725	7,861,456
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන	9	5,438,479	3,634,057
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම	9	(446,775)	(1,989,175)
පොළී ආදායම	13	(58,821,625)	(12,609,727)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම		109,711,372	83,686,926
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම			
තොගවල (වැඩි වීම)/ අඩු වීම	4	62,516	(75,870)
ලැබිය යුතු දෑවල (වැඩි වීම)/ අඩු වීම	5	(29,049,200)	(1,127,676)
අත්තිකාරම් ලැබීම්වල (වැඩි වීම)/ අඩු වීම		1,305,451	2,240,252
ණය හිමියන් සහ උපචිතයන්හි (වැඩි වීම)/ අඩු වීම	10	(1,129,065)	(464,970)
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහ		(28,810,294)	571,736
ගෙවන ලද ආදායම් බදු	21	(12,998,271)	(16,063,744)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		67,902,805	68,194,918
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහ			
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය		117,000,000	(110,000,000)
ස්ථාවර තැන්පතුවල ආයෝජනය		(228,000,000)	35,000,000
පොළී ආදායම		58,821,625	11,638,186
දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීම	1	(7,949,650)	(3,025,000)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		(60,128,025)	(66,386,814)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
මුදල් අමාත්‍යංශය වෙතින් ලද ප්‍රදානය		(552,384)	244,849
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		(552,384)	244,849
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		7,222,397	2,052,952
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		6,320,185	4,267,233
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		13,542,582	6,320,185
අතැති සහ බැංකුවේ ඇති මුදල්	6 හා 22		
අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය		13,550,961	5,437,940
ලංකා බැංකුව - ලෝක බැංකු ව්‍යාපෘති ගිණුම		-	508,578
ලංකා බැංකුව 1877		-	373,073
ඉතුරුම් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව		614	595
		13,551,575	6,320,185
ලංකා බැංකුව - ඝණ ශේෂය			
ලංකා බැංකුව 1877 - ලෙජරයට අනුව		(8,993)	-
		13,542,582	6,320,185

පිටු අංක 96 සිට 116 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

සටහන්	2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ		
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වැඩි වීම	**939,396,269**	972,710,329
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම	**939,396,269**	972,710,329
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම		
රජයේ සුරැකුම්පත්වලින් ලැබිය යුතු පොළියෙහි (වැඩිවීම)/ අඩුවීම	**(1,581,250,000)**	(35,502,718)
ලැබිය යුතු සෙස් බදුවල (වැඩි වීම)/ අඩු වීම	**6,815,722**	(20,875,866)
ගෙවිය යුතු දෑවල වැඩි වීම/(අඩු වීම)	**884,809,359**	-
රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලින් මාරු කළ යුතු ප්‍රමාණයේ (වැඩිවීම)/ අඩුවීම	**(540,000)**	87,981,414
	(690,164,919)	31,602,829
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් වැඩි වීම/(අඩු වීම)	**249,231,350**	1,004,313,159
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහ		
රජයේ සුරැකුම්පත්වල ආයෝජන	**(224,970,912)**	(1,153,407,500)
ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් වැඩි වීම/(අඩු වීම)	**(224,970,912)**	(1,153,407,500)
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	**24,260,438**	(149,094,341)
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**1,301,693**	150,396,035
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**25,562,131**	1,301,693
ජංගම ගිණුමේ ශේෂය	**1,000,000**	1,000,000
අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය	**24,562,131**	301,693
	25,562,131	1,301,693

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. 1 වාර්තා කිරීමේ ආයතනය

1.1.1 නෛතික ආකෘතිය

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදනය අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

කොමිසමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ 11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයෙහිය.

1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය.

කොමිෂන් සභාවේ අරමුණ හා වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීමයි.

පනතට අනුව කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය පහත පරිදි වේ.

(අ) ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තන් රක්ෂණකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම,

(ආ) රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම,

(ඇ) රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් රජය වෙත උපදෙස් ලබා දීම,

(ඈ) රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(ඉ) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම,

(ඊ) නිශ්චල හෝ චංචල දේපළ කිසිවක් අත්කර ගැනීම හා දැරීම, ඒ දේපළ විකිණීම, බද්දට දීම, උකස් කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම,

(උ) කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් ගිවිසුම්වලට ඇතුළත් වීම සහ,

(ඌ) මෙම පනත යටතේ යථා පරිදි කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම.

1.2 සකස් කිරීමේ පදනම

1.2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, සම කොටස්හි/ ශුද්ධ වත්කම්හි වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහයන් හා මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වන අතර ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර එම ප්‍රමිතීන්ට අනුකූල වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් 2023 ජූලි 17 වන දින නිකුත් කිරීමට අවසර ලබා දී ඇත.

1.2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇති අතර පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිඳු ගැලපීමක් සිදු නොකර අඛණ්ඩව අදාළ කර ඇත.

සටහන 3.1.1 හි පැහැදිලි කර ඇති පරිදි ආයුගණක තක්සේරුවක් මත පදනම්ව එහි වර්තමාන අගය අනුව අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම් මනිනු ලැබේ.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියෙන් දැක්වෙන සටහන් මගින් ආනාවරණය කර ඇත.

1.2.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තහවුරු කර ඇත. රක්ෂණ නියාමන කොමිෂන් සභාව චිරස්ථායී අනාගතයක් උදෙසා අඛණ්ඩව මෙහෙයුම් පවත්වාගෙන යන බවටත් එහි ව්‍යවස්ථාපිත වගකීම් සපුරාලන බවටත් කොමිෂන් සභාවේ සාමාජිකයින්හට සාධාරණ තක්සේරුවක් ඇත. අනාගත සියළුම තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඈවර කිරීමේ හෝ එහි මෙහෙයුම් නවතාලීමේ අවශ්‍යතාවක් හඳුනාගෙන නොමැත. ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගෙන ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.2.4 භාවිත සහ වාර්තා කරන මුදල්

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන කොමිසමේ භාවිත මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ. රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

1.2.5 සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ තත්වයෙන් ඉදිරිපත් කිරීම සහ වත්මන් වර්ෂය සමග සැසඳිය හැකි පරිදි පෙර වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

1.2.6 ද්‍රව්‍යමය බව සහ එකතු කිරීම

සමාන අයිතමවල සෑම ද්‍රව්‍යමය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වය සමාන නොවන අයිතම ද්‍රව්‍යමය නොවන්නේ නම් හැර වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

1.2.7 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරීත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීම සහ වාර්තා කළ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කළ යුතුය. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය සහ බලපෑමට ලක්වන ඕනෑ ම අනාගත කාල පරිච්ඡේදයක දී ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති මුදලට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමට අදාළ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන්වල ඇතුළත් වේ.

දුර්වලතා තක්සේරු කිරීම - වට්ටම් කළ මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපනවල දී භාවිතා වන ප්‍රධාන උපකල්පනයන්

වත්කමකට හෝ වත්කම් කළඹකට හානි වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේද යන්න කොමිෂන් සභාව වාර්තා කරන සෑම දිනකම ඇගයීමට ලක් කරයි. වත්කමක අය කරගත හැකි ප්‍රමාණය එහි භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි වන අතර එහි සාධාරණ වටිනාකම විකිණීමේදී අඩු පිරිවැයක් වේ. භාවිතයේ දී පවතින වටිනාකම තක්සේරු කිරීමේදී ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ මුදල්වල කාල අගය සහ වත්කමට විශේෂිත වූ අවදානම පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන සුදුසු වට්ටම් අනුපාත භාවිතා කරමින්ය.

ක්ෂය

ක්ෂය වීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ශේෂ වටිනාකම තීරණය කිරීමේදී විනිශ්චය අවශ්‍ය වේ.

විලම්භිත බදුකරණය

අනාගත බදු සැලසුම් උපාය මාර්ග සමග අනාගත බදු අය කළ හැකි ලාභ මට්ටම මත පදනම්ව, හඳුනාගත හැකි විලම්භිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට කළමනාකරණ විනිශ්චය අවශ්‍ය වේ.

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම්වල වගකීම තක්සේරු කිරීමට උපකල්පනවල සැලකිය යුතු කොටසක් අදාළවේ. එයට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත ඇතුළත් වන අතර මෙම සැලසුම් දිගුකාලීන වන බැවින් එවැනි ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයට යටත් වේ.

වත්මන් බදුකරණය

කළමනාකාරිත්වය විශ්වාස කරන පරිදි තථ්‍ය බැඳීම් නිරූපණය කෙරෙන අදාළ බදු ප්‍රඥප්ති සහ රෙගුලාසි අදාළ කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල වත්මන් බදු වගකීම් ඉදිරිපත් කරනු ලැබේ. ගණුදෙණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය ආදායම් බලධාරීන් විසින් විවාදයට ලක් කරන අවස්ථා ද තිබිය හැකිය. මෙම ගැටළුවලට අදාළ ඕනෑම අමතර පිරිවැයක් කොමිෂන් සභාවේ වගකීමක් ලෙස තහවුරු කරන අවස්ථාවේ දී බදු වියදමක් ලෙස ගණන් ගනු ලැබේ.

1.2. 8. වාර්තා කරන කාල සීමාවෙන් පසු හට ගන්නා සිදුවීම්

වාර්තා කරන කාල සීමාවෙන් පසුව හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

1.3 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශ මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතිකයන් පාදකව වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත. විදේශ මුදල්හි වත්කම් හා වගකීම් ශේෂ පත්‍රයේ පවතින විනිමය අනුපාත මත

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පරිවර්තනය කරනු ලැබේ. ඇති වන ලාභ හා අලාභ සම්බන්ධයෙන් ආදායම් හා වියදම් ගිණුම තුළ කටයුතු කරනු ලැබේ.

1.4 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම් පෙර ලැබීම් හා වෙනත් ගෙවිය යුතු දෑවලින් සමන්විත වේ. කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම් වලට ලැබිය යුතු දෑ සහ එහි කටයුතුවලින් සෘජුවම ලැබෙන මුදල් හා වෙනත් කෙටිකාලීන ආයෝජන ඇතුළත් වේ.

1.4.1 වෙළඳපළ අවදානම

වෙළඳපළ අවදානම යනු වෙළඳපළ මිල වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයෙහි සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ මිල අවදානම් වර්ග දෙකකින් සමන්විත වේ. වෙළඳපළ අවදානම මගින් බලපෑමට ලක් වන මූල්‍ය උපකරණවලට මූල්‍ය ආයතනවල තැන්පතු ඇතුළත් වේ.

1.4.1.1 පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපළ පොළී අනුපාත වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහයෙහි උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනාවරණය මූලික වශයෙන් පාවෙන පොළී අනුපාතත් කොමිෂන් සභාවේ වගකීමට අදාළ වේ.

1.4.1.2. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු කොමිෂන් සභාව විසින් අඛණ්ඩව මුදල් ප්‍රවාහ පුරෝකථනයන් හා මුදල් අයවැයකරණය භාවිත කරමින් එහි අරමුදල් හිඟයක් ඇති වීමේ අවදානම අධීක්ෂණය කිරීමයි.

2. වත්කම් හා අගය කිරීමේ පදනම

2. 1 දේපළ, පිරියත හා උපකරණ

ස්වසන්තක අයිතිය සහිත දේපළ පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන්/ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ අත්පත් කර ගැනීමේ පිරිවැය සමග එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

හුවමාරු නොවන ගනුදෙනුවක දී වත්කමක් ශූන්‍ය හෝ නාමික සලකා බැලීමක් සඳහා අත්පත් කර ගන්නා විට වත්කම මුලින් මනිනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමෙනි.

අයිතමයට සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන යාමට හෝ ගලා ඒම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා පසුකාලීනව දරන ලද පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකන ලදී. අනෙකුත් අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සඳහා වන වියදම් ඒවා දරණ ලද මූල්‍ය වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් අය කරනු ලැබේ.

වසර තුනකට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබන මෝටර් රථ සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කරගන්නා අතර ඉන් පසුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 යටතේ වන ප්‍රත්‍යාගණන ආකෘතියේ අවශ්‍යතාවලට අනුකූල වන බවට වග බලා ගනු ලැබේ.

කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංග වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

ක්ෂය

වත්කම් ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ. ප්‍රයෝජනවත් ආයු කාලය, ක්ෂය වීමේ ක්‍රම සහ අවශේෂ අගයන් වාර්ෂිකව හෝ එවැනි තක්සේරුවක් අවශ්‍ය වන බව පෙන්නුම් කරන අවස්ථාවට පෙර දිනයක දී තක්සේරු කරනු ලැබේ.

වාර්ෂික	(%)
මෝටර් වාහන	25
ලී බඩු, වැද්දුම සහ සවි කිරීම	12.5
කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම	25
පුහුණු උපකරණ	25

මිල දී ගත් දින සිට බැහැර කරන දින දක්වා ක්ෂය කරනු ලැබේ. විකුණුම් මත ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ විකුණුම් ආදායම ගෙන යන මුදල සමග සංසන්දනය කිරීමෙනි.

2.2 ආයෝජන

බලපත්‍රලාභී රජයේ බැංකුවල ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන ආයෝජන, රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරනු ලබන අතර වාර්තා කරන කාල සීමාව දක්වා පිරිවැය සහ උපචිත පොළී ලෙස දක්වා ඇත. මෙම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයෝජන වාර්තා කරන කාල සීමාව දක්වා පිරිවැය සහ එකතු කළ පොලියෙන් දක්වා ඇත. එබැවින් මූල්‍ය වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය උපකරණවල අවදානමක් නොමැත.

2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

2.4 ලැබිය යුතු දෑ

හානිය සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුව ලැබිය යුතු දෑ අපේක්ෂිත යථාර්ථවාදී අගයට රැගෙන යනු ලැබේ. වාස්තවික සාක්ෂි සලකා බැලීම මගින් සියලුම ලැබිය යුතු දෑ නිශ්චිත හානි සඳහා තක්සේරු කරනු ලැබේ.

2.5 මූල්‍ය නොවන වත්කම් හානි වීම

සෑම මූල්‍ය කාල සීමාවක් අවසානයේ ම කොමිෂන් සභාව මූල්‍ය නොවන වත්කම් හානි විය හැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ වෙනස් වීම් තක්සේරු කරයි. එවැනි ඇඟවීමක් තිබේ නම්, කොමිෂන් සභාව අය කරගත හැකි ඇස්තමේන්තුගත වත්කම් ප්‍රමාණය ලබා දෙයි. වත්කමක ගෙන යා හැකි මුදල එහි අයකර ගත හැකි මුදල ඉක්මවන විට, වත්කම හානි වූවා සේ සලකනු ලබන අතර එහි අයකර ගත හැකි මුදලට ලියා දක්වනු ලැබේ.

2.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා මුදල් සමාන දෑවලින් නියෝජනය වන්නේ සෑම විටම මුදල් ලෙස ලබා ගැනීමේ හැකියාව ඇති සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට යටත් වන බැංකුවේ මුදල් සහ අතැති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ මුල් කල් පිරීම මාස තුන හෝ ඊට අඩු වන ද්‍රවශීල ආයොජනයි.

3. බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනයට සියළු භෞතික බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන අතර පවතින බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයා ඇත. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළු ම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

3.1 වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළ විටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත.

3.2 වාර්තා කරන දිනයෙන් වර්ෂයකට පසු ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන බැරකම් සේ වර්ගීකරණය කර ඇත.

3.3 අවිනිශ්චිත වගකීමක් යනු කොමිෂන් සභාවේ පාලනයෙන් ඔබ්බට ඇති අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම මගින් හෝ පියවීමට සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි නිසා පිළිගත නොහැකි වර්තමාන වගකීමක් හේතුවෙන් පැන නැගිය හැකි වගකීමකි.

3.4 අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට දැනට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තු කිරීමක් සිදු කළ හැකිය.

3.5 සංචිතවල ස්වභාවය සහ අරමුණ

නිශ්චිත දේශීය අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තුල සංචිත නිර්මාණය කර පවත්වාගෙන යයි.

(අ)සමුච්චිත සංචිත

කොමිෂන් සභාවේ අතිරික්තය/හිඟය සමුච්චිත අරමුදලට මාරු කරනු ලැබේ.

(ආ) ප්‍රත්‍යාගණන සංචිතය

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ලැබෙන ලාභය/අලාභය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරනු ලැබේ.

3.1 විශ්‍රාම ප්‍රතිලාභ

3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිත

කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂිත පනත යටතේ සියළු සුදුසුකම් ලත් සේවකයන් සඳහා අවශ්‍ය පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් සකස් කරගන්නා ලදී. විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම මගින් විශ්‍රාම ගැනීමේ දී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය අර්ථ දැක්වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 සේවක ප්‍රතිලාභ යටතේ දක්වා ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කර නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අදාළ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

2022 මූල්‍ය වසර ආරම්භයේ දී	**21,614,840**
වර්තමාන සේවා පිරිවැය	2,529,452
පෙර සේවා පිරිවැය (විශ්‍රාමික වයස වෙනස් වීම හේතුවෙන්)	531,395
පොළී පිරිවැය	2,377,632
ආයුගණක අලාභ/ (ලාභ)	(2,815,631)
ආදායම් ප්‍රකාශයෙහි ලාභ හා අලාභවලට අදාළ ගැලපීම්	**2,622,848**
ගෙවන ලද ප්‍රතිලාභ	(446,775)
2022 මූල්‍ය වසර අවසානයේ දී	**23,790,913**

පූර්ව වර්ෂයේ ඌණ හෝ අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ඇති වූ වෙනස්කම් නිසා ලැබූ ලාභ හා අලාභ ඒවා ඇති වූ කාල සීමාවේ ආදායම් ප්‍රකාශයට අදාළ කරනු ලැබේ. වසර සඳහා වන බැඳීම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

භාවිත කරන ලද ප්‍රධාන ආයුගණක උපකල්පන පහත පරිදි වේ.

වට්ටම් අනුපාතය	:	වසරකට 18%
වැටුප් වැඩිවීමේ අනුපාතය	:	15%
විශ්‍රාම වයස	:	අවුරුදු 60

3.1.2 නිශ්චිත සහාගත සැලසුම - සේ.අ.අ. සහ සේ.නි.භා.අ.

අදාල ව්‍යවස්ථාවන් සහ රෙගුලාසිවලට අනුකූලව කොමිෂන් සභාවේ සියළු ම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායක වීමට සහ සේවක භාරකාර අරමුදලට දායක වීමට සුදුසුකම් ලබයි. කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙලින් 12% හා 3% ක මුදලක් දායක කරයි.

3.2 ප්‍රදානය

3.2. 1 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ. කෙසේ වුවද, කොමිෂන් සභා අරමුදලේ අතිරික්තය හේතුවෙන් මෙම ක්‍රියාවලිය නතර විය.

3.2.2 මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP)

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රදාන සාධාරණ වටිනාකමට අනුව හඳුනා ගැනේ. වියදමකට අදාළ ප්‍රදානය එය ක්‍රමානුකූල පදනමක් මත ගෙවීමට අදහස් කරන පිරිවැයට අනුරූප වීමට අවශ්‍ය කාල සීමාව තුළ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

අමාත්‍යංශය වෙතින් ලද ප්‍රදාන (බෙදාහැරීම් සම්බන්ධිත දර්ශකය (ඩීඑල්අයි)) ආදායමක් ලෙස හඳුනාගෙන ඇත. ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා ලද ප්‍රදාන දරණ ලද පිරිවැයට අනුව ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ.

3.3 අදාළ පාර්ශවයන්

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අදාළ පාර්ශවයක් ලෙස සලකනු ලබන්නේ තනි තනිව හෝ ඒකාබද්ධව පාලනය කිරීමට හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට හැකියාව ඇති පුද්ගලයෙකු හෝ ආයතනයකි. ප්‍රධාන කළමනාකාරිත්වයේ සාමාජිකයන් අදාළ පාර්ශව ලෙස සලකනු ලබන අතර ඊට රේඛීය අමාත්‍යාංශය සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් ඇතුළත් වේ.

4. ආදායම් හා වියදම්

4.1 ආදායම හඳුනා ගැනීම

4.1. 1 නුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගාස්තු සහ බදු

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිදුවීම සිදු වූ විට සහ වත්කම් හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන විට ගාස්තු සහ බදුවලින් ලැබෙන ආදායම හඳුනා ගනී. වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ වත්කම ආශ්‍රිත සේවා විභවයන් ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් ඇති විට සහ වත්කම්වල සාධාරණ වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය හැකි වූ විට වෙනත් හුවමාරු නොවන ආදායම් හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ආදායම වාර්ෂික ගාස්තු, අලුත් කිරීමේ ගාස්තු, ලියාපදිංචි ගාස්තු සහ ප්‍රකාශන විකිණීම යනාදියෙන් සමන්විත වේ.

4.1. 2 හුවමාරු වන ගණුදෙනුවලින් ලැබෙන ආදායම

පොළී ආදායම

වත්කම්වල ඵලදායී ආදායම සැලකිල්ලට ගත් කාලයට සමානුපාතිකව පොලී ආදායම හඳුනාගෙන ඇත.

වත්කම් අලෙවිය

වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදීමේදී, හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත මාරු කර ඇති විට හඳුනා ගැනේ.

4.2 වියදම් හඳුනා ගැනීම

කොමිෂන් සභාව පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියා හරිනු ලැබේ.

4.2.1 පොලී ආදායම සහ වියදම

පොලී වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි උපචිත පදනම මත පිළිගනු ලැබේ.

4.3 ආදායම් බදු වියදම්

වත්මන් බදුකරණය

කොමිෂන් සභාවේ බදු වියදම, වත්මන් බදුකරණය සහ වසර තුළ විලම්භිත බදු ලාභය හෝ අලාභය යනාදියෙන් සමන්විත වේ. බදුකරණය සඳහා වන ප්‍රතිපාදන බදුකරණ අරමුණු සඳහා සකස් කරන ලද වර්ෂයට අදාළ ලාභය/අතිරික්තය මත පදනම් වේ.

විලම්භිත බදු

මූල්‍ය වාර්තා කිරීම සඳහා වත්කම් සහ බැරකම් ඉදිරියට ගෙන යන මුදල් සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සඳහා පහසුකම් සලසන ක්‍රමයක් වන ශේෂ පත්‍ර වගකීම් භාවිතා කරමින් විලම්භිත බදුකරණය සපයනු ලැබේ. විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ වත්කම් භාවිතා කළ ප්‍රමාණයට සාපේක්ෂව අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇති ප්‍රමාණයට පමණි. විලම්භිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර තවදුරටත් අදාළ බදු ප්‍රතිලාභය ලබා ගැනීමට හැකියාවක් නැති වන තරමට අඩු කරනු ලැබේ.

4.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

4.5 අයවැය තොරතුරු

වාර්ෂික අයවැය උපචිත පදනම මත සකස් කර ඇත. එනම්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අවශ්‍යතා තීරණය කිරීම සඳහා සියලු සැලසුම්ගත පිරිවැය සහ ආදායම තනි ප්‍රකාශයක් තුළ ඉදිරිපත් කෙරේ.

මෙම අයවැය සංඛ්‍යාවන් මූල්‍ය වර්ෂය ආරම්භයේ දී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඒවා වේ.

5 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

5.1 නෛතික ආකෘතිය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ (RII පනත) 103(1) වගන්තිය ප්‍රකාරව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කරන ලද අතර එහි "රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අය කෙරෙන සෙස් බද්ද බැර කරනු ලබන රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ලෙස හැඳින්විය යුතු අරමුදලක් තිබිය යුතු වන්නේය" යනුවෙන් දැක්වේ.

5.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ (RII පනත) 103(1) වගන්තිය ප්‍රකාරව මෙම අරමුදලේ බැර කිරීමට ඇති අරමුදල් රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සඳහා සහ ඒ වෙනුවෙන් සාදන ලද නීති මගින් කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකි වෙනත් ඕනෑම විශේෂිත අරමුණක් සඳහා යොදා ගත යුතුය.

තවද, ඉහත සඳහන් කර ඇති ඕනෑම අරමුණක් සඳහා ක්ෂණිකව අවශ්‍ය නොවන ඕනෑම මුදලක් කොමිෂන් සභාව විසින් මනා ප්‍රතිලාභයක් ලබා දෙන සහ ආයෝජනය සුරක්ෂිත වන පරිදි දූරදර්ශී ලෙස ආයෝජනය කළ යුතුය.

සමාලෝචිත මූල්‍ය කාලපරිච්ඡේදය තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ස්වභාවයෙහි කිසිදු වෙනසක් සිදු නොවීය.

උපයෝගීතාව

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103(2) වගන්ති ප්‍රකාරව, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල භාවිත කළ යුත්තේ රක්ෂණ ඔප්පු හිමියන්ගේ සාමාන්‍ය ආරක්ෂාව සඳහා සහ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් විශේෂිත අරමුණු සඳහා ඒ වෙනුවෙන් සම්පාදනය කරන ලද රීති මඟිනි. 2005 සැප්තැම්බර් 29 දිනැති අංක 1412/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 10 රීතිය ප්‍රකාරව, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල යටතේ ඇති මුදල්, රක්ෂණ ඔප්පු හිමියන් සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ට අදාළ පහත සඳහන් විශේෂිත අරමුණු සඳහා භාවිතා කළ හැක.

(අ)රක්ෂණ කර්මාන්තය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේදීත් රක්ෂණ කාර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදු වන වියදම් පියවාලීම සහ

(ආ)කොමිෂන් සභාව එහි බලපත්‍ර, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේ දී දරණු ලබන වියදම් පියවා ගැනීම.

5.3 සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිඳු ගැලපීමක් සිදු නොකර අඛණ්ඩව අදාළ කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 දේපළ, පිරියත හා උපකරණ

	මෝටර් වාහන	ලී බඩු, වැද්දුම් හා සවි කිරීම්	කාර්යාල උපකරණ	පුහුණු උපකරණ	මෘදුකාංග	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය/ ප්‍රත්‍යාගණන						
2019 ජනවාරි 1 දිනට ශේෂය	10,300,000	14,152,432	26,635,537	141,450		51,229,419
එකතු කිරීම්	-	1,508,944	3,392,354	-		4,901,298
බැහැර කිරීම්	-	(18,895)	(2,271,627)	-		(2,290,522)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,300,000**	**15,642,481**	**27,756,264**	**141,450**		**53,840,195**
2020 ජනවාරි 1 දිනට ශේෂය	10,300,000	15,642,481	27,756,264	141,450		53,840,195
එකතු කිරීම්	-	1,383,081	4,390,440	-		5,773,521
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,300,000**	**17,025,562**	**32,146,704**	**141,450**		**59,613,716**
2021 ජනවාරි 1 දිනට ශේෂය	10,300,000	17,025,562	32,146,704	141,450		59,613,716
එකතු කිරීම්	-	-	3,025,000	-		3,025,000
බැහැර කිරීම්	-	-	-	-		-
නැවත තක්සේරු කෙරෙහි බලපෑම	2,500,000	(7,950,627)	(11,817,033)	-		(17,267,660)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**12,800,000**	**9,074,935**	**23,354,671**	**141,450**		**45,371,056**
2022 ජනවාරි 1 දිනට ශේෂය	12,800,000	9,074,935	23,354,671	141,450		45,371,056
එකතු කිරීම්			6,190,600		1,759,050	7,949,650
බැහැර කිරීම්						
නැවත තක්සේරු කිරීම කෙරෙහි බලපෑම		2,364,409	194,205	-	-	2,558,614
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**12,800,000**	**11,439,343**	**29,739,476**	**141,450**	**1,759,050**	**55,879,319**
සමුච්චිත ක්ෂය						
2019 ජනවාරි 1 දිනට ශේෂය	-	12,675,881	22,722,663	141,450		35,539,995
වර්ෂය සඳහා අය කිරීම	2,575,000	533,646	1,790,844	-		4,899,489
බැහැර කිරීම්	-	(18,895)	(2,271,627)	-		(2,290,522)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,575,000**	**13,190,632**	**22,241,880**	**141,450**		**38,148,962**
2020 ජනවාරි 1 දිනට ශේෂය	2,575,000	13,190,632	22,241,880	141,450		38,148,962
වර්ෂය සඳහා අය කිරීම	2,575,000	580,890	2,324,151	-		5,480,041
බැහැර කිරීම්	-	-	-	-		-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**5,150,000**	**13,771,522**	**24,566,031**	**141,450**		**43,629,003**
වර්ෂය සඳහා අය කිරීම	2,575,000	1,499,751	3,786,704	-		7,861,456
බැහැර කිරීම්	-	-	-	-		
නැවත තක්සේරු කිරීම කෙරෙහි බලපෑම	(7,725,000)	(9,878,066)	(12,343,701)	-		(29,946,767)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**5,393,207**	**16,009,034**	**141,450**		**21,543,691**
වර්ෂය සඳහා අය කිරීම	3,200,000	1,165,427	3,803,532	-	151,767	8,320,725
බැහැර කිරීම්	-	-	-	-		
නැවත තක්සේරු කිරීම කෙරෙහි බලපෑම	-	(1,054,538)	(232,358)	-		(1,286,896)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,200,000**	**5,504,096**	**19,580,208**	**141,450**	**151,767**	**28,577,520**
2022 දෙසැම්බර් 31 දිනට ලියා අඩු කළ අගය	**9,600,000**	**5,935,248**	**10,159,268**	**-**	**1,607,283**	**27,301,799**
2021 දෙසැම්බර් 31 දිනට ලියා අඩු කළ අගය	12,800,000	3,681,727	7,345,638	-	-	23,827,365

2022.12.31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් වල අගය 36,393,384 ක් වන අතර ඒවා තවමත් භාවිතයේ පවතී. ප්‍රත්‍යාගණනිත අගය රු. 3,845,510 කි

භාණ්ඩ සමීක්ෂණයේ වත්කම්වල තත්ත්වය පරීක්ෂා කර ප්‍රයෝජනවත් ආයු කාලය ප්‍රත්‍යාගණනය කර ඇත. එහි ප්‍රතිඵලයද අපේක්ෂිත පරිදි සකස් කරනු ඇත.

2021 මැයි මාසයේ දී ලංකා ඔටෝමොබයිල් සංගමයේ වෘත්තීය තක්සේරුකරු විසින් මෝටර් වාහන නැවත ඇගයීමට ලක් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන්	2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
2	**රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල් ආයෝජන හා වෙනත් ජංගම නොවන වත්කම්**			
	කුළී සහ විදුලි තැන්පතු		**9,593,949**	9,593,949
	ස්ථාවර තැන්පතු		**-**	436,000,000
			9,593,949	445,593,949
	ජංගම වත්කම්			
	ස්ථාවර තැන්පතුවල අයෝජනය		**9,030,350,000**	7,449,100,000
	රජයේ සුරැකුම්පත් හා ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොළිය		**1,045,737,393**	384,766,481
	ලැබිය යුතු සෙස් බදු		**154,386,720**	161,202,441
	අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය		**24,562,131**	301,693
	බැංකුවේ ඇති ශේෂය		**1,000,000**	1,000,000
			10,256,036,244	7,996,370,615
	අඩු කළා			
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කළ යුතු ප්‍රමාණය		**-**	540,000
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ පොළී මත බදු	21 (ආ)	**884,809,359**	-
			9,371,226,885	7,995,830,615
	මුළු වත්කම්		**9,380,820,834**	8,441,424,564
3	**වෙනත් ජංගම නොවන වත්කම්**			
	කුළිය සඳහා ආපසු ලබා දිය හැකි තැන්පතුව		**2,688,246**	2,688,246
	ගෙවීම්		**332,247**	775,242
	සේවක ණය*		**9,520,222**	6,176,249
			12,540,714	9,639,737
4	**භාණ්ඩ තොග**			
	මුද්‍රණ, ලිපි ද්‍රව්‍ය හා පරිගණක උපාංග		**527,655**	519,010
	මුද්දර		**8,259**	79,420
			535,914	598,430
5	**වෙනත් ජංගම වත්කම්**			
	හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ			
	වෙනත් ලැබිය යුතු දෑ		**270,954**	239,953
	හුවමාරු වන ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ			
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කළ යුතු ප්‍රමාණය		**-**	540,000
	අත්පත් කර ගැනීම් සඳහා ප්‍රතිපාදන	5.1	**-**	2,200,000
	සේවක ණය*		**3,311,546**	2,292,955
	උත්සව අත්තිකාරම්*		**1,190,100**	1,170,100
	අත්තිකාරම් හා පෙර ගෙවීම්		**3,707,402**	4,101,974
	එකතු කළ අගය මත බදු පාලනය		**1,807,933**	581,313
	තැන්පතු	5.2	**285,120**	228,686
	ලැබිය යුතු පොළී - රජයේ සුරැකුම්පත්		**28,024,105**	1,093,957
			38,597,160	12,448,937

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

5.1 2021 දෙසැම්බර් මාසයේදී ප්‍රදානය කරන ලද ලැප්ටොප් පරිගණක සම්බන්ධයෙන් අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිපාදන වේ.

5.2 තැන්පතු, ඉන්ධන තැන්පතු සහ ආරක්ෂිත ලොකරය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකු තැන්පතු නියෝජනය කරයි.

		සටහන්	2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
	*කාර්ය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය (කාර්ය මණ්ඩල ණය සහ උත්සව අත්තිකාරම්)			
	2022 ජනවාරි 1 දිනට ශේෂය		**9,639,304**	8,758,228
	වර්ෂය තුළදී ප්‍රදානය කළ ණය		**9,051,101**	7,257,500
			18,690,405	16,015,728
	වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම්		**(4,668,537)**	(6,376,424)
	2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		**14,021,868**	9,639,304
6	**මුදල් හා මුදල් සමාන දෑ**			
	බැංකුවේ ඇති මුදල්			
	අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය	22	**13,550,961**	5,437,940
	ලංකා බැංකුව 1877		**-**	373,073
	ලංකා බැංකුව - ලෝක බැංකු ව්‍යාපෘති ගිණුම	27 ආ	**-**	508,578
	ඉතුරුම් ගිණුම - ජාතික ඉතිරි කිරීමේ බැංකුව		**614**	595
			13,551,576	6,320,185
	ලංකා බැංකුව -සෘණ ශේෂය *			
	ලංකා බැංකුව 1877 - ලෙජරයට අනුව	22	**(8,993)**	-
			13,542,583	6,320,185
7	**රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල**			
	ආරම්භක ශේෂය		**8,441,424,564**	7,468,719,235
	වර්ෂය තුළ දී ලද සෙස් බදු		**587,757,528**	543,906,322
	ප්‍රතිමිලදී ගැනුම් මත පොළී		**3,505,521**	334,087
	ස්ථාවර තැන්පතු මත පොළී		**1,231,844,234**	515,764,257
	අරමුදල් කළමනාකරණ ගිණුම මත පොළී		**1,100,267**	150,009
			10,265,632,115	8,528,873,909
	අඩු කළා:			
	අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට ආපසු මාරු කිරීම්		**-**	87,446,414
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ පොළිය මත ආදායම් බදු වෙන් කිරීම		**884,809,359**	-
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම්		**884,809,359**	87,446,414
	බැංකු ගාස්තු		**1,922**	2,932
			884,811,282	87,449,347
	අවසාන ශේෂය		**9,380,820,835**	8,441,424,564

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
8	**ප්‍රදාන**		
	වර්ෂය ආරම්භයේ දී ශේෂය	**5,061,291**	10,829,811
	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන වියදම්	**-**	(5,773,521)
	අඩු කළා: වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම්	**-**	-
	වර්ෂය අවසානයේ දී ශේෂය	**5,061,291**	5,061,291

සටහන- ප්‍රදාන හඳුනා ගැනීම්

ප්‍රදාන හඳුනා ගැනීම ප්‍රදානයන්, මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත. (උදා: අදාළ වත්කම්වල ඵලදායී ජීවිත කාලයට අදාළව ක්‍රමානුකූල පදනමකින්)

කෙසේ වෙතත්, කොමිෂන් සභා අරමුදලෙහි අතිරික්තය හේතුවෙන් ප්‍රාග්ධන වියදම් රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලින් මාරු කිරීම නවත්වන ලදී. පසුගිය වසරේ සංඛ්‍යා වත්මන් වසරේ ඉදිරිපත් කිරීම පිළිබිඹු වන පරිදි සකස් කර ඇත.

මෝටර් වාහන	25%	25%
කාර්යාල උපකරණ - වෙනත් හා විද්‍යුත් දත්ත සැකසුම	25%	25%
ලී බඩු, වෑද්දුම් හා සවි කිරීම්	12.5%	12.5%
පුහුණු උපකරණ	25%	25%

		2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
9	**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**		
	වර්ෂය ආරම්භයේ දී ශේෂය	**21,614,840**	19,473,749
	වසර තුළ ප්‍රතිපාදන	**5,438,479**	3,634,057
	ආයුගණන (ලාභය)/ අලාභය	**(2,815,631)**	496,209
	(-) වසර තුළ සිදු කරන ලද ගෙවීම්	**(446,775)**	(1,989,175)
	වර්ෂය අවසානයේ දී ශේෂය	**23,790,913**	21,614,840
	වට්ටම් අනුපාතය	18%	11%
	අනාගත වැටුප් වර්ධක අනුපාතය	15%	9%

9.1 භාවිතා කරන ලද උපකල්පනවල සංවේදීතාව

උපකල්පනවල එක් ප්‍රතිශතයක වෙනසක් මගින් පහත බලපෑම් ඇති කරයි.

	වට්ටම් අනුපාතය	**අනාගත වැටුප් වර්ධක අනුපාතය**
1% වැඩිවීම	22,251,194	25,652,749
1% අඩු වීම	25,505,636	22,099,027

ඇක්චූරියල් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්හි වෘත්තීය ආයුගණකවරයෙකු විසින් 2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම පාරිතෝෂික වගකීම පිළිබඳ ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී. රාජ්‍ය අංශයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියෙන් නිර්දේශිත "සේවක ප්‍රතිලාභය" පිළිබඳ වන SLPSAS 19හි දක්වා ඇති "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය" ආයුගණකවරයා විසින් භාවිත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
10	**වෙනත් ජංගම වගකීම්**		
	උපචිත වියදම්	**26,369,239**	25,008,338
	ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්	**1,265,775**	1,247,337
	ගෙවිය යුතු සේවක භාර අරමුදල්	**189,868**	187,102
	උපයන විට බදු සඳහා කළ යුතු ගෙවීම්	**43,545**	35,068
	රඳවා ගැනීම සඳහා කළ යුතු ගෙවීම්	**36,228**	36,228
	ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	**51,558**	-
	ගෙවිය යුතු ආදායම් බදු	**35,295,147**	5,948,270
	ආපසු ගෙවීම් සහ අනෙකුත් ගෙවිය යුතු දේ	**758,416**	3,329,621
		64,009,776	35,791,964
11	**හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම**		
	රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තුව	**290,823,507**	257,764,270
	ලියාපදිංචි කිරීමේ සහ අලුත් කිරීමේ ගාස්තු	**17,082,329**	14,846,384
		307,905,835	272,610,654
12	**මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය මගින් ලද ආදායම**		
	ප්‍රදාන නොවන - ලෝක බැංකු ව්‍යාපෘතිය	**750**	255,150
		750	255,150
13	**හුවමාරු වන ගණුදෙනුවලින් ලැබෙන ආදායම**		
	ස්ථාවර තැන්පතු මත පොලිය	**41,262,360**	5,514,050
	අරමුදල් කළමනාකරණ ගිණුමේ පොලී	**1,121,610**	201,853
	ඉතුරුම් ගිණුමේ පොලී	**19**	41
	ප්‍රතිමිලදී ගැනුම් මත පොලී	**16,437,636**	6,893,783
		58,821,625	12,609,727
14	**වෙනත් ආදායම්**		
	වාහන ණය මත පොළිය	**291,708**	274,395
	ආපදා ණය මත පොළිය	**235,236**	149,012
	වෙනත් ආදායම්	**5,611**	1,890
		532,554	425,296

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
15	**කාර්ය මණ්ඩල පිරිවැය**		
	කාර්ය මණ්ඩල වැටුප්	**77,625,084**	77,422,627
	සේවක අර්ථසාධක අරමුදල 12%	**9,303,310**	9,293,499
	සේවක භාර අරමුදල 3%	**2,325,828**	2,323,376
	සභාපතිගේ වියදම් - දීමනා	**1,200,000**	1,200,000
	සභාපතිගේ ඉන්ධන දීමනා	**594,935**	241,050
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ ගාස්තු	**1,754,354**	1,384,859
	පුහුණු වන නිලධාරී දීමනාව	**1,877,000**	242,000
	අතිකාල	**426,546**	527,240
	කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම්	**2,681,572**	2,773,703
	කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය	**2,785,293**	2,328,894
	රක්ෂණය - ගිනි හා පුද්ගලික	**498,166**	587,977
	කාර්ය මණ්ඩල සුභසාධනය	**867,855**	4,459,324
	කාර්ය මණ්ඩල පුහුණු - දේශීය	**1,168,025**	921,188
	කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා	**9,291,626**	9,096,187
	ප්‍රචාරණය - බඳවා ගැනීම	**95,000**	732,740
	අධ්‍යක්ෂ දුරකථන - ගෘහස්ථ	**665,203**	786,390
	නිවාඩු දීමනා	**744,985**	1,796,425
	වාහන මෙහෙයුම් කල්බදු ගාස්තු	**485,016**	1,455,048
	අධ්‍යක්ෂවරුන්ගේ වාහන දීමනා	**4,487,603**	4,570,890
	අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන දීමනා	**3,364,460**	1,356,590
	සේවක පාරිතෝෂිත	**5,438,479**	3,634,057
		127,680,340	127,134,065
16	**වෘත්තීමය ගාස්තු**		
	බදු සහ පාරිතෝෂිත තක්සේරු ගාස්තු	**227,120**	320,576
		227,120	320,576

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
17	**මෙහෙයුම් වියදම්**		
	කුලී සහ සේවා ගාස්තු	**48,254,736**	44,182,960
	රථ ගාල් කිරීමේ ගාස්තු	**777,830**	763,550
	දුරකථන හා අන්තර්ජාල වියදම්	**1,463,367**	1,690,919
	විදුලිය	**1,367,225**	1,626,825
	කාර්යාල නඩත්තු කිරීම්	**572,855**	618,023
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	**1,560,693**	2,764,004
	මහජන දැනුවත් කිරීම්	**8,570,966**	1,814,843
	ගමන් වියදම් - දේශීය	**94,875**	58,840
	කාර්යාල උපකරණ (වි.ද.සැ. හා වෙනත්)	**2,969,581**	2,103,839
	සාමාජිකත්ව ගාස්තු (IAIS)	**5,999,664**	4,516,334
	ප්‍රචාරණය - වෙනත්	**163,520**	355,255
	රැස්වීම් ගාස්තු	**537,250**	290,520
	පුවත්පත් හා පුස්තකාල පොත්	**194,998**	164,694
	තැපැල් හා පණිවිඩ ගාස්තු	**87,426**	62,438
	විගණන ගාස්තු - විගණකාධිපති	**550,000**	504,000
	විගණන ගාස්තු - අභ්‍යන්තර	**1,300,000**	1,262,200
	ක්ෂය	**8,320,725**	7,861,456
	වෙළඳ බදු	**70,000**	-
	පොදු වියදම්	**104,435**	112,778
	නීති වියදම්	**55,755**	-
	විමර්ශන වියදම්	**13,070**	12,921
	අධීක්ෂණ වියදම්	**2,830**	-
	වාහන නඩත්තුව	**459,196**	223,973
	වාහන රක්ෂණය	**81,088**	96,464
	වාහන ඉන්ධන වියදම්	**262,872**	259,272
		83,834,958	71,346,108
18	**මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ වියදම්**		
	බඳවා ගැනීම් සඳහා දැන්වීම්	**-**	253,150
	බැංකු ගාස්තු	**-**	2,000
	වීසා සඳහා වියදම්	**750**	-
		750	255,150
19	**මූල්‍ය හා වෙනත් වියදම්**		
	බැංකු ගාස්තු	**297,028**	54,613
		297,028	54,613

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සත්‍ය 2022 රු.	අයවැය 2022 රු.	විචලනය රු.
20 අයවැයට සාපේක්ෂව සැබෑ ආදායම සහ වියදම් සංසන්දනය කිරීම			
ආදායම			
රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තුව	290,823,507	285,830,000	2%
ලියාපදිංචි කිරීමේ සහ අලුත් කිරීමේ ගාස්තු	17,082,329	14,290,000	20%
අඩු කළා: වියදම			
කාර්ය මණ්ඩල පිරිවැය	127,680,340	148,955,000	14%
වෘත්තීය ගාස්තු සහ මෙහෙයුම්	84,062,078	122,956,000	32%
මූල්‍ය සහ අනෙකුත්	38,279,669	9,500,000	-303%

	2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
21 බදුකරණය		
අ. කොමිෂන් සභාවේ අරමුදල		
වර්තමාන වසරේ ආදායම් බදු		
වර්තමාන වසරේ ආදායම් බදු ගාස්තුව	**42,345,148**	16,443,952
විලම්භිත බදු		
තාවකාලික වෙනස්කම් වල ආරම්භය සහ ආපසු හැරවීම සම්බන්ධය	**(4,363,257)**	(429,516)
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වාර්තා කරන ලද ආදායම් බදු වියදම	**37,981,891**	16,014,436

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2022 ඔක්තෝබර් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සම්මත ආදායම් බදු අනුපාතය 24% සිට 30% දක්වා ඉහළ නංවා ඇත (2022 අංක 45 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු සංශෝධන පනත). ඒ අනුව බදු ගණනය කිරීම සිදු කර ඇත

සැසඳීම	මාස 9	මාස 3	එකතුව
අ. ව්‍යාපාර ආදායම			
බදු පෙර ලාභය	116,415,426	38,805,142	155,220,568
එකතු: ඉඩ නොදෙන අඩු කිරීම්			
රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදල මත ගිණුම්කරණ ක්ෂය	6,240,544	2,080,181	8,320,725
විශ්‍රාම දායකත්වය සඳහා වන විධිවිධාන (පාරිතෝෂිත)	4,078,859	1,359,620	5,438,479
අධ්‍යක්ෂවරුන්ගේ ගෘහස්ථ දුරකථන	498,902	166,301	665,203
අඩු කළා: ඉඩ දෙන අඩු කිරීම්			
ක්ෂය විය හැකි වත්කම් මත ප්‍රාග්ධන දීමනා	2,294,965	764,988	3,059,953
ගෙවන ලද පාරිතෝෂිත	-	446,775	446,775
	124,938,767	41,199,481	166,138,247
මුළු ව්‍යාපාර ආදායම			
24% හා 30% ට ගෙවිය යතු බදු	24%	30%	
වර්තමාන වසරේ බදු	29,985,304	12,359,844	42,345,148
මුළු බදු			42,345,148

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	2022.12.31 දිනට රු.	2021.12.31 දිනට රු.
විලම්භිත බදු		
බදු අරමුණු සඳහා වේගවත් ක්ෂය වීම		
ජනවාරි 1 දිනට ශේෂය	**1,898,049**	483,021
වර්ෂය තුළ උත්පාදනය/(ආපසු හැරවීම).	**(4,363,257)**	1,415,028
දෙසැම්බර් 31 දිනට ශේෂය	**(2,465,208)**	1,898,049
වසර අවසානයේ දී විලම්භිත බදු ප්‍රතිපාදන පහත පරිදි සකස් කර ඇත		
තාවකාලික වෙනස්කම්වලින් විලම්භිත බදු ප්‍රතිපාදන		
- දේපළ පිරියත හා උපකරණ	**4,672,066**	2,197,895
- පාරිතෝෂිත	**(7,137,274)**	(299,847)
- නැවත තක්සේරු කිරීමේ අතිරික්තය		
	(2,465,208)	1,898,048

ආ. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වැනි වගන්තිය යටතේ වර්ගීකරණය කර ඇති අතර ලාභාංශ හෝ පොලී වලින් ලැබෙන ලාභය සහ ආදායම හැර වෙනත් ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.කෙසේ වෙතත්, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හඳුන්වාදීමත් සමග ඉහත සඳහන් කළ ව්‍යතිරේකය ඉවත් කරන ලදී. ඉහත කරුණු සහ බලපෑම සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඇත. කෙසේ වෙතත්, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ආදායමින් බදු ගෙවන ලෙස දන්වමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට මේ වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ලිපියක් ලැබී තිබේ. ඒ අනුව ගිණුම්වල පහත විධිවිධාන සලසා ඇත.

වර්ෂය	පොලී ආදායම	බදු අනුපාතය	බදු
2018	455,331,220	28%	127,492,742
2019	574,484,713	28%	160,855,720
2020	622,183,692	24%	149,324,086
2021	516,248,353	24%	123,899,605
			561,572,152
2022			
මාස 9	794,963,330	24%	190,791,199
මාස 3	441,486,692	30%	132,446,008
	1,236,450,022		**323,237,207**
			884,809,359

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

22. අරමුදල් කළමනාකරණ ගිණුම්, ලෙජර් ශේෂයන් හා බැංකු ශේෂයන්

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව සඳහා අපගේ ජංගම ගිණුමට සම්බන්ධව අරමුදල් කළමනාකරණ ගිණුම් 2 ක් පවත්වාගෙන යන අතර ජංගම ගිණුමේ ශේෂය රු.1,000,000 (බැංකු වාර්තාවලට අනුව) ඉක්මවන විට එම මුදල අරමුදල් කළමනාකරණ ගිණුමට මාරු කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන චෙක්පත් සැම විටම එසැනින් බැංකුවට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන බැවින් ඉහත අරමුදල් කළමනාකරණ ගිණුම් හා සම්බන්ධිත ගණුදෙනු කොමිෂන් සභාවේ ගිණුම්වලට ඇතුළත් කළ පසු ලෙජරයේ දැක්වෙන බැංකු ශේෂය ඍණ අගයක් ගත හැක.

2022 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය පහත පරිදි වේ.

අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය	Rs. 13,550,961
ජංගම ගිණුමේ ශේෂය	Rs. (8,993)
එකතුව	Rs. 13,541,968

23. ප්‍රාග්ධන බැඳියාවන්

2022 දෙසැම්බර් 31 දිනට කිසිඳු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

24. අවිනිශ්චිත වගකීම් සහ අවිනිශ්චිත වත්කම්

සම්පත් පිටතට ගලායාම දුරස්ථ නම් මිස සියලු අවිනිශ්චිත වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහනක් ලෙස අනාවරණය කෙරේ. හඳුනා ගත් අවිනිශ්චිත වගකීම මුලින් මනිනු ලැබුවේ එහි සාධාරණ වටිනාකමින් ය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වැනි වගන්තිය යටතේ වර්ගීකරණය කර ඇති අතර ලාභාංශ හෝ පොලියෙන් ලැබෙන ලාභය සහ ආදායම හැර වෙනත් ලාභය සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කෙරිණි. කෙසේ වුවද, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හඳුන්වාදීමත් සමග එම නිදහස් කිරීම ඉවත් කරන ලදී. ඉහත කරුණ සහ ඒ කෙරෙහි වන බලපෑම සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ පොළී ආදායම මත බද්ද, දඩ මුදල සහ පොළිය සමග ගෙවීමට 2023.01.19 සහ 2023.02.17 ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පහත ඇගයීම් ලැබී ඇත.

ඇගයුම් වර්ෂය	දඩ මුදල	පොළිය
2018/19	25,752,129	79,187,797
2019/20	36,757,586	74,434,113

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බදු තක්සේරුව අනුව ගිණුම්වල බදු ප්‍රතිපාදන සකස් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දඩයෙන් සහ පොළියෙන් නිදහස් කරන බව තහවුරු කළ පසුව එය හඳුනාගත යුතුය.

25. වාර්තා කරන කාල සීමාවෙන් පසු හට ගන්නා සිදුවීම්

24 වන සටහනෙහි දක්වා ඇති ඒවා හැර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිඳු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

26. බදුකරණය

බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එයට පසුව කරන ලද සංශෝධනවල විධිවිධානවලට අනුකූලවයි.

විස්තරය	2022. 12. 31	
	මාස 9	මාස 3
අ. ව්‍යාපාර ආදායම		
බදු පෙර ලාභය	116,415,426	38,805,142
එකතු: ඉඩ නොදෙන අඩු කිරීම්		
දේපළ, පිරියත හා උපකරණ මත ගිණුම්කරණ ක්ෂය	6,240,544	2,080,181
විශ්‍රාම දායකත්වය සඳහා වන විධිවිධාන (පාරිතෝෂිත)	4,078,859	1,359,620
අධ්‍යක්ෂ දුරකථන - ගෘහස්ථ	498,902	166,301
අඩු කළා: ඉඩ දෙන අඩු කිරීම්		
ක්ෂය විය හැකි වත්කම් මත ප්‍රාග්ධන දීමනා	2,294,965	764,988
ගෙවන ලද පාරිතෝෂිත	-	446,775
මුළු ව්‍යාපාර ආදායම	**124,938,767**	**41,199,481**
ගෙවිය යුතු ආදායම් බදු	24%	30%
	29,985,304	**12,359,844**
එකතුව		**42,345,148**
අඩු කළා: බදු බැර		
ඉදිරියට රැගෙන ආ ආදායම් බදු		5,948,270
රැඳවුම් බද්ද		-
ස්වයං තක්සේරු ගෙවීම්		(12,998,271)
ගෙවිය යුතු ශේෂය		**35,295,147**

27. ශ්‍රී ලංකා මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය

මූල්‍ය අංශය සංවර්ධනය කිරීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් සඳහා කාර්මික හා මූල්‍ය සහාය ලබා දීමට ශ්‍රී ලංකා රජය විසින් ලෝක බැංකුව වැනි සංවර්ධන හවුල්කරුවන් ගේ සහාය අපේක්ෂා කරන ලදී. වසර පහක (5) කාලයක් පුරාවට ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් ලෙස මූල්‍ය අංශ නියාමකයන් තිදෙනෙක් (3) සමග "ශ්‍රී ලංකා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය" සඳහා සහාය ලබා දීමට ලෝක බැංකුව එකඟ විය.

ව්‍යාපෘති සංවර්ධන අරමුණ වන්නේ ඉහළ යන මූල්‍ය වෙළඳපොළ හා රක්ෂණ අංශ කාර්යක්ෂමතාව සඳහා දායක වීම සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් හා පුද්ගලයන් අතර මූල්‍ය/ රක්ෂණ සේවාවන් භාවිතා කිරීමයි. මෙම ව්‍යාපෘතිය මගින් මූල්‍ය වෙළඳපොළ යටිතළ පහසුකම් නවීකරණය, මූල්‍ය පද්ධතිය සඳහා නෛතික සහ නියාමන රාමුව උත්ශ්‍රේණිගත කිරීම සහ මූල්‍ය අංශ නියාමකයන්ගේ එනම් ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව යන ආයතනවල ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම හරහා ව්‍යාපෘති සංවර්ධන අරමුණු ළඟා කරගනු ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ණය අංකය 6006-LK) අතර මූල්‍ය ගිවිසුමක් අත්සන් කරන ලද අතර එය 55,400,000 ක් වූ විශේෂ ගැණුම් හිමිකම්වලට සමාන ණයකි. (ඇ.ම.ඩො.මී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

75ක් පමණ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදාළ විසර්ජන සම්බන්ධිත දර්ශක ළඟා කර ගන්නා බැවින් 6,650,000ක (ඇ.ම.ඩො.මි. 9ක් පමණ) විශේෂ ආදාන හිමිකම් සහ 708,333 ක විශේෂ ආදාන හිමිකම් (ඇ.ම.ඩො.මි. 1 ක් පමණ) ලබා දීම සඳහා ණය මුදලට අදාළව රජය විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමග අතිරේක ගිවිසුමක් අත්සන් කරන ලදී.

SDR - විශේෂ ආදාන හිමිකම්

අ.ලෝක බැංකුව විසින් පහත දෑ මුදල් අමාත්‍යංශය වෙත ප්‍රේෂණය කරන ලදී.

(i) ශ්‍රී ලංකා මූල්‍ය අංශ නවීකරණය සඳහා ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය

නීතිමය සහ නියාමන රාමුව වැඩිදියුණු කිරීම සහ මූල්‍ය වෙළඳපල යටිතල පහසුකම් නවීකරණය කිරීම මගින් නියාමකයින්ගේ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම.

දිනය	**වටිනාකම (ඇ.ඩො.)**
14/01/2019	523,000
ගෙවීම්	(322,041)
	200,959

(ii) ප්‍රතිඵල පාදක මූල්‍යකරණය

විසැඳුම් සම්බන්ධිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට එරෙහිව යෝග්‍ය වියදම් වැඩසටහන සඳහා මූල්‍යමය ආධාර සැපයීම.

දිනය	**වටිනාකම (ඇ.ඩො.)**
27/03/2019	261,163.13
25/05/2019	64,677.66
09/10/2019	64,039.69
17/12/2019	64,803.28
12/02/2020	64,208.44

ආ. ශ්‍රී ලංකා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘත බැංකු ගිණුමේ (ලංකා බැංකු 73613) පවතින රු. 507,827.74ක ශේෂය ශ්‍රී ලංකා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ සියලුම ගෙවීම් අවසන් කර ඇති බැවින් බෙදාහැරීමේ ගිණුම පියවීම සඳහා 2022 නොවැම්බර් 18 වන දින "භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්" වෙත මාරු කරන ලදී.

28. සම්බන්ධිත පාර්ශව අනාවරණ

ජනාධිපති නීතිඥ රසික් සරූක් මහතා 2020 ජනවාරි 3 වන දින සිට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සභාපති ලෙස පත් කරන ලදී.

ඒ.කේ. සෙනෙවිරත්න මහතා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස ධුර දැරීම හේතුවෙන් 2022 අගෝස්තු 26 දින සිට නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් විය.

ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මහත්මිය නියෝජ්‍ය මහා බැංකු අධිපති ලෙස ධුර දැරීම හේතුවෙන් 2021 ජනවාරි 1 දින සිට නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් විය.

සංජීව දිසානායක මහතා සමාගම් රෙජිස්ට්‍රාර් ලෙස ධුර දැරීම හේතුවෙන් 2021 ජූලි 8 දින සිට නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් විය.

හරිස් සල්පිටිකෝරාල මහතා 2020 ජනවාරි 3 වන දින සිට කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

රාජා ගුණරත්න මහතා 2020 ජනවාරි 3 වන දින සිට කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

ඉන්ද්‍රා බදුගේ මෙනවිය 2020 ජනවාරි 3 වන දින සිට කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස නිල බලයෙන් පත් වූ පහත සඳහන් නිලධාරීන්ගේ ධුර කාලය අවසන් විය:

මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස ධුර දැරීම හේතුවෙන් නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් වූ ආර්.එම්.පී. රත්නායක මහතාගේ ධුර කාලය 2022 මාර්තු 1 දිනෙන් අවසන් විය.

මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස ධුර දැරීම හේතුවෙන් නිල බලයෙන් සාමාජිකයෙකු ලෙස පත් වූ එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතාගේ ධුර කාලය 2022 අගෝස්තු 15 දිනෙන් අවසන් විය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

28.1 සමාලෝචිත වසර තුළ කොමිෂන් සභාවෙහි සාමාජිකයන්ගේ සබැඳියාවන් පහත වගුවෙන් දැක්වේ.

සාමාජිකයාගේ නම	සම්බන්ධිත ආයතනය	සබැඳියාව
රසික් සරූක් මහතා	මුදල් කොමිෂන් සභාව	සාමාජික (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව	සාමාජික (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
ආර්.එම්.පී. රත්නායක මහතා	ලංකා බැංකුව(BOC)	නිල බලයෙන් පත් වූ සාමාජික (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	ලෝටස් ටවර් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම	සභාපති (වැඩ බලන) (2022 පෙබරවාරි 3 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	නිල බලයෙන් පත් වූ සාමාජික (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)	නිල බලයෙන් පත් වූ සාමාජික (2022 ජනවාරි 1 සිට 2022 පෙබරවාරි 28 දක්වා)
ඒ.කේ. සෙනෙවිරත්න	සිවිල් ගුවන් සේවා අධිකාරිය	අධ්‍යක්ෂ (2022 අගෝස්තු 8 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	වික්ටෝරියා නිවස	අධ්‍යක්ෂ (2022 අගෝස්තු 15 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
සංජීව දිසානායක මහතා	ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය	නිල බලයෙන් පත් වූ සාමාජික (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	ගිණුම්කරණ ප්‍රමිති කමිටුව	නිල බලයෙන් පත් වූ සාමාජික (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
ටී.එම්.ජේ.වයි.ජී. ප්‍රනාන්දු මිය	ශ්‍රී ලංකා මහ බැංකුව	නියෝජ්‍ය මහ බැංකු අධිපති (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB)	සභාපති (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL)	සභාපති (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	කොමසාරිස් (2022 ඔක්තෝම්බර් 11 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)
	අපි වෙනුවෙන් අපි අරමුදල	කළමනාකරණ මණ්ඩලයේ සාමාජික (2022 මැයි 06 සිට 2022 දෙසැම්බර් 21 දක්වා)
හරිස් සල්පිටිකෝරාල මහතා	-	-
රාජා ගුණරත්න මහතා	-	-
ඉන්ද්‍රා බදුගේ මෙනවිය	-	-

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

28.2 වෙළඳපල මිල ගණන් යටතේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලට අදාළව පහත සඳහන් ගනුදෙනු හැරුණු විට, සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් ආයතන සමග කිසිදු ගනුදෙනුවක් වාර්තා කර නොමැත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පහත සඳහන් ජංගම ගිණුම් දෙකක් සහ ඉතිරිකිරීමේ ගිණුම් තුනක් ලංකා බැංකුවේ (BOC) පවත්වාගෙන යන අතර බැංකු ශේෂයන් පහත වගුවේ දක්වා ඇත;

ගිණුමේ නම	ගිණුම් අංකය	2022.12.31 දිනට ශේෂය	2021.12.31 දිනට ශේෂය
ලංකා බැංකුව	1877	රු. 8,993	රු. 373,073
ලංකා බැංකුව	74236358	රු. 13,550,961	රු. 5,437,940
ලංකා බැංකුව	83094438	-	රු. 508,578
ලංකා බැංකුව	1886	රු. 1,000,000	රු. 1,000,000
	74236394	රු. 24,562,130	රු. 301,963

28.3 2021 වර්ෂය තුළ ලංකා බැංකුව හරහා පහත සඳහන් ආයෝජන යොමු කරන ලදී.

කොමිෂන් සභාවේ අරමුදල්

ආයෝජන වර්ගය	වසර තුළ සිදු කළ ආයෝජන (රු.)	2022.12.31 දිනට ශේෂය (රු.)
ප්‍රතිමිලදී ගැනුම්	රු. 1,168,000,000	රු. 107,000,000
ස්ථාවර තැන්පතු	රු. 148,000,000	රු. 148,000,000

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

ආයෝජන වර්ගය	වසර තුළ සිදු කළ ආයෝජන (රු.)	2022.12.31 දිනට ශේෂය (රු.)
ප්‍රතිමිලදී ගැනුම්	රු. 4,725,800,000	-
ස්ථාවර තැන්පතු	රු. 3,777,000,000	රු. 3,777,000,000

28.4 වසර තුළදී මුදල් අමාත්‍යාංශයේ, මුදල් අමාත්‍යවරයා සහ භාණ්ඩාගාර ලේකම්වරයා තේරී පත් වූ හෝ පත්කළ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලය සමග සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැර වෙනත් කිසිදු ගනුදෙනුවක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් වාර්තා කර නොතිබිණි.

28.5 ප්‍රධාන කළමනාකාරිත්වය සමග සිදු වූ ගනුදෙනු

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 14 එනම් "අදාළ පාර්ශව හෙළිදරව් කිරීම්" අනුව ප්‍රධාන කළමනාකාරත්වයට ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති අය ඇතුළත් වේ.

28.5.1 ප්‍රධාන කළමනාකාරිත්වය සඳහා වන වේතනය

පාලක මණ්ඩලයේ සාමාජිකයන්

ප්‍රවාහන වියදම් ඇතුළුව සමස්ථ වේතනය (සාමාජිකයින් 7)	රු.3,549,289
සාමාජිකයින් 3 ක් සඳහා වෛද්‍ය රක්ෂණ වාරිකය	රු.160,440

ප්‍රධාන විධායක සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

පුද්ගලයන් 6 දෙනෙකු සඳහා වන මුළු වේතනය	රු.25,629,600
මුදල් නොවන ප්‍රතිලාභ	රු. 1,316,286
පුද්ගලයන් 6 ක් සඳහා වෛද්‍ය රක්ෂණ වාරිකය	රු.307,210

29. සංසන්දනාත්මක තොරතුරු

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුකරණ ප්‍රමිති අංක 12 ප්‍රකාරව විලම්භිත බදු අය කිරීම ආරම්භ කරන ලදී. මින් පෙර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනසක් වන තාවකාලික කාල නියමයන්හි වෙනස්කම් සපයා නොතිබුණි. ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 ට අනුකූල වීම සඳහා පෙර වසර දෙක (2020 සිට) ප්‍රතිස්ථාපනය කෙරිණි.

මූල්‍ය කාර්ය සාධනයේ විශේෂ අවස්ථා









පරිශිෂ්ඨය I

2022 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්.

අංකය	රක්ෂණ සමාගමේ නම	රක්ෂණ ව්‍යාපාරයේ පන්තිය
1	ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය
2	අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
3	අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය
4	අමානා ටකාෆුල් ලයිෆ් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
5	අමානා ටකාෆුල් පීඑල්සී	සාමාන්‍ය රක්ෂණය
6	ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
7	සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
8	සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
9	කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
10	කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලයිෆ් ලංකා ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය
11	කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී	සාමාන්‍ය රක්ෂණය
12	කෝප් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
13	ෆෙයාර් ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
14	එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
15	එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
16	ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
17	ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය
18	එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
19	එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
20	එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
21	ජාතික රක්ෂණ භාර අරමුදල	සාමාන්‍ය රක්ෂණය
22	ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
23	පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී	සාමාන්‍ය රක්ෂණය
24	සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
25	සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
26	සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
27	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්.	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
28	යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය

** 2020.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි නව ජීවිත රක්ෂණ ප්‍රාරක්ෂණය කිරීම නතර කර ඇති බව සමාගම විසින් තහවුරු කරන ලදී.

පරිශිෂ්ඨය II

2022 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වූ රක්ෂණ තැරැව්කාර සමාගම්

අංකය	තැරැව්කරුවාගේ නම	ව්‍යාපාර පන්තිය
1	3 ඩී එච් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
2	ආසියාන් ඉන්ටර්නැෂනල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
3	ඒ.එම්.ඩබ්ලිව්. ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
4	ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
5	එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
6	ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
7	ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
8	ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
9	ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
10	අසේකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
11	ඒෂියා කෝප් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් (මීන් පෙර ජේ එෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
12	ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
13	බිමා ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
14	බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
15	කැන්ඩෙක්ස් ඒෂියා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
16	සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
17	සීලෑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
18	සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
19	සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
20	චැරෙන්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
21	කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
22	කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
23	ඩී එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
24	ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
25	ඊගල් ඩී වී ආර් එස් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
26	ඊගල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
27	ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
28	එස්නා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
29	එසාජි කරිම්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
30	ෆෙයාර්වේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය

පරිශිෂ්ඨය II

අංකය	තැරැව්කරුවාගේ නම	ව්‍යාපාර පන්තිය
31	ෆයින්ඩ් මයි ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
32	ෆොර්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
33	ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
34	ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
35	ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
36	ග්‍රීන් ඇල්ෆා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
37	ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
38	අයිකොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
39	අයි අයි ආර් එම් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් (මින් පෙර ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
40	ඉම්පීරියල් ස්පෙෂල්ටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
41	ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
42	ජේ බී බෝඩා ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්. (මින් පෙර ඇක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්)	සාමාන්‍ය රක්ෂණය
43	ජේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
44	එල් එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
45	ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
46	ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
47	එම් ආර් යූ එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
48	මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
49	මර්කන්ටයිල් ෆොර්චූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
50	මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
51	මියුචුවල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
52	මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
53	නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
54	පෙන්ෆීල්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
55	ෆ්ලෙජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
56	ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
57	ප්ලැනට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය

පරිශිෂ්ඨය II

අංකය	තැරැව්කරුවාගේ නම	ව්‍යාපාර පන්තිය
58	ප්‍රෙස්ටීජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
59	ප්‍රයෝරිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
60	ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
61	ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
62	රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
63	රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
64	රින්කූන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
65	සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
66	සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
67	සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
68	සෙරන්ඩිබ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
69	ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
70	සන්ගේට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
71	ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
72	යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
73	යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	සාමාන්‍ය රක්ෂණය
74	වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
75	වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
76	වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය
77	සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය

පරිශිෂ්ඨය III

2022 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වූ අලාභ ගැලපුම්කරුවන්.

අංකය	අලාභ ගැලපුම්කරුගේ නම	බලපත්‍රය බලාත්මක වන දිනය
1	එන්ට්‍රස්ට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්	2020 ජූනි 08
2	ද ෂීල්ඩ් ඇඩ්ජස්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	2019 මාර්තු 29
3	ඒ.ඩබ්.එම්. බන්දුල විජේකෝන් මයා	2019 මාර්තු 29
4	අහමඩ් නසීම් නස්වි රහමන් මයා	2018 ජූනි 25
5	ඇන්තනී ප්‍රශාන්ත් රොයිස් ද මැල් මයා	2022 සැප්තැම්බර් 28
6	අනුර මහින්සක දැඩිගම මයා	2020 අගෝස්තු 12
7	දිසානායක මුදියාන්සේලාගේ ඉන්දික සංජීව මයා	2022 මැයි 26
8	ගුණවර්ධන මුදියාන්සේලාගේ ආනන්ද උදය කුමාර ගුණවර්ධන මයා	2018 ජූනි 25
9	හේමා ගෝඨාභය මහානාම ලියනගේ මයා	2021 මාර්තු 16
10	ජාසින් බස්තියන් ආරච්චිගේ රවිනාත් නිරෝෂන මයා	2019 සැප්තැම්බර් 26
11	ජොහෑන් අමරතුංග මයා	2021 පෙබරවාරි 08
12	ලලින්ද්‍ර ක්‍රිෂාන්ත කරුණාරත්න මයා	2019 මාර්තු 29
13	මහබාලගේ දොන් සිසිර උපාලි පෙරේරා මයා	2018 ජූනි 26
14	මාම්පේ විතානගේ රූපසේන පෙරේරා මයා	2021 ජූලි 07
15	මංගල කීර්ති අශෝක කුමාර ධර්මරත්න මයා	2020 අගෝස්තු 12
16	මැද වලව්වේ ආනන්ද බණ්ඩාර රඹුක්වැල්ල මයා	2022 අගෝස්තු 24
17	නිරෝෂ් සංජීව වතුකාරවත්ත මයා	2018 ජූනි 26
18	පියල් වතුදුර මයා	2021 ජූලි 05
19	රාජපක්ෂ පතිරගේ දොන් කාන්චන සුරංගික මයා	2018 සැප්තැම්බර් 10
20	රන් බණ්ඩා තෙන්නකෝන් මයා	2018 ජූනි 25
21	ශෙල්වින් මාලිගස්පේ කෝරලගේ මයා	2020 අගෝස්තු 12
22	සිතිර පන්ඩිතසුන්දර මයා	2020 අගෝස්තු 12
23	ශ්‍රීනාත් බන්දුල අමරසේකර මයා	2020 අගෝස්තු 12
24	සුගත් වීරරත්න මයා	2021 ජූලි 07
25	සුසන්ත මහින්ද්‍රත්න වීරකෝන් මයා	2018 ජූනි 26
26	ස්වර්ණකමල් ස්වර්ණරාජ් මයා	2021 ජනවාරි 21
27	තනූජ හිගුලගේ මයා	2021 දෙසැම්බර් 06
28	විජිතසේන ලීලාරත්න ප්‍රනාන්දු මයා	2018 ජූනි 25
29	උදිතමාලා පීනාදූරි කුරුකුලසූරිය මිය	2018 ජූනි 13

පාරිභාෂික ශබ්ද මාලාව

සමුච්චිත වීම

එක් සමාගමක් සමග පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රතිරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්වයකි.

අත්කර ගැනීමේ වියදම්

අභිනව රක්ෂණ ගිවිසුම අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත් කිරීම (උදා: කොමිස් මුදල්) යන අවස්ථාවලදී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

ජීවගණකඥ

ජීවගණකඥයෙක් යනු අවිනිශ්චිත අවස්ථාවන්හි මූල්‍යමය ප්‍රතිමානයයන් ඇගයීම සඳහා පුහුණුව ලබා ඇති වෘත්තීයවේදියෙකි. රක්ෂණයේ සහ අනිකුත් මූල්‍ය සේවාවන්හි අනුමානික ස්වභාවය, වත්කම්වලට ආවේණික අවදානම් සහ සංඛ්‍යාලේඛන ආකෘතීන් පිළිබඳ අවබෝධයක් ජීවගණකඥයින් සතු විය යුතුය. මේ අනුව උදාහරණයක් ලෙස වාරික, තාක්ෂණික ප්‍රතිදාන සහ ප්‍රාග්ධන මට්ටම තහවුරු කිරීම සිදු කරනු ලැබෙයි.

පරිපාලන වියදම්

දේපළ, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේ දී ආයෝජන කළඹ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්

ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය නිශ්චය කිරීමේ දී ඇතුළත් කරනු ලැබෙන වත්කම් වේ. මෙවැනි වත්කම් 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

වාර්ෂිකය

යම් කිසි නිශ්චිත කාල සීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත වාර්ෂිකය - ගෙවීම් සිදු කිරීම යම්කිසි අනාගත කාලයකදී ආරම්භ වන්නේ නම් එය විලම්භිත වාර්ෂිකය නම් වේ. ක්ෂණික වාර්ෂිකය - ගිවිසුම ආරම්භ වන අවස්ථාවේ දීම අදාළ ගෙවීම් සිදු කිරීම අරඹන්නේ නම් එය ක්ෂණික වාර්ෂිකය නම් වේ.

බැංකු රක්ෂණ සේවාව

රක්ෂකයා විසින් රක්ෂණ සහ ආයෝජන නිෂ්පාදන බැංකු පාරිභෝගිකයින් වෙත අළෙවි කිරීමේ වැඩ පිළිවෙලකි.

ප්‍රතිලාභියා

ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායක ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR)

අවශ්‍ය කරනු ලබන අවදානම් පාදක ප්‍රාග්ධනය (RCR) ට සහාය දැක්වීම පිණිස වූ පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC), ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය මගින් මනිනු ලබයි.

$$\text{ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය} = \frac{\text{(පූර්ණ පවත්නා ප්‍රාග්ධනය)}}{\text{(නියමිත අවදානම් ප්‍රාග්ධනය)}} \times 100$$

ප්‍රතිරක්ෂිතයා

ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක් (ප්‍රාථමික රක්ෂණ සමාගම). දායකය - රක්ෂණ සමාගම් විසින් ප්‍රතිරක්ෂකයින් වෙතට මාරු කරනු ලබන අවදානම් කොටස.

හිමිකම් පෑම්

දේපළ විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍ය ශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම, රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිත වීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනාදී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

දරන ලද හිමිකම් පෑම

වර්ෂය ආරම්භයේ දී සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම් පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවලදී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂය තුළ හිමිකම් පෑම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

සිදු වී ඇති නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම් (IBNR)

දේපළ, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදු වී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

කටයුතු සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳ කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

පාරිභාෂික ශබ්ද මාලාව

සහභාග රක්ෂණය

නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමග ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

කොමිස්

රක්ෂකගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයෙකුට කරන ගෙවීමක්.

සංකේන්ද්‍රණ අවදානම

නෛසර්ගික ණය අවදානම යෝග්‍ය ලෙසින් අවම කරලීම පිණිස රක්ෂණ හිමියන්ගේ වත්කම් ප්‍රමාණවත් ලෙස විවිධාංගීකරණය වී නොමැති නම්, පවතින අතිරේක ණය අවදානම.

ණය අවදානම

ශ්‍රේණිගත සුරැකුම්පත් නිකුත් කරන්නන් (ආයෝජකයාගේ ආයෝජන කළඹෙනි), ණය ගැතියන්, (උදා: උකස්කරුවන්) හෝ ප්‍රතිපාර්ශවකරුවන් (උදා: ප්‍රතිරක්ෂණ ගිවිසුම්, ව්‍යුත්පන්න ගිවිසුම් හෝ තැන්පතු මත) සහ මැදිහත්කරුවන්ගේ ණය ප්‍රමාණන පැවරීම්වල පැහැර හැරීම් හෝ සංචලනයන් නිසා ඇති වන මූල්‍ය අලාභ අවදානම. ණය අවදානම තුළ පැහැර හැරීමේ අවදානම, අවශ්‍රේණිගත වීම හෝ සංක්‍රමණික අවදානම, වක්‍ර ණය හෝ ව්‍යාප්ත වීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම හා සහ සම්බන්ධ අවදානම අන්තර්ගත වේ. ණය අවදානම් මූලාශ්‍රයන්ට ආයෝජන ප්‍රතිපාර්ශවකරුවන් රක්ෂණ ඔප්පු හිමියන් (හිඟ වාරික හරහා) ප්‍රතිරක්ෂණකරුවන්, මැදිහත්කරුවන් සහ ව්‍යුත්පන්න ප්‍රතිපාර්ශවකරුවන් ඇතුළත් වේ.

විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

අත්හිටවූ මෙහෙයුම්

සමාගමක සමස්ත අංශයක්, අනුබද්ධිත ආයතනයක් හෝ කොටසක්, සමාගමෙන් ඉවත් කරලීම සඳහා විධිමත් සැලසුමක් පවතින විට ඒවායේ මෙහෙයුම්.

ඉපැයූ වාරික

වර්ෂය තුළ ඉපැයූ ලිඛිත වාරිකවලට වර්ෂය ආරම්භයේ දී සහ අවසානයේ දී ඇති නොඉපයූ වාරික ආදායම ගලපා සකස් කරගත් වාරික ආදායමයි.

උත්පාදන/ දායාද

අභාග්‍ය සම්පන්න අවස්ථාවක දී රක්ෂිතයාගේ ජීවිතය පමණක් ආවරණය වනවාට අමතරව රක්ෂණ ඔප්පුව කල්පිරීමේ දී ප්‍රතිලාභ හිමිකර දෙන ජීවිතරක්ෂණ ගිවිසුම්. (නිශ්චිත කාල සීමාවකින් පසුව ("කල් පිරීමේ දී") හෝ මරණයේ දී එකවර මුදලක් ලබා දීම සඳහා වන ජීවිත රක්ෂණ ගිවිසුමක්.)

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

ගිනි, මුහුදු උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ ඒකාබද්ධව පවත්වාගෙන යාම. ගිණුම් කාල පරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව සියලු මූලාශ්‍ර වෙතින් ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය.

දළ ලිඛිත වාරිකය (GWP)

වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවෙකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩු කිරීමට පෙර වූ වාරිකය.

රක්ෂකයා

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

අහෝසි වූ ඔප්පුව

වාරික මුදල් නොගෙවීම මත සහන කාලය අවසානයේ දී අවලංගු වූ රක්ෂණාවරණය.

වගකීම් ප්‍රමාණිකතා පරීක්ෂණය (LAT)

අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්තමාන අගය ඒවායේ රක්ෂණ ගිවිසුම් යටතේ යොදා ගනිමින් එහි හඳුනාගත් රක්ෂණ වගකීම් ප්‍රමාණවත් ද යන වග වාර්තා කරනු ලබන එක් එක් කාලසීමාව අවසානයේ ඇගයීම.

වගකීම් අවදානම

රක්ෂකයා විසින් ස්ථාපනය කරනු ලබන තාක්ෂණික සංචිත සහ ඔප්පු හිමියාගේ වගකීම් දැනට බලපවත්වන ඔප්පු සම්බන්ධ අනාගත හිමිකම් සහ වියදම් සඳහා ප්‍රමාණවත් වේවිද යන අවදානම.

ජීවිත අතිරික්තය

රක්ෂණ ඔප්පු හිමියන්ට ප්‍රසාද දීමනා බෙදා දීමෙන් පසුව, ජීවගණකඥයා විසින් තීරණය කරනු ලබන (ණය ගෙවීමේ

පාරිභාෂික ශබ්ද මාලාව

හැකියාවේ සීමා නිර්ණයන් සැලකිල්ලට ගනිමින්) වගකීම්වලට වඩා වත්කම්වල අතිරික්තය වේ.

දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය

මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කෙරෙන ගිවිසුම ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

වෙළඳපළ අවදානම

රක්ෂකයාගේ වත්කම්වල වෙළඳපළ වටිනාකම අඩුවීමේ අවදානම.

කල්පිරීම

දිගුකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව.

මරණ අනුපාතය

මුළු ජනගහනයට හෝ විශේෂිත වයස් කණ්ඩායමකට මරණ අනුපාතය. එය ගෝලීය වශයෙන් අනුපාත සංඛ්‍යාවන් ලෙසින් ප්‍රකාශිත අතර මරණ අනුපාත වගුව දක්වා ඇත.

ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය

ශුද්ධ හිමිකම් පෑමේ අනුපාතය, ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් අයකර ගත් පසු ශුද්ධ හිමිකම් පෑම, ප්‍රතිරක්ෂණකරුවන් වෙත වාරික ලබා දීමෙන් පසු ශුද්ධ වාරිකයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි. දළ ලිඛිත හිමිකම් පෑමේ අනුපාතය, ප්‍රතිරක්ෂණය සැලකිල්ලට ගැනීමට පෙර පිහිටීම පිළිඹිබු කරයි.

අලාභ අනුපාතය වශයෙන් ද මෙය හැඳින්වේ.

$$\frac{(\text{දරණ ලද ශුද්ධ හිමිකම් පෑම්}) \times 100}{(\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම})}$$

ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

ජීවිත නොවන ශුද්ධ අලාභ අනුපාතය සමග ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන ආදායම සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{(\text{දරණ ලද ශුද්ධ හිමිකම් පෑම්} \times 100)}{(\text{ඉපැයූ ශුද්ධ වාරිකය})} + \frac{(\text{වියදම්} \times 100)}{(\text{ඉපැයූ ශුද්ධ වාරිකය})}$$

ශුද්ධ ඉපැයූ වාරිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

නොඉපැයූ වාරිකයේ අඩු වීම හෝ වැඩි වීම සහ දරන ලද ප්‍රතිරක්ෂණය අනුව සකස් කරන ලද දළ ලිඛිත වාරිකය.

ශුද්ධ වියදම් අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

ජීවිත නොවන ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා: කොමිස්, බදු, සේවක පිරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

ශුද්ධ ලිඛිත වාරිකය යනු රක්ෂණ සමාගමක් විසින් යම් කාල සීමාවක් තුළ ලිඛිත වාරිකවල එකතුවෙන් ප්‍රතිරක්ෂණ සමාගම්වලට පවරා ඇති වාරික අඩු කර භාර ගන්නා ලද ඕනෑම ප්‍රතිරක්ෂකයන් එකතු කිරීම වේ. එමෙන්ම ලියා ඇති ශුද්ධ වාරික මගින් අවදානම් උපකල්පනය කිරීම සඳහා සමාගමකට කොපමණ වාරික ප්‍රමාණයක් තබාගත හැකි ද යන්න නිරූපණය කරයි.

සහභාගීත්වය රහිත ඔප්පු - දිගුකාලීන රක්ෂණය ව්‍යාපාර

ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතුවලදී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය

2016 ජනවාරි 01 දිනට අවදානම් පාදක ප්‍රාග්ධන රීතිය යටතේ දළ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු රක්ෂණ වගකීම්වලට වඩා 2015 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු ඔප්පු වගකීම්වල අතිරික්තය. (ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික තක්සේරුවට වෙනස් වීම නිසා ඇති වූ අතිරික්තය)

එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය මාරු කිරීම

ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික තක්සේරුව වෙත වෙනස් වීම නිසා ඇති වූ අතිරික්තය කොටස් හිමියන්ගේ අරමුදලට මාරු කිරීම.

මෙහෙයුම් ලාභය

ආයෝජන ආදායම්, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය.

මෙහෙයුම් අවදානම

මූල්‍යමය අලාභයන්ට හේතුවන අභ්‍යන්තර පද්ධතිවල, සේවක මණ්ඩලයේ කාර්ය පරිපාටි හෝ පාලනයන්හි ප්‍රමාණවත් නොවන බව හෝ අසාර්ථක වීම නිසා පැන නගින අවදානම. මෙහෙයුම් අවදානමට භාරකාරීත්ව අවදානම ද ඇතුළත් වේ.

පාරිභාෂික ශබ්ද මාලාව

ඔප්පුව

ඔප්පු හිමියා වෙත නිකුත් කරනු ලබන රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියවිල්ලකි.

ඔප්පු හිමියා

රක්ෂණකරු සමග අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරු වන තැනැත්තා. ඔප්පු ණය ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරණ අගය ඇපයට තබමින් ඔප්පු හිමියෙකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොළී අය කරනු ලැබේ.

ඔප්පු ණය

ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරණ අගය ඇපයට තබමින් ඔප්පු හිමියෙකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොළී අය කරනු ලැබේ.

ප්‍රතිරක්ෂණය

එක් පාර්ශවයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිශ්ඨාවක් සමග අනෙකුත් පාර්ශවයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු) එළඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝමුළුමනින් ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවයකි.

ප්‍රතිරක්ෂණ කොමිස්

ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

භාර ගනු ලබන ප්‍රතිරක්ෂණ

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම.

භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම.

ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්

ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ශුද්ධ ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කර ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂයෙකුගෙන් ප්‍රාථමික රක්ෂණ සමාගම් වෙත ලැබිය යුතු කොමිස් මුදල්.

සීමා කරන ලද නියාමන සංචිතය

16 වන විධිවිධානයට අනුව සහභාගීත්ව දිගුකාලීන ව්‍යාපාරය හැර කොටස් හිමියන්ගේ අරමුදලට මාරු කරන ලද එක් වරක් පමණක් ලැබෙන අතිරික්තය.

රඳවා ගැනීම

භාරගනු ලැබූ අවදානමින් රක්ෂණකරු/ ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන/ පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම් වෙනුවෙන් රඳවාගත් ආදායම.

ප්‍රතිපවරා දීම

ප්‍රතිරක්ෂකයා එහි ඇති අවදානම වෙනත් ප්‍රතිරක්ෂකයෙකු වෙත පැවරීම සිදු කරන ගණුදෙනුවකි.

නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR)

2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව තක්සේරු කරනු ලබන සහ නිශ්චය කරනු ලබන අවදානම් ප්‍රාග්ධන ගාස්තුවේ මුළු මුදල. නියමිත අවදානම් ප්‍රාග්ධනය සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණය සඳහා වෙන් වෙන්ව ගණනය කරන අතර රක්ෂණය සහ කොටස් හිමියන්ගේ අරමුදල යන දෙකම ඇතුළත් වේ.

(අ) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා:
සෘකසෘ¸ √: (ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව
+ සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව
+ ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව)
+ වෙළඳපළ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව)^2
+ වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව^2 +
මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව^2

සහ

(ආ) දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය:
RCR -උපරිම {(SVCC,[(ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + වෙළඳපළ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව)^2 + වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව^2 + මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව^2

ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය)

රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම්වලට අදාළ තාක්ෂණික ප්‍රතිපාදන අවශ්‍යතාව සැපිරීමට රක්ෂණකරුවෙකු විසින් වෙන් කළ යුතු නිර්බාධීය වත්කම් නිර්ණයට අමතරව 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26(1) වගන්තිය යටතේ ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව අර්ථ දක්වා ඇති රක්ෂණකරුවෙකු විසින් සැපිරිය යුතු පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවමය සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අවමයෙහි අවශ්‍යතාවන්.

පාරිභාෂික ශබ්ද මාලාව

පවාරණ අගය

ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල. පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (SVCC)

සියලු ජීවිත රක්ෂණ ගිවිසුම් සමගාමීව පවාරණය වී ඇති විට, අත්‍යන්ත හානිකර වාතාවරණයක් පිළිබඳ පවත්නා අවදානම.

කාලීන රක්ෂණය

කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා හෝ නිශ්චිත වසර කාල සීමාවකට ආවරණය සපයා දෙන ජීවිත රක්ෂණ ඔප්පු වර්ගයකි. ඔප්පුවෙහි සඳහන් කර ඇති කාලසීමාව තුළ රක්ෂණකරු මියයාමකදී ඔප්පුව සක්‍රියව පවතින්නේ නම් හෝ බලාත්මකව පවතී නම් මරණ ප්‍රතිලාභය ගෙවනු ලැබේ.

තාක්ෂණික ප්‍රතිපාදන

ස්වකීය රක්ෂණ බැඳියාවන් ඉටු කිරීමට සහ ඔප්පු හිමියන්ගේ සියලුම වගකීම් නිරාකරණය කිරීමට ඔප්පුවල පරිපාලන කටයුතු සඳහා, ප්‍රතිරක්ෂණය සඳහා සහ ඉතිරිව ඇති අවදානම් ආවරණය කිරීම සඳහා වන වියදම් ද වෙනුවෙන් රක්ෂණකරුවකු විසින් වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය වේ.

පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය

ක්‍රියාත්මකව පවතින විට සහ ඈවර කිරීමේ දී යන අවස්ථා දෙකෙහි සියලු අවස්ථාවන්හි දී රක්ෂණකරුවෙකුගේ අලාභ ආවරණය කිරීම සඳහා පූර්ණ වශයෙන් පවතින ස්ථිර ප්‍රාග්ධනය.

දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය

පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනයේ ඇතැම් අන්තර්ග්‍රහණ ලක්ෂණ මෙහි නොමැති වුවද, ක්‍රියාත්මකව පවතින විට සහ ඈවර කිරීමේ දී කිසියම් අලාභ අවශෝෂණයක් සපයා දෙන ප්‍රාග්ධනය.

පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC)

පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය සහ දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය එකතු කර 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව කිසියම් නියමිත අඩුකිරීම් සිදු කිරීමෙන් පූර්ණ පවත්නා ප්‍රාග්ධනය නිර්ණය කරනු ලබයි.

ප්‍රාරක්ෂණ ලාභය

ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මගින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

නොඉපැයූ වාරිකය

ගෙවීමට නියමිතව ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍ර දිනට අනතුරුව එළඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරිකමුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

නොඉපැයූ වාරික සංචිතය

දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරඹයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි. කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්වල වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මවා යන ප්‍රමාණය.

කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය

ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්වල වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මවා යන ප්‍රමාණය.

සර්වත්‍ර ආයුකාලය

ආයෝජන ඉතිරි කිරීමේ සංරචකය සහ අඩු වාරික සහිත කාලීන ජීවිත රක්ෂණය වැනි ස්ථිර ජීවිත රක්ෂණය. බොහෝමයක් සර්වත්‍ර ජීවිත රක්ෂණ ඔප්පුවල නම්‍යශීලී වාරික විකල්පයන් අඩංගු වේ. තවද, ඇතැම් තනි වාරික (එක්වර ගෙවන තනි වාරිකය) හෝ ස්ථිර වාරික (නියමිත ස්ථිර වාරික) අවශ්‍ය කෙරේ.

පූර්ණ ජීවිත රක්ෂණය

පූර්ණ ජීවිත රක්ෂණය, රක්ෂණය වූ තැනැත්තාගේ ජීවිතය සඳහා ආවරණය සපයයි. මරණ ප්‍රතිලාභයක් ලබා දීමට අමතරව, මුදල් වටිනාකම ක්‍රමයෙන් එක් රැස්වන ඉතිරි කිරීමේ සංරචකයක්ද පූර්ණ ජීවිත රක්ෂණයෙහි අන්තර්ගත වේ. මෙම ඔප්පු ස්ථිර හෝ සාම්ප්‍රදායික ජීවිත රක්ෂණ ලෙසින් ද හඳුන්වනු ලැබේ

ව්‍යසනකාරී පාඩු

සාමාන්‍යයෙන් සමස්ථ පාඩු ඇති කරන සාපේක්ෂව දුර්ලභ සිදුවීමක් හෝ සංසිද්ධියකි.

ආතතිය පරීක්ෂා කිරීම

රක්ෂණකරුට දැඩි ලෙස බලපාන සාධක එකක් හෝ කිහිපයක් අවධාරණය කිරීමේ මූල්‍ය බලපෑම මනින ඇගයුම් ක්‍රමයකි.

සටහන්

පොදු තොරතුරු

කාර්යාලීය ලිපිනය
11 මහල, නැගෙනහිර කුළුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
ශ්‍රී ලංකාව.

දුරකථන : +94112396184-9
ෆැක්ස් : +94112396190
ඊමේල් : info@ircsl.gov.lk
වෙබ් අඩවිය : www.ircsl.gov.lk

නෛතික ආකෘතිය
2001 පෙබරවාරි 23 දිනැති අංක 1172/27 දරන රජයේ ගැසට් පත්‍රය මගින් 2001 මාර්තු 01 දින සිට ක්‍රියාකාරී තත්වයට පත් වූ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

කොමිෂන් සභාවේ අරමුණ හා වගකීම
කොමිෂන් සභාවේ අරමුණ සහ වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

ගිණුම්කරණ වර්ෂය
31 දෙසැම්බර්

විගණකයන්
විගණකාධිපති

බැංකුකරුවන්
ලංකා බැංකුව

විගණන කමිටුව

ආර්.එම්.පී. රත්නායක මහතා	(01.01.2022 - 01.03.2022)
සමන් ප්‍රනාන්දු මහතා	(11.03.2022 - 15.08.2022)
ඒ.කේ. සෙනෙවිරත්න මහතා	(26.08.2022 - 31.12.2022)
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය	(01.01.2022 - 31.12.2022)
හරිස් සල්පිටිකෝරාල මහතා	(01.01.2022 - 31.12.2022)
ඉන්ද්‍රා බදුගේ මෙනවිය	(01.01.2022 - 11.03.2022)

ශ්‍රී ලංකා
රක්ෂණ නියාමන
කොමිෂන් සභාව

11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9 | ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් තැපෑල : info@ircsl.gov.lk | වෙබ් අඩවිය : www.ircsl.gov.lk